209 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 209 - இல. 3
**Volume 209 - No. 3**

2012 ජූනි 07 වන බ්‍රහස්පතින්දා
2012 யூன் 07, வியாழக்கிழமை
**Thursday, 07th June, 2012**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
  කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය**
  ජලය නොලැබීමෙන් උතුරු මැද පළාතේ ගොවීන් මුහුණ දෙන අර්බුදය

**කල් තැබීමේ යෝජනාව:**
  ජීවන වියදම ඉහළ යෑම මැඩ පැවැත්වීම සහ රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ වඩා හොඳ පාලනයක්

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

  சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**

  நீர்ப் பற்றாக்குறையினால் வட மத்திய மாகாண விவசாயிகள் எதிர்நோக்கும் நெருக்கடி

**ஒத்திவைப்புப் பிரேரணை:**

  வாழ்க்கைச்செலவு அதிகரிப்பைத் தடுத்தல் மற்றும் பொது நிதி மீதான சிறந்த கட்டுப்பாடு

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
  Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
  Crisis faced by farmers of North-Central Province due to scarcity of water

ADJOURNMENT MOTION:
  Arrest of increase in Cost of Living and exercise of better control over Public Finance

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2012 ජුනි 07 වන බ්‍රහස්පතින්දා*
*2012 யூன் 07, வியாழக்கிழமை*
*Thursday, 07th June, 2012*

*අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.*
*பாராளுமன்றம் பி..ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2012 ජුනි මස 6 වන දින මවිසින් ටී.බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2012 ජුනි මස 07 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2011 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. - [වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2004, 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා - පැමිණ නැත.

ගරු වික්ටර් ඇන්ටනි මහතා - පැමිණ නැත.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා - පැමිණ නැත.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### දහම් පාසල් ගුරු පත්වීම්: ක්‍රියා මාර්ග
### தஹம் பாடசாலை ஆசிரியர் நியமனம்: நடவடிக்கை
### APPOINTMENT OF DHAMMA SCHOOL TEACHERS : STEPS TAKEN

1120/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ධර්මාචාර්ය විභාගය සමත්ව මේ වනවිට දහම් පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල නිරතව සිටින ගුරු පිරිසට රජයේ ගුරු පත්වීම් ලබා දීමට අදාළව කැබිනට් පත්‍රිකා දෙකක් අනුමත කරගෙන තිබේද;

(ii) එම ගුරු පිරිසට 2600 වැනි සම්බුද්ධත්ව ජයන්ති වර්ෂය තුළදී රජයේ ගුරු පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தர்மாச்சார்ய பரீட்சையில் சித்தியடைந்து தற்போது தஹம் பாடசாலைகளில் கற்பித்தல் நடவடிக்கைகளில் ஈடுபட்டுள்ள ஆசிரியர்களுக்கு அரசாங்க ஆசிரியர் நியமனம் வழங்குதல் தொடர்பாக இரண்டு அமைச்சரவை நிருபங்கள் அங்கீகரிக்கப்பட்டுள்ளனா என்பதையும்;

(ii) மேற்படி ஆசிரியர்களுக்கு 2600 ஆவது சம்புத்த ஜயந்தி ஆண்டுக்குள் அரசாங்க ஆசிரியர் நியமனங்களை வழங்க நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அத்திகதி யாது?

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) whether approval has been obtained for two Cabinet memoranda relating to granting Government teaching appointments to those who are involved in teaching in the Dhamma Schools, having passed the "Dharmacharya" examination;

(ii) whether steps will be taken to give Government teaching appointments to the aforesaid set of teachers during the year of 2600th 'Sambuddhathwa Jayanthi'; and

(iii) if so, the date on which such appointments will be made?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

(ii) අදාළ සුදුසුකම් සපුරාලීම අනුව තෝරා ගනු ලබන දහම් පාසල් ගුරු පිරිසට පත්වීම් ලබා දීම පිණිස මුදල් අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර, එම පත්‍රිකාව සඳහා නිර්දේශ ලබා ගැනීම පිණිස ජාතික වැටුප් හා සේවා කොමිෂන් සභාව වෙත අමාත්‍ය මණ්ඩලය මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) අදාළ අනුමතිය ලද වහාම ඒ පිළිබඳව කටයුතු කරනු ලබන බව සඳහන් කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාට සඳහන් කරන්න පුළුවන්ද, ධර්මාචාර්ය විභාගය සමත්, දැනට දහම් පාසල්වල උගන්වන පිරිසට පළමුවැනි පත්වීම් ලිපි ප්‍රදානය කවදා වෙන කොට සිද්ධ කරන්න පුළුවන්ද කියලා. හරියට අහවල් දවසේ අහවල් වෙලාවට කියලා කියන්න ඕනෑ නැහැ. මේ වසර තුළ පුළුවන්ද, නැත්නම් ලබන වසර තුළ පුළුවන්ද කියලා කිව්වොත් ඇති. මොකද, 2011 ජනවාරි මාසයේ මේ පත්වීම් දෙනවා කියලා තමයි කිව්වේ. මේක ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් ඔබතුමන්ලා වෙච්ච පොරොන්දුවක්. ඒ නිසා පළමුවැනි පත්වීම් ලිපි ප්‍රදානය කවදා වෙන කොට සිද්ධ කරන්න ඔබතුමන්ලාට හැකියාව තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

අපි පොරොන්දු ඉටු කරන රජයක්. පොරොන්දු ඉටු කිරීමේ කාල වකවානු තීරණය වෙන්නේ රටේ භාණ්ඩාගාරයෙන් අපට මුදල් ලැබෙන ආකාරයට. ඒ මුදල් ලැබුණු වහාම, ඒ අනුමැතිය ලද වහාම අපි ඒක සතුටින් තමුන්නාන්සේට දැනුම් දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පළමුවැනි ප්‍රශ්නයෙන් ඇහුවේ කාල වකවානුවක්. නමුත් එතුමා කාල වකවානුවක් කියන්නේ නැහැ. මුදල් ලැබෙන විධියට පොරොන්දු ඉෂ්ට කරනවා කියලා ඡන්ද කාලයේ කිව්වේ නැහැ. ඒ කොහොම වෙතත් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති වර්ෂයත් පහු වුණා. එම ධර්මාචාර්ය ගුරු භවතුන්,-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

සම්බුද්ධත්ව ජයන්තියයි, ක්‍රිස්තු පූර්වයයි වැඩක් නැහැනේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පොඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. ප්‍රශ්නය අහනකල් ඉන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඔව්, ප්‍රශ්නය ඇහුවේ නැහැනේ. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි.

ධර්මාචාර්ය විභාගය සමතුන් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී, දැනට පවතින ගුරු සේවා ව්‍යවස්ථාවේ බාධාවක් තිබෙනවාද? ඒ බාධා ඉවත් කරන්න මොකක්ද අමාත්‍යාංශයට තිබෙන සැලැස්ම?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඉතා පැහැදිලි සැලැස්මක් තිබෙනවා. කැබිනට් මණ්ඩලයෙන් තමයි ඒ අනුමැතිය ලබා ගෙන ගුරුවරු හැටියට අන්තර්ග්‍රහණය කරන්නේ. නමුත්, අපි ඉතාම සීරු මාරුවෙන් ගුරුවරුන්ට පත්වීම් දෙන්න ඕනෑ. ඔබතුමන්ලා කියන විධියට, රටේ එක එක අංශ ඉල්ලන විධියට, ධර්මාචාර්ය චේවා, වෙනත් අංශ චේවා මේ දරුවන්ගේ අනාගතය තීරණය කරන්න බැහැ.

ආශ්චර්යවත් ලෝකයකට ගෙන යන්න ඉලක්ක සහගත කණ්ඩායම තමයි මේ රටේ දරුවෝ. ඒ දරුවන් වෙනුවෙන් ගන්නා තීරණ ඉතාම නිවිහැනහිල්ලේ ගන්න සිද්ධ වෙනවා. ඒවා කලබලයට කරන්න පුළුවන් දේවල් නොවෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරුකථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. මම දන්නේ නැහැ, ගරු ඇමතිතුමා එක එක අංශ කියලා අපහාසයෙන් උපහාසයෙන් කථා කරනවා. සමස්ත ලංකා ශාසනාරක්ෂක -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

විස්තර නැතිව ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය තමයි, අහන්නේ. සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති හාමුදුරුවෝත්, ලේකම් හාමුදුරුවෝත් වරක් සඳහන් කළා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සඳහන් කරපු ඒවා වැඩක් නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති හාමුදුරුවෝත්, ලේකම් හාමුදුරුවෝත් වරක් සඳහන් කළා, මේ පත්වීම් ලබා නොදෙනවා නම්, ඒ අයට ශාසනාරක්ෂක බල මණ්ඩල තනතුරුවලින් ඉල්ලා අස් වන්න පවා සිද්ධ වෙනවා කියලා. රට පුරාම සිටින ශාසනාරක්ෂක බල මණ්ඩල සභාපති ස්වාමීන් වහන්සේලා සහ ලේකම් ස්වාමීන් වහන්සේලා දැන් එවැනි ක්‍රියා මාර්ගයකට ගමන් කරමින් ඉන්නවා. මෙවැනි තත්ත්වයක් ඇති වුණොත් ඔබතුමන්ලාට දහම් පාසල් අධ්‍යාපනය සහ දහම් පාසල් පවත්වා ගෙන යාමේ වැඩ පිළිවෙළටත් යම් බාධා ඇති වන්න පුළුවන්. ඒ නිසා මෙවැනි ප්‍රමාදයක් සිද්ධ වෙනවා නම් ගරු ශාසනාරක්ෂක බල මණ්ඩල සභාපති ස්වාමීන් වහන්සේලා, ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා සහ මෙයට සම්බන්ධ පිරිස දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් අමාත්‍යාංශයට ආරම්භ කරන්න බැරි ඇයි?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
දැනුවත් කරලායි තිබෙන්නේ. දැනුවත් කරන්න විශේෂ අවශ්‍යතාවක් නැහැ. විපක්ෂය හැටියට තමුන්නාන්සේලාගේ කරුණු කාරණා ගැන තමුන්නාන්සේලාටත් දැනුවත් කරන්න පුළුවන්. අපි නිවැරදිව, පැහැදිලිව අපේ තීන්දු තීරණ අර ගෙන ඒ අය දැනුවත් කරලායි තිබෙන්නේ. ස්වාමීන් වහන්සේලාට එහෙම වර්ජනවලට යන්න අවශ්‍ය නැහැ. හැබැයි, ඒ වර්ජන තර්ජනවලට භයත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අන්තිම ප්‍රශ්නය පිළිතුරුවලට අදාළ නැහැ. එහෙත් කමක් නැහැ.

ප්‍රශ්න අංක 3-1664/'11-(2), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඇල්කඩුව වැවිලි සමාගමට අයත් වතු : විස්තර
### எல்கடுவ பெருந்தோட்டக் கம்பனிக்குரிய தோட்டங்கள்: விபரம்
### ESTATES BELONGING TO ELKADUWA PLANTATIONS COMPANY : DETAILS

1862/'11

4. **ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) ඇල්කඩුව වැවිලි සමාගමට අයත් වතු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) සේවකයින් බඳවා ගැනීම, ඉවත් කිරීම හා සේවය දීර්ඝ කිරීමේ පූර්ණ බලතල එම සමාගමේ පරිපාලනය සතු වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැවිලි සමාගමේ වත්මන් සභාපතිවරයා වැවිලි ක්ෂේත්‍රය තුළ දූෂණ හා වංචා සිදු කළ අයෙකු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම දූෂණ හා වංචා සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එම පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iii) එම පරීක්ෂණයෙන් එම සභාපතිවරයා වරදකරුවකු වුවහොත් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද;

(iv) එම සභාපතිවරයා ඉදිරිපත් කරන ඇල්කඩුව වැවිලි සමාගමේ ගිණුම් වාර්තා පිළිගත හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සමාගමේ 2007-2010 වර්ෂ තුළ ලාභ ලැබූ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) අලාභ ලැබුවේ නම්, එම අලාභය කොපමණද;

(iii) දූෂණ සහ අක්‍රමිකතා ඊට හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) (i) එම සමාගම සඳහා කෝප් වාර්තාවක නිර්දේශයක් පරිදි ආශ්‍රිත මෙහෙයුම් කාර්යාලයක් ඉදිකර තිබේද;

(ii) එය ඉදිකිරීමට හේතුව කවරේද;

(iii) ඒ සඳහා වැයවූ මුදල කොපමණද;

(iv) එම කාර්යාලයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எல்கடுவ பெருந்தோட்டக் கம்பனிக்குச் சொந்தமான தோட்டங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவையென் பதையும்;

(ii) ஊழியர்களை ஆட்சேர்த்தல், நீக்குதல் மற்றும் சேவை நீடிப்பு வழங்குதல் தொடர்பான முழுமையான அதிகாரம் மேற்படி கம்பனியின் நிர்வாகத்துக்கு உள்ளதா என்பதையும்:

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி பெருந்தோட்டக் கம்பனியின் தற்போதைய தலைவர் பெருந்தோட்டத் துறையில் ஊழல் மோசடிகளில் ஈடுபட்ட ஒருவராவார் என்பதை அவர் அறிவாரா?

(இ) (i) மேற்படி ஊழல், மோசடிகள் தொடர்பாக விசாரணை மேற்கொள்ளப்படுகின்றதா என்பதையும்;

(ii) அவ்விசாரணையின் முன்னேற்றம் யாதென்பதையும்;

(iii) மேற்படி விசாரணையில் குறித்த தலைவர் குற்றவாளியாகுமிடத்து மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

(iv) மேற்படி தலைவர் சமர்ப்பிக்கின்ற எல்கடுவ பெருந்தோட்டக் கம்பனியின் கணக்கு அறிக்கைகளை ஏற்றுக்கொள்ள முடியுமா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) (i) மேற்படி கம்பனியின் 2007-2010 ஆண்டுகளினுள் இலாபம் ஈட்டிய தோட்டங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) நட்டம் ஏற்பட்டிருப்பின் அந்த நட்டம் எவ்வளவென்பதையும்;

(iii) ஊழல் மற்றும் முறைகேடுகள் அதற்குக் காரணமாயமைந்ததா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) (i) மேற்படி கம்பனியின் பொருட்டு `கோப்' அறிக்கையொன்றின் சிபார்சுக்கமைய நடவடிக்கை அலுவலகமொன்று நிறுவப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அது நிறுவப்பட்டமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(iii) அதற்காக செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி அலுவலகத்தின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஊ) இன்றேல், ஏன்?

asked the Minister of State Resources and Enterprise Development:

(a) Will he state -

(i) the number of estates that belong to the Elkaduwa Plantations Company, and their names; and

(ii) whether the administration of that company is vested with the absolute power to recruit, remove and extend the services of employees?

(b) Will he inform this House-

(c) Is he aware of the fact that the current Chairman of this Company is a person with a record of committing acts of corruption and fraud in the estate sector?

(d) Will he inform this House-

(i) whether an investigation is being carried out with regard to such acts of corruption and fraud;

(ii) the progress of that investigation;

(iii) the course of action to be taken against that Chairman if he is found guilty at the investigation; and

(iv) whether the reports of accounts of the Elkaduwa Plantations Company, submitted by him are acceptable?

(e) Will he state-

(i) the number of estates of this company which made profits from 2007-2010;

(ii) if losses were incurred, the amount of the loss; and

(iii) whether acts of corruption and malpractices attributed to it?

(f) Will he state-

(i) whether a related operations office has been set up, as per a recommendation made by a COPE report on this Company;

(ii) the reason for establishing that office;

(iii) the cost incurred on it; and

(iv) the current progress of that office?

(g) If not, why?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

(අ) (i) වතු සංඛ්‍යාව 10කි.

1. ඇල්කඩුව වත්ත
2. මිල්ලවාන වත්ත
3. නාලන්ද වත්ත
4. හුණුගල වත්ත
5. පිටකන්ද වත්ත
6. සැලගම වත්ත
7. බණ්ඩාරපොළ වත්ත
8. රත්වත්ත වත්ත
9. හපුගස්පිටිය වත්ත
10. නෙල උල්ල වත්ත

[ගරු දයාශ්‍රිත තිසේරා මහතා]

(ii) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය අනුව මෙම කාර්යයන් සඳහා සම්පූර්ණ බලය මෙම සමාගමේ පරිපාලනය සතුය.

(ආ) නැත.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඈ) (i) 2007-2010 වර්ෂ තුළ ලාභ ලැබූ වතු.

2007 මිල්ලවාන වත්ත හා නාලන්ද වත්ත

2008 ඇල්කඩුව වත්ත, හුණුගල වත්ත, මිල්ලවාන වත්ත, නාලන්ද වත්ත හා හපුගස්පිටිය වත්ත.

2009 මිල්ලවාන වත්ත.

2010 මිල්ලවාන වත්ත, නාලන්ද වත්ත, හපුගස්පිටිය වත්ත.

(ii) ඒ වාගේම 2007-2010 වර්ෂ තුළ අලාභ ලැබූ වතු රුපියල් මිලියනවලින්.

2007 - ඇල්කඩුව වත්ත 9.42, එම වත්ත 2008 - නැත, 2009 - 15.92, 2010 - 11.27ක්ද,

ඒ වාගේම බණ්ඩාරපොළ වත්ත 2007 - 4.87, 2008 - 3.74, 2009 - 4.33, 2010 - 4.55ක්ද,

ඒ වාගේම හුණුගල වත්ත 2007-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

වතු 10ම කියනවාද? වතු 10ම අවශ්‍යද? ඒ කොටස සභාගත කරන්න. දීර්ඝ පිළිතුරක් නේ තිබෙන්නේ.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ගරු කථානායකතුමනි, පිළිතුරේ ඉතුරු කොටස **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතුරු කොටස:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*
*Rest of the Answer tabled:*

(ii) 2007 - 2010 වර්ෂ තුළ අලාභ ලැබූ වතු (රු.මි)

| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ඇල්කඩුව වත්ත | 9.42 | - | 15.92 | 11.27 |
| බණ්ඩාරපොළ වත්ත | 4.87 | 3.74 | 4.33 | 4.55 |
| හුණුගල වත්ත | 5.36 | - | 8.57 | 5.06 |
| පිටකන්ද වත්ත | 7.04 | 2.17 | 5.41 | 10.22 |
| රත්වත්ත වත්ත | 9.75 | 3.05 | 20.64 | 0.42 |
| සැලගම වත්ත | 2.57 | 2.04 | 5.32 | 5.55 |
| හපුගස්පිටිය වත්ත | 2.10 | - | 1.71 | - |
| නාලන්ද වත්ත | - | - | 1.25 | - |

(iii) අදාළ නොවේ.

(ඉ) (i) ඔව්.

(ii) මෙම කාර්යාලය පිහිටුවීමට හේතු වූයේ වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්දක් තිබූ ප්‍රධාන විධායක නිලධාරි යටතේ වතු පරිපාලනය විධිමත් කිරීමට බව සභාපතිවරයා දන්වා ඇත.

(iii) මේ සඳහා වැය වූ මුළු මුදල රුපියල් 3,113,110/- වන අතර, රත්වත්ත වතු යායේ තිබූ පැරණි ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කොට නව කාර්යාලය පිහිටුවා ඇති බව දන්වා ඇත.

(iv) සිදු කරන ලද පරීක්ෂණ අනුව ප්‍රධාන විධායක නිලධාරි යටතේ මෙම කාර්යාලයේ පරිපාලන කටයුතු ඉතා දුර්වල අයුරින් පවත්වා ගෙන ගොස් ඇති බව හා විවිධ අවිධිමත් කටයුතු සිදුවී ඇති බව හෙළිදරව් වී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ආපසු ප්‍රධාන කාර්යාලයට කැඳවන ලදී. 2011 ජූනි මස ප්‍රධාන විධායක නිලධාරියා ආපසු ප්‍රධාන කාර්යාලයට කැඳවා ඇත. 2011 ජූනි මස මෙම ප්‍රධාන විධායක නිලධාරියාගේ සේවා කොන්ත්‍රාත්තුව අවසන් විය. දැනට විගණන අංශය, සහකාර වතු අධිකාරි (වන වගා) සහ ව්‍යාපෘති කළමනාකරු යන නිලධාරීන් මෙහෙයුම් කාර්යාලයේ සේවය කරන බව හා ඉදිරියේදී සාමාන්‍යාධිකාරි තනතුර සඳහා පත් කරනු ලබන නිලධාරියා යටතේ මෙම කාර්යාලය පවත්වා ගෙන යාමට කටයුතු යොදන බව ආයතනයේ සභාපති විසින් දන්වා ඇත.

(ඊ) පැන නොනඟී.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු ඇමතිතුමනි,-

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ගරු මන්ත්‍රීතුමනි, වතු 10ම කියන්න අවශ්‍යද ඔබතුමාට?

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

වතු 10ම අවශ්‍ය නැහැ. මුළු එකතුව කිව්වා නම් ඇති.

2010 කොපමණද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කෙටියෙන් පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

2010 වෙද්දී අලාභය අවම වෙලා රුපියල් මිලියන එකක වාගේ සුළු ලාභයක් තමයි මුළු වතු ක්ෂේත්‍රයේම තිබෙන්නේ. මේ වතු ක්ෂේත්‍රයේ වසර 25ක් තිස්සේ EPF, ETF සහ gratuityවල ප්‍රශ්න රාශියක් තිබුණා. ඒ අනුව 2010 දී අපි අපේ අමාත්‍යාංශය තුළින් අලාභය අවම කරලා සුළු ලාභයක් සඳහා ගිහින් තිබෙනවා කියා ප්‍රකාශ කරන්න පුළුවන්.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය ඇල්කඩුව වැවිලි සමාගමේ සේවාව දීර්ඝ කිරීම සම්බන්ධවයි. වයස අවුරුදු 63ක් වූ මහින්ද සිරිමාන සාමාන්‍යාධිකාරිවරයාත්, වයස අවුරුදු 63ක් වූ ආර්.ආර්. ජයසූරිය ගණකාධිකාරිවරයාත්,

වයස අවුරුදු 64ක් වූ විනී විමලසූරිය කියන පරිපාලන උපදේශකවරයාත් තවදුරටත් සේවයේ යෙදී සිටිනවා. මේ අයව විශ්‍රාම ගැන්වීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් නිර්දේශ කර ඇති බව ඔබතුමා පිළිගන්නවාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
COPE වාර්තාව අනුව අපි ඒ නිලධාරින් සම්බන්ධව තීන්දුවක්, තීරණයක් ගන්නවා. ඒ අනුව අපි කටයුතු කරනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ඒ සම්බන්ධයෙන් ඔබතුමා මේ වන විට නියෝග නිකුත් කරලා තිබෙනවාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
අපි මේ වන විට COPE වාර්තාව අනුව කමිටුවක් පත් කරලා තිබෙනවා. ඔබතුමා ඔය කියන ගැටලු, ප්‍රශ්න සම්බන්ධව -ඒ අය සම්බන්ධයෙන්- ඒ කමිටුව තුළින් පරීක්ෂණ කරලා යම් අකටයුත්තක් වෙලා තිබෙනවා නම් එය නිවැරදි කරනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු ඇමතිතුමා මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. හුණුගල වතුයායේ ගස් කැපීම සම්බන්ධවත්, රත්වත්ත වත්තේ කරාබු නැටි ටෙන්ඩර් සම්බන්ධවත්, මිල්ලවාන වත්තේ පොල් විකිණීම සම්බන්ධවත් දූෂණ, වංචා සිදු වෙලා තිබෙන බව විගණන පරීක්ෂණවලින් වාර්තා වෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමා පරීක්ෂණයක් පවත්වනවාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
මිල්ලවාන වත්තේ පොල් විකිණීම සම්බන්ධ වංචාවට අදාළව හිටපු වතු අධිකාරිවරයාව වෙනත් ස්ථානයකට මාරු කරලා තිබෙනවා. ඔහුගේ සේවය අත් හිටුවීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අනෙක් වතු දෙකේ ප්‍රශ්න සඳහාත් යම් විශේෂිත වූ කමිටුවක් අලුතින් පත් කරලා, ඒ තුළින්, සිදු වන අකටයුතු නිවැරදි කර දෙන්නම් ගරු මන්ත්‍රීතුමා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
මොකද, ඒ වත්තේ දූෂණ, අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. එසේ සිදු වෙලා තිබුණාට තවම පරීක්ෂණයක් පවත්වලා නැහැ.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
පරීක්ෂණයක් සඳහා කමිටුවක් පත් කරලා -

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
වතු කමිටුවක්?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
අමාත්‍යාංශය තුළින් අපි පත් කරලා තිබෙනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ඒ සම්බන්ධයෙන් දැනට වාර්තාවක් ඉදිරිපත් වෙලා තිබෙනවාද ගරු ඇමතිතුමනි?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
තවම නම් ආවේ නැහැ. ආපු ගමන් මම ඒ වාර්තාව ඉදිරිපත් කරන්නම්.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි ගරු කථානායකතුමනි. ඇල්කඩුව වැවිලි සමාගමට අයත් වතුවල 2010 වර්ෂයේ ආදායම් වාර්තාව අනුව, රුපියල් 2,02,48,512ක ලාභයක් පෙන්වලා තිබෙනවා. අභ්‍යන්තර විගණන නිලධාරි අනුෂ්ක ඒකනායකගේ වාර්තාවට අනුව එම වර්ෂයේ රුපියල් 49,65,702ක පාඩුවක් පෙන්වලා තිබෙනවා. මේ විගණන වාර්තා දෙකෙන් කොයි එකද සත්‍ය ගරු ඇමතිතුමනි?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ඒ ගැනත් පොඩ්ඩක් හොයා බලන්න වෙනවා. ඒ සම්බන්ධව මම හිතන්නේ-

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
විගණන වාර්තා දෙකක් තිබෙනවා. ඒ විගණන වාර්තා දෙකෙන් කොයි වාර්තාවද හරි ගරු අමාත්‍යතුමනි? අමාත්‍යාංශයෙනුත් විගණන කරලා තිබෙනවා. වෙනම විගණනයක් කරලා තිබෙනවා, firm එකක්.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
මේ ගැන පැමිණිලි ඇවිල්ලා තිබෙනවා. මේ ගැන සොයා බලා උපදේශක කාරක සභාවේදී ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-2092/'11-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

නව විශ්‍රාම වැටුප් ක්‍රමයකට යාම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කරමින් සිටිනවාය කියන ටික සඳහන් කරන්නට ඕනෑ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වතුකරයේ නොවන දෙමළ මාධ්‍ය පාසල් : විස්තර
## பெருந்தோட்டங்களைச் சாராத தமிழ்மொழிமூலப் பாடசாலைகள்: விபரம்
## NON-ESTATE TAMIL MEDIUM SCHOOLS : DETAILS

2107/’11

6. **ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන දෙමළ මාධ්‍යයෙන් පමණක් අධ්‍යාපන කටයුතු කරන වතුකරයේ නොවන පාසල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(ii) එම දෙමළ මාධ්‍ය පාසල් අතර පවතින ජාතික පාසල්, පළාත් පාසල්, නවෝද්‍යා හා ඉසුරු පාසල් සංඛ්‍යාව; සහ

(iii) ප්‍රාථමික හා ද්විතීයික පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ද්විතීයික පාසල් 1000 ව්‍යාපෘතියට අයත් වතුකරයේ නොවන දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ක්‍රියාත්මක රජයේ දෙමළ පාසල්වල ළමුන්ගේ පාසල් හැර යාමේ අනුපාතය කොපමණද;

(ii) පසු ගිය වර්ෂ 5 තුළ වැසී ගිය රජයේ දෙමළ පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது நடைமுறையிலிருக்கும் தமிழ்மொழி மூலம் மாத்திரம் கல்வி நடவடிக்கைகளை மேற்கொள்ளும் பெருந்தோட்டங்களைச் சாராத பாடசாலை களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்திற் கிணங்க வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி தமிழ் மொழிமூல பாடசாலைகளுக்கிடையில் இருக்கும் தேசிய பாடசாலைகள், மாகாண பாடசாலைகள், நவோத்யா பாடசாலைகள் மற்றும் இசுரு பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) முதலாம் நிலை மற்றும் இரண்டாம் நிலைப் பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 1000 இரண்டாம் நிலைப் பாடசாலைகள் திட்டத்தில் அடங்கும் பெருந்தோட்டத்தைச் சாராத தமிழ் மொழிமூலப் பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அந்தப் பாடசாலைகளின் பெயர்கள் ஒவ்வொரு மாவட்டத்திற்கும் ஏற்ப வெவ்வேறாக யாவை என்பதையும்

அவர் அறிவிப்பாரா?

(இ) (i) தற்போது இயங்கும் அரச தமிழ் பாடசாலைகளில் பாடசாலைகளை விட்டு விலகிச் செல்லும் மாணவர்களின் விகிதாசாரம் எவ்வளவு என்பதையும்;

(ii) கடந்த 5 வருடங்களினுள் மூடப்பட்ட அரச தமிழ்ப் பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) the number of non-estate schools operative in each district in Sri Lanka where educational activities are conducted only in Tamil medium ;

(ii) the number of national schools, provincial, Navodya and Isuru schools ; and

(iii) the number of primary and secondary schools amongst those Tamil medium schools?

(b) Will he inform this House-

(i) the number of non-estate Tamil medium schools belonging to the 1000 secondary school project; and

(ii) separately the names of such schools, as per each district?

(c) Will he state-

(i) the dropout rate of school children of the Government Tamil schools which are currently in operation ; and

(ii) the number of Government Tamil schools that were closed down during the past 5 years?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඇමුණුම 01හි දක්වා ඇත.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඇමුණුම කියවන්න පුළුවන්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමියනි, දීර්ඝ ලේඛනයක් තිබෙනවා. කියවනවා නම් කාල වේලාව යනවා. ඒ නිසා සභාගත කරන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දිස්ත්‍රික්ක 25ක විස්තර කියවන්න තිබෙනවා. පාසල් සංඛ්‍යාව කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමියනි, වතු පාසල් හැර රජයේ දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව 2028කි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
හොඳයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

(ii) ජාතික පාසල් - 25
පළාත් පාසල් - 2003
නවෝදය පාසල් - 64
ඉසුරු පාසල් - 22

(iii) ප්‍රාථමික - 646
ද්විතියික - 1382

(ආ) (i) 167කි.

(ii) ඇමුණුම 02 හි දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) (i) ගිලිහී යාමේ අනුපාතය 6.02කි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වාර්තාවල පෙන්වනවා ඒ ප්‍රමාණය සියයට 8.5ක් කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමිය මගේ උත්තරය අහලා ප්‍රශ්නය පසුව අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රෝසි සේනානායක මන්ත්‍රීතුමියනි, පිළිතුරු දීලා අවසන් වෙනකම් පොඩ්ඩක් ඉන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

(ii) 70කි.

මෙයින් ඇතැම් පාසල් ද්විතීයික පාසල් 1,000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේදී පෝෂිත ප්‍රාථමික පාසල් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
*Annexes tabled:*

ඇමුණුම 01

වතු පාසල් හැර රජයේ දෙමළ මාධ්‍ය පාසල්

| දිස්ත්‍රික්කය | එකතුව |
|---|---|
| කොළඹ | 31 |
| ගම්පහ | 20 |
| කළුතර | 16 |
| මහනුවර | 75 |
| මාතලේ | 23 |
| නුවරඑළිය | 16 |
| ගාල්ල | 10 |
| මාතර | 10 |
| හම්බන්තොට | 8 |
| යාපනය | 373 |
| කිලිනොච්චි | 79 |
| මන්නාරම | 95 |
| වවුනියාව | 166 |
| මුලතිව් | 67 |
| මඩකලපුව | 314 |
| අම්පාර | 211 |
| ත්‍රිකුණාමලය | 195 |
| කුරුණෑගල | 74 |
| පුත්තලම | 68 |
| අනුරාධපුරය | 64 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 34 |
| මොනරාගල | 9 |
| රත්නපුර | 20 |
| කෑගල්ල | 29 |
| එකතුව | **2028** |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

ඇමුණුම 02

**පාසල් 1000 වැඩසටහනේ වතු පාසල් නොවන දෙමළ මාධ්‍ය පාසල්**

| අංකය | දිස්ත්‍රික්කය | පාසල |
|---|---|---|
| 1 | ගම්පහ | අල් අස්හර් ම.ම.වි. |
| 2 | ගම්පහ | අල් මුබාරක් ම.ම.වි. |
| 3 | කළුතර | සි.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි. |
| 4 | කළුතර | සහිරා ම.වි. |
| 5 | මහනුවර | අල් මනාර් ම.ම.වි. |
| 6 | මහනුවර | අල් අෂාර් ම.වි. |
| 7 | මාතලේ | අජ්මීර් ජා.පා. |
| 8 | නුවරඑළිය | ශ්‍රී නිශ්ශංකමල්ල ම.වි. |
| 9 | මාතර | අරෆා ම.ම.වි. |
| 10 | මාතර | හැන්ෆෝර්ඩ් දෙ.ක.වි. |
| 11 | හම්බන්තොට | සහිරා ම.ම.වි. |
| 12 | යාපනය | චන්ද්‍රපුර ස්කන්ධවරෝදය ම.වි. |
| 13 | යාපනය | චාවකච්චේරි හින්දු වි. |
| 14 | යාපනය | කොඩිකාමම් තිරුනවු කරසු ම.වි. |
| 15 | යාපනය | වාරනි ම.වි. |
| 16 | යාපනය | වයිතීස්වර වි. |
| 17 | යාපනය | වෙම්බඩි උසස් බාලිකා වි. |
| 18 | යාපනය | වයාවිලන් ම.ම.වි. |
| 19 | යාපනය | පුංකුඩුතිව් ම.වි. |
| 20 | යාපනය | ඩෙල්ෆ් ම.වි. |
| 21 | යාපනය | වේලනයි ම.ම.වි. |
| 22 | යාපනය | අනලයිතිව් සතාසිවම් ම.වි. |
| 23 | යාපනය | ශාන්ත අන්තෝනි වි. |
| 24 | යාපනය | ඒරලායි ම.වි. |
| 25 | යාපනය | ස්කන්ධවරෝදය වි. |
| 26 | යාපනය | මානිපායි හින්දු වි. |
| 27 | යාපනය | ආචාර්ය ඒ. ත්‍යාගරාජා ම.ම.වි. |
| 28 | යාපනය | චන්කනායි සිවප්‍රකාශ ම.වි. |
| 29 | යාපනය | වද්දු හින්දු වි. |
| 30 | යාපනය | වික්ටෝරියා වි. |
| 31 | යාපනය | යාපනය හින්දු බාලිකා වි. |
| 32 | යාපනය | කොන්ඩවිල් හින්දු ම.වි. |
| 33 | යාපනය | යාපනය හින්දු වි. |
| 34 | යාපනය | හාට්ලි වි. |
| 35 | යාපනය | මෙතෝදිස්ත උසස් බාලිකා වි. |
| 36 | යාපනය | උඩුතුරායි ම.වි. |
| 37 | යාපනය | වඩමාරච්චි බාලිකා ම.ම.වි. |
| 38 | යාපනය | තෙල්ලිඅඩි ම.ම.වි. |
| 39 | යාපනය | විග්නේෂ්වර වි. |
| 40 | යාපනය | අච්චුවේලි ම.ම.වි. |
| 41 | යාපනය | කෝපායි ක්‍රිස්තියානි වි. |
| 42 | යාපනය | පුතූර් ශ්‍රී සෝමස්කන්ද වි. |
| 43 | යාපනය | මාදගල් ශාන්ත ජෝසප් ම.වි. |
| 44 | යාපනය | ශාන්ත හෙන්රි වි. |
| 45 | කිලිනොච්චි | තාමපුරම් ම.වි. |
| 46 | කිලිනොච්චි | මුරුගානන්ද ම.වි. |
| 47 | කිලිනොච්චි | කිලිනොච්චි හින්දු වි. |
| 48 | කිලිනොච්චි | අක්කරායන් ම.වි. |
| 49 | කිලිනොච්චි | භාරති වි. |
| 50 | කිලිනොච්චි | කිලිනොච්චි ම.ම.වි. |
| 51 | කිලිනොච්චි | මුලන්කාවිල් ම.වි. |
| 52 | මන්නාරම | ෆාතිමා ම.ම.වි. |
| 53 | මන්නාරම | අඩම්පන් ම.ම.වි. |
| 54 | මන්නාරම | මුරුන්කන් ම.වි. |
| 55 | මන්නාරම | ශාන්ත ආනා ම.ම.වි. |
| 56 | මන්නාරම | කාකයියන්කුලම් මුස්ලිම් ම.වි. |
| 57 | මන්නාරම | පෙරියපඩිවිරිච්චන් ම.වි. |
| 58 | මන්නාරම | එරුක්කාලම්පිඩ්ඩි මුස්ලිම් ම.ම.වි. |
| 59 | මන්නාරම | තලෙයිමන්නාරම පියර් ර.දෙ.වි. |
| 60 | මන්නාරම | ඉලුප්පායි කඩවායි ම.වි. |
| 61 | මන්නාරම | පෙරියමඩු ම.වි. |
| 62 | මන්නාරම | මුසාලි ම.වි. |
| 63 | මන්නාරම | නානත්තන් ම.වි. |
| 64 | මුලතිව් | විද්‍යානන්ද වි. |
| 65 | මුලතිව් | යෝගපුරම් ම.වි. |
| 66 | මුලතිව් | පඩියන්කුලම් ම.වි. |
| 67 | මුලතිව් | මුලතිව් ම.වි. |
| 68 | මුලතිව් | මාන්කුලම් ම.වි. |
| 69 | මුලතිව් | මුත්තායන්කඩ්ඩු දකුණු ඉවුර දෙමළ බාලිකා වි. |
| 70 | මුලතිව් | ඔඩ්ඩුසුඩාන් ම.වි. |
| 71 | මුලතිව් | පුතුකුඩුරුප්පු ම.වි. |
| 72 | මුලතිව් | උදයාර්කඩ්ඩු ම.වි. |
| 73 | මුලතිව් | මල්ලවි ම.ම.වි. |
| 74 | වවුනියාව | ඕමන්තෙයි ම.ම.වි. |
| 75 | වවුනියාව | සයිවප්‍රකාශ බාලිකා වි. |
| 76 | වවුනියාව | කනගරායන්කුලම් ම.වි. |
| 77 | වවුනියාව | පුතුකුලම් ම.වි. |
| 78 | වවුනියාව | තරනිකුලම් ගනේෂ වි. |
| 79 | වවුනියාව | පුවරාසම්කුලම් ම.වි. |
| 80 | වවුනියාව | වවුනියා පෙරියකෝමාරසන්කුලම් ම.වි. |
| 81 | වවුනියාව | නැදුන්කර්නි ම.වි. |
| 82 | වවුනියාව | පුලියන්කුලම් හින්දු වි. |
| 83 | වවුනියාව | වවුනියා අල් ඉක්බාල් වි. |
| 84 | වවුනියාව | වීරපුරම් මනිවාසකර් ම.වි. |
| 85 | අම්පාර | අක්කරෙයිපත්තු ම.ම.වි. |
| 86 | අම්පාර | මහමුද් බා.වි. |
| 87 | අම්පාර | පඩිරුප්පු ම.වි. |
| 88 | අම්පාර | සහිරා වි. |
| 89 | අම්පාර | අඩ්ඩාලච්චේනයි ම.ම.වි. |
| 90 | අම්පාර | රාමක්‍රිශ්නා ම.වි. |
| 91 | අම්පාර | විපුලානන්ද ම.ම.වි. |
| 92 | අම්පාර | අල් අෂ්රක් ම.ම.වි. |
| 93 | අම්පාර | මදීනා ම.වි. |
| 94 | අම්පාර | අල්-ඉර්ෆාන් බා.වි. |
| 95 | අම්පාර | පොතුවිල් දෙමළ ම.වි. |
| 96 | අම්පාර | විනයාගපුරම් ම.වි. |
| 97 | අම්පාර | තම්බිලුවිල් ම.ම.වි. |

| | | |
|---|---|---|
| 98 | අම්පාර | අල් අෂ්රෆ් ම.වි. |
| 99 | අම්පාර | රණමඩු හින්දු ම.වි. |
| 100 | අම්පාර | අල් මාජන් වි. |
| 101 | අම්පාර | සමන්තුරෙයි ම.ම.වි. |
| 102 | අම්පාර | අල්-හම්රා ම.වි. |
| 103 | අම්පාර | මින්හාජ් ම.වි. |
| 104 | අම්පාර | අස් සිරාජ් ම.වි. |
| 105 | අම්පාර | ශ්‍රී රාමක්‍රිශ්නා වි. |
| 106 | අම්පාර | පොතුවිල් ම.ම.වි. |
| 107 | අම්පාර | ෆයිසා ම.වි. |
| 108 | මඩකළපුව | කරදියනාරු දෙමළ බා.වි. |
| 109 | මඩකළපුව | අල්-හිරා ම.වි. |
| 110 | මඩකළපුව | කන්නකුඩා ම.වි. |
| 111 | මඩකළපුව | සාන්තිවේලි සිත්ති විනයාගර් වි. |
| 112 | මඩකළපුව | කරුවක්කර්නි විග්නේශ්වර වි. |
| 113 | මඩකළපුව | කදිරවේලි විග්නේශ්වර වි. |
| 114 | මඩකළපුව | කිරාන් ම.වි. |
| 115 | මඩකළපුව | පෙරියකල්ලාර් ම.ම.වි. |
| 116 | මඩකළපුව | මුතාලායිකුඩා ම.වි. |
| 117 | මඩකළපුව | අලිගාර් ම.ම.වි. |
| 118 | මඩකළපුව | මාකන් මාකර් ම.වි. |
| 119 | මඩකළපුව | පුඩිරුප්පු කලෙයිමගර් වි. |
| 120 | මඩකළපුව | අල්-නසාර් බා.වි. |
| 121 | මඩකළපුව | අල්-අමීන් ම.වි. |
| 122 | මඩකළපුව | කාත්තන්කුඩි ම.ම.වි. |
| 123 | මඩකළපුව | හින්දු වි. |
| 124 | මඩකළපුව | මහජන වි. |
| 125 | මඩකළපුව | අරයාම්පති ම.වි. |
| 126 | මඩකළපුව | මහිලාවද්දවන් ම.වි. |
| 127 | මඩකළපුව | වාන්තරු මූලායි ම.ම.වි. |
| 128 | මඩකළපුව | වාලච්චේනයි අන්නූර් ම.ම.වි. |
| 129 | මඩකළපුව | මීරාවෝඩයි අල් හිදායා ම.වි. |
| 130 | මඩකළපුව | ඔට්ටමාවඩි ම.ම.වි. |
| 131 | මඩකළපුව | පෙන්තලායි විපුලානන්ද වි. |
| 132 | මඩකළපුව | තුරෙයි නීලවානි ම.වි. |
| 133 | මඩකළපුව | කලුදාවලෙයි ම.වි. |
| 134 | මඩකළපුව | අම්පිලාන්දුරෙයි කලෙයිමගල් ම.වි. |
| 135 | මඩකළපුව | පලූකාමම් කන්ඩුමනි වි. |
| 136 | ත්‍රිකුණාමලය | ශ්‍රී සම්පහ ම.වි. |
| 137 | ත්‍රිකුණාමලය | කින්නියා අල් අක්ෂා වි. |
| 138 | ත්‍රිකුණාමලය | අල් ඉර්ෆාන් ම.වි. |
| 139 | ත්‍රිකුණාමලය | අල්-හිලාල් ම.ම.වි. |
| 140 | ත්‍රිකුණාමලය | මුතූර් ම.ම.වි. |
| 141 | ත්‍රිකුණාමලය | අල්-හිජ්රා ම.වි. |
| 142 | ත්‍රිකුණාමලය | සිරාජ් මුස්ලිම් වි. |
| 143 | ත්‍රිකුණාමලය | අල්-තාරික් ම.වි. |
| 144 | ත්‍රිකුණාමලය | ඉලන්කයිතුරායි මුහතුවරාම් හින්දු වි. |
| 145 | ත්‍රිකුණාමලය | නිලාවේලි දෙ.ම.වි. |
| 146 | ත්‍රිකුණාමලය | පුල්මුඩායි මුස්ලිම් ම.වි. |
| 147 | ත්‍රිකුණාමලය | ආතිකෝනේශ්වර ම.වි. |
| 148 | ත්‍රිකුණාමලය | අල්-අස්හර් මුස්ලිම් ම.වි. |
| 149 | ත්‍රිකුණාමලය | විපුලානන්ද ම.ම.වි. |
| 150 | කුරුණෑගල | හිස්බුල්ලා ම.ම.වි. |
| 151 | කුරුණෑගල | මාදිගේ මිදියාල මුස්ලිම් ම.ම.වි. |
| 152 | පුත්තලම | තිගාලි මුස්ලිම් ම.වි. |
| 153 | පුත්තලම | පල්ලිවාසල්තුරෙයි මුස්ලිම් ම.වි. |
| 154 | පුත්තලම | අල්-අක්ෂා ම.ම.වි. |
| 155 | පුත්තලම | කඩියාමොට්ටායි මුස්ලිම් ම.වි. |
| 156 | පුත්තලම | ආඩිමුනායි දෙමළ ම.වි. |
| 157 | පුත්තලම | අල්-හිරා මුස්ලිම් ම.වි. |
| 158 | පුත්තලම | ෆාතිමා බා.ම.වි. |
| 159 | පුත්තලම | සහිරා ම.ම.වි. |
| 160 | පුත්තලම | මාම්පුරි රෝ.ක.සි.දෙ.ම.වි. |
| 161 | අනුරාධපුරය | කදන්දුගම ජයා මුස්ලිම් වි. |
| 162 | පොළොන්නරුව | සේනපුර අල්-අමීන් මුස්ලිම් ම.වි. |
| 163 | බදුල්ල | ගුරුතලාව මුස්ලිම් ම.වි. |
| 164 | මොණරාගල | බකිනිගහවෙල මුස්ලිම් ම.වි. |
| 165 | කෑගල්ල | දිප්පිටිය මුස්ලිම් ම.වි. |
| 166 | කෑගල්ල | අල්-අස්හාර් මුස්ලිම් ම.වි. |
| 167 | කෑගල්ල | සුලෙයිමානියා මුස්ලිම් වි. |

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙකයි. 2009 වසරේ පමණක් දෙමළ මව් භාෂාව වශයෙන් හදාරන දරුවන් සියයට 25ක් එම විෂයය අසමත් වී තිබෙනවා. මහින්ද චින්තනය අනුව යුද්ධයෙන් පීඩාවට පත් වෙච්ච උතුරු, නැඟෙනහිර හා ඒ ආසන්න ප්‍රදේශවල අධ්‍යාපනය නංවීමට කඩිනමින් පාසල් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවලිය ආරම්භ කරන බවට දුන් පොරොන්දු ඉටු වී තිබේද? මේ වෙනුවෙන් ගෙන තිබෙන ක්‍රියාදාමය මොකක්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඇති. "ඉටු වී තිබේද?" කියලා ඇහුවාම ඇති. අනික් ප්‍රශ්නය දෙවන අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, මේ වතු පාසල් තිබුණේ කුඩා පොල් අතු පාසල් -කුඩා ගෙවල්- වශයෙන් "පුල්ලෙමඩු" කියලා. මේවා 1974 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සහ ආචාර්ය බදිඋද්දීන් මහ්මුද් මැතිතුමා විසින් රජයට පවරා ගත්තා. අද මේ පාසල් අප එක්තරා මට්ටමකට රැගෙන එමින් පවතිනවා. මුස්ලිම් සහ වතු පාසල් සඳහා දෙමළ මාධ්‍ය ගුරු පත්වීම් ලබා දීලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒක තමයි මේ කියන්නේ. සංවර්ධනය නේ. [බාධා කිරීමක්] මම දන්නේ නැහැ, රනිල් වික්‍රමසිංහ නායකතුමාත් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්නය හොඳට අහ ගන්න. කෙටි පිළිතුරක් දෙන්න. ප්‍රශ්නයක් කෙටියෙන් ඇහුවාම හොඳට පැහැදිලියි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මහින්ද චින්තන ඉදිරි දැක්මේ පැහැදිලිවම කියා තිබෙනවා යුද්ධයෙන් පීඩාවට පත් වෙච්ච උතුරු, නැඟෙනහිර සහ ඒ ආසන්න ප්‍රදේශවල අධ්‍යාපනය නංවාලීමට අලුත් පාසල් ගොඩනැඟිලි ඉදි කිරීම හා එයට අදාළ සංවර්ධන කටයුතු කරනවා කියලා. මේ සම්බන්ධයෙන් යම් කිසි ක්‍රියාදාමයක් අරගෙන තිබෙනවාද? සංවර්ධනය වෙලා තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ක්‍රියාදාමයක් අරගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි. පාසල් දහසේ ව්‍යාපෘතිය යටතේ දෙමළ මාධ්‍යයෙන් යාපනය ඇතුළුව පාසල් 167ක් මේ වර්ෂය සඳහා අන්තර්ගත කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ පාසල් 167 සමඟ එයට අනුබද්ධ වන ප්‍රාථමික පාසල් පහකුත් තිබෙනවා. ඒ නිසා ඉතා පැහැදිලිව ඉදිරි වර්ෂ කීපය වන විට උතුරු නැඟෙනහිර සහ අනිකුත් පළාත්වල සියලුම දෙමළ පාසල් මේ රටේ උසස් පාසල් මට්ටමට ගෙන එන්නට මහින්ද චින්තනය අනුව කටයුතු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. "මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව වතුකරයේ තරුණ තරුණියන් දාහකට ද්විඩ මාධ්‍යයෙන් ගණිතය, විද්‍යාව වැනි විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු පුහුණුවක් ලබා දීමට යෝජනා කර තිබේ. මෙය මේ වන විට ක්‍රියාත්මක කර තිබේද? ද්විඩ මාධ්‍යය ගුරු හිඟය පියවීමට ගෙන ඇති ක්‍රියාදාමය කවරේද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොනවද මේ කියවන්නේ ඔබතුමිය?

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මහින්ද චින්තනයේ තිබුණු පොරොන්දු අහන්නේ, ගරු කථානායකතුමනි. මම අහන ප්‍රශ්නය -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න අහන කොට ඔහොම කියවන්න බැහැ. දීපු පිළිතුර තවදුරටත් පැහැදිලි කර ගන්න තමයි අතුරු ප්‍රශ්න අහන්නේ. ලියා ගෙන ඇවිල්ලා කියවීමේ සම්ප්‍රදායක් නැහැ. කමක් නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
රජයේ දෙමළ පාසල්වල ළමුන්ගේ පාසල් හැර යෑමේ අනුපාතය සියයට 6.2ක් කියලා නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා. මා අහන්නේ, "මහින්ද චින්තනයේ දීපු පොරොන්දු ඉෂ්ට කරලා තිබෙනවාද?" කියලායි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. මහින්ද චින්තනය ගැන මේ ප්‍රශ්නයේ සඳහන් වෙලා නැහැ. [බාධා කිරීම්]

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, ගණිතය, විද්‍යාව සහ මවු බස වෙනුවෙන් විශේෂයෙන්ම දෙමළ දරුවන් දාහක් පුරුදු පුහුණු කරනවා කියලා මහින්ද චින්තනයේ පොරොන්දු වෙලා තිබෙනවා.

ඒ සම්බන්ධයෙන් ක්‍රියාදාමයක් අරගෙන තිබෙනවාද? එතුමා දුන් පිළිතුරට අනුව අතුරු ප්‍රශ්නයක් මම අහන්නේ. [බාධා කිරීම්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
දුෂ්කර ප්‍රදේශවල - මොනරාගල, ඌව පළාත් ගත්තොත් - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා තේරුම් ගන්න ආකාරයෙන් පිළිතුරු දේවි. ඒක අහගෙන ඉඳලා තුන්වන අතුරු ප්‍රශ්නයත් ඊට අදාළව අහන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අවශ්‍ය ගුරු පුහුණුව ප්‍රාදේශීය වශයෙන් ආරම්භ කර, වතු පාසල්වලට අවශ්‍ය ගුරුවරුන් පුහුණු කරමින් පවතිනවා. අලුතෙන් ගුරුවරුන් දහස් ගණනක් බඳවා ගෙන තිබෙනවා. මේ රජය එකවර තුන් දහසකට වඩා වතු පාසල් ගුරුවරුන් බඳවා ගෙන තිබෙනවා, මහින්ද චින්තනය යටතේ. එම නිසා මම ඔබතුමියට කියනවා ලියා ගෙන ඇවිත් මාල ගිරව් වාගේ දොඩවන්නේ නැතිව ප්‍රශ්නය අහන්න කියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ඇති. තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, ලියා ගෙන ඇවිත් නොවෙයි. එතුමා කියන උත්තරවලට කෙටි සටහන් හදා ගෙන මම කියවනවා. නියෝජ්‍ය අමාත්‍යතුමා දෙන පිළිතුර අනුව විස්තර ලියා ගෙන මට කියවන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙකයි. සාමාන්‍යයෙන් මේ රටේ දරුවන් සියයට 40ක් ගණිතය විෂය අසමත් වෙනවා. විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ඒ ප්‍රමාණය සියයට 50 ඉක්මවා ගිහින් තිබෙනවා. මහින්ද චින්තනයෙන් දුන් පොරොන්දු අනුව ගණිතය, විද්‍යාව සහ අනෙකුත් විෂයයන් වැඩිදියුණු කිරීමට උතුරු නැඟෙනහිර ප්‍රදේශවල සහ වතුකරයේ පාසල්වලට අලුතින් පුස්තකාල, විද්‍යාගාර ලබා දී තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ගැන ප්‍රශ්නයේ අසා තිබෙනවා ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි. පාසල් දහසේ ව්‍යාපෘතිය යටතේ මේ හැම පාසලකටම පුස්තකාල ලබා දෙන්න යෝජිතයි. විද්‍යාගාර, පුස්තකාල මේ සියල්ල -

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
දීලා නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
දෙන්න හදන්නේ. පොඩ්ඩක් ඉන්න. කොටන් පුච්චලා අළු ගන්න බැරි අය කෙස් පුච්චලා අළු ගන්නේ කොහොම ද? ළමා සොල්දාදුවෝ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊළඟ ප්‍රශ්නයට යමු.

## බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාව ප්‍රතිසංස්කරණය : පිරිවැය
## பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டப புனர்நிர்மாணம் : செலவினம்
## RENOVATION OF BMICH : COST

1553/'11

7. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාව ප්‍රතිසංස්කරණය සහ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කළ දිනය කවරේද;

(iii) ඇස්තමේන්තු කළ මුළු පිරිවැය සහ ව්‍යාපෘතියේ වැඩ අවසන් වන විට වැය වූ සැබෑ පිරිවැය කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ශ්‍රමය සඳහා දරන ලද පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සේවයේ යෙදුණු දේශීය හා විදේශීය ශ්‍රමික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදේශීය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට ගෙන්වන ලද රට හෝ සමාගම මගින් එම විදේශීය ශ්‍රමිකයින්ට ලබා දුන් තනතුරු නාමයන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතියෙහි ශ්‍රමිකයන් වෙනුවෙන් ගෙවන ලද සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත ගෙවූ දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத விவகாரங்களுக்கான அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டப புனர்நிர்மாணம் மற்றும் திருத்தக் கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட திகதியையும்;

(ii) மேற்படி கருத்திட்டம் நிறைவு செய்யப்பட்ட திகதியையும்;

(iii) உத்தேச மொத்த செலவினத்தையும் கருத்திட்டம் நிறைவடைந்த வேளை ஏற்பட்டிருந்த உண்மையான செலவினத்தையும்;

(iv) இக் கருத்திட்டத்திற்கான ஊழியச் செலவு யாதென்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டப புனர்நிர்மாணம் மற்றும் திருத்தக் கருத்திட்டத்தில் பணியாற்றிய வெளிநாட்டுப் பணியாட்கள் மற்றும் உள்நாட்டுப் பணியாட்களின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

(ii) வெளிநாட்டுப் பணியாளர்களுக்கு அவர்களை வரவழைத்த நாட்டினால் அல்லது கம்பனியினால் வழங்கப்பட்ட பதவிப் பெயர்களையும்;

(iii) மேற்படி கருத்திட்டப் பணியாட்கள் சார்பில் வழங்கிய ஊழியர் சேமலாப நிதியம் மற்றும் ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியம் ஆகியவற்றின் பெறுமதிகளையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) the date on which the project for reconstruction and repair of BMICH was commenced ;

(ii) the date on which the aforesaid project was completed;

(iii) the total cost estimated and the actual cost incurred at the time of the completion of the project; and

(iv) the labour cost component of the project?

(b) Will he state-

(i) the number of foreign workers and local workers employed in the BMICH reconstruction project separately;

(ii) the designations given to the foreign workers by the country or company by which they were brought to Sri Lanka; and

(iii) the values of the EPF and ETF paid on behalf of the workers of the aforesaid project?

(c ) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2010 මාර්තු මස 05 වන දින

(ii) මෙතෙක් අවසන් කර නැත.

2012.12.31 දිනට අවසන් කර දෙන ලෙස ඉල්ලා ඇත.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(iii) ඇස්තමේන්තු කළ මුළු මුදල චීන යුආන් මිලියන 94කි.

වැඩ අවසන් වී නොමැති බැවින් මුළු පිරිවැය මෙතෙක් නිශ්චය කර නැත.

(iv) චීන යුආන් මිලියන 15කි.

(ආ) (i) දේශීය - 80

විදේශීය - 120

(ii) 1. ඉංජිනේරු

2. කාර්මික සේවක

3. ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය

4. වෘත්තීය කාර්මික ඉංජිනේරු

5. වෘත්තීය කාර්මික

6. සාමාන්‍ය ශ්‍රමික

(iii) ඔව්.

සියලුම දේශීය ශ්‍රමිකයන් ලියාපදිංචි වූ දේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් සපයා ගනු ලබන බැවින් ඔවුන්ගේ සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල එම සැපයුම්කරුවන් විසින් ගෙවීම සිදු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි ගරු ඇමතිතුමනි. ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම අහන්නේ මේකයි. ජාතිකත්වය ගැන ලොකු කැක්කුමක් තිබෙන ආණ්ඩුවක් වශයෙන් කථා කරන ඔබතුමන්ලා රටේ විරැකියා ප්‍රශ්නය තිබෙන අවස්ථාවේදී මේ වාගේ සරල දෙයකටත් චීනයෙන් ශ්‍රමිකයන් 120ක් ගෙනෙන එකේ තේරුම මොකක්ද? ඊයේ කිව්වා, දුම්රිය දෙපාර්තමේන්තුවේ නවීකරණ කටයුතුවලට 1,900ක් පිටින් ගන්නවා කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාවක් තිබුණේ නැහැ. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු සමයේදී චීන මහජන ආණ්ඩුව සම්පූර්ණයෙන්ම පරිත්‍යාගයක් ලෙස බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාව ශ්‍රී ලංකාවට ලබා දුන්නා. ඒ වෙනුවෙන් මුළු ලංකාවම චීනයට කෘතවේදීත්වය පළ කළ යුතුයි. ඒ නිසා නොබැඳි ජාතීන්ගේ සම්මේලන වාරය ඇතුළුව අපේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ රාශියක් අඛණ්ඩව පැවැත්වීමට හැකි වූ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වේවා, එක්සත් ජාතික පක්ෂය වේවා, ඒ සැමටමත් මේ ශාලාවේ ප්‍රයෝජනය ලබා ගැනීමටද හැකි වී තිබෙනවා. මෙය යම් යම් සම්මතයන් අනුව සැලසුම් කරන ලද, ඉදි වුණු ගොඩනැඟිල්ලක්. ඒ ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා කටයුතු චීන රජයේ ආයතන සම්බන්ධ කර ගෙන සිදු වෙමින් පවතිනවා. මේ ගැන රවි කරුණානායක මැතිතුමාට අමුතු වේදනාවක් ඇති වී තිබීම ගැන මම පුදුම වෙන්නේ නැහැ. එතුමාගේ වේදනාව තමයි, චීන ඉංජිනේරුවන් විසින් නිර්මාණය කරන ලද ශ්‍රී ලංකාවේ සම්භාවනීය සම්මන්ත්‍රණශාලාව චීන ඉංජිනේරුවන් විසින් අලුත්වැඩියා කරන්නේ ඇයිද කියන එක. එතුමා ප්‍රශ්න ගැන තේරුම් ගන්නා ආකාරය තමයි මේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අපට තේරෙන්නේ නැහැ; ඇහෙන්නේ නැහැ; පෙනෙන්නේ නැහැ. ඉතින් මේ දන්නා විධියට කටයුතු කරන මේ ආණ්ඩුවේ ඔබතුමන්ලා හම්බන්තොට වරායට චීනයෙන් 1900 දෙනෙක් කැඳවා තිබෙනවා. [බාධා කිරීමක්] මගේ නේ ප්‍රශ්නය. ඔබතුමා ටිකක් අහගෙන ඉන්න. ඔබතුමන්ලාගේ නොදැනුවත්කම නිසා මේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා. ඔබතුමන්ලාගේ නොදැනුවත්කම නිසා නිකම් වාචාලකමට කැ ගහන එක නොවෙයි අවශ්‍ය වෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙන් හම්බන්තොටට යන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ ප්‍රශ්නය වන්නේ මේකයි ගරු කථානායකතුමනි. මෙතුමාගේ පිළිතුරෙන් කිව්වේ දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ දක්ෂතාව නිසා පරිත්‍යාගයක් වශයෙන් චීනයෙන් සල්ලි ලබා ගන්න පුළුවන් වුණාය කියායි. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමාට මේ සම්මන්ත්‍රණ ශාලාව වැඩිදියුණු කරන්න සල්ලි ලබා ගන්න බැරි වුණා. ඒ සඳහා ණයක් ලබා ගත්තා. ඒ ණය ලබා ගත්තායින් පසුව එහි වැඩ කටයුතු කරන්න අපේ ලාංකික ශ්‍රමිකයන් හොඳ නැහැ. ඒකයි මගේ ප්‍රශ්නය. ඉතින් නිකම් වැරැදි උත්තරයක් දීලා මේ පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා. ණයක් ගත්තාම ඒ ණය ගෙවීම සම්බන්ධයෙන් වැඩ කරන්න ඕනෑ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්නේ. මේ සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පාවිච්චි කරන්නේ නැත්තේ ඇයි කියන එකයි මම අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම දැන් කියෙව්ව සංඛ්‍යා ලේඛනය අනුව ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් 80ක් වැඩ කරනවා. [බාධා කිරීමක්] Please let me speak. ඊට අතිරේකව ගරු කථානායකතුමනි, මේ කටයුත්ත සඳහා ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතන රාශියකින් චීන සමාගම විවිධ බඩු බාහිරාදිය ගන්නවා. ඒවායේත් අපේ කම්කරුවන්, අපේ ශිල්පීන් වැඩ කරනවා. මන්ත්‍රීතුමා ඉතාම බොළඳ ආකාරයේ ප්‍රශ්න අහන්නේ. ඊර්ෂ්‍යාවට සහ වෛරයට සීමාවක් තිබෙන්න ඕනෑ. විපක්ෂ නායකතුමා නම් කවදාවත් මේ වාගේ ප්‍රශ්නයක් අහන්නේ නැහැ. මේ වාගේ දෙයකදී චීනයේ වටිනාකම එතුමා දන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. දැන් මන්ත්‍රීතුමාගේ 3වන අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එතුමා කථා කරන්න ඕනෑ අපේ පක්ෂයේ ප්‍රශ්න සම්බන්ධයෙන් නොවෙයි; තමන්ගේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබීම සම්බන්ධයෙනුයි. චීනයෙන් සියයට 8ක පොලියට ණය ගන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඔබතුමා අහන්නේ 3වන අතුරු ප්‍රශ්නයයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හම්බන්තොට වරායට චීනයෙන් ශ්‍රමිකයන් 1,900යි. Indian Railway එකේ කට්ටිය 1,900ක් ඉන්නවා. සියයට 8ක පොලියට ණය අරගෙන කරන මේ ව්‍යාපෘතියට යන වියදම ඇස්තමේන්තුවක් වශයෙන් හෝ කියන්න බැරි ආණ්ඩුවකින් අපි අහන්නේ,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වියදම කියනවාද කියලායි අහන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

(අ) (iii) යටතේ අහලා තිබෙන්නේ කොතරම් වියදමක් කළාද කියලායි. ඒකත් නිශ්චිත වශයෙන් කියන්න බැහැ කියනවා. මෙච්චර වියදම් කළාය කියලා කියන්න බැරි වෙන්නේ ඇයි?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඒකේ විස්තරාත්මක කරුණු අපට ඉදිරියේදී ලබා දෙන්න පුළුවන්. චීනය දෙවැනි සම්මන්ත්‍රණ ශාලාවත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නමින් ප්‍රධාන සම්මන්ත්‍රණශාලාවට යාබදව ගොඩ නැඟුවා. මෙය අමතක කරන්න එපා. මේ සියල්ල මේ රටට ලැබුණු ජයග්‍රහණයන්. රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාට නම් මතක ඇති, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ -මන්ත්‍රීතුමා ඒ කාලයේ කොයි පැත්තේ හිටියාද කියලා මා දන්නේ නැහැ- අලුත්කඩේ උසාවි සංකීර්ණය චීන සමූහාණ්ඩුව ලංකාවට ලබා දුන්නු බව. වෛරය, ඊර්ෂ්‍යාව පදනම් කරගෙන ප්‍රශ්න අහන්න. කමක් නැහැ. හැබැයි ඒවාට ඔබතුමා බලාපොරොත්තු වන පිළිතුරු නම් ලැබෙන්නේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ ප්‍රශ්නයට අදාළවයි මම අහන්නේ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අපි දෙන්නා තුන්දෙනා එකතු වෙලා කථා කරමු.

## "පනහඬුව" වැවේ පිටවාන ගිලා බැසීම : ප්‍රතිසංස්කරණය
`பனஹடுவ' குளத்தின் நீர் வெளியேறும் மடை: புனரமைப்பு
CAVING IN OF SPILL OF "PANAHANDUWA" TANK : RESTORATION

1635/'11

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, කිබොල්කැටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් පාලනය වන, "පනහඬුව" වැවේ පිටවාන ගිලා බැසීම හේතුවෙන් කුඹුරු අක්කර හැටක පමණ ප්‍රමාණයක් විනාශ වී යාමේ තර්ජනයකට ලක්ව ඇති බැවින් ප්‍රදේශයේ ගොවි ජනතාව ගැටලු රාශියකට මුහුණ පා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැවේ පිටවාන කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமநல சேவைகள், வன சீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) இரத்தினபுரி மாவட்டத்தின் திபொல்கெட்டிய கமநல சேவைகள் நிலையத்தினால் நிருவகிக்கப்படுகின்ற `பனஹடுவ' குளத்தின் நீர் வெளியேறும் மடை நிலத்தில் அமிழ்ந்துள்ளமையால் சுமார் அறுபது ஏக்கர் நெற்காணி அழிவுறும் அச்சுறுத்தலுக்கு உள்ளாகியுள்ளதால் பிரதேசத்தின் விவசாயிகள் பல சிரமங்களை எதிர்நோக்கியுள்ளனர் என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி குளத்தின் நீர் வெளியேறும் மடையை துரிதமாக புனரமைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agrarian Services and Wildlife:

(a) Is he aware that due to the caving in of the spill of the "Panahanduwa" Tank administered by the Kibolketiya Agrarian Service Centre of the Ratnapura District, the farmer community of the area has encountered a host of problems as an extent of 60 acres of paddy lands face the threat of ruination ?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(b) Will he inform this House-

(i) whether action will be taken to promptly restore the spill of the aforesaid tank; and

(ii) if so, the period of time to be taken for this purpose ?

(c) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට අදාළ පිළිතුර මෙසේයි.

(අ) පසු ගිය වසරේ පැවති අධික වර්ෂාව හේතුවෙන් "පනහඩුව" වැවෙහි වැව් බැම්ම හා පිටවාන කඩා ගෙන යාමක් සිදු වූ අතර, පිටවාන ගිලා බැසීමක් සිදු නොවීය.

(ආ) (i) ඔව්.

(ii) වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සිද්ධියත් එක්ක ගොවීන්ට සිදු වුණු පාඩුව කොපමණද කියලා අමාත්‍යාංශය ගණනය කිරීමක් කරලා තිබෙනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තමුන්නාන්සේගේ මුල් ප්‍රශ්නයෙන් ඒක අහලා නැහැ; ගොවීන්ට සිදු වී තිබෙන හානිය පිළිබඳව අහලා නැහැ. තමුන්නාන්සේ අහලා තිබෙන ප්‍රශ්නයට උත්තර සපයා තිබෙනවා. තමුන්නාන්සේ අහන මේ අතුරු ප්‍රශ්නය නැවත වෙනම ප්‍රශ්නයක් විධියට අහන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ ප්‍රශ්නයෙන් අහලා තිබෙනවා, ගොවීන් ගැටලු රාශියකට මුහුණ දීලා තිබෙන බව එතුමා දන්නවාද කියලා. මා අහන්නේ, මේ ගැටලු තුළින් ඒ අයට සිදු වී තිබෙන හානිය කොපමණද කියලා තක්සේරුවක් අමාත්‍යාංශයට නැද්ද කියලායි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තමුන්නාන්සේ ඒ ප්‍රශ්නය වෙනම ප්‍රශ්නයක් හැටියට නැවත අහන්න. දැනට අහලා තිබෙන ප්‍රශ්නයට උත්තර ලැබී තිබෙන්නේ මේ ආකාරයටයි. වැව ගැන විතරයි අහලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ වාගේ ප්‍රශ්න උපදේශක කාරක සභාවට ඉදිරිපත් කළා නම් හොඳයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමනි, මුල් ප්‍රශ්නයෙන් වැව ගැන, වැවේ පිට වාන ගැන විතරයි අහලා තිබෙන්නේ. ගොවීන් ගැන අහලා නැහැ. ගොවීන් සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් නැවත අහන්න. එතකොට මා උත්තර දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එතුමා කියන කාරණය සාධාරණයි ගරු කථානායකතුමනි. මොකද, එතුමා යටතේ තිබෙන්නේ කෘෂිකර්ම හා ගොවිජන සේවාවලින් කොටසයි නේ. එම නිසා භාගයට තමයි උත්තරයක් දෙන්න වෙන්නේ. [බාධා කිරීම්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගොවීන්ට හානියක් වෙලා නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මොකද නැත්තේ? අපි ළඟ තොරතුරු තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මෙතුමා අසත්‍ය ප්‍රකාශ කරන්නේ. දන්නවාද පනහඩුව තිබෙන්නේ කොහේද කියලා?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලබල වන්න එපා, ගමක නමක් කිව්වාම. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්නකෝ. අනම් මනම් කථා කරන්න ගියාම තමයි,- [බාධා කිරීම්] ඉක්මනට ප්‍රශ්නය අහන්න. කාලය ගත වනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අපි ලංකාවේ මොන දිස්ත්‍රික්කයකට අදාළව ප්‍රශ්න ඇහුවත් ඒ ප්‍රශ්නවලට අදාළ තොරතුරු, වාර්තා, ඡායාරූප සියල්ල අරගෙනයි ප්‍රශ්න අහන්නේ.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ වාගේ අවස්ථාවකදී ගොවීන්ට යම් කිසි සහනයක් දෙන්න, ඒ අයට වගා පාලු සඳහා ආධාරයක් දෙන්න අමාත්‍යාංශයට වැඩ පිළිවෙළක්, දැක්මක් තිබෙනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව තමුන්නාන්සේගේ ප්‍රශ්නයෙන් අහලා නැහැ. අපි පිළිතුරු සපයන්නේ අහලා තිබෙන ප්‍රශ්නයටයි. රටේ නැති, ලෝකයේ නැති ඒවා ඔක්කොම එකවර අහන්න ගියාම කොහොමද මම පිළිතුරු දෙන්න ලෑස්ති වෙලා එන්නේ? ගරු මන්ත්‍රීතුමා, ගොවීන් ගැන වෙනම අහන්න. ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමා මේ විස්තර දන්නවා. වැව කැඩුණා; අපි ගිහින් වැව හැදුවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකට කමක් නැහැ. මේවාට පිළිතුරු දෙන්නත් පොඩ්ඩක් ඉගෙන ගත්තොත් හොඳයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු කථානායකතුමනි, විස්තර ඇතුව උත්තර දෙන්න එපායැ. මේ උත්තරීතර සභාවේ ආවාට ගියාට උත්තර දෙන්න බැහැ. එතුමා හිටපු හැටියේ එක එක ප්‍රශ්න අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කන්න කීයක් වගාව අත හැරුණාද කියලා අහන්න. එතකොට ඒක දැන ගන්න පුළුවන් නේ. [බාධා කිරීම්]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මොකක්ද, ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, මම මේ ගරු මන්ත්‍රීතුමාට උදවුවක් හැටියට කිව්වේ. කන්න කීයක් අත් හැරුණාද කියලා ඇහුවොත්, එතකොට තක්සේරු කර ගත හැකියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කථානායකතුමාටත් උත්තරය දෙයි, "ඒක අදාළ නැහැ" කියලා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
වැව ගිය මාස් කන්නයේ කැඩුණා. දැන් අපි හදලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 -1871/'11- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10- 2093/'11-(1) ගරු සජිත් ප්‍රේමදාස මහතා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, according to Standing Order No. 31 (11), a question fully answered must not be asked again during the same session. I asked the same Question on 24th of May, 2012, Question No. 2181/'11 and the Hon. Minister gave me a comprehensive reply.

අලි ගැන නැවතත් ප්‍රශ්න කරනවා. ඒ පිළිබඳව උත්තර දීලා අවසානයි. ඇතින්නියන් ගැන අහනවා නම් කමක් නැහැ. අපි එදා ඇහුවා නේ. සිරිකොත වනයේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක ඇහුවේ 2001 දීද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නැහැ, ගරු කථානායකතුමනි පසු ගිය මාසයේ. මෙන්න, හැන්සාඩ් වාර්තාව; 208 වන කාණ්ඩයේ 7 වන කලාපය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා කියන එකේත් පොඩි ඇත්තක් තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පොඩි නොවෙයි ගරු කථානායකතුමනි, ලොකු ඇත්තක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මෙහෙන් වුණු අඩු පාඩුවක්. ඒ ගැන සොයන්න ඕනෑ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මම පොඩි ඒවා අහන්නේ නැහැ. ලොකු ඒවා අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඒ ගැන සොයා බලා කටයුතු කරන්නම්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එහෙම නම් දැන් උත්තර දෙනවාද? ගරු කථානායකතුමනි, next week අහන්න කියන්න. ඇතින්නියන් ගැන අහනවා නම් කමක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇතින්නිය ළඟට යන්න පුළුවන් පස්සේ. පොඩ්ඩක් අහගෙන ඉන්න. [බාධා කිරීමක්] දැන් රීති ප්‍රශ්නයක් මතු කළා. මේ පිළිබඳව - [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මටත් කථා කරන්න ඉඩ දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉස්සරවෙලා මම කියන දේ අහගෙන ඉන්න. තමුන්නාන්සේට ඊට පස්සේ කථා කරන්න ඉඩ දෙන්නම්. අස්වර මන්ත්‍රීතුමා point of Order එකක් නැඟුවා. මම බලන්න ඕනෑ එතුමා කියපු ආකාරයට මේ ප්‍රශ්නය මෑතකදී අහලා තිබෙනවාද කියලා. ඒකට මට එකපාරටම උත්තරයක් දෙන්න බැහැ. ඒ නිසා මම මේ ප්‍රශ්නය ලබන සතියට කල් දමනවා. [බාධා කිරීමක්] මම කිව්වාට පස්සේ මගේ තීරණය තමයි. මම බලන්න ඕනෑ, මීට පෙර අහපු ප්‍රශ්නයක් නැවත අහලා තිබෙන්නේ ඇයි කියලා. එහෙම ගැටලුවක් ඇති නොවුණොත් මේ ප්‍රශ්නය ලබන සතියේ අහන්න ඉඩ දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේක වැරදි පූර්වාදර්ශයක්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, you have given a Ruling.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මටත් කථා කරන්න අවස්ථාව දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම තමුන්නාන්සේව එළියට දානවා. කියන දේ අහගෙන ඉන්න. එක්කෙනෙකුට විතරක් නෙමෙයි මෙතැන අයිතියක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ මට කථා කරන්න අයිතියක් නැහැ කියන එකද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථා කරන්න අයිතිය දුන්නා. දැන් ඒක ඉවරයි.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය : පොලිස් ළමා කාර්යාංශය
## தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை: பாலிஸ் சிறுவர் பணியகம்
## NATIONAL CHILD PROTECTION AUTHORITY: POLICE CHILDREN'S BUREAU

2113/'11

11. **ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ශ්‍රී ලංකාවේ සිටින වීදි දරුවන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව,

(i) සියලු දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සම්පූර්ණයෙන්ම සහතික කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අනුබද්ධිත පොලිස් ළමා කාර්යාංශයක් පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එය පිහිටුවා ඇති දිස්ත්‍රික්කය කුමක්ද;

(iii) දරුවන්ට පමණක් වෙන්වූ අධිකරණ පද්ධතියක් මේ වන විට ආරම්භ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව වයස අවුරුදු පහ දක්වා දරුවන්ට කිරි මිලදී ගැනීම සඳහා ලබා දෙන රුපියල් 200ක මාසික දීමනාව වෙනුවට වර්තමානයේ රුපියල් 60ක දීමනාවක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දීමනාව ලබා දීම ආරම්භ කළ වර්ෂය කුමක්ද;

(iii) එමඟින් ප්‍රතිලාභ ලබන ළමුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ දක්වා ඇති පරිදි පෝෂණ මල්ලට අමතරව සමෘද්ධිලාභී මව්වරුන් දරුවකු බිහි කිරීමේදී දරුවාට අවශ්‍ය දෑ අඩංගු තිළිණ පාර්සලයක් ලබා දෙන්නේද;

(ii) එම තිළිණ පාර්සලය හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கையிலுள்ள வீதிச் சிறார்களின் எண்ணிக்கை யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) மஹிந்த சிந்தனை தொலைநோக்கின் பிரகாரம்,

(i) அனைத்து சிறுவர்களினதும் பாதுகாப்பையும் பேணலையும் உறுதிப்படுத்துவதற்காக தேசிய சிறுவர் பாதுகாப்பு அதிகார சபையுடன் இணைந்ததாக பொலிஸ் சிறுவர் பணியகமொன்று தாபிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அது தாபிக்கப்பட்டுள்ள மாவட்டம் யாதென்பதையும்;

(iii) சிறுவர்களுக்கு மாத்திரம் ஒதுக்கப்பட்ட நீதிமன்றக் கட்டமைப்பொன்று தற்போது ஆரம்பிக்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மஹிந்த சிந்தனை தொலைநோக்கின் பிரகாரம் ஐந்து வயது வரையான சிறுவர்களுக்கான பால் கொள்வனவு செய்வதற்காக மாதாந்தம் வழங்கப்படும் ரூபா 200/= க்குப் பதிலாக தற்போது ரூபா 60/= கொடுப்பனவொன்று வழங்கப்படுகிறதா என்பதையும்;

(ii) அவ்வாறாயின், குறித்த கொடுப்பனவை வழங்குவதற்கு ஆரம்பித்த ஆண்டு யாதென் பதையும்;

(iii) இதன் மூலம் பயன்பெறுகின்ற சிறுவர்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) (i) மஹிந்த சிந்தனை தொலைநோக்கில் குறிப்பிடப்பட்டுள்ளதன் பிரகாரம் போசணைப் பொதிக்கு மேலதிகமாக சமுர்த்தி பெறும் தாய்மார்கள் குழந்தையொன்றைப் பெற்றெடுக் கும்போது குழந்தைக்குத் தேவையான பொருட்களடங்கிய பரிசுப் பொதியொன்று வழங்கப்படுகின்றதா என்பதையும்;

(ii) மேற்படி பரிசுப்பொதி கிடைக்கப்பெற்றுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs:

(a) Will he state the number of street-children in Sri Lanka?

(b) Will he state-

(i) whether a Police Children's Bureau affiliated to the National Child Protection Authority has been established to fully ensure the protection and the care of all children as per the "Mahinda Chintana - Vision for the Future";

(ii) if so, the district in which it is located; and

(iii) whether a court system exclusively for children has been established by now?

(c) Will he inform this House-

(i) whether an allowance of Rs. 60/- is being paid currently instead of the monthly allowance of Rs. 200/- paid for purchasing milk for children up to five years of age in line with the "Mahinda Chintana -Vision for the Future ;

(ii) if so, the year in which the payment of the aforesaid allowance commenced ; and

(iii) the number of children benefitted from it?

(d) Will he inform this House-

(i) whether a gift parcel containing what is required for the child is provided in addition to the nutritious food basket set out in the "Mahinda Chintana" when babies are delivered by mothers receiving Samurdhi benefits; and

(ii) the number of families who received that benefit?

(e) If not, why?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) වීදි දරුවන් සංඛ්‍යාව නිශ්චිතව දැක්විය නොහැකිය. මෙම සංඛ්‍යාව දහවල, රාත්‍රිය වශයෙන් වෙනස් වේ. 2008 වසරේදී වීදි දරුවන් වැඩි වශයෙන් සිටිතැයි සැලකෙන දිස්ත්‍රික්ක 04ක කළ සමීක්ෂණයක් අනුව පහත තොරතුරු අනාවරණය වී ඇත.

- ➢ අනුරාධපුර - ළමුන් 72
- ➢ මහනුවර - ළමුන් 93
- ➢ කොළඹ - ළමුන් 91
- ➢ හම්බන්තොට - ළමුන් 25

(ආ) (i) නැත. එහෙත්, අධිකාරියේ පොලිස් ළමා කාර්යාංශයක් පිහිටුවන ලෙස ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පොලිස්පතිතුමාගෙන් ඉල්ලීමක් කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) විශේෂ අධිකරණ පද්ධතියක් පිහිටුවා නොමැත. එහෙත්, කොළඹ දිස්ත්‍රික්කයේ අධිකරණ කලාප කිහිපයක් ආවරණය වන පරිදි ළමා මහේස්ත්‍රාත් අධිකරණයක් බත්තරමුල්ලේත්, වර්තමානයේදී අලුතින් යාපනයේත් පිහිටුවා ඇත.

(ඇ) (i) නැත.

පෙර පාසල් / මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන් වෙනුවෙන් නැවුම් කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරේ.

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

(ii) දීමනාවක් ලබා නොදේ. එහෙත්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ට නැවුම් කිරි වීදුරුවක් ලබා දීම කරන අතර, එය ආරම්භ කළේ 2009 දී ය.

(iii) 2011 වර්ෂයේ දී පෙර පාසල්/මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන් වෙනුවෙන් නැවුම් කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන යටතේ දරුවන් 212,623කට ප්‍රතිලාභ හිමි වී ඇත.

(ඇ) (i) මෙම අමාත්‍යාංශය මඟින් එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක නොවේ.

(ii) අදාළ නොවේ.

(ඉ) අදාළ නොවේ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. වීදි දරුවන් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා දිස්ත්‍රික්ක වශයෙනුත් සඳහන් කළා. ශ්‍රී ලංකාවේ වීදි දරුවන් පුනරුත්ථාපනය කිරීම උදෙසා විධිමත් වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවාද? සහශ්‍ර සංවර්ධන ක්‍රියාවලිය තුළින් 2015 වෙන කොට සියලුම දරුවන් පාසල් වෙත යවා අවුරුදු 16 වන තෙක් අධ්‍යාපනය ලබා දෙනවා කියන එක මහින්ද චින්තනයේ වාගේම සහශ්‍ර සංවර්ධන ඉලක්කවලින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට අපි දීපු පොරොන්දුවක්. ඒ අනුව මේ වීදි දරුවන් වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

අපි 2015ට වැඩසටහන් ඉලක්කගත කර තිබෙන්න පුළුවන්. නමුත් මේ වෙන කොට ඒ ඉලක්කය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනවාද කියලා මට පිළිතුරක් සපයන්න බැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු ඇමතිතුමා, ඉලක්කගත කර ඇතියි කියා ඔබතුමා නිශ්චිතව කියනවාද? නැතිනම් අවිනිශ්චිතවද කියන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. පොලිස් මාධ්‍ය ප්‍රකාශක පොලිස් අධිකාරී අජිත් රෝහණ මැතිතුමා කියලා තිබෙනවා මේ රටේ ස්ත්‍රී දූෂණවලින් සියයට අනූවක් අවුරුදු 16ට අඩු දරුවන්-

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ඒක මේ ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

අදාළ වෙනවා නේ. මම වීදි දරුවෝ ගැන අහලා තිබෙනවා නේ.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

මේක දරුවන් සම්බන්ධයෙන් අහලා තිබෙන ප්‍රශ්නයක්.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

මම අහන්නේ දරුවන් සම්බන්ධයෙන් තමයි. විශේෂයෙන්ම අවුරුදු 16ට අඩු දරුවන්ට අධිකරණයේ නඩුවක් දිගින් දිගටම තිබීමෙන්, ඒ දරුවන්ගේ පෞද්ගලිකත්වයට, මානසිකත්වයට ලොකු බලපෑමක් ඇති වෙනවා. විශේෂයෙන්ම ළමා අධිකරණයක් සම්බන්ධයෙන්, ළමා පොලිස් කාර්යාංශයක් සම්බන්ධයෙන් මහින්ද චින්තනයෙන් පොරොන්දු දීලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්නේ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යවරයා හැටියට ඔබතුමාගේ අමාත්‍යාංශය විසින් අධිකරණයේ පවතින මේ නඩු ඉක්මන් කරවීමටත්, ඒ දරුවන්ට යම්කිසි සහනයක් ලබා දීමටත්, ඒ දරුවන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමටත්, මානසිකත්වය ආරක්ෂා කිරීමටත් යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවාද කියන එකයි.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

දැනට බත්තරමුල්ල උසාවියෙන් ඒ වැඩ කටයුත්ත කර ගෙන යනවා. මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාට දැනුම් දීමක් කර තිබෙන බවට මම කලින් ඔබතුමියට පැහැදිලි පිළිතුරක් ලබා දුන්නා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. දෙමවුපියන් බාල වයස්කාර දරුවන් අතහැර දමා යාම සම්බන්ධයෙන් බලන විට 2011 වසරේ පමණක් සිද්ධීන් 206ක් වාර්තා වෙලා තිබෙනවා. 2012 වසරේ ජනවාරි මාසයේ පමණක් දරුවන් වීදිවල අතහැර දමා යාම් 26ක් වාර්තා වෙලා තිබෙනවා. 2011 වසරේ 206ක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මොකක්ද ප්‍රශ්නය?

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

මගේ ප්‍රශ්නය මේකයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මේ දරුවන් වෙනුවෙන් යම්කිසි ක්‍රියාදාමයක් අර ගෙන තිබෙනවාද?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
වීදිවල අතරමන් කර දමන දරුවන් අපි භාර අර ගෙන ළමා නිවාසවලට භාර දීමක් දැනට කර ගෙන යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 - 1554/'11 - (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා. චීන කොම්පැනියක් ගැන කැක්කුමක් තිබුණාය කියලා කිව්වා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ විහාරමහා දේවී උද්‍යානය ගැන. චීනය ගැන නොවෙයි. මේක වෙනස්. තැන් දෙකක්. විහාරමහා දේවී උද්‍යානය කියලා තමයි පටන් ගන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
චීන සංස්කෘතික මධ්‍යස්ථානය-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ ප්‍රශ්නය අහන්නේ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේ කාලය ගැන. ඉතින් අපි මේ ගැන සොයා බලා හොඳ පිළිතුරක් ලබා දීමට කටයුතු කරනවා. [බාධා කිරීම්] නැහැ, වෙලාව දෙන්න කෝ. එතුමාටත් ගෞරවයක් ඇති පිළිතුරක් දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ නිසා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා වාගේ අපි හදපුවට නම් දමන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක හොඳයි නම් දමන්නේ නැති එක. එතුමා කවදාවත් නම දමන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක ඉගෙන ගන්න ඕනෑ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13 - 1636/'11 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නිරුවත් වෙරළ තීර ඇති කිරීම : හේතු
நிர்வாணமாக நடமாடக்கூடிய கடற்கரைகள் : காரணங்கள்
SETTING UP OF NUDE BEACHES : REASONS

1902/'11

14. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ නිරුවත් වෙරළ තීර ඇති කිරීමට කටයුතු සූදානම් කර තිබේද;

(ii) නිරුවත් වෙරළ තීර ඇති කරන්නේ නම්, ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත වෙරළ තීරයන් කවරේද;

(iii) නිරුවත් වෙරළ තීර ඇති කිරීමට හේතු කවරේද;

(iv) එම වෙරළ තීරයන් ඇති කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நிர்வாணமாக நடமாடக்கூடிய கடற்கரைகளை ஏற்படுத்துவதற்கு திட்டமிடப்பட்டுள்ளதா;

(ii) நிர்வாணமாக நடமாடக்கூடிய கடற்கரைகள் ஏற்படுத்தப்படுமாயின் அதற்கென ஒதுக்குவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள கடற்கரைகள் யாவை;

(iii) நிர்வாணமாக நடமாடக்கூடிய கடற்கரைகளை ஏற்படுத்துவதற்கான காரணங்கள் யாவை;

(iv) மேற்படி கடற்கரைகளை ஏற்படுத்துவதன்மூலம் எதிர்பார்க்கப்படுகின்ற நன்மைகள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minister of Economic Development:

(a) Will he inform this House-

(i) whether arrangements have been made to set up nude beaches in Sri Lanka;

(ii) if such nude beaches are set up, the names of beaches expected to be allocated for that purpose ;

(iii) the reasons for setting up of nude beaches; and

(iv) the benefits expected through the setting up of such beaches?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) එසේ සූදානමක් හෝ අදහසක්වත් කිසිසේත්ම නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඇහුවේ ඇයි කියලා මට තේරෙන්නේ නැහැ. ලංකාවේ කිසිම තැනක නිරුවත් සංචාරක වෙරළක් ඇති කිරීමට හෝ කිසිම තැනක නිරුවතින් ක්‍රියා කිරීමට ඉඩ දීමට මේ රජය යටතේ කටයුතු කරන්නේ නැහැ. එහෙම අදහසක් ඇත්තේත් නැහැ. එහෙම සාකච්ඡාවක් කරලාත් නැහැ. ඒ ගැන හීනෙකින්වත් හිතලාත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තරයේ මුකුත් නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තරයක් දුන්නා නම් එපායැ අතුරු ප්‍රශ්න අහන්න. ඔබතුමා අහන්න ප්‍රශ්නය. අදාළද නැද්ද කියලා මම තීරණය කරන්නම්. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ පොඩ්ඩක් වාඩි වෙලා ඉන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, මේ වැදගත් දෙයක් අහන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නටන්න එපා.

ගරු කථානායකතුමනි, කළුතර කැලිඩෝ වෙරළ තීරය ගැන මම කියන්න කැමැතියි. ඔබතුමන්ලා මේ සම්බන්ධව සාකච්ඡා පවත්වලා තිබෙනවා. කළුතර නගර සභාවේ Superintendent සී.එච්. මුණසිංහ මහත්තයාගේ රස්සාව නැති කරන්න එපා. Company එකේ නම මම කියන්නේ නැහැ. මේ ගොල්ලන් plan එකක් භාර දීලා තිබෙනවා.

ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියා මාර්ග සඳහා අවශ්‍ය කටයුතු ටික ලෑස්ති කර ගෙන යනවා කියලා දැන ගන්නට තිබෙනවා. මම ඔබතුමාට තවත් විස්තර කියන්නම්. "Wasantha de Silva who is in charge of Calido Beach Project..." මේ project එක භාරව දැන් කෙනෙක් පත් කරලා ඉන්නවා. මම දන්නේ නැහැ ඔබතුමා දැනුවත්වද, නොදැනුවත්වද කියලා. එතුමාත් බොහොම පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, "ඉතිරි කාරණා සම්බන්ධයෙන් එතුමාට කියන්න බැහැ" කියලා. ගරු කථානායකතුමනි, ඒ නිසායි මම කිව්වේ. මම දන්නේ නැහැ එතුමා නොදන්නවාද කියලා. නමුත් මේ Calido Beach එක සම්බන්ධව Project Director කෙනෙක් පත් කරලා තිබෙනවා. වෙනම project එකක් අර ගෙන යනවා. ඒකේ තමයි මේ කාරණා ටික ඔක්කොම සඳහන් වෙන්නේ. ඒ සියලු තොරතුරුත් එක්කයි මම මේ කථා කරන්නේ. ඒකයි මම ඔබතුමාගෙන් පොඩි වෙලාවක් දෙන්න කියා ගෞරවයෙන් ඉල්ලුවේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, ඕනෑම සමාගමකට, ඕනෑම දෙයක් ගැන හිතන්න පුළුවන්; සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් තීන්දු ගන්නේ රජය. රජය එහෙම තීන්දුවක් ගන්නෙත් නැහැ, ඒවාට ඉඩ දෙන්නෙත් නැහැ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර පැහැදිලියි. [බාධා කිරීමක්] තමුන්නාන්සේ ඔය කියවන පත්‍රිකාව මොකක්ද, දිනය මොකක්ද? යමක් කියවන්න ඕනෑ පෙන්වලා, අවසරයක් අරගෙනයි. නිකම්ම ගෙනැල්ලා කියවන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ සම්පූර්ණ විස්තර මේ ලේඛනවල සඳහන් වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් ඒවා ඉදිරිපත් කරන්න. ඔය වාගේ කරුණු ඉදිරිපත් කරනවා නම් ඉස්සෙල්ලා අවසරයක් ගන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, නිරුවත් වෙරළ තීර සම්බන්ධයෙන් මා ළඟ තිබෙන ලේඛන සියල්ල මා **සභාගත*** කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හොඳයි. මට බලන්න පුළුවන්. [බාධා කිරීමක්] දැන් පැහැදිලිව කිව්වා, එහෙම එකක් නැහැ කියලා. ඊට වඩා මොකක්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කිසිම දවසක ඉඩ දෙන්නෙත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊට අදාළව මොනවා හෝ තිබෙනවා නම් සාක්ෂිත් එක්ක ඇවිල්ලා ඒ ගැන වෙනත් දවසක කථා කරමු. සාකච්ඡා කළාය කිව්වාට එතුමා නැහැයි කියනවා. [බාධා කිරීමක්] ඔය ගැන පරීක්ෂණයක් පවත්වන්න. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමා, එතුමා ඔබතුමාගේ යාළුවෙක්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමා කියන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, අන්තිම අවස්ථාව.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මහින්ද චින්තනය යටතේ නොකියපු ඒවා කොච්චර කරලා තිබෙනවාද? මේකත් කරන්න තමයි හදන්නේ. ඒකයි මම කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම කරලා තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මහින්ද චින්තනය යටතේ කියපු නැති දේවලුත් කරනවා. ඒ, මහ ජනතාවට හොඳ දේවල්. මහ ජනතාවට ගැළපෙන දේවල් කරනවා, කිව්වේ නැති වුණත්. [බාධා කිරීමක්] මහින්ද චින්තනයේ නැති දේවල් කරනවා, මහ ජනතාවට ගැළපෙනවා නම්. [බාධා කිරීමක්]

## 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල : ප්‍රතිපාදන

### 2018 பொதுநலவாய நாடுகளின் விளையாட்டுப் போட்டி : நிதி ஏற்பாடுகள்

### COMMONWEALTH GAMES 2018 : FINANCIAL PROVISION

2094/'11

15. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම උදෙසා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම එක් එක් ක්‍රියාමාර්ගය සඳහා වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිපාදනයන් ලබා ගත් ආකාරයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018 பொதுநலவாய நாடுகளின் விளையாட்டுப் போட்டியை இலங்கைக்குப் பெற்றுக்கொள்வதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு நடவடிக்கை தொடர்பாகவும் செலவிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(iii) மேற்படி நிதி ஏற்பாடுகள் எத்தகைய முறையில் பெறப்பட்டன என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன் ?

asked the Minister of Sports:

(a) Will he state-

(i) the measures taken by Sri Lanka to get the opportunity to host the Commonwealth Games - 2018 in Sri Lanka ;

(ii) separately, the amounts of money spent on each of the aforesaid measures ; and

(iii) the ways in which the aforesaid provisions were obtained?

(b) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ගරු කථානායකතුමනි, පිළිතුර මෙසේයි:

ගරු මන්ත්‍රීතුමාගේ (අ) (i) වෙනි ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් තිබෙනවා.

(අ) (i)

i. 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල හම්බන්තොට නගරයේ පැවැත්වීමට සහ එහි සත්කාරකත්වය සැපයීමට ශ්‍රී ලංකාව මූලික වශයෙන් කැමැත්ත පළ කරන ලදී.

ii. අතිගරු ජනාධිපතිතුමන් විසින් 2010 ඔක්තෝබර් මාසයේදී ඉහත ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම වෙනුවෙන් ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ඉහළ මට්ටමේ සංවිධායක කමිටුවක් පත් කරන ලදී.

සම සභාපතිත්වය-

* ක්‍රීඩා කටයුතු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා
* ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා

විශේෂ උපදේශකවරුන්

* ගරු නාමල් රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී, හම්බන්තොට දිස්ත්‍රික්කය
* ගරු ඩිලාන් පෙරේරා මහතා, විදේශ සේවා අමාත්‍ය

iii. පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සංගමය වෙත භාර දිය යුතු වන ලංසු පොත සකස් කිරීම මැයි මස වන විට කළ යුතු ප්‍රමුඛතම කාර්යය විය. ඒ අනුව ලංසුව සැකසීම හා ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉහත කමිටුවේ පළමු රැස්වීම් දින වූ 2010 නොවැම්බර් මස 02 වන දින සිටම ආරම්භ විය.

iv. ඉහත කටයුතු පූර්ණ කාලීනව සිදු කර ගෙන යෑම සඳහා සී/ස සී.ඩබ්ලිව්.ජී. හම්බන්තොට 2018 පුද්ගලික සමාගම 2010 නොවැම්බර් මස මුල් සතිය තුළදී පිහිටවනු ලැබූ අතර, එහි ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් නලින් ආටිගල මහතා පත් කරන ලදී.

v. ඉහත කාර්යයන් සඳහා උපදේශකත්වය ලබා ගැනීම වෙනුවෙන් ඒ සඳහා කැමැත්ත දක්වන සමාගම්වලින් අයදුම්පත් කැඳවීම, 2010 නොවැම්බර් මස 14 සිට 21 යන දිනයන්වලදී සිදු කරන ලදී.

vi. එම අයදුම් පත් අතරින් පීඑම්පී ලෙගසි සමාගම ජාත්‍යන්තර උපදේශක ලෙස තෝරා ගන්නා ලදී.

vii. 2011 ජනවාරි මාසයේදී, අරලියගහ මන්දිරයේ පැවති විචිත්‍රවත් උත්සවයකදී 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා හම්බන්තොට නගරයේ ලාංඡනය ඉදිරිපත් කරන ලදී.

viii. 2011 මාර්තු ස 19 වන දින ගෘහ නිර්මාණ ශිල්පීන් වන ඩිසයින් ටීම් 3 (Design Team 3) විසින් සකස් කරන ලද හම්බන්තොට ක්‍රීඩා නගරය සඳහා වූ ආකෘතිය ප්‍රකාශයට පත් කෙරිණි.

ix. 2011 ජනවාරි සිට මැයි දක්වා පහත දැක්වෙන තේමාවන් 15 යටතේ ලංසු පොත සකස් කරන ලදී.

* තේමා 1 - ක්‍රීඩා දැක්ම සහ සංකල්ප
* තේමා 2 - දේශපාලනික සහ ආර්ථික පරිසරය සහ ව්‍යුහය
* තේමා 3 - නෛතික තත්ත්වය
* තේමා 4 - රේගු සහ ආගමන විධිවිධාන
* තේමා 5 - පරිසරය, රූමය/ තිරසාරකත්වය සහ කාලගුණය
* තේමා 6 - මූල්‍යය
* තේමා 7 - අළෙවිකරණය සහ සන්නිවේදනය
* තේමා 8 - ක්‍රීඩා සහ ක්‍රීඩා පවත්වන ස්ථාන
* තේමා 9 - පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා ගම්මානය
* තේමා 10 - වෛද්‍ය සේවාවන්
* තේමා 11 - ආරක්ෂාව
* තේමා 12 - නවාතැන් පහසුකම්
* තේමා 13 - ප්‍රවාහනය
* තේමා 14 - තාක්ෂණය
* තේමා 15 - මාධ්‍ය කටයුතු

x. 2011 මැයි 11 දින ක්වාලාලම්පූර්වලදී පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සංගමය වෙත අනර්ඝ ලංසු පොතක් හම්බන්තොට නගරය නියෝජිතත්වයෙන් ඉදිරිපත් කරන ලදි.

xi. 2011 මැයි මස තුළදී, ප්‍රධාන ක්‍රීඩා පරිපාලනයට අමතරව රජයේ සහ පෞද්ගලික අංශයේ විශිෂ්ට නායකයින් පස් දෙනෙක් ලංසු ප්‍රවර්ධනය සඳහා පත් කරන ලදී.

xii 2011 වසරේ ජුලි මස සිට ඔක්තෝබර් මස දක්වා මූලික කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සංගම්වල දූත පිරිස් ශ්‍රී ලංකාවට පැමිණියහ.

xiii. 2011 ජුලි මස සිට ඔක්තෝබර් මස දක්වා ලංසුව සම්බන්ධයෙන් තවදුරටත් දැනුවත් කිරීම සඳහා දූත මෙහෙයුම් ගණනාවකට සහභාගි විය.

* ක්‍රීඩා පිළිබඳ ජාත්‍යන්තර සංසදය -ලන්ඩන් - 2011 අප්‍රේල්
* පැසිෆික් ක්‍රීඩා, නිව් කැලිඩෝනියා - අගෝස්තු /සැප්තැම්බර්
* ලෝක ක්‍රීඩා ශූරතාවය, ඩේගු, කොරියා - අගෝස්තු /සැප්තැම්බර්
* සමස්ත අප්‍රිකා ක්‍රීඩා, මොසැම්බික්- සැප්තැම්බර් 2011
* පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සංසදය තරුණ ක්‍රීඩා, අයිල් ඔෆ් මෑන් - සැප්තැම්බර් 2011
* පෑන්-ඇම් ක්‍රීඩා - මැක්සිකෝව - ඔක්තොබර් 2011
* රග්බි වර්ල්ඩ් කප්, නවසීලන්තය - ඔක්තෝබර් 2011

2011 නොවැම්බර් මස 11 දින ශාන්ත කිට්ස් හි පැවති අවසාන ඡන්ද විමසීම් සඳහා ශ්‍රී ලංකාව සාධාරණ ශුභවිධිත්වයකින් යුතුව මුහුණ දෙන ලදී. නමුත්, ගෝල්ඩ් කෝස්ට් නගරය ඉදිරිපත් කළ ශක්තිමත් ලංසුව හමුවේ, හම්බන්තොට වෙනුවෙන් ඉදිරිපත් කළ ලංසුවට දුෂ්කරතා කිහිපයක් සමඟ කටයුතු කිරීමට සිදු විය. ඒ අනුව ගෝල්ඩ් කෝස්ට් ජයග්‍රහණය කළද, සමස්තයක් වශයෙන් හම්බන්තොට ලංසුව හරහා විවිධ අයුරින් ධනාත්මක ප්‍රතිඵල ළඟා කර ගැනීමට හැකි විය.

(ii) අදාළ ගිණුම් විගණනය කළ පසු පමණක් දැනුම් දිය හැකිය.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මුදල් ප්‍රමාණයන් ගැන අහලා තිබෙනවා. අපට තවම විස්තර එවලා නැහැ. විගණනය කෙරෙමින් තිබෙනවා. ඒ නිසා සම්පූර්ණ විස්තර මේ වෙලාවේදී දෙන්න බැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමා, රජය මේ සඳහා වෙන් කළේ රුපියල් මිලියන 100යි. මේ රුපියල් මිලියන 100න් රුපියල් මිලියන 39ක් හම්බන්තොට beach ball ක්‍රීඩා උළෙල සඳහා අපි වෙන් කළා. ඒ අනුව රුපියල් මිලියන 61කිනුයි රජයෙන් මේ සඳහා දායකත්වය දරලා තිබෙන්නේ.

(iii) මුළු ආයෝජනයෙන් යම් ප්‍රතිශතයක් සඳහා රජයෙන් ද, ඉතිරිය සඳහා පෞද්ගලික අංශයෙන්ද ප්‍රතිපාදන සපයන ලදී.

පෞද්ගලික අංශයේ මැදිහත් වීම අංශ දෙකකින් සිදු විය.

භෞතිකව: බොහෝ පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන්, මෙම ව්‍යාපෘතියේ ආරම්භක දිනයේ සිට සෙන්ට් කිට්ස් හි ලංසු ක්‍රියාවලියෙහි ඡන්ද ලබා ගැනීමට ගන්නා ක්‍රියා මාර්ගය සහ අවසන් ඡන්ද ප්‍රකාශ කිරීම දක්වා ඍජු සහභාගීත්වය සපයමින් දායක විය.

එයට අමතර රටේ ඉහළ මට්ටමේ ක්‍රීඩකයින්, ගායකයින්, නර්තන ශිල්පීන්, කලාකරුවන්, මාධ්‍යකරුවන්, වෛද්‍ය කාර්ය මණ්ඩල, ක්‍රීඩා පරිපාලකයින්, පරිගණක විශේෂඥයින්, බැංකුකරුවන්, අපනයනකරුවන්, ආනයන කරුවන් ආදී බොහෝ දෙනා සහයෝගය ලබා දුන්හ.

මූල්‍යමය: ඍජු මූල්‍ය සහායන් හා ගෘහ නිර්මාණ සේවා, නවාතැන් පහසුකම්, ගමන් පහසුකම් යනාදිය සඳහා සහ පරිගණක, විදුලි සංදේශ යනාදී සේවා සැපයීමේදී ඒවා නොමිලයේ හෝ අඩු මිලට ඉටු කර දීමෙන්, පෞද්ගලික අංශය විසින් අනගි සහායක් ලබා දුනි.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහලා තිබෙනවා, ප්‍රතිපාදන ලබා ගත් ආකාරය ගැන . මම ඔබතුමාට කිව්වා, රජයෙන් ලබා ගත් මුදල. අනෙක් මුදල් සියල්ලම පුද්ගලික දාන පරිත්‍යාග. විගණනය අවසන් වූ වහාම මා ඒ විස්තර -කොහෙන් කොහෙන්ද මුදල් ලැබුණේ කියලා- උපදේශක කාරක සභාවේදී ලබා දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 ඇසීමට ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ඉඩ දෙනවා. ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ මැයි මාසයේ 24 වන දින ප්‍රශ්නය අහලා තිබෙන්නේ වෙනත් ආකාරයකින්. ඒ නිසා 10 වන ප්‍රශ්නය ඔබතුමාට අහන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් 10 වන ප්‍රශ්නය අහන්න තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් මට අතුරු ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙනවා. ඒකට අවසරය තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නයක්ද, ඇතුළේ ප්‍රශ්නයක්ද? [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇතුළේ ප්‍රශ්න ටික අපි විසඳා ගන්නම්. මට අහන්න තිබෙන්නේ අතුරු ප්‍රශ්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉක්මනට ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම මේ වාගේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා උළෙලක් අපේ රටට ලබා ගන්න කොට පක්ෂ පාට භේදයෙන් තොරව, එක කොටසකට පමණක් සීමා නොකොට සර්ව පාක්ෂික මෙහෙයුමක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. නමුත්, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල අපේ රටට ලබා ගැනීමේදී මේ සියලුම කොට්ඨාස, සම්පත් දායකයින් සියලු දෙනා සම්බන්ධ කරගෙන මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ නැහැ. කොටසක් පමණයි මේකට නායකත්වය ලබා දුන්නේ. උදාහරණයක් වශයෙන් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උදාහරණ නොවෙයි, ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක තමයි මා අහන්නේ. ඔබතුමන්ලා පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව, පාට -වර්ණ- භේදයෙන් තොරව ජාතික මෙහෙයුම් කමිටුවක් හදලා ඒ හරහා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරගාවලිය -ක්‍රීඩා උළෙල- අපේ රටට ලබා ගැනීමේ ක්‍රමවත්, සැලසුම් සහගත, ගුණාත්මක, හරාත්මක, ධනාත්මක ක්‍රියාදාමයක් දියත් කළේ නැත්තේ ඇයි?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මේකේ ඔය කියාපු සියලුම දේවල් තිබුණා. ගුණාත්මක, හරාත්මක -මේ සියල්ල- මේක ඇතුළේ තිබුණා. ඔබතුමා ඇහුවා, දේශපාලන භේදයෙන් තොරව මේ කටයුත්ත කළේ නැත්තේ ඇයි කියලා. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සියලු දෙනාටම නායකත්වය දෙන විපක්ෂ නායකතුමාගේ ආශීර්වාදය මේ තරගාවලිය සඳහා තිබුණා. වෙන මොකක්ද? මේ bid එක දැමීමේදී විපක්ෂ නායකතුමා එක්ක අපි සාකච්ඡා කළා. එතුමා අපට කැමැත්ත පළ කළා. ඉතින් ඊට වැඩිය අපට මේක ගැන කථා කරන්න විපක්ෂයක් නැහැ. අපි විපක්ෂය දැනුවත් කරලා මේ කටයුත්ත කරලා තිබෙනවා. ඉතින් ඒක ගැන ඔබතුමා දැනුවත් නොකෙරුවාට මට කරන්න දෙයක් නැහැ. ප්‍රධාන විපක්ෂය අපි දැනුවත් කරලා තිබෙනවා. ඔබතුමාටත් ඉතින් පක්ෂයෙන් දැනුවත් කරන දේවල් තිබෙනවානේ. ඕනෑ නැති දේවල් කියන්නේ නැහැනේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම ශාන්ත කිට්ස් දූපතේ මේ තීරණාත්මක අවස්ථාව එළැඹෙන මොහොතේ මේ අවස්ථාව දිනා ගන්නට සියයකට හෝ එකසිය හැටකට ආසන්න ප්‍රමාණයක දූත පිරිසක් ශ්‍රී ලංකාවෙන් ගිහිල්ලා තිබෙනවා කියලා අපට දැන ගන්න ලැබුණා. ඒ වුණාට ඕස්ට්‍රේලියාවේ ගෝල්ඩ් කෝස්ට් නගරය නියෝජනය කරමින් ඇවිල්ලා තිබෙන්නේ 20 දෙනකු පමණ වන නියෝජිත කණ්ඩායමක්. ඉතින් මම අහන්න කැමැතියි, මේ තරම් විශාල පිරිසක් රැගෙන ගිහිල්ලාත් ඇයි මේ අසාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට සිදු වුණේ කියලා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මේ තරගාවලියේ-[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනික් ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මේ තරගාවලියේ කිසිදු අසාර්ථක පිළිතුරක් ලැබිලා නැහැ. මම දන්නේ නැහැ, ඔබතුමාට මම හැම දාම කියනවා. පාර්ලිමේන්තුවේ කථා කළාට ඔබතුමාට මේක තේරෙන්නේ නැහැ, මොළේ නැහැ. මීටත් වැඩිය කියන්න මට තේරෙන්නේ නැහැ. මේ තරගාවලියේ ඡන්ද සංඛ්‍යාව 72යි. හැබැයි රටවල් 56යි තිබුණේ. ගරු මන්ත්‍රීතුමනි, අප ඡන්ද 27ක් ගත්තා. මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 50ක් අප ගත්තා. අප පැරදුණත් හම්බන්තොට කියන ගම්මානය මෙයට සුදුසුයි කියලා - අපේ ලංසුව හරි කියලා- ඒ රටවලින් සියයට 50ක් පිළිගත්තා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කවුද එක්ක ගෙන ගියේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොකටද? මම කියන එක අහන්න ගරු මන්ත්‍රීතුමනි. අප ලංසුව ඉදිරිපත් කරපු එකෙන් පරාදයි කියන එක පිළිගන්නවා. හැබැයි මෙවැනි ජාත්‍යන්තර තරගාවලියකට තරග කරලා එකට එක ඡන්ද අපි ගත්තා. පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මේලනය පිළිගත්තා මේ පවතින ක්‍රමවේදය වැරැදියි කියලා. මේකේ හැම දාම සුදු රටවල් ඡන්දය දිනන අවස්ථාවක් තිබෙන්නේ. මේකේ ආසියාවට දීලා තිබෙන්නේ දෙපාරයි. එංගලන්තයට තිබුණා ඡන්ද තුනක්. ඒ ගොල්ලෝ හදා ගෙන තිබෙනවා රටවල් 56ට අමතරව ඒ ගොල්ලන්ට ඕනෑ රටවලට ඡන්දය දෙන්න, අනික් රටවලට ඡන්දය දීලා.

අනික් කාරණය මේකයි. ගරු මන්ත්‍රීතුමනි, ගිය පිරිස ගැන ඔබතුමා කියනවා. අපේ රටේ සංස්කෘතියක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඇති, පිළිතුර.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සමාවෙන්න ගරු කථානායකතුමනි. මට තත්පරයක් දෙන්න.

ගරු මන්ත්‍රීතුමනි, අප ශ්‍රී ලංකාවේ සංස්කෘතික කණ්ඩායමක් අරගෙන ගියා. ඕස්ට්‍රේලියාවේ ලස්සන ගැනු ළමයෙක් වේදිකාවට ඇවිල්ලා සින්දු කියලා ගියා. අපේ සංස්කෘතික කණ්ඩායමක් ගියා. අපට කරන්න දෙයක් නැහැ. [බාධා කිරීම්] ඔව්, ඉතින් ඒක ප්‍රශ්නයක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන තමුන්නාන්සේ ඊර්ෂ්‍යා කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අනර්කලී ගෙනිච්චා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නම් අප අනර්කලී වික්කාම මොකද? [බාධා කිරීම්] තමුන්නාන්සේලාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හොඳයි. අපට අනර්කලී හොඳ නැහැ. දෙන්නාම දේශපාලන නියෝජිතයෝ නේ. [බාධා කිරීමක්] නැහැ, මා කියන්නේ මේකයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එක්සත් ජාතික පක්ෂයට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විකුණන්න පුළුවන්. ඇයි අපට බැරි?[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔය නම් සඳහන් කරන කොට වයස බලලා කථා කරන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, බැලුවාම වයස පෙනෙන්නේ නැහැ, ඒකයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙකයි. [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, ඔබතුමාට මොළේ තිබෙනවා. අපට මොළේ නැහැ. ඔබතුමාගේ ඇඟ පුරාම මොළේ තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න. හරි, ඉවරයි දැන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. තවම-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් වෙලාව පස් වරු දෙකයි. එහෙම ඉඩ දෙන්න බැහැ. මේ ගරු සභාව පාලනය කරන්නේ මමයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මටත් අයිතියක් තිබෙනවා එතුමා කියපු දෙයට පිළිතුරු දෙන්න. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක තුන්වැනි අතුරු ප්‍රශ්නය හැටියට අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම ගරු ඇමතිතුමා සඳහන් කළා, "pmplegacy" කියන ආයතනය ගැන. මේ "pmplegacy" කියන ආයතනයේ මුදල් දත්ත වාර්තා තුළ තිබෙනවා, සියයට 15ක කොමිස් මුදලක් ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලියේ සංවිධාන කමිටුවට ලබා දුන්නාය කියලා. ඒක සත්‍යයක්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහි කිසිම සත්‍යයක් නැහැ. ඔබතුමාට පුළුවන් නම් ඔප්පු කරන්න, එහෙම කොමිස් මුදලක් ගෙවලා තිබෙනවාය කියලා. ශත පහක් එහෙම ගෙවලා නැහැ. එහෙම දෙයක් තමුන්නාන්සේ ඔප්පු කළොත් ඒ පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වලා ඔවුන්ව අධිකරණයට ඉදිරිපත් කරන්න කටයුතු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වේලාව පස් වරු 2.00යි. කාලය ඉවරයි. නමුත් ප්‍රශ්න අංක 10, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට අහන්න පුළුවන්.

## වන අලි සංරක්ෂණය : වෙන් කළ මුදල
## காட்டு யானைகளைப் பேணிப் பாதுகாத்தல் : ஒதுக்கிய பணத்தொகை
## CONSERVATION OF WILD ELEPHANTS : MONEY ALLOCATED

2093/'11

**10. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වත්මන් වන අලි ගහණය කොපමණද;

(ii) වන අලි සංරක්ෂණය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iii) එම ක්‍රියා මාර්ග තුළින් ලබා ඇති ප්‍රතිඵල කවරේද;

(iv) වන අලි සංරක්ෂණය වෙනුවෙන් වර්ෂ 2005-2010 අතර කාලය තුළ වෙන් කර ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் தற்போதைய காட்டு யானைகளின் தொகை யாது;

(ii) காட்டு யானைகளைப் பேணிப்பாதுகாப்பதற் காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(iii) மேற்படி நடவடிக்கைகளின் மூலம் பெற்றுக் கொள்ளப்பட்ட பெறுபேறுகள் யாவை;

(iv) காட்டு யானைகளைப் பேணிப்பாதுகாப்பதற் காக 2005 தொடக்கம் 2010ஆம் ஆண்டு வரையிலான காலத்தில் ஒதுக்கப்பட்ட பணத்தொகை வருடாந்த அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

ask the Minister of Agrarian Services and Wildlife :

(a) Will he state-

(i) the wild elephant population in Sri Lanka at present ;

(ii) the courses of action that have been taken for the conservation of wild elephants ;

(iii) the results that have been achieved through the courses of action mentioned above ; and

(iv) separately, the amount of money that has been allocated for the conservation of wild elephants in each year during the period from the years 2005 up to 2010?

(b) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) 2011 අගෝස්තු සංගණන වාර්තා අනුව වන අලි 5,879ක් වාර්තා වී ඇත. මේ අනුව දිවයිනේ වන අලි 6,000ක් පමණ ජීවත් වන බවට අපේක්ෂා කරනු ලැබේ.

(ii)

- රක්ෂිත ප්‍රදේශ ජාලය පවත්වාගෙන යාම;
- ජාතික රක්ෂිත සහ අභය භූමි තුළ ජල අවශ්‍යතා සපුරාලීමට වැව් සහ ජල පද්ධති 36ක් පසු ගිය වසර 4 තුළ ඉදිකිරීම;
- සතුන්ගේ ආහාර සුලබ කිරීම සඳහා වාසස්ථාන හෙක්. 3550.23ක (තුන්දහස් පන්සිය පනහයි දශම දෙකයි තුනක) ආක්‍රමණික ශාක ඉවත් කර ආහාරයට ගන්නා ශාක සුලබ කිරීමට කටයුතු කර ඇත;
- වන අලි ගැවසෙන ප්‍රදේශවල මහජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පුවරු 474ක් ස්ථාපිත කිරීම - (2008 - 2011);
- ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම;
- අලි වෙඩි මිලදී ගෙන වන අලින්ගෙන් ආරක්ෂා වීම සඳහා ගොවි ජනතාව වෙත බෙදා දීම;
- විදුලි වැටවල් කි.මී. 1,642ක් ඉදිකිරීම - (1992 සිට);
- රක්ෂිත ප්‍රදේශවලින් බැහැරව පිහිටුවන අලි පාලන ඒකක සංඛ්‍යාව 14 දක්වා වැඩි කිරීම - (2009ට පෙර පිහිටුවා තිබූ සංඛ්‍යාව 2ක් පමණි.)
- අලින්ගෙන් සිදු වන හානි සඳහා වන්දි ගෙවීම;
- වන අලි සංරක්ෂණ මධ්‍යස්ථාන ඇති කිරීම;
- අලි සංගණන පැවැත්වීම මඟින් තොරතුරු යාවත්කාලීන කිරීම.

(iii) මේ වන විට මිනිස් මරණ හා අලි මරණ සංඛ්‍යාව පාලනය වී ඇති අතර දැනට ගනු ලබන ක්‍රියාමාර්ග මත ඉදිරියේදී මිනිස් මරණ හා අලි මරණ සංඛ්‍යාව අඩු වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

(iv)

| වර්ෂය | වන අලි සංරක්ෂණය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය මුදල (රුපියල් මිලියන) |
|---|---|
| 2005 | 3.4 |
| 2006 | 11.2 |
| 2007 | 15.2 |
| 2008 | 125.0 |
| 2009 | 300.0 |
| 2010 | 300.0 |

(ආ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්ත වශයෙන්ම මේ වන අලි සංරක්ෂණයට බලපාන බරපතළම ප්‍රශ්නය තමයි අලි මිනිස් ගැටුම. පසු ගිය කාල වකවානුව තුළ අලි මිනිස් ගැටුම අවම කරන්නට ගජ මිතුරු ව්‍යාපෘතිය හරහා කෝටි ගණනක් මුදල් වැය කළා . නමුත් පැහැදිලි ධනාත්මක ප්‍රතිඵලයක් අපට ලැබී නැහැ. එම නිසා මේ අලි මිනිස් ගැටුම අවම කරන්නට තිරසාර සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ කවදාද කියා ඔබතුමාගෙන් මම අහන්නට කැමතියි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
දැනට අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලි බහුල වශයෙන් ජීවත් වන ප්‍රදේශවල අලි සංරක්ෂණ මධ්‍යස්ථාන 4ක් ඉදි කරන්නට කටයුතු කර ගෙන යනවා. ඒ අනුව දකුණේ වෙහෙරගලත්, පොළොන්නරුව ප්‍රදේශයේ මාදුරුඔයත්, වයඹ පළාතේ ගල්ගමුවේත්, අනුරාධපුර ප්‍රදේශයේ හොරොව්පතානේත් සංරක්ෂණ මධ්‍යස්ථාන දැනට ඉදි කර ගෙන යනවා. අප දැනට හොරොව්පතාන සහ වෙහෙරගල ඒ කටයුතු ආරම්භ කරලාත් තිබෙනවා. සාමාන්‍යයෙන් ප්‍රචණ්ඩකාරී අලි සියයට 10ක් විතර තමයි ඉන්නේ. මද කිපිච්ච අලි බිහි වන්නේ එක්තරා කාලයකටයි. අලි සංරක්ෂණය කර අවුරුදු පහකින් පමණ ජාතික වන උද්‍යානවලට මුදා හරිනවා. ඒ වැඩ පිළිවෙළ අප කර ගෙන යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි ඔබතුමාම දන්නවා, වන අලි සංරක්ෂණයට වැදගත්ම ක්ෂේත්‍රය තමයි පශු වෛද්‍ය ක්ෂේත්‍රය. වන ජීවී දෙපාර්තමේන්තුවට පශු වෛද්‍යවරුන් 11 දෙනෙක් සිටිය යුතු කාලයක අද සිටින්නේ සිටින්නේ ක්ෂේත්‍රයේ 6 දෙනයි. ඒ වාගේම සම්පත් අඩුකම - හිඟකම- තිබෙනවා. යාන වාහන නැතිකම, ප්‍රවාහන පහසුකම් අඩුකම තිබෙනවා. විශේෂයෙන්ම ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ මානසිකත්වය ඉතාමත්ම පහළ මට්ටමකයි තිබෙන්නේ. කොළඹට කේන්ද්‍රගත වී තිබෙන වන ජීවී කාර්යාලයේ සම්පත් ක්ෂේත්‍රයට ලබා දී අලි මිනිස් ගැටුම අවම කරන්නට ඒ සම්පත් ටික බෙදා හරින්නේ කවදා ද කියා මා අහන්නට කැමතියි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
කලාප හැටියට 7යි තිබුණේ. කලාප 11 දක්වා දැන් අප වැඩි කර තිබෙනවා. ඒ වාගේම කාර්යාල 11 දක්වා වැඩි කරන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම අලි පාලන ඒකක 14 දක්වා වැඩි කර තිබෙනවා. ඒ නිලධාරින්ට අවශ්‍ය උසස් වීම් ආදී ඒ සියලු දේවල් මේ වන විට ලබා දීලායි තිබෙන්නේ. මා හිතන හැටියට ඒ අයගේ මානසික තත්ත්වයේ දුර්වලකමක් ගැන ඔබතුමාට මොන මට්ටමකින් කිව්වාද දන්නේ නැහැ. මා දන්නා තරමින් වන ජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ මානසික මට්ටම ඉතාම ඉහළ මට්ටමක තිබෙනවාය කියන එක මම කියන්නට කැමතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට මේ අදහස දෙන්නේ මේ ගැන සොයා බලන්නයි. විශේෂයෙන්ම මින්නේරිය ජාතික වනෝද්‍යානය ආශ්‍රිතවත්, කවුඩුල්ල ජාතික වනෝද්‍යානය ආශ්‍රිතවත් කුඩා අලි පැටවුන් ඉතාමත්ම කූට අන්දමින් කුමන්ත්‍රණකාරීව සොරකම් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වනවාය කියලා අපට ආරංචි ලැබිලා තිබෙනවා. සාක්ෂි තිබෙනවාය කියලා බොරුවට කියන්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ප්‍රශ්නයක් විධියට අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා මේ කරුණ පිළිබඳව විශේෂ විමර්ශනයක් කරලා යම් කිසි විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරනවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපේ වන ජීවී දෙපාර්තමේන්තුවේ වැටලීම් ඒකකයක් තිබෙනවා. ඒ අනුව එවැනි පැමිණිල්ලක් ලැබුණාම අපි ගිහිල්ලා ඒ අලි පැටවුන් සොරකම් කරන්න උත්සාහ කරන අය, සොරකම් කරන අය අපි දැනටමත් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. බහුල වශයෙන් එහෙම කෙරෙන්නේ නැහැ. බොහෝ දුරට කට කථාවක් වශයෙන් තමයි මෙය පැතිරී තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කැමැත්තෙන් ගිය අයට මොනවාද කරන්නේ?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
කැමැත්තෙන් ගිය අය බොහොම ලස්සනට ඉන්නවා. [බාධා කිරීමක්] නැහැ, ඒක තමයි. කැමැත්තෙන් ආපු අය ප්‍රීතියෙන් ඉන්නවා. ආපු නැති අය දුකෙන්, තමන්ගේ - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර අවසන්ද? දෙවැනි වටය.

## දේශීය විශ්වවිද්‍යාලවලට බඳවා ගත් විදේශ සිසුන් : විස්තර

உள்நாட்டுப் பல்கலைக்கழகங்களில் அனுமதிக்கப்பட்ட வெளிநாட்டு மாணவர்கள்: விபரம்
FOREIGN STUDENTS ENROLLED IN LOCAL UNIVERSITIES: DETAILS

0768/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

[ගරු රවි කරුණානායක මහතා]

(අ) (i) 2006 සිට 2010 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයේදී දේශීය විශ්වවිද්‍යාලවලට බඳවා ගත් විදේශ සිසුන් සංඛ්‍යාව ඔවුන් අයත් රටවල් අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් බඳවා ගෙන ඇති අධ්‍යයන අංශ කවරේද;

(iii) ඉහත කී ශිෂ්‍යයන්ගෙන් වාර්ෂිකව ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දේශීය විශ්වවිද්‍යාලවලට වැඩි වශයෙන් විදේශ සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා විකල්ප වැඩසටහනක් හඳුන්වා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දේශීය විශ්වවිද්‍යාල පද්ධතියට විදේශ සිසුන් බඳවා ගැනීම හේතුවෙන්, විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වූ දේශීය සිසුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ගැටලුව විසඳන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006 முதல் 2010 வரையிலான காலப்பகுதியில் உள்நாட்டுப் பல்கலைக்கழகங்களுக்கு அனுமதிக் கப்பட்ட வெளிநாட்டு மாணவர்களது எண்ணிக்கையை நாடுகள் மற்றும் வருட வாரியாக வெவ்வேறாகவும்;

(ii) அவர்கள் எந்தெந்த கற்கைநெறிகளுக்கு அனுமதிக்கப்பட்டார்கள் என்பதையும்;

(iii) மேற்படி மாணவர்கள் மூலம் இலங்கைக்கு கிடைக்கப்பெற்ற அந்நியச் செலாவணியை வருடாந்த அடிப்படையில் வெவ்வேறாகவும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) உள்நாட்டுப் பல்கலைக்கழகங்களுக்கு மேலும் அதிகளவு மாணவர்களை ஈர்க்க மாற்று நிகழ்ச்சித் திட்டம் ஒன்று அறிமுகப்படுத்தப்படுமா என்பதையும் அவர் தெரிவிப்பாரா?

(இ) (i) உள்நாட்டுப் பல்கலைக்கழகங்களுக்கு வெளி நாட்டு மாணவர்கள் அனுமதிக்கப்படுவதன் காரணமாக வாய்பை இழக்கும் உள்நாட்டு மாணவர்களின் எண்ணிக்கையையும்;

(ii) இப்பிரச்சினை எவ்வாறு தீர்க்கப்படும் என்ப தையும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education:

(a) Will he inform this House-

(i) the number of foreign students who enrolled in local universities from year 2006 to 2010 on per year and per country basis separately;

(ii) the fields of study for which they have been enrolled; and

(iii) the amount of foreign exchange received by Sri Lanka from the aforesaid students on per year basis?

(b) Will he state whether an alternative programme will be introduced to attract more foreign students to local universities?

(c) Will he also state-

(i) the number of local students lose out owing to foreign students coming into the local university system; and

(ii) as to how this problem is resolved?

(d ) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S. B. Dissanayake - Minister of Higher Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා. මේ ප්‍රශ්නය ඇසීම ගැන ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා. මොකද, මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්.

(අ) (i) ඇමුණුමෙහි තීරු අංක 1, 2, 3 හා 4 යටතේ දක්වා ඇත.

(ii) ඇමුණුමෙහි තීරු අංක 5 යටතේ දක්වා ඇත.

(iii) ඇමුණුමෙහි තීරු අංක 6 යටතේ දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) ඔව්. අපි විදේශීය ශිෂ්‍යත්ව 100ක් ජනාධිපති ශිෂ්‍යත්ව වශයෙන් ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. ලෝකයේ අපේ සෑම තානාපති කාර්යාලයක් හරහා, ඒ වාගේම ඒජන්සි හරහා අපේ ප්‍රධාන විශ්වවිද්‍යාල හතක් පිළිබඳව, පාඨමාලා පිළිබඳව සියලු තොරතුරු මුද්‍රණය කර පොත් පත් මඟින් දන්වා තිබෙනවා.

(ඇ) (i) විදේශ සිසුන් බඳවා ගැනීම හේතුවෙන් දේශීය සිසුන් කිසිවෙකුට දේශීය විශ්වවිද්‍යාලයන්ට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී නොමැත. මොකද, පසු ගිය අවුරුදු කිහිපයේත් අපි විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා සිසුන් ප්‍රමාණය කීයකින් හරි වැඩි කරලා තිබෙනවා. මෙවරත් අපි ඇතුළත් කර ගන්නා සිසුන් ප්‍රමාණය වැඩි කරනවා.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

** Annex tabled:*

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | සිසුන් සංඛ්‍යාව | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| කොළඹ විශ්වවිද්‍යාලය | 2005/2006 | 3 | භූතානය | වෛද්‍ය පීඨය | 15,000 |
| | 2006/2007 | 2 | භූතානය | වෛද්‍ය පීඨය | 10,000 |
| | 2007/2008 | 8 | භූතානය | වෛද්‍ය පීඨය | 40,000 |
| | 2008/2009 | 6 | භූතානය | වෛද්‍ය පීඨය | 30,000 |
| | 2009/2010 | 12 | භූතානය | වෛද්‍ය පීඨය | 60,000 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2005/2006 | 3 | භූතානය | වෛද්‍ය පීඨය | 10,000 |
| | 2006/2007 | 4 | භූතානය | වෛද්‍ය පීඨය | 20,000 |
| | 2007/2008 | 9 | භූතානය | වෛද්‍ය පීඨය | 45,000 |
| | 2008/2009 | 7 | භූතානය | වෛද්‍ය පීඨය | 35,000 |
| | | 1 | ඉරානය | වෛද්‍ය පීඨය (දන්ත වෛද්‍ය) | 6,500 |
| | | 4 | භූතානය | වෛද්‍ය පීඨය (දන්ත වෛද්‍ය) | 26,000 |
| | 2009/2010 | 2 | භූතානය | වෛද්‍ය පීඨය (දන්ත වෛද්‍ය) | 13,000 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2005/2006 | - | - | - | - |
| | 2006/2007 | - | - | - | - |
| | 2007/2008 | 3 | මාලදිවයින | වෛද්‍ය පීඨය | 15,000 |
| | 2008/2009 | - | - | - | - |
| | 2009/2010 | - | - | - | - |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 2005/2006 | - | - | - | - |
| | 2006/2007 | - | - | - | - |
| | 2007/2008 | - | - | - | - |
| | 2008/2009 | - | - | - | - |
| | 2009/2010 | 1 | ඔස්ට්‍රියාව | ස්වභාවික විද්‍යා පීඨය | 800 |
| | | 1 | මාලදිවයින | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 600 |

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | සිසුන් සංඛ්‍යාව | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| කැළණිය විශ්වවිද්‍යාලය | 2005/2006 | 3 | භූතානය | වෛද්‍ය පීඨය | 15,000 |
| | | 10 | චීනය | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව I | 6,000 |
| | | 10 | බංගලාදේශය | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව II | 6,000 |
| | | 9 | බංගලාදේශය | ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (කලා) | 7,425 |
| | 2006/2007 | 5 | භූතානය | වෛද්‍ය පීඨය | 25,000 |
| | | 10 | බංගලාදේශය, ඉන්දුනීසියාව | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව I | 6,000 |
| | | 8 | බංගලාදේශය, ඉන්දුනීසියාව | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව II | 4,800 |
| | | 20 | බංගලාදේශය | ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (කලා) | 16,500 |
| | 2007/2008 | 14 | භූතානය | වෛද්‍ය පීඨය | 50,000 |
| | | 15 | බංගලාදේශය,චීනය, මියන්මාර්, කොරියාව,කාම්බෝජය | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව I | 9,000 |
| | | 10 | බංගලාදේශය, ඉන්දුනීසියාව | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව II | 6,000 |
| | | 6 | බංගලාදේශය | ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (කලා) | 4,950 |
| | 2008/2009 | 14 | භූතානය | වෛද්‍ය පීඨය | 70,000 |
| | | 4 | බංගලාදේශය, මියන්මාර්, කාම්බෝජය | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව I | 2,400 |
| | | 15 | බංගලාදේශය, චීනය, මියන්මාර්,කොරියාව, කාම්බෝජය, | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව II | 9,000 |
| | | 6 | බංගලාදේශය | ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (කලා) | 4,950 |
| | 2009/2010 | 15 | භූතානය | වෛද්‍ය පීඨය | 75,000 |
| | | 11 | බංගලාදේශය,චීනය, කාම්බෝජය, මියන්මාර් | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව I | 6,600 |
| | | 4 | බංගලාදේශය, කාම්බෝජය, මියන්මාර් | පාලි හා බෞද්ධ ඩිප්ලෝමා පාඨමාලාව II | 2,400 |
| | | 23 | බංගලාදේශය,චීනය, කොරියාව | ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (කලා) | 18,975 |
| | | 2 | ජපානය | සිංහල සහතික පත්‍ර පාඨමාලාව | 1,000 |

[ගරු එස්.බී. දිසානායක මහතා]

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | සිසුන් සංඛ්‍යාව | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 2005/2006 | 21 | බංගලාදේශය | බෞද්ධ අධ්‍යයන පීඨය | Rs.43600 + us$ 10900 |
| | | 20 | මියන්මාරය | | |
| | | 19 | කාම්බෝජියාව | | |
| | | 2 | නේපාලය | | |
| | | - | භූතානය | | |
| | | - | චෙක් ජනරජය | | |
| | | - | ඉන්දියාව | | |
| | 2006/2007 | 16 | බංගලාදේශය | බෞද්ධ අධ්‍යයන පීඨය | Rs.45200 + us$ 12225 |
| | | 13 | මියන්මාරය | | |
| | | 7 | කාම්බෝජියා | | |
| | | 5 | නේපාලය | | |
| | | - | භූතානය | | |
| | | - | චෙක් ජනරජය | | |
| | | 1 | ඉන්දියාව | | |
| | 2007/2008 | 32 | බංගලාදේශය | බෞද්ධ අධ්‍යයන පීඨය | Rs.26800 + us$ 17745 |
| | | 19 | මියන්මාරය | | |
| | | 3 | කාම්බෝජියාව | | |
| | | 5 | නේපාලය | | |
| | | 2 | භූතානය | | |
| | | - | චෙක් ජනරජය | | |
| | | - | ඉන්දියාව | | |
| | 2008/2009 | 50 | බංගලාදේශය | බෞද්ධ අධ්‍යයන පීඨය | Rs.14000 + us$ 18195 |
| | | 18 | මියන්මාරය | | |
| | | 4 | කාම්බෝජියාව | | |
| | | 1 | නේපාලය | | |
| | | - | භූතානය | | |
| | | 1 | චෙක් ජනරජය | | |
| | | - | ඉන්දියාව | | |
| | 2009/2010 | 25 | බංගලාදේශය | බෞද්ධ අධ්‍යයන පීඨය | Rs.800 + us$ 13375 |
| | | 19 | මියන්මාරය | | |
| | | - | කාම්බෝජියාව | | |
| | | 1 | නේපාලය | | |
| | | - | භූතානය | | |
| | | - | චෙක් ජනරජය | | |
| | | - | ඉන්දියාව | | |

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | සිසුන් සංඛ්‍යාව | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය | 2007/2008 | 1 | මියන්මාරය | ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව | 100 |
| කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2005/2006 | 1 | ඕමානය | විද්‍යාපති ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය | 3,477 |
| | 2006/2007 | - | - | - | - |
| | 2007/2008 | 1 | මියන්මාරය | දර්ශනශූරී පැලෑටි ආරක්ෂණය | 911 |
| | 2008/2009 | - | - | - | - |
| | 2009/2010 | 1 | අප්‍රිකාව | දර්ශනශූරී ජෛව සංඛ්‍යානය | 5,450 |
| | | 1 | බංගලාදේශය | දර්ශනශූරී භෝග විද්‍යාව | 2,725 |
| විද්‍යා පශ්චාත්උපාධි ආයතනය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2005/2006 | - | - | - | - |
| | 2006/2007 | - | - | - | - |
| | 2007/2008 | - | - | - | - |
| | 2008/2009 | 1 | ඉන්දියාව | වෛද්‍ය / භෞතික | 2,400 |
| | 2009/2010 | - | - | - | - |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය | 2005/2006 | 1 | භූතානය | පශ්චාත් උපාධි ඩිප්ලෝමා වෛද්‍ය -ශුද්ධ ජීව විද්‍යා | 5,000 |
| | 2006/2007 | 1 | භූතානය | ළමා වෛද්‍ය (Paediatrics) | 4,465 |
| | | 1 | භූතානය | විද්‍යාපති - ශුද්ධ විද්‍යා (MD) | 5,000 |
| | 2007/2008 | - | - | - | - |
| | 2008/2009 | - | - | - | - |
| | 2009/2010 | 1 | භූතානය | පශ්චාත් උපාධි ඩිප්ලෝමා වෛද්‍ය -නීති | 5,000 |
| කළමනාකරණ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2009/2010 | 5 | මාලදිවයින | රේගු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9,000 |

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | මුළු සිසුන් | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය -කැලණිය විශ්වවිද්‍යාලය | 2005/2006 | 9 | චීනය,කොරියාව, මියන්මාරය,ඉන්දියාව | බෞද්ධ අධ්‍යයනය පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 41,000 |
| | | 58 | තායිලන්තය,මියන්මාරය, චීනය,කාම්බෝජියාව, නේපාලය,වියට්නාමය, බංගලාදේශය,මුරුසිය | ශාස්ත්‍රපති බෞද්ධ අධ්‍යයනය | |
| | | 4 | චීනය | දර්ශනපති Master of Phylosophy | |
| | | 2 | කොරියාව | දර්ශනපති Doctor of Phylosophy | |
| | | 1 | තායිලන්තය | | |
| | | 1 | කාම්බෝජියාව | | |
| | | 1 | මුරිසිය | | |
| | | 1 | ජර්මනිය | | |
| | 2006/2007 | 1 | කාම්බෝජියාව | බෞද්ධ අධ්‍යයනය පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 200 |
| | | 1 | චීනය | | 450 |
| | | 2 | ඉන්දියාව | | 1,050 |
| | | 2 | මියන්මාරය | | 900 |
| | | 4 | තායිලන්තය | | 950 |
| | | 1 | බංගලාදේශය | ශාස්ත්‍රපති බෞද්ධ අධ්‍යයනය | 500 |
| | | 4 | කාම්බෝජියාව | | 2,000 |
| | | 5 | චීනය | | 2,200 |
| | | 1 | ඉන්දියාව | | 500 |
| | | 4 | කොරියාව | | 1,700 |
| | | 59 | මියන්මාරය | | 19,850 |
| | | 1 | නේපාලය | | 500 |
| | | 1 | තායිලන්තය | | 500 |
| | | 1 | වියට්නාමය | | 50 |
| | | 1 | නේපාලය | ශාස්ත්‍රපති කලා උපාධිය (පාලි) | 500 |
| | | 2 | චීනය | දර්ශනපති Doctor of Phylosophy | 6,950 |

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | මුළු සිසුන් | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය -කැලණිය විශ්වවිද්‍යාලය | 2007/2008 | 1 | හොංකොං | බෞද්ධ අධ්‍යයනය පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 550 |
| | | 5 | කොරියාව | | 2,925 |
| | | 1 | මියන්මාරය | | 550 |
| | | 3 | බංගලාදේශය | ශාස්ත්‍රපති බෞද්ධ අධ්‍යයනය | 1,800 |
| | | 5 | කාම්බෝජියාව | | 3,000 |
| | | 4 | චීනය | | 2,400 |
| | | 2 | ඉන්දියාව | | 1,450 |
| | | 3 | ඉන්දුනීසියාව | | 2,300 |
| | | 1 | මැලේසියාව | | 600 |
| | | 70 | මියන්මාරය | | 39,550 |
| | | 2 | නේපාලය | | 1,200 |
| | | 1 | සිංගප්පූරුව | | 600 |
| | | 4 | තායිලන්තය | | 2,400 |
| | 2007/2008 | 4 | චීනය | දර්ශනපති Doctor of Phylosophy | 18,800 |
| | | 2 | කොරියාව | | |
| | | 2 | ඉන්දියාව | | |
| | | 2 | මියන්මාරය | | |
| | | 1 | තායිලන්තය | | |
| | | 1 | කාම්බෝජියාව | | |
| | | 1 | වියට්නාමය | | |

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | මුළු සිසුන් | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය -කැලණිය විශ්වවිද්‍යාලය | 2008/2009 | 1 | චීනය | බෞද්ධ අධ්‍යයනය පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 600 |
| | | 1 | ජපානය | | 850 |
| | | 4 | කොරියාව | | 2,425 |
| | | 1 | මැලේසියාව | | 775 |
| | | 2 | මියන්මාරය | | 1,100 |
| | | 1 | තායිවානය | | 600 |
| | | 1 | තායිලන්තය | | 775 |
| | | 8 | කාම්බෝජියාව | ශාස්ත්‍රපති බෞද්ධ අධ්‍යයනය | 4,800 |
| | | 5 | චීනය | | 2,450 |
| | | 1 | හොංකොං | | 600 |
| | | 2 | ඉන්දියාව | | 1,450 |
| | | 7 | කොරියාව | | 3,975 |
| | | 1 | මැලේසියාව | | 600 |
| | | 108 | මියන්මාරය | | 59,200 |
| | | 1 | තායිලන්තය | | 50 |
| | | 2 | චීනය | දර්ශනපති දර්ශනශූරි (ආචාර්ය උපාධිය) | 20,700 |
| | | 1 | ඉන්දියාව | | |
| | | 1 | කාම්බෝජියාව | | |
| | | 3 | ඉන්දුනීසියාව | | |

[ගරු එස්.බී. දිසානායක මහතා]

| තීරු අංක 01 | තීරු අංක 2 | තීරු අංක 3 | තීරු අංක 4 | තීරු අංක 5 | තීරු අංක 6 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය | මුළු සිසුන් | රට | අධ්‍යයන අංශය/පාඨමාලාව | වාර්ෂික විදේශ විනිමය (ඇ.ඩො.) |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය -කැලණිය විශ්වවිද්‍යාලය | 2009/2010 | 2 | චීනය | පශ්චාත් උපාධි ඩිප්ලෝමා බෞද්ධ අධ්‍යයනය | 1,100 |
| | | 5 | කොරියාව | | 3,425 |
| | | 2 | මියන්මාරය | | 1,100 |
| | | 1 | තායිලන්තය | | 200 |
| | | 1 | ඇමරිකාව | | 850 |
| | | 1 | බංගලාදේශය | ශාස්ත්‍රපති බෞද්ධ අධ්‍යයනය | 600 |
| | | 1 | බර්මා | | 200 |
| | | 13 | කාම්බෝජියාව | | 7,400 |
| | | 4 | චීනය | | 2,400 |
| | | 1 | ඉන්දියාව | | 600 |
| | | 2 | කොරියාව | | 925 |
| | | 79 | මියන්මාරය | | 45,350 |
| | | 3 | නේපාලය | | 1,700 |
| | | 1 | තායිවානය | | 600 |
| | | 1 | තායිලන්තය | | 925 |
| | | 2 | බංගලාදේශය | දර්ශනපති දර්ශනශූරි (ආචාර්ය උපාධිය) | 15,050 |
| | | 1 | භූතානය | | |
| | | 1 | කාම්බෝජියාව | | |
| | | 7 | චීනය | | |
| | | 2 | ඉන්දියාව | | |
| | | 3 | ඉන්දුනීසියාව | | |
| | | 1 | ජපානය | | |
| | | 7 | කොරියාව | | |
| | | 1 | මැලේසියාව | | |
| | | 4 | මියන්මාරය | | |
| | | 1 | නේපාලය | | |
| | | 1 | තායිලන්තය | | |
| | | 1 | වියට්නාමය | | |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය ඇසීම ඔබතුමා අගය කළා. මේ රටේ දැවෙන ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ ආර්ථිකය හදන්න පුළුවන් හොඳ අධ්‍යාපනයක් ලබා දීම තුළින්. මම හිතන හැටියට ඔබතුමා නිර්භීතව උසස් අධ්‍යාපනයට කරන සේවය -හැම දෙයම නොවෙයි. යම් කොටසක්- අපි යම් විධියකින් අගය කළ යුතුයි. අද 145,800ක විතර ශිෂ්‍ය පිරිසක් උසස් පෙළ හදාරනවා. සාමාන්‍යයෙන් සියයට 80ක විතර පිරිසක් උසස් පෙළ සමත් වෙනවා. පසු ගිය අවුරුද්දේ විශ්වවිද්‍යාලවලට ඇතුළු කර ගෙන තිබෙන්නේ 22,100යි. ඉතුරු සිසුන් ප්‍රමාණය සම්බන්ධ ප්‍රශ්නය නිරාකරණය කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්නේ කොහොමද, කොයි ආකාරයෙන්ද කියන එක ගැන අපව දැනුවත් කරන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ඒ අතුරු ප්‍රශ්නයටත් මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කිව්වාට වඩා සංඛ්‍යා ලේඛන හුඟක් වෙනස්. 320,000ක් උසස් පෙළට ලියනවා. 150,000ක් විතර විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්න සුදුසුකම් ලබනවා. අපි පසු ගිය අවුරුද්දේ 22,300ක් විශ්වවිද්‍යාලවලට ඇතුළු කර ගත්තා. 3,000ක් ගත්තා උසස් තාක්ෂණික ආයතනවලට. අපේ රාජ්‍ය නොවන, වෙනත් විදේශ විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වෙලා තිබෙන විශ්වවිද්‍යාල ආයතන 28හි තවත් ළමයින් 3,000ක් ඉගෙන ගන්නවා. පසු ගිය අවුරුද්දේ ළමයින් 4,000ක්, 5,000ක්, 6,000ක් විතර විදේශගත වෙලා තිබෙනවා ඉගෙන ගන්න. ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ හැම රටක්ම මේ ප්‍රශ්නය විසඳලා තිබෙන්නේ පෞද්ගලික අංශයට විශ්වවිද්‍යාල විවෘත කරන්න ඉඩකඩ දීලායි. මම පසු ගිය මාසයේ සඟරාවක දැක්කා දැනට ඉන්දියාවේ පෞද්ගලික විශ්වවිද්‍යාල 3,701ක් තිබෙනවාය කියා. දැනට චීනයේ බීජින් අගනුවර විතරක් පෞද්ගලික විශ්වවිද්‍යාල 91ක් තිබෙනවා. අපිත් මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල විවෘත කරනවා විතරක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි, ඒවායින් යම් කිසි ප්‍රතිශතයක් -සියයට 20ක උපරිමයකට යටත්ව- ශිෂ්‍යත්ව හැටියට අරගෙන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න බැරි, සල්ලි නැති ළමයින් සඳහා ඒ ශිෂ්‍යත්ව ලබා දී මේ ප්‍රමාණය ව්‍යාප්ත කරන්න අපි කටයුතු කර ගෙන යනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේකෙන් අපේ නිදහස් අධ්‍යාපන ක්‍රමයට කිසිම බාධාවක් ඇති නොවේවිය කියලා මම විශ්වාස කරනවා. නමුත් අපිට පෙනෙනවා මෙතෙක් දුරට විශ්වවිද්‍යාලයේ තිබුණු ප්‍රමිතිය -quality එක- අඩු වීමේ ප්‍රශ්නයකට එය තුඩු දෙනවා කියලා. මම හිතන විධියට අන්න ඒ නිසා තමයි උසස් පෙළ හදාරන සිසුන්ට පෞද්ගලික විශ්වවිද්‍යාල ගැන භයක් ඇති වෙලා තිබෙන්නේ. මේ පෞද්ගලීකරණය කියන වචනය ඔබතුමන්ලාම කුණුහරුපයක් ලෙස පාවිච්චි කරන වචනයක් නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පෞද්ගලීකරණය කියන වචනය ශබ්ද කෝෂයෙන් එළියට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කථා පවත්වන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාම දැන් මෙය පිළිඅරගෙන තිබෙන කොට මේක ප්‍රශ්නයක් ලෙසයි ඒ ගොල්ලෝ සලකන්නේ. කරුණාකරලා ඒ භය නැති කරලා- [බාධා කිරීම්]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
එකක් තමයි, පෞද්ගලික විශ්වවිද්‍යාල හරහා අපේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට යම් කිසි තර්ජනයක් එනවා නම් පෞද්ගලික විශ්වවිද්‍යාල නියාමනය කිරීමේ කවුන්සිල් එක හරහා නීතිරීති මඟින් අපි ඒක වැළැක්වීම. දෙවැනි කාරණය තමයි, අපි ඒ හැම පෞද්ගලික විශ්වවිද්‍යාලයකින්ම මුදල් නැති දරුවන් පිරිසකට ශිෂ්‍යත්ව ලබා ගන්න එක. තුන්වන කාරණය තමයි අපේ රාජ්‍ය විශ්වවිද්‍යාල ජාත්‍යන්තර තලයේ ඉහළට ගෙනෙන්න ක්‍රියා මාර්ග ගණනාවක් අරගෙන තිබීම. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නය අහලා නැහැ. ඒ ගැනත් මම ඉතාම කෙටියෙන් කියන්නම්.

මීට අවුරුදු දෙකකට කලින් අපේ එක විශ්වවිද්‍යාලයක්වත් world rankingsවල 5000න් පහළ තිබුණේ නැහැ. අද කොළඹ විශ්වවිද්‍යාලය world rankingsවල 1200වන ස්ථානයේයි ඉන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉස්සරත් තිබුණා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
නැහැ, කවදාවත් තිබුණේ නැහැ. 5000න් ඉහළ එකක්වත් තිබුණේ නැහැ. [බාධා කිරීමක්] 1960 ගණන්වල හරි. හැට ගණන්වල ඊටත් උඩින් තිබුණා. [බාධා කිරීමක්] ඒවා හරි. මම මේ කියන්නේ පසු ගිය අවුරුදු 10ක් තුළ. මෑත කාලයේදී -[බාධා කිරීමක්] නැහැ. 1987, 1988, 1989 කාලයේදී තිබුණේත් නැහැ. විශ්වවිද්‍යාල world rank එකෙන් පහළට ඇදගෙන වැටුණේ 1987 ඉඳලායි. ඒකට ඔබතුමන්ලා වග කිව යුතු නැහැ. ඒකට වග කිව යුත්තේ ජනතා විමුක්ති පෙරමුණයි. ඔබතුමන්ලා නොවෙයි, ඒකට වග කිව යුත්තේ ජනතා විමුක්ති පෙරමුණයි. කඩා ගෙන වැටුණේ එතැනිනුයි. මීට අවුරුදු දෙකකට කලිනුත් 5000න් මෙහා එකක්වත් තිබුණේ නැහැ. ගිය අවුරුද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය 3600ක් උඩට ආවා. අනික් විශ්වවිද්‍යාල 3600ක් තල්ලු කර ගෙන උඩට ආවා. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තවත් විශ්වවිද්‍යාල 3700ක් තල්ලු කර ගෙන උඩට ආවා. ඒ නිසා අද අපේ ප්‍රධාන විශ්වවිද්‍යාල හයක් 2000 - 3000 අතරේ තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමාට තේරෙනවා ඇති, අපි පරීක්ෂණ කටයුතු වැඩි කරලා තිබෙනවා. ජාත්‍යන්තර ශිෂ්‍යයන්ගේ ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. අද අපේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වැඩි කරලා තිබෙනවා. අද, world rank එකෙන් උඩට එන්න අවශ්‍ය දේවල් විශ්වවිද්‍යාල තුළ තරගකාරී විධියට කර ගෙන යමින් අපේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තර තලයේ ඉහළට ගෙනෙන්න කටයුතු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි. දැන් ඇති.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි අගය කරනවා, අපේ විශ්වවිද්‍යාල උසස් තත්ත්වයට ගෙන එන එක ගැන. කරුණාකර අපට කියන්න පුළුවන්ද, මීට වඩා ඉක්මනට මේ තත්ත්වය වර්ධනය කර තවත් හොඳ තත්ත්වයට ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් -[බාධා කිරීමක්]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මෙතුමන්ලා නිතර අහන ප්‍රශ්නයක් තමයි ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාලවලට වෙන් කරන සල්ලි ප්‍රමාණය මදියි, උසස් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ කීයද කියන එක. ගිය වතාවේ වෙන් කරපු සල්ලිවලින් එක විශ්වවිද්‍යාලයක් ඇරෙන්න වෙනත් කිසිදු විශ්වවිද්‍යාලයකට සියයට 50ක් වියදම් කර ගන්න බැරි වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තරය දෙනකම් ඉන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, එක විශ්වවිද්‍යාලයක් ඇරෙන්න අනික් විශ්වවිද්‍යාල එකකටවත් ගිය වතාවේ වෙන් කරපු සල්ලිවලින් සියයට 50ක් වියදම් කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒකයි ප්‍රශ්නය. වෙන් කරපු මුදල් මදි වෙලා නොවෙයි. වෙන් කරපු මුදල්වලින්වත් සියයට 50ක් වියදම් කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒක හදනවා. ඒක අපි හදනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
### தனி அறிவித்தல் மூல வினா
### QUESTION BY PRIVATE NOTICE

## ජලය නොලැබීමෙන් උතුරු මැද පළාතේ ගොවීන් මුහුණ දෙන අර්බුදය
### நீர்ப் பற்றாக்குறையினால் வட மத்திய மாகாண விவசாயிகள் எதிர்நோக்கும் நெருக்கடி
### CRISIS FACED BY FARMERS OF NORTH-CENTRAL PROVINCE DUE TO SCARCITY OF WATER

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

වී වගා බිම් සඳහා ජලය නොලැබීම හේතුවෙන් උතුරු මැද පළාතේ ගොවීන් විශාල සංඛ්‍යාවකට මුහුණ දීමට සිදු වී ඇති අර්බුදකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

[ගරු අනුර දිසානායක මහතා]

මේ වන විට අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල වී ගොවීන් අතිවිශාල සංඛ්‍යාවකට තම වගා බිම් සඳහා අවශ්‍ය ජලය නොලැබීමේ ගැටලුවකට මුහුණ දීමට සිදු වී තිබෙනවා. ගොවි පවුල් 2,500ක් වාසය කරන ගිරිතලේ ව්‍යාපාරයේ ගොවීන් මුහුණපාන ගැටලුව එයින් එක් නිදසුනක් පමණයි.

ඔවුන් විසින් මෙම ව්‍යාපාරය තුළ නිසි වාරි ක්‍රම සහිතව වගා කරන කුඹුරු අක්කර 7,500ක්ද, අතිරේක කුඹුරු අක්කර 2,500ක්ද පමණ ප්‍රමාණවත් ජලය නොලැබීම හේතුවෙන් විනාශ වීමේ අවදානමක් මතුව තිබෙනවා. එක් මුරයක් සඳහා අක්කර අඩි 2,500ක ජලය ලබා දිය යුතුව තිබුණද දැනට එම ගොවීන්ට නිකුත් කරනු ලබන්නේ, අක්කර අඩි 1,500ක් පමණයි. ගිරිතලේ වැවෙන් දැනට නිකුත් කළ හැකි ජල ප්‍රමාණය වන අක්කර අඩි 4,500 අනුව සලකා බලන විට ඔවුන්ගේ වගාව සඳහා නිකුත් කළ හැක්කේ උපරිම මුර 3ක් සඳහා වන ජලය පමණයි. මහවැලි ව්‍යාපාරය යටතේ අක්කර අඩි 28,000ක පමණ ජලය ප්‍රමාණයක් ගිරිතලේ ව්‍යාපාරයට නිකුත් කරනු ඇති බවට ගොවීන්ට ලබා දුන් වාචික පොරොන්දුව ක්‍රියා මාර්ග බවට පෙරළී නැහැ.

මෙම අවිනිශ්චිත තත්ත්වය හමුවේ මෙවර තම වගා බිම් වියළී යාමේ ඛේදවාචකයකට ඔවුන් මුහුණ දී සිටිනවා. වගා බිම් සඳහා කෘමිනාශක හා පොහොර අදාළ කාලවලදී ලබා දිය යුතුයි. ගොවීන් ඒ සඳහා බොහෝ විට මුදල් සොයා ගන්නේ ණය වීමෙන් ආදී බොහෝ දුෂ්කර කොන්දේසි යටතේයි. එවැනි තත්ත්වයකදී තෙල් සහ පොහොර වෙනුවෙන් ආයෝජනය කර අවසානයේදී වී වගා බිම් වෙළී ගියහොත් ඔවුන්ට සිදු වන පාඩුව දෙගුණ, තෙගුණ වන බව අමුතුවෙන් කිව යුතු නැහැ. එබැවින් ඔවුන්ට ජලය ලැබෙනු ඇති බවට නිශ්චිත පොරොන්දුවක් අවශ්‍යයි. මහවැලි "එච්" කලාපයේ තත්ත්වයද මෙයට දෙවැනි වන්නේ නැහැ. මේ වන විට කලා වැවේ වතුර තවත් එක් මුරයක් පමණක් දක්වා පහළ බැස තිබෙනවා. ඊයේ දිනයේ රජරට ගොවි ජනතාව කලා වැව් බැම්ම මත දේව කන්නලව්වක් කිරීම දක්වා මෙම ජල අර්බුදය බරපතළ වී තිබෙනවා.

කෘෂිකර්මය සඳහා දිරිගන්වන බවට "අපි වවමු-රට නගමු" සටන් පාඨ පවතින නමුදු ගොවියාට ඒ වැවීම තමන් විසින් සිදු කර ගන්නා මහා පාපකර්මයක් ලෙස පෙනී ගිය අවස්ථා වූයේ එකක්, දෙකක් නොවේ. පසු ගිය කාලයේ එළවලු ගොවීන්ටද, වී ගොවීන්ටද එවැනි අවාසනාවන්ත අත් දැකීම්වලට මුහුණ දෙන්නට සිදු වුණා. ඉතිහාසයේද එවැනි අවස්ථාවලට මුහුණ පෑ විට ගොවීන්ට සිදු වූයේ වගාව වෙනුවෙන් ගෙනා කෘෂි රසායනවල රස බැලීමටයි.

ප්‍රමාණවත් තරම් ආදායමක් නොලැබෙන්නේ නම් ඊට අනුරූප ලෙස තමන්ගේ පරිභෝජනය සීමා කර ගැනීමත්, ආහාර සීමා කර ගනිමින් කුසගින්නේ සිටීමත් රජරට ගොවියාට සුපුරුදු තත්ත්වයක්.

එහෙත් වගා කරන ලද කුඹුරුවලට අඩුවෙන් ජලය ලබා දීම නිසා ගොයම වෙළී යාම දරා ගැනීමට ඔවුන්ට පහසු නැහැ. සාපේක්ෂ වශයෙන් වැඩෙන කාලයේ උපරිම ජල ප්‍රමාණයක් ඉල්ලා සිටින වී වගාවට, වැවේ ඇති ජල ප්‍රමාණය හෝ මහවැලි ගඟෙන් ලැබෙන්නට නියමිත ජල ප්‍රමාණය පිළිබඳව සංඛ්‍යා ලේඛනවලින් හෝ ඒ පිළිබඳ වාචික පොරොන්දුවලින් අර්ථයක් නැහැ. වගාවට අවශ්‍ය වනුයේ ජලය පමණයි.

අනෙක් අතට මෙම පියවර ගොවියා වී වගාවෙන් ඉවත් කර බහු ජාතික සමාගම්වල අපනයන බෝග වගාවට යොමු කර වීමට කූට සැලැස්මක් විය හැකි බවට මත පළ වනවා. ඇතැම් ප්‍රදේශවල ගොවීන්ට වී වගා නොකරන ලෙසට කල් ඇතිවම කෘෂිකර්ම නිලධාරින්ගෙන් තාක්ෂණික උපදෙස් නිකුත් වී තිබෙනවා. මහවැලි ජල පෝෂක ප්‍රදේශවලට වර්ෂාවේ සැලකිය යුතු අඩුවක් ඇති බව ප්‍රකාශයට පත් නොවී තිබියදීම එයින් පෝෂණය වන වැව්වලට, ගොවිතැන්වලට අවශ්‍ය ජලය ලබා දීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත්තේ මන්ද යන්න ගැටලු සහගතයි. කෘෂිකර්මය නොසලකා මහවැලි ජලය විදුලි බලය නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අසීමිතව මුදා හැරීමද මෙවැනි තත්ත්වයක් උද්ගත වීමට හේතුවක් බව ගොවීන්ගේ අදහසයි.

මෙම හේතුවෙන් පැන නඟින පහත ප්‍රශ්න පිළිබඳව ගරු අමාත්‍යතුමා මෙම සභාව දැනුවත් කරනු ඇතැයි අපේක්ෂා කරනවා.

ගිරිතලේ ව්‍යාපාරය ඇතුළු වැව් පද්ධතියට මහවැලි ජලය ලබා නොදීමේ තීරණයක් ගෙන තිබේද, වගා කරන ලද කුඹුරුවලට අඛණ්ඩව ජලය සැපයීම සඳහා ගෙන ඇති පියවර කුමක්ද, පවතින හා ඇති විය හැකි වගා හානිවලින් ගොවීන් පීඩාවට පත් නොවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න පිළිබඳව ගරු අමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් උතුරු මැද පළාතේ සමහර ප්‍රදේශවල වගා බිම් සඳහා වාරි ජලය ලබා දීමේ ගැටලුව පිළිබඳව ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්න කරනු ලැබීම පිළිබඳව පළමුව එතුමාට ස්තුතිවන්ත වෙමි. මා එසේ ස්තුතිවන්ත වනුයේ මෙම ප්‍රශ්නය පිළිබඳව යථා තත්ත්වය නොදන්නා පුද්ගලයින්ට හා යථා තත්ත්වය දැන ගෙන එය විකෘති කිරීමට උත්සාහ දරන පුද්ගලයින්ට හා සංවිධානයන්ට යථා තත්ත්වය විස්තර කර දීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මහඟු අවස්ථාවක් දැන් ලබා දී ඇති හෙයිනි.

දැනට වාරි ජලය පූර්ණ වශයෙන් ලබා දීමට නොහැකි ප්‍රදේශ ලෙස ගිරිතලේ ව්‍යාපාරය, කලා වැව, හුරුලු වැව පෝෂිත ඇළ, කණ්ඩලම ඇලහැර යෝධ ඇළ ව්‍යාපාර හඳුනා ගෙන ඇති අතර ජලය ඇත්තේ නම් මේ ව්‍යාපාර යටතේ වගා කළ හැකි සම්පූර්ණ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 40,000කි. පසු ගිය කන්න තුනේදී මෙම ව්‍යාපාර යටතේ ඉහත කී සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයේ වී වගා කරනු ලැබීය. එසේ කළ හැකි වූයේ එවකට පැවැති ප්‍රමාණවත් වර්ෂාපතනය නිසා මෙම ව්‍යාපාර සඳහා ජලය සපයනු ලබන කොත්මලේ ජලාශය හා පොල්ගොල්ල හැරවුම තුළින් ප්‍රමාණවත් ජල ධාරිතාවක් ලබා දීමට හැකි වූ නිසාය.

2009 වසරේ යල කන්නයේ එවකට පැවැතුණු ජල හිඟය නිසා මෙම ගොවි බිම්හි වගා කිරීමට හැකි වූයේ ඉහත කී සමස්ත බිම් ප්‍රමාණයෙන් සියයට 50ක් පමණකි. 2003 වසරේදීද ඇති වූ දැඩි නියඟය නිසා ඉහත කී ව්‍යාපාරයන්හි පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාව තුළම වී වගා කළ හැකි බිම් ප්‍රමාණය බෙහෙවින් අඩු වූ අතර එකී ප්‍රදේශයන්හි වී නිෂ්පාදනයද සැලෙන ප්‍රමාණයකින් අඩු වූ බව මතක් කර දෙනු කැමැත්තෙමි. මෙම වසරේ ඇති වී ඇති තත්ත්වය 2003 නියඟය නිසා මෙම ප්‍රදේශවල ඇති වූ තත්ත්වයට බෙහෙවින් සමානය.

මෙම කාලගුණික තත්ත්වය පිළිබඳව ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට මතක් කර දෙනුයේ, මෙම ප්‍රශ්නය මෙම වසරේදී පමණක් අහම්බෙන් සිදු වූවක් නොව ගෝලීය උණුසුම්කරණය නිසා ලෝකයේ දැනට ඇති වී ඇති කාලගුණික හා දේශ ගුණික රටාවන්ගේ වෙනස් වීමේ බලපෑම් ශ්‍රී ලංකාව තුළද ඇති වීම නොවැළැක්විය හැකි කරුණක් වන හෙයින් එවැනි අවස්ථාවලදී ගත හැකි ක්‍රියා මාර්ගයන් ඉතා අල්ප හෙයිනි.

සමස්ත ශ්‍රී ලංකාව තුළ ඉදිරි කන්නය වගා කිරීම සඳහා ජලය නිකුත් කිරීමේ රටාව විශ්ලේෂණය කිරීමේදී ඉහත කී ව්‍යාපාරයන් හැරුණු විට කුරුණෑගල දිස්ත්‍රික්කයේ බතලගොඩ, හක්වඩුන ඔය හා සමහර කුඩා ව්‍යාපාර කිහිපයක් හැර දිවයිනේ අනිකුත් සෑම ව්‍යාපාර සඳහාම පසු ගිය වසර තුළ වගා කළ ඉඩම් ප්‍රමාණයම වගා කිරීම සඳහා නිසි ජල කළමනාකරණයක් තුළින් වාරි ජලය ලබා දීමට කටයුතු කර ඇති අතර මෙම කන්නය තුළ එසේ ජලය ලබා දීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හැකි වනු ඇත.

ගිරිතලේ ඇතුළු ඉහත ගරු මන්ත්‍රීතුමා දක්වා ඇති වාරි මාර්ග ව්‍යාපාර සඳහා ජලය සම්පූර්ණ ප්‍රමාණය ලබා දීමට නොහැකි වීමට තුඩු දුන් පසුබිම විස්තර කර දීමට කැමැත්තෙමි. [බාධා කිරීමක්] මේක අහගන්න. එතකොට ඔබතුමාට තේරෙයි.

ගිරිතලේ ඇතුළු ඉහත කී ව්‍යාපාර සඳහා අවශ්‍ය ජලය ලබා ගනුයේ ඉහළ මධ්‍යම කඳුකරයේ පිහිටා ඇති කොත්මලේ ජලාශයේ ගබඩා වී ඇති ජලය මහවැලි ගඟ හරහා පොල්ගොල්ල වේල්ලෙන් හරවා යැවීමෙනි. කොත්මලේ ජලාශය සඳහා ඉහළ කඳුකරයෙන් ගලා එන උල්පත් ජලයත්, ඉහළ කඳුකරයේ පිහිටි වන බිම් හා ජල දහරා ප්‍රදේශ මත පතිත වන වර්ෂා ජලයත් එකතු කර ගන්නා අතර, පොල්ගොල්ල හැරවුමට වර්ග කිලෝමීටර් 612ක ජල පෝෂක ප්‍රදේශයක් වෙත පතිත වන වර්ෂාවෙන් ජලය ලැබේ. කොත්මලේ සිට පොල්ගොල්ල දක්වා ගෙන එනු ලබන ජලය පොල්ගොල්ල හැරවුමේ ජල පෝෂිත ප්‍රදේශයට ලැබෙන ජලයද එකතු කොට ගෙන උකුවෙල ජල විදුලි බලාගාරය හරහා සුදු ගඟට නිදහස් කොට එතැනින් බෝවතැන්න ජලාශයටත්, එතැනින් දඹුලු ඔය හරහා කලා වැවටත්, මින්නේරිය, යෝධ ඇළ ඔස්සේ ගිරිතලේ ජලාශයටත් ලබා දෙයි. එහෙයින් ගිරිතලේ, කලා වැව ඇතුළු ඉහත කී ජලාශ සඳහා ජලය ලබා දීමට නම් ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් කොත්මලේ ජලාශයටත්, පොල්ගොල්ල හැරවුමටත් ස්වභාවධර්මයාගේ ආශිර්වාදයෙන් ලැබිය යුතුය.

පසු ගිය අවුරුදු 30ක ජලය ලැබීමේ සාමාන්‍යය ගණනය කළ විට සෑම වසරකම මැයි මාසයේදී කොත්මලේ ජලාශයට ජලය අක්කර අඩි 41,300ක ප්‍රමාණයක්ද, පොල්ගොල්ල ජලාශයට ජලය අක්කර අඩි 71,000ක්ද එකතු වේ. - සාමාන්‍ය වර්ෂාපතනය තිබුණා නම් - මෙම ජල පෝෂක ප්‍රදේශ දෙක සඳහා වැඩිම වර්ෂාපතනයක් බලාපොරොත්තු වන්නේ මැයි හා ජුනි මාසවලදීය. මෙම වර්ෂයේ මැයි මාසයේ කොත්මලේ ජලාශය සඳහා වර්ෂාවෙන් ලැබී ඇති ජල ප්‍රමාණය අක්කර අඩි 8,900ක් පමණක් වන අතර පොල්ගොල්ල හැරවුමට ලැබී ඇත්තේ අක්කර අඩි 10,500ක් පමණකි. මෙසේ ලැබී ඇති ජල ප්‍රමණය එකී ප්‍රදේශ හා මහවැලි ගඟ ආශ්‍රිත ජනතාවගේ ගෘහස්ත ජල පරිභෝජනය සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයටත් වඩා අඩු ප්‍රමාණයක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

දැනට මෙසේ එකතු වී ඇති ජල ප්‍රමාණය සම්පූර්ණයෙන් මුදා හැරියහොත් පානීය ජල අවශ්‍යතාව සපුරා දීමට නොහැකි වන බව අප විසින් පැහැදිලිව තේරුම්ගත යුතුවේ. එසේම 2010 වර්ෂයේ මැයි මස තුළ කොත්මලේ ප්‍රදේශයට පතිත වුණු වර්ෂාව මිලිමීටර් 351ක් වන අතර, 2011 වර්ෂයේ දී එය මිලිමීටර් 142ක් විය. පොල්ගොල්ල ප්‍රදේශයට එලෙස පතිත වුණු වර්ෂාව මිලිමීටර් 97ක් වුණු අතර, 2011 වර්ෂයේ දී මිලිමීටර් 51ක් වේ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ වර්ෂවල දී විශාල ජල ප්‍රමාණයක් ගබඩා කර ගන්න බැරි වුණේ.

මෙම වර්ෂයේ මැයි මාසයේ දී කොත්මලේ ජල පෝෂිත ප්‍රදේශයට ලැබුණු වර්ෂාව මිලිමීටර් 19ක ඉතා සුළු අගයක් බවද, පොල්ගොල්ල ජල පෝෂිත ප්‍රදේශයට ලැබුණු වර්ෂාව මිලිමීටර් 2ක් පමණ බවද වැඩිදුරටත් අවධාරණය කළ යුතුව ඇත.

ඉහත කී කරුණු අනුව මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ පෙන්වා දී ඇති ප්‍රදේශවල ගොවි ජනතාවට කුඹුරු ගොවිතැන් සඳහා ජලය ඔවුන් ඉල්ලා සිටින පරිදි ලබා දීමට නොහැක්කේ මන්ද යන්න දැන් වඩාත් පැහැදිලිව ගරු මන්ත්‍රීතුමාටත් ගොවි ජනතාවටත් තේරුම් ගත හැකි වනු ඇත. රජරට ගොවි ජනතාව කලා වැව බැම්ම මත දේව කන්නලව්වක් කළ බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර ඇත. එයින්ද පෙනී යන්නේ ගොවි ජනතාව මෙම ප්‍රශ්නය ගැඹුරින් තේරුම් ගෙන ඇති බවත් වර්ෂාව නොලැබුණහොත් ජලය ලබා දීමට රජයට හා වාරි මාර්ග දෙපාර්තමේන්තුවට මෙන්ම මහවැලි අධිකාරියටවත් නොහැකි බව ඔවුන් පැහැදිලිවම තේරුම් ගෙන දේව කන්නලවු කර වැස්ස ප්‍රාර්ථනා කරන බවත්ය.

ගරු මන්ත්‍රීතුමා විසින් සිය ප්‍රකාශයෙන් කරන ලද ගැටලුව පිළිබඳව යථා තත්ත්වය පැහැදිලි කිරීම මාගේ යුතුකමකි. වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරින් ජලාශවල රැඳී තිබූ ජල ප්‍රමණය පිළිබඳ නිසි තක්සේරුවක් කිරීමෙන් අනතුරුව අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ, බදුල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන්, අදාළ සියලුම රාජ්‍ය නිලධාරින් හා අදාළ සියලු ගොවි සංවිධාන නියෝජිතයන් පේරාදෙනිය ගන්නෝරුවට කැඳවා 2012 මාර්තු 30වන දින පවත්වන ලද මහවැලි ජල පාලන රැස්වීමේදී 2012 යල කන්නයේ ජල තත්ත්වය හා ඒ අනුව සිදු කළ හැකි වගා සැලසුම් පිළිබඳව දැනුවත් කරන ලදී.

එහිදී ගිරිතලේ සහ කලාවැව ව්‍යාපාර සඳහා නිර්දේශ කරනු ලැබුවේ සියයට 40ක වී වගාවක් සහ සියයට 40ක අතිරේක භෝග වගාවකි.

2012.04.10වන දින ක්ෂේත්‍රයේ පවත්වනු ලැබූ කන්න රැස්වීමේදීද නැවතත් ගිරිතලේ ව්‍යාපාරයේ ගොවි ජනතාව දැනුවත් කළ අතර, කලාවැව ව්‍යාපාරයටද මේ සම්බන්ධව විශේෂ ව්‍යාපාර කමිටු රැස්වීමක් පවත්වා එම දැනුවත් කිරීම කර ඇත.

අපි මුලින්ම කිව්වා, මෙන්න මේ විධියටයි කරන්න පුළුවන් වෙන්නේ තිබෙන ජලය අනුව කියලා.

නමුත්, ගොවීන් විසින් මෙම උපදෙස්වලට පටහැනිව අත්තනෝමතික ලෙස සියයට 100ක් වී වගාව සඳහා කටයුතු කර ඇත. එසේ සිදු කොට දැන් සියයට 100ක් වී වගාව සඳහා ජලය බලාපොරොත්තු වේ. මෙය කොතරම් දුරට යුක්ති සහගතද, සාධාරණද, ප්‍රායෝගිකද යන්න ප්‍රශ්න කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ගොවීන් ණය ගැනීම, තෙල්, පොහොර සඳහා ආයෝජනය කිරීම ගැන ගරු මන්ත්‍රීතුමා විසින් සානුකම්පික ලෙස කර ඇති ප්‍රකාශය පිළිබඳව පැවැසිය යුත්තේ, මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් නොසලකා හරිමින් මෙලෙස අත්තනෝමතික ලෙස කටයුතු කිරීම ගැන රජයට දොස් පැවරීම කිසිසේත් සාධාරණ නොවන බවය.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

"අපි වවමු - රට නඟමු" වැඩ පිළිවෙළ මහා පාප කර්මයක් ලෙස හැඳින්වීම අතිශයින් ඛේදජනකය. ශ්‍රී ලංකාවේ පාරිභෝගික අවශ්‍යතාවට වඩා විශාල ප්‍රමාණයක් එළවලු නිෂ්පාදනය සිදු වූ නිසා එළවලු මිල ටික කාලයක් පහත වැටී තිබුණද දැන් ඒ සඳහා ස්ථාවර මිලක් ලැබී ඇත. මෙයින් පෙනී යන්නේ "අපි වවමු - රට නඟමු" වැඩ පිළිවෙළ හුදු සටන් පාඨයක් නොව, එය අර්ථවත් වූ ක්‍රියාවලියක් වූ බවය. ඒ පිළිබඳව විපක්ෂය සතුටු වනු වෙනුවට සාවද්‍ය අර්ථ කථනයක් ලබා දීම කනගාටුවට කරුණකි. ඉහත කී ව්‍යාපාරවලින් පූර්ණ ජල ප්‍රමාණයක් නිකුත් කරන බවට කිසිදු ලිඛිත හෝ වාචික පොරොන්දුවක් වාරිමාර්ග හෝ මහවැලි නිලධාරින් විසින් ලබා නොදුන් බව තරයේ ප්‍රකාශ කරමි. වරින් වර අදාළ ස්ථානවලට ගොස්, අත්තනෝමතිකව උපදෙස්වලට එරෙහිව මෙසේ කටයුතු කිරීමෙන් මුහුණ පෑ හැකි මෙවැනි ඛේදනීය තත්ත්වය පිළිබඳව මාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරින් විසින් ගොවි ජනතාව දැනුවත් කර ඇත.

ඕනෑම ප්‍රශ්නයකදී බහු ජාතික සමාගම් නමැති ගෝනි බිල්ලකු ඉස්මතු කොට පෙන්වා, මෙම ජල හිඟයද බහු ජාතික සමාගම්වලට උපකාර කිරීමක් හා සම්බන්ධ බව පෙන්වමින් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කිරීම හාස්‍යජනකය. සමහර ප්‍රදේශවල ගොවි ජනතාවට වී වගා නොකොට අතිරේක භෝග වගාව සඳහා යොමු වන ලෙස නිලධාරින් උපදෙස් දී ඇත්තේ එකී ප්‍රදේශවලට වී වගාව සඳහා අවශ්‍ය ජලය සැපයීමට නොහැකි වූ අවස්ථාවලදී පමණකි.

කොත්මලේ ජලාශයෙන් වාරි කටයුතු සඳහා නිකුත් කරනු ලබන ජලය වාරි ජල අවශ්‍යතාවන් මත වරින් වර මුදා හරිනු ලැබේ. මෙය ක්‍රමානුකූල සැලැස්මක් මත සිදු කරන්නකි. ලංකා විදුලිබල මණ්ඩලයට අයත් turbines හරහා මෙම ජලය නිකුත් කරන අතර, එයින් විදුලිය නිෂ්පාදනයද සිදු වේ. තවද මෙම සමස්ත ජලයම වාරි කටයුතු සඳහා නැවත යොදා ගන්නා බව දන්වනු කැමැත්තෙමි. මේ පිළිබඳව යම් සැකයක් පවතී නම් කොත්මලේ විදුලි බලාගාරයට ගොස් එය සියැසින් දැක බලා ගැනීමේ අවස්ථාව සලසා දීමට මා ඕනෑම අවස්ථාවක සූදානම්ය.

2010 සහ 2011 වර්ෂවල මැයි මාසයේදී කොත්මලේ ජලාශයේ විදුලි උත්පාදනය පිළිවෙළින් ගිගාවොට් පැය 33ක් සහ 42ක් විය. නමුත්, පසු ගිය මැයි මාසයේදී එය ගිගාවොට් පැය 5ක් දක්වා පහත බැස ඇත.

ඒ කියන්නේ ඔබතුමා හෝ කවුරු හෝ කියනවා නම් අපි මේ සඳහා වැඩිය,-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අප්‍රේල් මාසයේ කීයද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
කියන්නම්, පොඩ්ඩක් ඉන්න. මේක අහගන්නකෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අප්‍රේල් මාසය ගැන කියන්නකෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමාට ප්‍රකාශය කරන්න අවස්ථාව දෙන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මේ අනුව ගරු මන්ත්‍රීතුමා විසින් නඟා ඇති පළමුවැනි ප්‍රශ්නයට පිළිතුර වශයෙන්, ගිරිතලේ ව්‍යාපාරය ඇතුළු වාරි පද්ධතිය සඳහා මහවැලි ජලය ලබා නොදීමේ තීරණයක් ගෙන නැති බව දන්වමි.

නමුත් ලබා දිය හැකි ජල ප්‍රමාණය දැනට ජලාශවල ඇති ප්‍රමාණය හා ඉදිරි කාලයේදී ජලාශවලට ලැබෙන ජල ප්‍රමාණය මත රඳා පවතිනු ඇත.

කන්න රැස්වීමේ දී එළඹෙන තීරණවලට පටහැනිව වගා කරන ලද කුඹුරුවලට අඛණ්ඩව ජලය සැපයීම මාගේ ප්‍රකාශයේ පළමු වැනි කොටසේ සඳහන් තාක්ෂණික හා කාලගුණික තත්ත්වයන් අනුව කළ නොහැකි බව ගොවි ජනතාව දන්නා කරුණකි.

අනාගතයේ දී මෙවැනි කාලගුණික තත්ත්වයන් නිසා ඇති වන ජල ප්‍රශ්නය විසඳීම සඳහා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළින් මොරගහකන්ද හා කළු ගඟ ව්‍යාපෘති ආරම්භ කර ඇත. මේ වන විට රජයේ අරමුදලින් රුපියල් මිලියන 5,000ක් පමණ යොදවා එම වැඩ කටයුතු ආරම්භ කර ඇති අතර, මොරගහකන්ද ප්‍රධාන වේල්ලේ කැණීම් කටයුතු සඳහා ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 252ක ගිවිසුම සයිනෝ හයිඩ්‍රෝ කෝපරේෂන් ආයතනය සමඟ හෙට අත්සන් තබනු ඇත. මොරගහකන්ද හා කළු ගඟ ජලාශ ඉදි කිරීමෙන් අනතුරුව වැඩි ජල ප්‍රමාණයක් කලා වැව, ගිරිතලේ හා ඇලහැර ප්‍රදේශවලට ලබා දිය හැකි වනු ඇත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය මෙරට ආර්ථික සංවර්ධනය උදෙසා සුවිශේෂී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යන අතර, එය සාර්ථක කර ගැනීම සඳහා ජනතා සහයෝගයත්, නිසි අවබෝධයත් අවශ්‍ය වේ. එහෙයින් ලෝකයේ කාලගුණ විපර්යාසයන් සමඟ ඇති වී ඇති විවිධ අභියෝග තේරුම් ගනිමින් තැන් තැන්වල බෝඩ් ලෑලි ඔසවා උද්ඝෝෂණය කිරීම් තුළින් මෙවැනි ප්‍රශ්නවලට විසඳුම් ලබා ගත නොහැකි බව තේරුම් ගත යුතු කාලය දැන් එළඹ තිබේ.

අපගේ නිලධාරින් විසින් කන්න රැස්වීම්වලදී ලබා දුන් උපදෙස් නිසි ලෙස පිළිපදිමින් වගා කිරීම අත්හිටවූ හා වගා බිම් ප්‍රමාණය අඩු කළ ඇලහැර, හුරුලුවැව, පෝෂිත ඇළ, කණ්ඩලම හා මින්නේරිය, යෝධ ඇළ ගොවීන්ට ඔවුන්ගේ ආචාරශීලීත්වය, හික්මීම හා නීතිගරුක බව පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ස්තුතිය මෙම සභා ගර්භය තුළ ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.යෝජනා අංක 1 - ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද ප්‍රශ්නය, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, හෙට සවස් වරුවේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයට ගන්නා යෝජනාවක් මම අද උදේ ඔබතුමාට භාර දුන්නා. ඇත්ත වශයෙන්ම ඒ යෝජනාවෙන් මම අහලා තිබෙන්නේ රට ගැනයි. මම කිසිම පුද්ගලයකුගේ නමක් සඳහන් කරලාත් නැහැ. තනතුරක් කියලාත් නැහැ. මෙහි සඳහන් වන්නේ 2012 ජුනි මස 06 වැනි දින පෙරවරුවේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ගැන මම තීරණයක් දුන්නා නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ රට ගැනයි. රටට වෙච්ච අවමානයක් ගැනයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මගේ මතය අනුව මෙය හදිසි ප්‍රශ්නයක් හෝ ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් නොවන බව තේරුණ නිසා එයට ඉඩ දුන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාගේ ලිපියේ එහෙම සඳහනක් කරලා නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමා යම් තීන්දුවක් දුන්නායින් පස්සේ, ගරු කථානායකතුමාගේ තීන්දුව අභියෝගයට ලක් කරන්න බැහැ. You cannot challenge the Hon. Speaker's Ruling.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකුතමනි, ඔබතුමාගේ ලිපියේ වගන්තියක් සඳහන් කරලා නැහැ. ඔබතුමා එවන ලද ලිපියේ සඳහන් කර තිබෙන්නේ "2012 .06.08 වැනි දින සභාව කල් තබන අවස්ථාවේ විවාදයට ගැනීමට ඔබ විසින් එවන ලද ඉහත යෝජනාව ස්ථාවර නියෝගවලට අනුව විවාදයට ගැනීමට අවසර දිය නොහැකි බව" -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, මම කිව්වා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි. ගරු කථානායකතුමනි, අපේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමා ලිපියක් එවා තිබෙනවා. ඔබතුමා කිව්වා, මෙය හදිසි පොදු වැදගත් කරුණක් නොවෙයි කියලා. නමුත් ඔබතුමාගේ ලිපියේ එහෙම සඳහන් කරලා නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා හේතුවක් දෙන්න ඕනෑ. ඔබතුමාත් අවුරුදු 20ක් තිස්සේ පාර්ලිමේන්තුවේ ඉන්න කෙනෙක්. මගේ යෝජනාව පිළිගන්නේ නැත්නම් ඔබතුමා හේතුවක් දෙන්න ඕනෑ. වගන්තියක් දෙන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඒක කිව්වා නේ. මගේ මතය අනුව, මෙය හදිසියේ-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ රට ගැන -[බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට තිබෙනවා, ඒ ගැන යම්කිසි අයිතියක්. ඔබතුමන්ලා ඉදිරිපත් කරන ඒවා අවශ්‍ය නම් ඉවත් කරන්න මට පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට අයිතිය තිබෙන එක ඇත්ත. ඔබතුමාගේ අයිතිය සාධාරණව පාවිච්චි කරන්න ඕනෑ. ඔබතුමාට අයිතිය තිබෙනවා. අපටත් අයිතිය තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අයිතිය තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ අයිතිය සාධාරණව පාවිච්චි කරන්න ඕනෑ. ඔබතුමාට ඒ අයිතිය හිතුවක්කාර විධියට පාවිච්චි කරන්න බැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හිතුවක්කාර විධියට නොවෙයි. ඒක තමුන්නාන්සේගේ අර්ථකථනයක්. මේක මමයි තීරණය කළේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
You cannot intimidate the Chair.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Hon. Member cannot be allowed to challenge the Chair. - [*Interruption.*]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, කරුණාකරලා ඒක ඉවත් කර ගන්න. නැත්නම් සභාවෙන් එළියට යන්න. [බාධා කිරීම්] කරුණාකරලා සභාවෙන් එළියට යන්න. කරුණාකරලා සභාවෙන් එළියට යන්න. [බාධා කිරීම්] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා සාධාරණව කටයුතු කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාධාරණව තමයි කටයුතු කරන්නේ. අසාධාරණව- [බාධා කිරීම්]

මම පැහැදිලිව මගේ මතය ප්‍රකාශ කළා. ඊට පස්සේ ඒක ගැන තර්කයක් කරන්න වැඩක් නැහැ. මොනවා හරි තිබෙනවා නම් ඇවිල්ලා කථා කරන්න. අපි ඊළඟට බලමු. [බාධා කිරීම්] හරි, එහෙනම් මගේ මතය ප්‍රකාශ කරලා ඉවරයි. [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අවශ්‍ය ප්‍රශ්න නේ කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? [බාධා කිරීම්] මෙතැන අනවශ්‍ය විධියට කථා කරන්න එන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හතර මං හන්දියේ පෙන්වලා කාමරයේ සාකච්ඡා කරන්න දෙයක් නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Speaker, you should not allow him to challenge the Chair.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, මම දැන් තමුන්නාන්සේට කිව්වා. යම් කිසි ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම තනිව හොඳට සලකා බලා තමයි ඒ තීරණය දුන්නේ. එහෙම නැතිව කිසි කෙනෙක් කියන දෙයක් නොවෙයි මම කරන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේකේ කිසිම නමක් සඳහන් කරලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක තමයි කිව්වේ. නමක් සඳහන් කරලා නැහැ. ඉතින් මේකේ ජාතික වැදගත්කමකුත් නැහැ. මගේ මතය; මට පෙනෙන හැටි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You should send him out of the House.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා තමුන්නාන්සේ ඉස්සෙල්ලා යන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ රටට දුන් අවස්ථාවක් අහිමි කරලා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නොහැකියාව නිසා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක තමුන්නාන්සේගේ මතය. නමුත් අපි බලන්න ඕනෑ මේ වෙලාවේ මේක ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්නයක්ද කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම දෙයක් ඔබතුමාගේ ලිපියේ නැහැ. ඒකයි මම කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඒක බලන්නම්, ඒ ලිපියේ කොහොම තිබෙනවාද කියලා. මම ලේකම් මණ්ඩලයට උපදෙස් දුන් විධියට තමයි ඒක කරලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියනවා නම්, මම අහපු ප්‍රශ්නය ජාතික වැදගත්කමක් නැහැ කියලා. නමුත් ඔබතුමාගේ ලිපියේ එහෙම එකක් නැහැ. ඒකයි මම කියන්නේ. නියෝජ්‍ය මහලේකම්තුමා එකක් කියනවා, ඔබතුමා තව එකක් කියනවා. මේ ලිපියේ එහෙම නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම ඒක බලන්නම්, ගරු මන්ත්‍රීතුමා. මම උපදෙස් දුන්නේ අර විධියට.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගර කථානායකතුමනි, මම හිතන හැටියට මේ ප්‍රශ්නය ගැන විවිධ අදහස් තිබෙනවා, ආණ්ඩුවේත්, ඒ වාගේම විරුද්ධ

පක්ෂයේත්. ඊයේ ඇති වුණු සිද්ධියක්. ඒක වැදගත් නොවෙයි කියලා හිතනවා නම්, ඉස්සෙල්ලා පක්ෂ නායකයින් එක්ක සාකච්ඡා කරන එක වැදගත්. එතකොට අපට පුළුවන් මෙතැනට එන්න. මෙතුමාගේ යෝජනාව මම දැක්ක හැටියට ආණ්ඩුවෙන් ප්‍රකාශයක් ඉල්ලා තිබුණා විතරයි. එච්චරයි මම කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද හවස 2.30ට පක්ෂ නායක රැස්වීම තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මේ සභාව තුළදීත් යම් කිසි ක්‍රියාදාමයක් තිබෙන්න ඕනෑ මේ ප්‍රශ්නය වැදගත්ද නැද්ද කියලා දැන ගන්න. මේ වුණු සිද්ධිය අපිත් අනුමත කරන්නේ නැහැ. මම හිතන හැටියට පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයට වග කීමක් තිබෙනවා. ඒ රැස්වීම ඒ ගොල්ලන්ම ඒක ආරක්ෂා කර ගන්න ඕනෑ. මම හිතන හැටියට මෙතුමා අහලා තිබෙන්නේ මේ පිළිබඳව ආණ්ඩුවේ ප්‍රකාශයක් ගැන. ඊට පස්සේ අපට තීරණය කරන්න පුළුවන් විවාදයකට යනවාද නැද්ද කියලා. මම හිතන හැටියට විරුද්ධ පක්ෂයෙන් මෙතුමා කියන්නේ එච්චරයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක තමයි කිව්වේ. තීරණයක් දුන්නා. පක්ෂ නායක රැස්වීමේදී ඒක තීරණය කරන්න. ඊට පස්සේ දෙපක්ෂය සාකච්ඡා කරලා තීන්දුව ගන්න. එච්චරයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ ලිපියේ නමක් සඳහන් වෙන්නේ නැහැ. මම අහලා තිබෙන්නේ රට ගැන.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, දැන් අපි මේක තීරණය කළා. අද පස්වරු 2.30ට පක්ෂ නායකවරු රැස් වෙනවා. එතැනදි සාකච්ඡා කරලා වෙනම විවාදයක් ඉල්ලා ගන්න.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනා අංක 2. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. එතුමා නැත.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාව කල් තැබීමේ යෝජනාව, ගරු රවි කරුණානායක මහතා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF *COMMITTEES* [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, you may move the Adjournment Motion now.

## ජීවන වියදම ඉහළ යෑම මැඬ පැවැත්වීම සහ රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ වඩා හොඳ පාලනයක්
## வாழ்க்கைச்செலவு அதிகரிப்பைத் தடுத்தல் மற்றும் பொது நிதி மீதான சிறந்த கட்டுப்பாடு
## ARREST OF INCREASE IN COST OF LIVING AND EXERCISE OF BETTER CONTROL OVER PUBLIC FINANCE

[අ.භා. 2.41]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am happy to move this Adjournment Motion while you are in the Chair.

[ගරු රවි කරුණානායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"2012 මැයි මස 22 වැනි දින යෝජනා කිහිපයක්ම ඉදිරිපත් කරන ලදුව විවාදයකින් තොරව සම්මත කළ හෙයින්ද,

එකී යෝජනා නිශ්චිත වශයෙන් පහත සඳහන් පරිදි විවිධ විෂයයන්ට අදාළ වන හෙයින්ද:

1. දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
2. අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
3. වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම සඳහා අත්තිකාරම් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
4. කෘෂි කාර්මික ගොවිපළ නඩත්තු හා බීජ අළෙවි අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. රජයේ කර්මාන්තශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම සහ කළ වැඩ අත්තිකාරම් ගිණුම
6. පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අළෙවිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
7. රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගෙවීම පිළිබඳ නියමයක්

තවද, මෙකී සියලු නියමයන් හේතුවෙන් රාජ්‍ය වියදමේ විචලනයන් සහ වැඩිවීම් සිදු වන හෙයින්ද, සහ

මෙකී වැඩිවීම් සඳහා යෙද වෙන මුදල කිනම් හෝ අයුරකින් මහජනයා හට දැරීමට සිදු වන හෙයින්ද, සහ

රාජ්‍ය අරමුදල් පරිහරණය කිරීමේදී ඒ පිළිබඳව ඇති පාලනය හෝ සුපරීක්ෂණය ඉතා අඩු මට්ටමක පැවතීම හෝ එවැන්නක් නොමැති බව පෙනී යන හෙයින්ද, සහ

පවත්නා රෙගුලාසිවලට පටහැනි වන පරිදි දෙපාර්තමේන්තු කිහිපයකම උපයන විට බදු අදාළ සේවකයාගෙන් අය කර ගැනීම වෙනුවට රජය විසින් ගෙවා ඇති බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වන ගරු ඩී.ඊ.ඩබ්ලිව්. ගුණසේකර මහතා විසින් සිදු කළ ප්‍රකාශයෙන් මේ බව මුලින්ම හෙළි වූ හෙයින්ද, සහ

වැය ශීර්ෂ අංක 240හි පවතින අරමුදල් ඉතා දැඩි ලෙස නොමනා අයුරින් පරිහරණය කර ඇති හෙයින්ද, සහ

ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා සේවක අර්ථසාධක අරමුදල වැනි රජය භාරයේ පවතින අරමුදල් රජයට සහ අවසානයේදී සේවක අර්ථසාධක අරමුදලේ හිමිකාරිත්වය දරන සේවකයින්ට මෙන්ම බැංකුවේ තැන්පත්කරුවන්ටද පාඩු විඳීමට සිදු වන අයුරින්, සැබෑ මිල අබිබවා ගිය ඉහළ අධි මිලකට, බැංකුවල සහ අනෙකුත් ආයතනවල කොටස් මිලදී ගැනීම සඳහා යොදා ගැනීම සිදු වන හෙයින්ද,

ජීවන වියදම තව දුරටත් ඉහළ යෑම මැඩ පැවැත්වීම සඳහාත් රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ වඩා හොඳ පාලනයක් ඇති කිරීම සඳහාත් ගැනීමට අපේක්ෂා කරන පියවර කවරේදැයි රජය විසින් මෙම සභාවට දැනුම් දිය යුතු යැයි මෙම සභාව යෝජනා කර සිටියි."

මම මේ අදහස් ඉදිරිපත් කරන්නේ අද රටේ තිබෙන බැරෑරුම් ආර්ථික තත්ත්වය මුල් කොටගෙනයි. එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි අද ඉතාමත් ඕනෑකමින් මේ රටේ ආර්ථිකයේ සිදු වන දේවල් බලා ගෙන ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්න කල්පනා කරනවා.

මේ පාර්ලිමේන්තුවේ ඇමතිවරු ගණනාවක් සිටියත්, මේ වෙලාවේ මේ ගරු සභාවේ ඉන්න අයට රටේ බැරෑරුම් තත්ත්වය පෙන්වා දීම අපේ යුතුකමක් වනවා. මේ අවස්ථාවේදී මේ කල් තබන යෝජනාව යටතේ අපට පෙනෙනවා, අද මේ බංකොලොත් වෙලා තිබෙන ආණ්ඩුව නොයෙක් ක්ෂේත්‍ර තුළින් අන්තිම පිදුරු ගහෙත් එල්ලෙන්න හදන ගමනක් තමයි මේ යන්න හදන්නේ කියලා.

ඒ අනුව සියලුම සල්ලි, සංචිත තිබෙන ආයතන මේ ආණ්ඩුවේ මූල්‍යකරණයට හා අවශ්‍යතාවට පාවිච්චි කරන ක්‍රමයක් තමයි තිබෙන්නේ. රටක ආර්ථිකය සුබ සාධනයට සහ රටේ සංවර්ධනයට යොමු කරන්න පුළුවන්. රටක් අය වැයක් ඉදිරිපත් කරලා ඉලක්ක කරන්නේ මේ රටට අදට වඩා හොඳ ආර්ථික තත්ත්වයක්, ඉදිරි දැක්මක් සහිත වැඩ පිළිවෙළක් හෙට ක්‍රියාත්මක කරන්නයි. මේ ආණ්ඩුවේ එවැනි දෙයක් තිබෙනවාද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. පඩි වැඩි කිරීම ආණ්ඩුවක් කළ යුතු දෙයක්. මම හිතන හැටියට වියදම අඩු කිරීම සහ දූෂණය නැති කිරීම ආණ්ඩුවේ ප්‍රධානම කාර්ය භාරයක් ලෙස අද ජනතාව බලාපොරොත්තු වනවා. නමුත් ඊට හාත්පසින් වෙනස් දේවල් වෙන්නේ. දූෂණය, අක්‍රමිකතා සහ අලසකම ඔහේ වැඩි වී ගෙන යන විට රටේ තිබෙන ආදායම අඩු වෙලා, වියදම වැඩි වීම ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අද රටේ නීතිය වල්මත් වෙලා තිබෙනවා. අද නීතිමය ප්‍රශ්නයකට උසාවි ගියොත් වැරදිකරු නිවැරදිකරු වෙනවා, නිවැරදිකරු වැරදිකරු බවට පත් වෙනවා. පොලීසියට යනවාට වඩා පාතාල ලෝකයට ගිහින් ප්‍රශ්න විසඳන යුගයකට තමයි අද රට තල්ලු වෙන්නේ. නීතිය ආණ්ඩුව විසින්ම නැති කර ගෙන යනවා. අද ආදායම උපයන විට බදු යටතේ රුපියල් කෝටි 1,100ක් උපයන්න ආණ්ඩුව ඉලක්ක කරලා තිබෙනවා. නමුත් මේ ආණ්ඩුව ඒවා නොතකා ආයතන 29ක් ආණ්ඩුවේ හිතුමතයට, තමන්ගේ ඕනෑකමට, ඕනෑ විධියට පාවිච්චි කරලා ඒක උල්ලංඝණය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම බැරෑරුම්, ඉතාමත් භයානක, පාර්ලිමේන්තුවක මෙතෙක් දුරට වෙලා නැති දේවල් තමයි මේ රටේ පාර්ලිමේන්තුවේ වෙන්නේ. අය වැයක් ඉදිරිපත් කළාම එහි වැය ශීර්ෂ අනුව කටයුතු කිරීම තමයි සාමාන්‍ය සම්ප්‍රදාය. නමුත් මේ ආණ්ඩුව ඒ සම්ප්‍රදායට පයින් ගහලා වැය ශීර්ෂ 240 යටතේ පරිපූරක ඇස්තමේන්තු ගේන්න තිබෙන අවස්ථාවත් නැති කර ගෙන යන ගමනක් තමයි පේන්න තිබෙන්නේ. ඒ සම්බන්ධව තමයි අද අපි විපක්ෂයක් වශයෙන්, ඇහුම් කන් නොදෙන, ජනතාවගේ අසරණ භාවයට ඇහුම් කන්නොදෙන ආණ්ඩුවකට පෙන්වලා දෙන්න හදන්නේ. ඒ සම්බන්ධයෙන් අපට පෙන්වන්න පුළුවන් වන්නේ මොනවාද, කොහොමද? කොයි ආකාරයෙන්ද මේක කියන්නේ? හිටපු මුදල් ඇමති ගරු සරත් අමුණුගමට මැතිතුමාට මට නැවත නැවත කියන්න අවශ්‍යතාවක් නැහැ. එතුමා දන්නවා මොනවාද අපි කියන්න යන්නේ කියලා. නමුත් ඒ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු අද ඉල්ලීමක් කරලා තිබෙනවා, අනේ අපට මීට වැඩිය වැඩ කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා. අපිත් ඒකට එකඟ වෙනවා. මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන අවස්ථාවේ අදක්ෂතාවෙන් පෙළෙන ඇමතිවරු පැත්තකට දාලා, ඒ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු පාවිච්චි කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලන්න මොනවාද වෙලා තිබෙන්නේ කියලා. අය වැය හිඟයක් තිබෙනවා. දවසින් දවස ඒක වැඩි වෙනවා. ලෝකයේ ආර්ථිකය එසේ මෙසේ ගමනක් නොවෙයි යන්නේ. අමාරු ගමනක්. ඒ වාගේම ලංකාවේ ආර්ථිකයත් ඒ ආකාරයෙන්ම හැලහැප්පිලි තුළින්, අමාරු තත්ත්වයක් තුළින් තමයි ගමන් කරන්නේ. ඒක වළක්වන්න බැහැ. කවුරුත් ඒක නැහැයි කිව්වොත් ඒක අධි තක්සේරු කිරීමක් විතරයි. ඊට වැඩිය හොඳයි නිහතමානීව පිළිගන්න, ලෝක ආර්ථිකයේ ප්‍රශ්නයකුත් තිබෙනවා, ලංකාවේ ආර්ථිකයේ ප්‍රශ්නයකුත් තිබෙනවා කියලා. අපි කොහොමද මේ ජාතික ආර්ථිකය ඉදිරියට ගෙන යන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් ඇති කරන්නේ කියන එක බලන්න. ඔබතුමන්ලාගේ රජයේ නිලධාරින් අද දේශපාලන කටයුතු කරලා, තිබෙන ආර්ථිකයත් නැති කර ගෙන යන තැනට කටයුතු කරන එක ගැන අපට දුකයි. මේ ගැන පෙන්වන්න හදන අපිව පෙන්වන්න හදන්නේ දේශද්‍රෝහියෝ කියලා. අද අර්ථ සාධක අරමුදලේ මුදල් පාවිච්චි කරලා, ඒක අර්ථ සාධක අරමුදලේ තිබෙන සියයට 5ක, 6ක විතර

සංචිතයකින් පාවිච්චි කරලා තිබෙන පොඩි කොටසක් කියලා තමයි පෙන්වන්න හදන්නේ. මේ වාගේම තමයි රක්ෂණ සංස්ථාවේ තිබෙන අරමුදල. ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වාගේ මේ සියල්ලේම අරමුදල් පාවිච්චි කරන්නේ රටේ සුබ සාධනයට නොවෙයි. ඒවා පාවිච්චි කරන්නේ ඔබතුමන්ලාගේ පටු දේශපාලන ගමන ඉදිරියටත් දේශපාලනීකරණයෙන් ගෙන යෑමටයි. ඒ ගැන තමයි අපට දුක. ඒ සම්බන්ධයෙන් අපට යුතුකමක් තිබෙනවා මේවා පෙන්වලා දෙන්න.

ණයබරතාව දවසින් දවස වැඩි වෙනවා. 2005 ජනවාරි මාසයේ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමෙන් රුපියල් කෝටි 178,400ක්ව තිබුණ ණයබරතාව අද කථා කරන මේ අවස්ථාවේදී රුපියල් කෝටි 548,800කට වැඩි වෙලා තිබෙනවා. මේ අවුරුදු 5 තුළ සියයට 400 ගුණයකින් වැඩි වීම ඔබතුමන්ලා කිසිසේත්ම ආඩම්බර විය යුතු කරුණක් නොවෙයි.

ඒ ණයබරතාව වැඩි වනවා වාගේම මේ රටේ වත්කමත් වැඩි වනවා නම් කිසිසේත්ම ප්‍රශ්නයක් නැහැ. නමුත් වත්කම කඩා ගෙන වැටෙනවා; ණය බරතාව වැඩි වනවා. ඒක තමයි තිබෙන දුක.

මේ අවුරුද්දේ අය වැය තුළ සම්පූර්ණ ආදායම රුපියල් කෝටි 1,20,000යි. නමුත් ණය සහ පොලී ප්‍රමාණය, ඒ වැය ශීර්ෂය යටතේ විතරක් ගෙවීම, රුපියල් කෝටි 1,28,000යි. සමස්ත රටේ සම්පූර්ණ ආදායමත් මදි තමුන්නාන්සේලා අරගෙන තිබෙන ණයත් ඒ පොලී ප්‍රමාණයත් ගෙවන්න. මේ නිසා තමයි වෙනින් දේවල්වලට ගිහිල්ලා ඇඟිලි ගහලා, ඒ තිබෙන සංචිත නැති කර ගෙන භයානකකාරී තත්ත්වයකට රට ගෙනියන්න හදන්නේ.

මතක් කරන්න අවශ්‍යයි, කළුකඩ ව්‍යාපාරයක් මෙන් තෙල් මිල ඉහළ මට්ටමට ගෙන යන කොට මේ රටේ ජනතාව වෙනුවෙන් ආණ්ඩුවට විරුද්ධව මමත් අපේ ගරුතර පාලිත ස්වාමීන් වහන්සේත් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය අවස්ථාවේදී ඔබතුමන්ලා ඒකට පයින් ගහලා, "මේකෙන් ජනතාවට වාසිදායක තත්ත්වයක් ඇති කරන්න කිසිසේත් අවශ්‍ය නැහැ. අපියි ආණ්ඩුව. අපට ඕනෑ විධියට අපි කටයුතු කරනවා" යි කියලා කිව්ව ආකාරය. පෙට්‍රල් ලීටරයක් රුපියල් 65කට එදා විකුණන්නට පුළුවන්කම තියෙද්දී රුපියල් 135කට විකුණන කොට, මේක අසාධාරණයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වාට පසුවත් ඒකටත් ඇහුම්කන් දුන්නේ නැති ආණ්ඩුවක් තමයි මේ කථා කරන්නේ. ඒ වාගේ ස්වරූපයක් තුළින් තමයි අදත් ගමන් කරන්නේ.

පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 150ට වැඩි කරනවා, මේ පෙබරවාරි මාසයේ 12 වන දා. ඒ වැඩි කරන අවස්ථාවේදී ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරල් එකක මිල ඇමෙරිකන් ඩොලර් 124යි කියලා ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේදී හෙළිදරවු කළා. අද ඒ මිල ඇමෙරිකන් ඩොලර් 88කට 89කට අඩු වෙලා. ඒ කියන්නේ සියයට 35කට වැඩි ප්‍රමාණයකින් මිල අඩු වෙලා. අද කොළඹ වරායට පෙට්‍රල් ලීටරයක් රුපියල් 73කට, ඩීසල් ලීටරයක් රුපියල් 71කට, භූමිතෙල් ලීටරයක් රුපියල් 65කට ගෙනෙන්න පුළුවන් අවස්ථාවක, ජනතාවට සෙතක් වන විධියට, ජීවන වියදම අඩු කරන්න පුළුවන් වන විධියට වැඩ කටයුත්තක් ඔබතුමන්ලා කිසිසේත් නොකිරීම, එලෙස දරදඬු මතයෙන් කටයුතු කිරීම තමයි අපට තිබෙන දුක. ඒ නිසා තමයි විරුද්ධ පාර්ශ්වයක් වශයෙන් අපි එකතු වෙලා ඔබතුමන්ලා මේ යන ගමන නිවැරදි කරන්නට අවශ්‍ය වන්නේ. තමුන්නාන්සේලාගේ ආර්ථික දක්ෂතාව නැත්නම් ඒ වැරැද්ද ජනතාව පිට පටවන්න එපා කියන එකයි අපි ඉතාමත්ම ඕනෑකමින් මතක් කරන්න කැමැති. ඒ සම්බන්ධයෙන් අපට උදාහරණ පෙන්වන්න පුළුවන්. ඔබතුමන්ලා චීනයට යනවා; සල්ලි ගන්නවා. ඔබතුමන්ලා වාණිජ බැංකුවලට යනවා; සල්ලි ගන්නවා. සියයට 4ක, 5ක, 6ක පොලී ප්‍රමාණයකට ණය ගන්නවා. එක කාලයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ රටින් පැන්නුවා. පන්නපු ඔබතුමන්ලාගේ ආණ්ඩුවම ඊට පස්සේ පාවඩ දාලා ඉඹලා මේ රටට නැවත ගෙන්නා ගත්තා. ගෙන්වා ගත්තාට පස්සේ ඒ තුළින් යැපිලා, ඒ ගොල්ලන් කියන විධියට නටන්න පටන් අරන් තිබෙනවා.

ඔබතුමාත් අපිත් ගිය මාසයේ වොෂින්ටන් නුවර සිටියා. රටේ ආර්ථිකය අපි ආරක්ෂා කරන්න ඕනෑ නිසා, ඒ අවස්ථාවේදී අපේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා අපට දුන්නු උපදෙස් අනුව කිව්වේ, රටට හිතකර වෙන්න පුළුවන් විධියට කටයුතු කරන්න, ඔබතුමන්ලා ගිහිල්ලා කියන්න, "දෙන්න පුළුවන් ණය ප්‍රමාණය දෙන්න, නමුත් ඒක රටට ඔබින විධියට ලබා දෙන්න. නැතුව මේ අයගේ දේශපාලන ගමන ස්ථිර කර ගැනීම නොවෙයි අවශ්‍ය වන්නේ" කියලා. මම අගය කරනවා, ඒ ගොල්ලන්ගේ විවෘතභාවය. ඔබත් මාත් දන්නා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි, ලෝක බැංකුවයි අවුරුදු හතරකට පහකට ඉස්සර වෙලා ඒ ගොල්ලෝ හිතුවේ ඒ ගොල්ලෝ සියලු දේම දන්නා පුද්ගලයෝ කියලා. අද ඒකට හාත්පසින් වෙනස්ව රටට ජනතාවට අවශ්‍ය වන විධියට ඒ ණය දෙන්න පටන් අරන් තිබෙන නිසා අපට සතුටුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ලෝක බැංකුවේ විනිවිදභාවය යම් විධියකින් පෙන්වා ගෙන යන අවස්ථාවකදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන තවම ලංකාවේ එවැනි දැක්මක් අපට පෙනෙන්නේ නැහැයි කියන එක අප මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ඔබතුමන්ලාට ඕනෑ විධියට -අමාත්‍යතුමාගේ අවශ්‍යතාවට නොවෙයි- මහ බැංකුවේ අධිපතිට ඕනෑ විධියට නටලා, බ්‍රයන් ඇට්කින් වාගේ පුද්ගලයෝ මේ රටේ ආර්ථිකයට යම් විධියේ ප්‍රශ්නයක් ඇති කරන්න පුළුවන් විධියේ කටයුත්තක් කළා. ලෝක බැංකුව එවැනි දෙයක් කළේ නැහැ. අපි හැම අවස්ථාවකදීම කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙනුයි, ලෝක බැංකුවෙනුයි ණය ගැනීම වෙනින් ආයතනයකින් ණය ගැනීමට වඩා සුදුසු බව. ඇයි? ගෙවන්න අවුරුදු ගණනාවක් තිබෙනවා. පොලිය සියයට 1.5යි. අන්න ඒ නිසා තමයි ඒ ණය වෙත යන්න තිබෙන්නේ. අද මොනවාද වෙලා තිබෙන්නේ? ණය උගුලකට අහු වෙලා තිබෙනවා.

සියයට 8ක පොලියකට චීනයෙන් ගත්ත ණය ගෙවන්න බැරි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. එක නිදසුනක් වශයෙන් හම්බන්තොට වරාය වෙනුවෙන් ගත්ත ණය මුදලට ඔබතුමන්ලා එක අවුරුද්දකට පොලිය සහ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 5,900ක් ගෙවන්න තිබෙනවා. නමුත් ඒ වරායේ ආදායම රුපියල් මිලියන 10ක්වත් නැහැ. ඉතින් ඒ රුපියල් මිලියන 5,900ම ගෙවන්න සිදුව තිබෙන්නේ කොළඹ වරායට. අන්න ඒ සම්බන්ධයෙන් අද ඉතාමත් භයානකකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ආණ්ඩුවකට වැරදි වෙනවා. කරුණාකරලා ඔබතුමන්ලා නිහතමානීව පිළිගන්න අවශ්‍යයි, " ඔව් වැරැද්දක් තිබෙනවා" යි කියන එක. විරුද්ධ පාර්ශ්වයක් වශයෙන් අපි කියන්නේ, "මේක අපේ ආර්ථිකය" කියලා. මේවා ඔබතුමන්ලාගේ පෞද්ගලික ධන පරිත්‍යාගවලින් කරන දේවල් නොවෙයි. මේ රටේ අහිංසක ජනතාවගේ බදු සල්ලි තුළින්. ඒ නිසා මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑමක් තමයි අවශ්‍ය වන්නේ. ඉතින් අපි මේවා පෙන්වා දෙන කොට අපි දේශ ද්‍රෝහියෝ.

සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති කරලා තිබෙන රජයේ නිලධාරින්ට අනුමැතිය දෙන මේ ඇමතිවරු කරන දේවල් දේශ ප්‍රේමී කටයුතු ලෙසයි පෙන්වන්න හදන්නේ. ඒ නිසා මේ කියන දේවල්වලට උත්තර සපයන එක ඔබතුමන්ලාගේ කාර්ය භාරයක්.

[ගරු රවි කරුණානායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනවාරි මාසය අගදී රුපියල් 114ට තිබුණු ඇමෙරිකානු ඩොලරයේ අගය අද වන විට රුපියල් 132ට වැඩි වීම නිසා රුපියලේ අගය කඩා වැටිලා තිබෙනවා. මේ රුපියල් 18ක වැඩි වීම නිසා මොකද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා රුපියල් කෝටි පන්ලක්ෂ හැටපන්දහසක ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒකෙන් සියයට 48ක් පිට රට ණය. රුපියලේ අගය වෙනස් වීම තුළ, එහෙම නැත්නම් ඩොලරයේ අගය රුපියල් 114 ඉඳන් රුපියල් 132ට වැඩි වෙලා රුපියල කඩා වැටීම තුළ රුපියල් කෝටි එක්ලක්ෂ විසිඅටදහසක ණය බරතාවක් වැඩි වෙලා තිබෙනවා. කවුද මේකට වග කියන්න අවශ්‍ය වන්නේ? ලෝකයේ තෙල් මිල අඩු වන කොට මේ රටේ තෙල් මිල අඩු කරන්න බැරි වෙලා තිබෙන්නේ රුපියල කඩා වැටීම නිසායි. අද මේ රටේ පාන් මිල වැඩි කරලා තිබෙන්නේ තිරිඟු පිටි මිල වැඩි වීම නිසා නොවෙයි, මේ රටේ රුපියලේ අගය කඩා වැටිලා තිබෙන නිසායි. මේ රටේ තමුන්නාන්සේලාගේ ආර්ථික පරිපාලනයේ බොහොම දුර්වලතාවක් ඇති වෙලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන, ලෝක බැංකුව ගැන ඔබතුමන්ලා කථා කරලා තිබෙනවා. ඒ කථා කරන අවස්ථාවේදී ගෙවුම් ශේෂ හිඟයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ගෙවුම් ශේෂ හිඟය ඉදිරිපත් කරලා ඔබතුමන්ලා වැරැද්ද නිවැරදි කළ යුතුව තිබෙන්නේ රුපියලේ අගය එහෙ මෙහෙ කිරීම තුළින් විතරක් නොවෙයි. ඒක එක සාධකයක් විතරයි. නිෂ්පාදන වියදම, ඒ වාගේම අනෙක් රටවල් එක්ක මේ රටේ තිබෙන තරගකාරී තත්ත්වය, මේ රටට අනෙක් රටවල්වලින් තිබෙන අභියෝග ගැනත් බලන්න ඕනෑ. මියන්මාර් වාගේ රටවල් අද ලංකාවට ලොකු අභියෝගයක් වී තිබෙනවා. මේවා සම්බන්ධයෙන් ඔබතුමන්ලා දැනුවත්ව කටයුතු කරන්න අවශ්‍යයි. There must be a level playing field, Hon. Deputy Chairman of Committees. This is what is lacking. The trade deficit is a direct resultant of the lack of knowledge, the most important aspect of the cost ingredients. So, if you cannot compete with your cost, there is no point in talking on export-driven economy.

මෙන්න මේක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. ඒ සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කරගෙන යන්න ඕනෑ කොයි ආකාරයෙන්ද කියලායි අපි මේ කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ඉල්ලන අවස්ථාවේදී ඛනිජ තෙල් සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමක් කරන්න ඕනෑය කියලා නිවාඩ් කබ්රාල් මහතා සමඟ එකතු වෙලා ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා 2009 ජුනි මාසයේ ගිවිසුමක් අත්සන් කරලා දුන්නා. ඒ අවස්ථාවේදී කිව්වේ 2010 වර්ෂයේ කිසිම අලාභයක් නොවන විධියට කටයුතු කරන්න ඔබතුමන්ලා පොරොන්දු වනවා කියලායි.

නමුත් මේ වන කොට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය කෝටි නවදහස් හාරසියයි. මා හිතන විධියට ලංකාව ලෝකයේ වැඩිම තෙල් මිලක් තිබෙන රටක් වශයෙනුයි දැනුවත් වෙලා තිබෙන්නේ. 2011 වර්ෂයට ඛනිජ තෙල් සංස්ථාව කෝටි නවදහස් හාරසියයක අලාභයක් ලබා තිබෙනවා.

මම අගය කරනවා, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ විවෘත භාවය. එතුමා සැබෑ තත්ත්වය පෙන්වා තිබෙනවා. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 01වැනි දා සිට මාර්තු 31වැනි දා තෙක් අලාභය කෝටි දෙදහස් දෙකක් වශයෙන් පෙන්වා දී තිබෙනවා. ඉතින් කොයි ආකාරයෙන්ද මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ?

ඒ වාගේම තමයි ලංකා විදුලිබල මණ්ඩලය. මේකේ අලාභය රුපියල් කෝටි 2,600යි. ලංකා ගමනාගමන මණ්ඩලය රුපියල් කෝටි 400ක අලාභයක් ලබා තිබෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුව රුපියල් කෝටි 408ක අලාභයක් ලබා තිබෙනවා. ශ්‍රීලංකන් ගුවන් සේවයේ අලාභය රුපියල් කෝටි 1,900යි. මිහින් ලංකා ආයතනය රුපියල් කෝටි 45ක අලාභයක් ලබා තිබෙනවා. ඒ වාගේම වරාය අධිකාරිය රුපියල් කෝටි 5,800ක අලාභයක් ලබා තිබෙනවා. ඉතින් රජය සතු දෙපාර්තමේන්තු, කොම්පැනි මෙවැනි ආකාරයෙන් අලාභ ලබන කොට මේවා පියවන්නේ ජනතාවගේ බදු සල්ලිවලිනුයි. මේ ආයතන ජනතාවට සේවයක් වශයෙන් පවත්වා ගෙන යනවාය කියන බොරුව ඔබතුමන්ලා කියන්න එපා. එහෙම කරනවා නම් ඉස්සෙල්ලාම පටන් ගන්න තිබෙන්නේ ඇමති මණ්ඩලයෙනුයි. තමුන්නාන්සේලා ජනතාවට පඩි වැඩි කරන්නේ නැතිව ඇමති මණ්ඩලයේ අයට ලක්ෂය බැගින් බෙදා ගෙන මේ කටයුතු ඉදිරියට ගෙන යාම තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය.

There must be financial discipline starting from the very top itself. There is no point in pretending to cut costs on one side and then virtually increasing the expenditure of the Cabinet.

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

ගරු මන්ත්‍රීතුමනි, ඇමතිවරුන්ට කාලෙකින් පඩි වැඩි කළේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කාලෙකින්? ඔබතුමන්ලා 2010 ජනාධිපතිවරණය වෙලාවේ කිව්වේ "අපි ජනවාරි මාසයේ ඉඳන් රුපියල් 2500කින් ජනතාවට පඩි වැඩි කරනවා" කියලායි. කිව්වේ නැද්ද? එතකොට ආවාට පස්සේ මාස තුනකින්-

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මම කිව්වේ ඇමතිවරුන්ට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇමතිවරුන්ගේ තමයි ලක්ෂයකින් වැඩි කළේ. [බාධා කිරීමක්] හරි, පස්සේ උත්තර දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමාට නොලැබෙනවා වෙන්න පුළුවන්. අනෙක් අයට ලැබෙන එක තමයි තිබෙන ප්‍රශ්නය.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Mahinda Amaraweera, what is your point of Order?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඇමතිවරුන්ට පඩි වැඩි කිරීමක් කළේ නැහැ. ඒ නිසා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. මොකද, ජනතාව නොමඟ යනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ජනාධිපතිවරණයෙන් පස්සේ, මාස තුනක් ඇතුළත -2010දී- ලක්ෂයකින් ඇමති මණ්ඩලයේ වැටුප් වැඩි කළාය කියන එක මම වග කීමකින් කියනවා. ඊට පස්සේ ඕනෑ එකක් කියන්න පුළුවන් ඔබතුමාට.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම පැහැදිලිව කියනවා අපේ වැටුප් වැඩි කළේ නැහැ කියලා. ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. අප වැටුප් වැඩි කරන්න කියලා ඉල්ලන්නෙත් නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you may carry on.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද එස්.බී. දිසානායක ඇමතිතුමා පෙන්වලා දුන්නා විශ්වවිද්‍යාලවල වියදමවත් හරියට දරා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබුණු බව. ඒ වාගේම තමයි තෙල් මිල අඩු කරලා නැහැ කියලා අප පෙන්වා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි ඔබතුමන්ලාගේ පෞද්ගලීකරණය නැවත -

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඒ චෝදනාව ඉවත් කර ගන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි ඒ? මොකටද? මම වග කීමකින් කියනවා ඇමතිවරුන්ගේ ගෙවල්වලට, වාහනවලට ලක්ෂයක් ලබා දීලා තිබෙන බව. ඒ ගැන මේ පාර්ලිමේන්තුවේදී මම අහපු ප්‍රශ්නයකට දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා උත්තර දීලාත් තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ, නැහැ. අපේ වැටුප් වැඩි කළේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට ඕනෑ දෙයක් කියන්න පුළුවන්. කියන්න, වැඩි කළේ නැහැය කියලා.

මම මේ අවස්ථාවේදී කියනවා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය ඔබතුමන්ලා පෞද්ගලීකරණයට යොමු කරලා තිබෙන්නේ-

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Mahinda Amaraweera. What is your point of Order?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීතුමා කරන ප්‍රකාශය රටේ ජනතාව නොමඟ යවනවා. මම ඉතාම පැහැදිලිව වග කීමෙන් කියනවා ඇමතිවරුන්ගේ පඩි වැඩි කිරීමක් අවුරුදු ගණනකින් කරලා නැති බව. එහෙම අවශ්‍යතාවක් තිබෙනවා කියනවා නොවෙයි. එහෙම වැඩි කිරීමක් කරලා නැහැ. අපේ පඩිය වැඩි කරලා නැහැ. කවුද කියන්නේ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Member, you may carry on.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ජනාධිපතිවරණයෙන් පස්සේ ඔබතුමන්ලාගේ වැටුප් වැඩි කළා. මගේ ඒ තර්කය ඔබතුමන්ලා බිඳ දමන්න. ඔබතුමන්ලා හරි දක්ෂයි නේ ඒවාට. ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, ඔබතුමාට පෞද්ගලිකව ලැබෙන එකක් ගැන නොවෙයි අප කියන්නේ. මේක ඇමති මණ්ඩලයට ලැබෙන දෙයක්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අපි පඩි වැඩි කරන්න කියලා ඉල්ලුවෙත් නැහැ; ඉල්ලන්නෙත් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක දැන් කියන්නේ නැතිව ඔබතුමා කථා කරන වෙලාවේදී කියන්න. මොකද මගේ වෙලාව ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි, ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනය ඔබතුමන්ලා පෞද්ගලීකරණය කළා කියන එක. ඊට පස්සේ ඒ සමාගම නැවත ආණ්ඩුවට භාර ගත්තා. එය පෞද්ගලීකරණය කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. ඒ කරපු එකත් අප විවේචනය කළා. ඒ කරපු දෙය වැරැදියි. නමුත් එහෙම පෞද්ගලීකරණය කරපු කාලාන්තරයේ මේ අලාභය රජය දරන්නේ නැතිව කටයුතු කිරීමත් යම් විධියේ සාර්ථකත්වයක් ලෙස අප පෙන්වන්න අවශ්‍යයි.

[ගරු රවි කරුණානායක මහතා]

මහින්ද චින්තනය අනුව මේක 2008දී නැවත ආණ්ඩුවට ගත්තා. 2008දී රුපියල් මිලියන 4,800ක්ව තිබුණු එම ආයතනයේ ලාභය 2009, 2010, 2011 වෙන කොට අලාභයක් බවට පරිවර්තනය වුණා. ශ්‍රී ලන්කන් ආයතනය 2009දී රුපියල් මිලියන 2,900ක අලාභයක්, 2010දී රුපියල් මිලියන 6,800ක අලාභයක්, 2011දී රුපියල් මිලියන 19,100ක අලාභයක් ලබා තිබෙනවා. 2012 වර්ෂයට අද වන තුරු රුපියල් මිලියන 14,800ක අලාභයක් ඒ අය ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ මදිවාට මේ කැබිනට් එකෙන් රුපියල් මිලියන 350ක් දෙනවා ගිහින් අලුත් ගුවන් යානා ගන්න කියලා. මෙවැනි කටයුතු කිරීමට වග කීමක් තිබෙනවාද ඔබතුමන්ලාගේ ආණ්ඩුවට? රටේ ප්‍රමුඛත්වය මොකක්ද? සමෘද්ධි ආධාර ලබන ලක්ෂ 15ක ප්‍රමාණයකට ඔබතුමන්ලා දෙන්නේ රුපියල් මිලියන 8,200යි. නමුත් මේ ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනයට -එක ආයතනයකට- පිස්සු නටන්න රුපියල් මිලියන 19,100ක් වෙන් කර තිබෙනවා, "ගිහිල්ලා ඕනෑ දෙයක් කරපල්ලා" කියලා. මේවා සාධාරණද? අලාභ ලබන මේ ආයතනයට මේ සල්ලි ටික නොදී සමෘද්ධිලාභීන්ට දුන්නා නම් ඒ ගොල්ලන්ට ලැබෙන්න තිබෙන ප්‍රදාන සියයට තුන්සිය ගුණයකින් වැඩි කරන්න තිබුණා නේ. ඉතින් මෙවැනි දේවල් අප පෙන්නුවාම අප දේශ ද්‍රෝහියෝ. මේවා කරන ඔබතුමන්ලා දේශ ප්‍රේමියෝ. මේ සම්බන්ධයෙන් අපට පෙන්වන්න තිබෙන්නේ කරුණාකරලා මේ රටේ ආර්ථිකය ඉදිරියට හදා ගෙන යන්න අවශ්‍යයි කියන එකයි.

අනික් කාරණය මේකයි. හැම වෙලාවේම ඔබතුමන්ලා පෙන්වන්න හදනවා, මහින්ද චින්තනය තුළ අරක කළා, මේක කළා කියලා. "තමුන්නාන්සේලා විපක්ෂයේ නේ, විපක්ෂයට පේන්නේ නැද්ද මොනවාද මේ වන්නේ කියලා" ඔබතුමන්ලාගේම ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් ඇවිල්ලා මගෙන් ඇහුවා. මටත් ඇත්ත වශයෙන්ම ලජ්ජාවක් ඇති වුණා. මම පෙන්වලා දුන්නා. නොරොච්චෝලේ බලාගාරය කළේ කවුද? චන්ද්‍රිකා කුමාරතුංග. එතකොට Upper Kotmale Project එක කළේ කවුද? පටන් ගත්තේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ කාලයේ, එක්සත් ජාතික පක්ෂය කථා කරලා. මේ අදහස කොයි ආණ්ඩුවෙන්ද පටන් ගත්තේ? මේ හැම එකම නිකම් මහින්ද චින්තනයෙන් පෙන්නුවා වාගේ නේ කථා කරන්නේ. අධිවේග මාර්ග හදන්න යෝජනා කළේ එක්සත් ජාතික පක්ෂය කාලයේ. මුතුරාජවෙල ව්‍යාපෘතිය පටන් ගත්තේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ කාලයේ. දැදුරුඔය ව්‍යාපෘතිය පටන් ගත්තේ ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා විසින් එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ. කොළඹ වරාය දියුණු කිරීම ආරම්භ වුණේ එක්සත් ජාතික පක්ෂය කාලයේ. ඒ වාගේම තමයි, airport development එකත් එක්සත් ජාතික පක්ෂය කාලයේ ඇරඹුණේ. ඊට පස්සේ ඒක මංගල සමරවීර මැතිතුමා විසින් අවසන් කළා. හම්බන්තොට වරාය හදන්න සැලසුම් කළේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ කාලයේ. මේක අන්තිමට ඉවර කරපු තැනින් නම දමලා, මෙන්න මේක මහින්ද චින්තනය තුළින් කළා කියන එක නොවෙයි පෙන්විය යුත්තේ. හම්බන්තොට වරාය එදා පටන් ගත්තේ deep seaport එකක් වශයෙන්. නැව් ඇවිල්ලා එතැනදී තෙල් ටික ගහ ගෙන වෙනින් කටයුතු කර ගෙන යන්න මිසක් - [බාධා කිරීමක්] ඔව්, bunkering, dry docks වාගේ දේවල්වලට. සම්පූර්ණයෙන් වරායක් ලෙස කටයුතු සිද්ධ කළා. අන්තිමට මොනවාද වෙලා තිබුණේ? ඒකෙන් වෙලා තිබෙන්නේ මේකයි. අද කොළඹ වරායට ගේන්න තිබෙන කාර් ටික එහාට ගෙනියලා ඊයේ ලොකු ප්‍රචාරයක් කරලා පෙන්නුවා, "ඔන්න කාර් ටිකක් එනවා" කියලා. ඒක කොයි තරම් අලාභයක්ද මේ රටට? රුපියල් මිලියන 5,800ක ණය සහ පොලී ප්‍රමාණයක් ගෙවන්න තිබෙන කොට මිලියන 100ක් හොයා ගෙන මේක කරන්න පුළුවන්ද? ඒ සම්බන්ධයෙන් අපට කිසි සේත්ම ඊර්ෂ්‍යාවක් නැහැ.

අප ඉතාම අගය කරනවා, රටේ ආර්ථිකය ඉදිරියට තල්ලු කරගෙන යන එක ගැන. නමුත් මතක තියා ගන්න, 1977 දී බලයට පත් වුණු එක්සත් ජාතික පක්ෂ රජය මහවැලි යෝජනා ක්‍රමය ඇති කරලා වික්ටෝරියා, රන්දෙණිගල, දැදුරුඔය සහ මාදුරුඔය ජලාශ ඇති කරලා රටට කොතරම් සේවයක් කළාද කියලා. එදා ආර්ථික පුනර්ජීවනයක් ඇති වුණා. කෘෂිකර්මය දියුණු වුණා. ජනතාව ඒ ප්‍රදේශවලට ගිහිල්ලා පදිංචි වී කටයුතු කරන්න පටන් ගත්තා. මෙන්න මෙහෙම තමයි වැඩ කටයුතු විය යුත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් මේ රජය නැව් එන්නේ නැති තැනක වරායක් හදනවා; ජනතාව යන්නේ නැති තැනක ගුවන් තොටුපොළක් හදනවා. සාමාන්‍යයෙන් වෙනත් රටවල ජනතාව යන තැනක තමයි ගුවන් තොටුපොළක් හදන්නේ. එහෙම නැතිව ජනතාව යන්නේ නැති තැනක ගුවන් තොටුපොළක් හදලා "උඹලා එතැනට පලයල්ලා" කියලා වැඩක් තිබෙනවාද? රටේ සංවර්ධනය කියලා කියන්නේ මේකද? කරලා තිබෙන එකම දේ තමයි පොහොර සහනාධාරය ලබා දීම. ඔබතුමන්ලා රුපියල් 350ට පොහොර ලබා දෙනවාය කියලා කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් මේකේ සැබෑ තත්ත්වය ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී මතක් කළා. එතුමා කිව්වා, පොහොර වෙනුවෙන් රුපියල් මිලියන 50,000ක් -කෝටි 5,000ක්- වෙන් කරනවාය කියලා. මා ඒ ඇමතිතුමාගෙන් අහනවා, එහෙම සල්ලි ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා නම් ඔබතුමන්ලා ඒ සල්ලි ප්‍රමාණය වෙන් කරන්නේ කොයි වැය ශීර්ෂයෙන්ද කියලා. ඒ වාගේ බොරු ප්‍රකාශ කරලා රටේ ජනතාව නොමඟ යවන්න එපා. කෝටි 5,000ක් දෙනවා නම් කොයි වැය ශීර්ෂය යටතේද ඒ සල්ලි එන්නේ? එක පොහොර ගෝනියක් දීලා මෙන්න "කෝටි පන්දාහක් මෙහෙම වියදම් කළා"ය කියලා ලොකුවට රූපවාහිනියෙන් පෙන්වනවා. ඇයි මේ වාගේ බොරු ප්‍රකාශ කරන්නේ? මෙතරම් පොහොර ප්‍රමාණයක් පාවිච්චි කරනවා නම් අස්වැන්න -ඵලදායිතාව- ඉන්දියාවට ගිහිල්ලාද තිබෙන්නේ? කරුණාකරලා මෙවැනි ජනතාව නොමඟ යවන ප්‍රකාශ කරනවාට වැඩිය හොඳයි, සැබෑ තත්ත්වයෙන් මේ රට ඉදිරියට ගෙනි යන්නේ කොහොමද කියලා කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි වෙළෙඳ ශේෂයේ ප්‍රශ්නයක් තිබෙනවා. දැන් වෙළෙඳ ශේෂයේ ප්‍රශ්නය නිරාකරණය කරන්න ඔබතුමන්ලා තාවකාලිකව නොයෙක් නොයෙක් දේවල් කරනවා. ගිය අය වැයේ දී කුඩා පවුලකට කාර් එකක් ගන්න පහසුකම් දෙන්න අපි බදු අඩු කරනවාය කියලා ජනාධිපතිතුමා ප්‍රකාශ කළා. එතකොට මෙතැන සිටි පිරිස අත්පුඩි ගැහුවා. මාස තුනකට පස්සේ ඒ කරපු ප්‍රකාශයට වඩා සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ ගමනක් ආණ්ඩුව යනවා. "නැහැ, අපි නැවත මේ බදු වැඩි කරනවා" කියලා කියනවා. මොන වාගේ ප්‍රෝඩා ගමනක්ද මේ යන්නේ? රටක යම් විධියක ඉදිරි දැක්මක් තියෙන්න ඕනෑ. කාලාන්තරයකින් -අවුරුදු දෙක තුනකින්- වැරැදි වෙන්න පුළුවන්. හැම ආණ්ඩුවක්ම වැරැදි කරන්න ඉඩ තිබෙනවා. ඒක නැහැ කියලා අප කියන්නේ නැහැ. අප විපක්ෂයක් වශයෙන් එහෙම නිකම් විවේචනය කරන්නේ නැහැ. එයට කාලාන්තරයක් දිය යුතුයි. ගෙවුම් ශේෂයේ හිඟයක් තිබුණාය කියලා සියයට 30ට අඩු කරපු බදු සියයට 120 දක්වා එක රැයකින් වැඩි කිරීම සාධාරණද? ඒ වාගේම තමයි මෙවැනි තරගකාරී තත්ත්වයකදී මා කිව්වා වාගේ රුපියලේ අගය හරියාකාරව තිබෙන්න අවශ්‍යයි. නිෂ්පාදන වියදම අඩු කරන්න අවශ්‍යයි. තරගකාරී තත්ත්වය ඇති කරන්න අවශ්‍යයි. දූෂණය නැති කරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි උසාවියේ තිබෙන නීතියේ සාධාරණීකරණයක් ඇති වන්න අවශ්‍යයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක නීතියකුත්, තව පක්ෂයකට තවත් නීතියකුත්, රජයේ ආයතනවලට තවත්

නීතියකුත් තියා ගන්න බැහැ. ඒ වාගේම තමයි පොලිසිය. සමහර විට පොලිසියට පැමිණිලි කරන්න ගිය කෙනාට තමයි ප්‍රශ්න ඇති වන්නේ. වැරැදිකරුවා නිවැරැදිකරු බවට පත් වනවා. ඉතින් මෙවැනි දේවලට පිට රට ආයෝජකයෝ පමණක් නොවෙයි, ලංකාවේ ආයෝජකයෝත් භය වෙලා තිබෙනවා. මේ විධියට ගියොත් මියන්මාරය වාගේ රටවල් අපේ රට වාගේ රටවල්වලට අභියෝගකාරී තත්ත්වයක් ඇති කරන්න ඉඩ තිබෙනවා. ඔබතුමන්ලා ඒ ගැන දැනුවත් වෙන්න අවශ්‍යයි. ගරු සරත් අමුණුගම වාගේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු මේවා දැනගෙන කොළේ වහලා කථා කරනවාට වැඩිය හොඳයි, " ඔව්. අපේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා. මෙහෙම තමයි ඉදිරියට යන්න තිබෙන්නේ" කියලා කථා කරන එක. එය මා හිතන හැටියට ඇහට ගුණයි. රටට හොඳයි. ගෙවුම් ශේෂ හිඟය පියවන්න ඔබතුමන්ලා අන්තිමට ගන්න යන ක්‍රියා මාර්ගය මට ආරංචි වුණා. ඇමතිතුමා කියලා තිබුණා, "පුළුවන් තරම් මෙහේ ශ්‍රමිකයන් පිට රටට යවන්න ඕනෑ"ය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේ සංවර්ධනයක්ද රටට අවශ්‍ය වන්නේ? මේ රටේ අදක්ෂතාව නිසා, ගෙවල්වල ප්‍රශ්න ඇති කරගෙන සිටින අහිංසක අයගේ ශ්‍රමය විකිණීමට ඔවුන් පිට රට යවන එකද කරන්න තිබෙන්නේ? ඊට වඩා නිර්මාණශීලී වෙන්න අවශ්‍යයි. රටේ ආර්ථිකය දියුණු කළ යුත්තේ ආර්ථිකය ප්‍රසාරණය කිරීම තුළිනුයි. ඔබතුමන්ලාට අන්න එවැනි දක්ෂතාවක් නැති නිසා එක්සත් ජාතික පක්ෂ රජය ඇති කළ විවෘත ආර්ථිකයට බණිනවා. තුනෙන් දෙකක බලයක් තිබෙන ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇයි මේ ආර්ථිකය සංවෘත ආර්ථිකයකට ගෙනි යන්නේ නැත්තේ? එක්සත් ජාතික පක්ෂයට එක පැත්තකින් බණිනවා. අනික් පැත්තෙන් ඒකෙම එල්ලිලා ඒක තුළින් ඊට වඩා අන්තයට ගෙනි යන්න උත්සාහ කරනවා. ඒක තමයි තිබෙන නාඩගම.

බලන්න, දැන් ඊට වඩා භයානකකාරී තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඔබතුමන්ලාගේ මහ බැංකුව තුළින් සියයට හය හතක විරැකියාභාවයක් තිබෙනවාය කියලා පෙන්නුවාට අප හිතන හැටියට සියයට 10ක 11ක විතර disguised unemployment එකක් තිබෙනවා. අපි මේ සුමානය තුළ ඔබතුමන්ලාගෙන් ප්‍රශ්න අහලා තිබෙනවා. ඒ එක ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ඔබතුමන්ලාගේ වරාය හා මහාමාර්ග නියෝජ්‍ය ඇමති කියලා තිබෙනවා, "හම්බන්තොට වරාය හදන්න චීන ශ්‍රමිකයන් 2,300ක් පාවිච්චි කළා" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට පස්සේ ඊයේ විදුලිබල හා බලශක්ති ඇමති කියනවා, "නොරොච්චෝලේ හදන්න චීනයෙන් ශ්‍රමිකයන් 1,920ක් ගෙනාවා"ය කියලා. ප්‍රවාහන ඇමති කියනවා, "මාතර ඉඳලා හම්බන්තොටට රේල් පීලි ටික හදන්න ඉන්දියාවෙන් ශ්‍රමිකයන් 192ක් ගෙනාවා"ය කියලා.

ඊට පස්සේ අද උදේ කිව්වා, BMICH එක ප්‍රතිසංස්කරණය කරන එකට 120ක කම්කරු සේවක පිරිසක් චීනයෙන් ගෙනැල්ලා තිබෙනවාය කියා. එවැනි දේවලින් මොනවාද කර තිබෙන්නේ? එක්සත් ජාතික පක්ෂයේ රජය එදා කෝටි පන්දාහකින් මුළු මහවැලි යෝජනා ක්‍රමයම හදනකොට ඒකට සුද්දෝ ගෙනාවේ නැහැ. අප එතැනදී පිට රටින් ණය විතරක් ගෙනාවා. ඒ ගෙනාව ණය a return on investment විධියට තමන්ගේ ප්‍රාග්ධනයට නැවත අදායම ලබා, අවුරුදු 12කින් සම්පූර්ණ ණය ගෙවන්නට හැකියාව ඇති වුණා. ඒ වාගේ සංවර්ධන කටයුතුවලට එක්සත් ජාතික පක්ෂ රජය සුද්දන් ගෙන්වන්නේ නැතිව ලංකාවේ ශ්‍රමය පාවිච්චි කළා. එතකොට මේ රට තුළ value-addition එකක්, මුදල් එකතු වීමක්, තිබෙනවා. එහෙම තමයි රටක් හදන්න තිබෙන්නේ. [බාධා කිරීමක්] කවුද? එක්කෙනෙක් දෙන්නෙක් ගෙනාවාට ඕක ලොකු වෙනසක්යැ. ඇයි දැන් මේ රට පාලනය කරන්නේ ඇමෙරිකන්කාරයෝ නේ. ආර්ථික සංවර්ධන ඇමති ඇමෙරිකන් කාරයෙක්. ආරක්ෂක ලේකම් ඇමෙරිකන් පුද්ගලයෙක්. තව මොනවා ද කියන්නේ? තමුන්නාන්සේලා කට වහලා, අත් බැඳලා එළියට දාලා තිබෙන හිටපු යුද හමුදාපති සරත් ෆොන්සේකා ඇමෙරිකාවේ පුද්ගලයෙක්. ඔය සුද්දෝ ගැනද ඔය කථා කරන්නේ? එහෙම කථා කරනවා නම් අප නිශ්ශබ්දව ඉන්නම්. ලංකාවේ අය පිට රට ගිහිල්ලා සුද්දන්ගේ ලේබලය දාලා මෙහෙ ආවාම ඔය ගොල්ලෝ ඒගොල්ලන්ටත් ඊර්ෂ්‍යා කරනවා නම් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am taking 15 minutes more because we have some additional time left.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
But, we had a late start.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, no. We have 30 minutes. So, we are taking advantage of it. We will be taking 15 minutes off that.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
We had a late start. We started at 2.40 p.m.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ( ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
We cannot sacrifice our time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You do not need to sacrifice your time.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Do not take our time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
We, the Opposition, have our own time. We will take necessary action on that particular issue.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
We had a late start.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

We had a late start owing to lack of management of time from the Chair. We will fully utilize our time.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Your time will be over at 3.10 p.m. So, you have only one more minute.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

When the Debate comes to the tail end, those rectifications will be done. But, I was told by the Hon. Chief Opposition Whip that 15 minutes will be given.

දැන් බලන්න, රටේ නිෂ්පාදන වියදම ගැන. අප නිදසුනක් වශයෙන් ඉන්දියාව ගනිමු. ඉන්දියාවේ වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 28 වෙන කොට මෙහේ නිෂ්පාදන වියදම කීයද ගරු මහින්ද අමරවීර ඇමතිතුමා? ඔබතුමා දන්නවානේ. ඇයි මේ දෙක අතර මේ වාගේ පරතරයක් තිබෙන්නට පුළුවන් වන්නේ? ලූනුත් ඒ වාගේම තමයි. එහේ රුපියල් 13යි. මෙහේ නිෂ්පාදන වියදම කීයද? ඒ වාගේම තමයි තිරිඟු. එහේ රුපියල් 28යි. මෙහේට ආනයනය කරන විට මිලේ වෙනස කීයද? මේ පරතරය මෙතරම් විශාල වන්නේ ඇයි? යම් විධියකින් සියයට 5ක සියයට 6ක පරතරයක් තිබුණා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඊට වඩා පරතරයක් ඇති වන්නේ කොහොමද? මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙනුත් ඒ වාගේම තමයි. IMF එකෙන් සහ World Bank එකෙන් ඔබතුමන්ලා ණය ගන්නවා. අප එය අගය කරනවා. ඔබතුමන්ලා විනයක් අනුව ගන්න තිබෙනවා නම් ඒ ණය ගන්න. නමුත් ඒ කොන්දේසි අනුව කටයුතු කරන්නට අවශ්‍යයි. නමුත් ඔබතුමන්ලා එතැනට ගිහිල්ලා එකක් කියලා චීනයට නැත්නම් වෙනත් තැනකට ගිහින් - HSBC එකට ගිහින් - සියයට 8 , 9 පොලියට ණය ගන්න එක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් අපි IMF එකට කියනවා, කරුණාකර ඔබතුමන්ලා මේ රටට ණයක් දෙන්න අවශ්‍ය නම් වෙන රටවල් වාගේ Right to Information Act එක යටතේ අනිවාර්යයෙන්ම දෙන්න කියලා. නැත්නම් ඒ අයත් හවුල් වෙනවා, මේ දෙන සල්ලි කාබාසිනියාවට ලක් කරන වැඩ කටයුතුවලට. අපි IMF එකට කියනවා මේ රටට සල්ලි දෙන්න; සල්ලි දෙන්නේ නැතිව ඉන්න එපා; නමුත් ඒ දෙන ඒ සල්ලි දේශපාලනීකරණය වෙන්නේ නැහැ කියන එකට වග කියන්නට අවශ්‍යයි කියා. එම නිසා අප්‍රිකාව, ලතින් ඇමෙරිකාව වාගේ රටවලට සල්ලි දෙනවා වාගේම කරුණාකර Right to Information Act එක යටතේ ණය දෙන්න කියා අප කියනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order please! Ten minutes has been allocated to the ITAK. Do you want to take that time?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Yes, we are taking that time.

ඒ සම්බන්ධයෙන් මුදල් දෙන්නට ඉස්සෙල්ලා හරියාකාරව මෙවැනි පනතක් ඇති කරන්නට ඕනෑය කියන එක අප වගකීමෙන් කියනවා. ලෝක බැංකුව වන්නට පුළුවන්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වන්නට පුළුවන්. හෙට අප ආණ්ඩුව ගත්තොත් අප පළමුවෙන්ම කරන ක්‍රියාව Right to Information Act එක ගෙනෙන එකයි කියන එක අප වගකීමකින් මේ අවස්ථාවේදී කියන්නට කැමතියි. එම නිසා මේ exchange rate එක floating rate එකක් නොවෙයි. අපේ වචනවලින් කියනවා නම් sinking rate එකක්. ඔහේ නිකම් කිසිම දර්ශනයක් නැතිව කඩා වැටීගෙන යනවා. තමුන්නාන්සේලා මොනවා කථා කළත් නැතත් ඉන්දියාවත් මේකට බලපෑමක් ඇති කරනවා.

ඉන්දියාවේ රුපියල අව ප්‍රමාණය වෙනවා නම් ලංකාවේ රුපියල අධිප්‍රමාණය වෙන්න බැහැනේ. එහේ රුපියලේ අගය 57කට 58කට තිබෙන කොට මෙහේ රුපියල 125ට යවන්න ජනාධිපතිතුමා නියෝග කළාය කිව්වාම, 132ට ගියේ මොකටද? එහෙම නම් ජනාධිපතිට එහෙම නියෝග කර කරන්නට බැරි ප්‍රශ්නයක් තිබෙනවා නේද? එම නිසා කරන්නට බැරි දේවල් පෙන්වන්නේ නැතිව ඉන්න. මේක අපේ රටේ ජාතික ආර්ථිකය. ඒක ඔබතුමන්ලාගේත් ප්‍රශ්නයක්. අපේත් ප්‍රශ්නයක්. ඉතින් අපි දෙගොල්ලෝම ජාතික ආර්ථිකයක් හදන්න කටයුතු කරන එක අපේ වගකීමක් වාගේම ඔබතුමන්ලාගේ යුතුකමක්. මේ වාගේ යනවා නම් මේ රුපියල 132ට නොවෙයි, 150ට ගිහිල්ලාත් නවතින්නේ නැහැ කියන එක තමයි අප කියන්නේ. මේවා කිව්වාම අපේ ආර්ථිකය කඩා වැටෙනවාය කියනවා. අපට තිබෙන්නේ මේ රට ආරක්ෂා කිරීම මිසක් ඔබතුමන්ලාගේ මේ බොරු කරන, දූෂණය කරන ආණ්ඩුව ආරක්ෂා කිරීම නොවෙයි.

මේ ආර්ථිකය කඩා වැටීම නැවැත්වීම තමයි අපට අවශ්‍ය වන්නේ.

මේ බලන්න, කුමාර වෙල්ගම ඇමතිවරයා පුවත් පතකට කියලා තිබෙනවා, "ලංගම හැම තැනම දූෂණ තිබෙනවා" කියලා. අපිද මේවා කියන්නේ? නැහැ. ඔබතුමන්ලාගේම ඇමතිතුමෙක් මේ කියන්නේ. අපි එය අගය කරනවා. එතුමාට කොන්දක් තිබුණා, ඒක කියන්න. ඒ වාගේම සෞඛ්‍ය ඇමතිවරයා කියලා තිබෙනවා, "එදා ඉඳලාම මේ රටේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දූෂණ තිබිලා තිබෙනවා" කියලා. ඒ සම්බන්ධව එතුමා කියපු එකත් ලොකු දෙයක්. බලන්න, නිහාල් අමරසේකර කියන්නේ මේ රටේ වරලත් ගණකාධිකාරිවරයෙක්. එතුමාගේ "Settlement of colossal fraud on Sri Lanka Government" කියන අලුත් පොත තුළින් මේ වාගේ කරුණු පෙන්වා දී තිබෙනවා. මෙවැනි දූෂණ අද ජාත්‍යන්තර මට්ටමටත් ගිහිල්ලා තිබෙනවා. I am saying with all responsibility that Mr. Nihal Sri Amarasekera - [*Interruption*.]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath)

What did you do with the Hilton case?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am quoting from Mr. Amarasekera's new book in which he has referred to the hedging deal. - [*Interruption*.] Please, Hon. Minister, I am telling this with full responsibility. He has referred to the hedging

deal. In his new book titled “Settlement of colossal fraud on Sri Lanka Government”, he has referred to the hedging deal. He is basically talking of the Exchange Control Regulations.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
What about the Hilton affair?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Whether it is Hilton or whatever, all those are part of it. Everything is there. If the Hilton affair was originated by us, who made it a big blunder? When it could have been solved, you all brought in the expropriation bill and then made the loss of Rs. 2 billion into Rs. 25 billion. Now, what is happening?

අන්න ඒ වාගේ තත්ත්වයක් තිබෙනකොට, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, EPF එක, ETF එක, රක්ෂණ අරමුදල යන මේ සියලු ආයතනවල සල්ලි පාවිච්චි කරලා, අද ඒ ආයතන නැති කරගෙන යනවා. මම පෙන්වන්නම්, දේශපාලන ඝාතකයන් වාගේම ආර්ථික ඝාතකයන්ද සිටින බව. මේ ආර්ථික ඝාතන ගැන කථා කරනකොට මම කියන්න කැමැතියි, pyramid scam එක ගැන. කවුද ඒක මේ රටට ඇති කළේ? ඒ මහ බැංකුවේ අධිපති. ඒ වාගේම හෙජින් සූදුව ඇති කළේ කවුද? ඒත් මහ බැංකුවේ අධිපති. රත්තරන් විකිණීම සම්බන්ධයෙන් කවුද ඉදිරිපත් වෙලා ඉන්නේ? එතකොට මේ රටේ රුපියල අවප්‍රමාණ කරන්න ඕනෑ කියලා පී.බී. ජයසුන්දර කිව්වාම, "නැහැ, ඕනෑ නැහැ" කියලා අපේ අපනයනය අඩු වෙලා, ආනයනය වැඩි වුණු අවස්ථාවක් ඇති කරලා තිබෙන්නේ කවුද? ඒ වාගේම HSBC ණය ගන්න අවස්ථාව ඇති කළේ කවුද? ජාතික ඉතිරි කිරීමේ බැංකුව - NSB - සමඟ The Finance Company ගනුදෙනුව කළේ කවුද? මුදල් අමාත්‍යාංශයේ පී.බී. ජයසුන්දර කියනවා, එයා කළේ නැහැ කියලා. එහෙනම් මහ බැංකුවේ Monetary Board එකේ ඉන්නේ කවුද? ඒ වාගේම සෙලින්කෝ සමූහ ව්‍යාපාරය කඩා වැට්ටුවේ කවුද? ඒ වාගේම IMF එකට ඕනෑ විධියට "ඔව්, අපි රුපියල අවප්‍රමාණ කරනවා, අපි විදුලි බිල වැඩි කරනවා, තෙල් මිල ඒ විධියටම රැකගෙන ඉන්නවා, අපි ඔබතුමන්ලාට ඕනෑ විධියට නටනවා" කියලා රංජිත් සියඹලාපිටියත් එක්ක අත්සන් කරලා දුන්නේ කවුද? ඒ වාගේම Central Bank එක රුපියල අවප්‍රමාණ කරනකොට නිශ්ශබ්දව ඉඳලා, ඊට පසුව ඒකෙන් වෙනත් ප්‍රශ්න ඇති වනවාය කියලා, ඒ ආකාරයෙන් කටයුතු කරන්නේ කවුද? ඉතින් මේ සම්බන්ධයෙන් අද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

ගෝල්ඩන් කී ආයතනය, The Finance Company, හින්ගාරා ආයතනය සම්බන්ධ ගනුදෙනු ගැන බලන්න. තමන්ගේ සල්ලි තැන්පත් කරපු ඒ අහිංසක තැන්පත්කරුවන් අද බලාගෙන ඉන්නවා, කවදාද තමන්ගේ මේ සල්ලි ලැබෙන්නේ කියලා. මේ ආයතන කඩාගෙන වැටිලා දැනට අවුරුදු දෙකහමාරක්, තුනක් වෙනවා. අර ලලිත් කොතලාවල කියලා කියන්නේ මොනවා වුණත් රටට සේවයක් කරලා තිබෙන පුද්ගලයෙක්. රටේ ආර්ථිකය කඩා වැටුණාම ඒ අයට බැනලා හරියන්නේ නැහැ. හොඳයි, අපි කියමු ඒ අය වැරැදිකරුවන්මයි කියලා. නමුත් ඒ අයගේ සල්ලි - ප්‍රාග් ධනය - තැන්පත් කරලා තිබෙන්නේ කොහේද? සෙලාන් බැංකුවට රුපියල් මිලියන 4,000ක මුදලක් ලැබෙන්නට තිබුණා. සෙලින්කෝ සෙලිස්ටියල් ආයතනයට රුපියල් මිලියන 9,000ක මුදලක් ලැබෙන්න තිබුණා. ඒ සල්ලි අරගෙන අර තැන්පත්කරුවන්ට ගෙවුවා නම් ඒ අය මැරෙන්නේ නැහැ. අද වන විට ඒ තැන්පත්කරුවන් හතර දෙනෙක් දිවි නසාගෙන. තව කී දෙනෙක් ප්‍රශ්න ඇති කරගෙන තිබෙනවාද? නිවාඩ් කබ්රාල් වැනි පුද්ගලයන් මහ බැංකුවේ අධිපති හැටියට පත් කරලා, ඒ සමූහ ව්‍යාපාරය කඩා වැට්ටුවා. රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු නීතිපති මොහාන් පීරිස්ව ඒ කඩා වැටුණු සෙලාන් බැංකුවේ සභාපති කළා. මොන වාගේ විළිලජ්ජා නැති කටයුත්තක්ද මේ කරන්නේ? ඒ වාගේම තමයි ජනක රත්නායක වැනි පුද්ගලයන්. මම මේ නම් වශයෙන් කියන්නම්. ලලිත් කොතලාවලගේ Ceylinco Investment Company Limited එකෙන් සියයට 25ක් අරගෙන, MBSL කොටස්වලින් එවැනි ප්‍රමාණයක් අරගෙන අද කටයුතු කරගෙන යන ආකාරය බලන්න. මහ බැංකුවේ අධිපති, අජිත් දේවසුරේන්ද්‍ර, අනුර ප්‍රනාන්දු, රේනෝ සිල්වා වාගේ අය පත් කරගෙන මොන ආකාරයෙන්ද තමුන්නාන්සේලා කටයුතු කරගෙන යන්නේ? ඔන්න බලන්න, දැන් වෙන දේවල්. මා හේතු සහිතවයි මේ කරුණු ඉදිරිපත් කරන්නේ. Ceylinco Investment Company Limited අධ්‍යක්ෂවරුන්ගේ නම් සහිතවයි ඉදිරිපත් කරන්නේ. Ceylinco Investment Company Limited තමයි holding company එකක් වශයෙන් කටයුතු කළේ. ජනක රත්නායක මැතිතුමා තමයි අද අපනයන සංවර්ධන මණ්ඩලයේ - EDB - සභාපති. ලලිත් කොතලාවලට අයත් සියයට 35ක කොටස් ප්‍රමාණය බලහත්කාරයෙන් අත්සන් අරගෙන මාරු කරලා තිබෙනවා. සුප්‍රිම් උසාවියෙන් නඩු තීන්දුවක් දීලා තිබෙනවා, ලලිත් කොතලාවල, පද්මිණී කරුණානායක කියන ඒ වාගේ කට්ටියට අනිවාර්යයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයෙන් පිටතට යන්න බැහැ කියලා. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් අද උදේ කථා කරලා කියනවා, "මේ අය අධ්‍යක්ෂක මණ්ඩලයේ සිටිනවාද නැද්ද කියන එක ගැන කරුණාකරලා ඔබතුමන්ලාගේ ඇමති මණ්ඩලය මඟින් අපට දැනුවත් කරන්න" කියලා. එහි හිටපු Directorsලා වන ලලිත් කොතලාවල, පද්මිණී කරුණානායක, සිසිලියා කොතලාවල යන අයගේ නම් අද ඉවත් කරලා තිබෙනවා. කොයි ආකාරයෙන්ද එහෙම වුණේ? ඔවුන් ඉල්ලා අස් වුණාද, නැත්නම් බලහත්කාරයෙන් අස් කළාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි Ceylinco Celestial Residencies කියන කොම්පැනිය. ඔබතුමන්ලා ඒකේ අයිතිය නොවැම්බර් මාසයේ 11 වැනිදා නැවත ආණ්ඩුවට පවරා ගත්තා, expropriate කළා. ඒ අවස්ථාව වන කොට Ceylinco Homes Internationalවලින් ඇති කරලා තිබුණ Ceylinco Celestial Residencies කොම්පැනියේ වැඩ සියයට 80ක් ඉවර කරලා තිබුණා. ඒ කොම්පැනිය අවුරුදු 99කට පර්චස් 210ක් සහ තව පර්චස් 31ක් රුපියල් ලක්ෂ 30ක් බැගින් අරගෙන, ඒ සල්ලි ප්‍රමාණය සම්පූර්ණයෙන් ගෙවලා තිබෙද්දී, ඔබතුමන්ලා Ceylinco Celestial Residencies කියන කොම්පැනිය වැරදි නමකින් අත්පත් කර ගෙන තිබෙනවා. “Insurance company” කියලා කිව්වාට, Sinolanka Hotels and Spa (Pvt.) Limited කියන කොම්පැනිය තුළින් ඒ කොම්පැනිය අත්පත් කර ගෙන තිබෙනවා.

එතැනදී මම ගරු කරනවා, Professor Lakshman Watawalaට වාගේම, KPMG audit firm එකට. KPMG audit firm එක මේක තක්සේරු කරලා - offer කරලා - තිබෙනවා මිලියන 9,800කට. Professor Lakshman Watawala මේක මිලියන 6,900කට ගන්න ඉදිරිපත් වෙලා තිබෙන අවස්ථාවේදී, 2011 දෙසැම්බර් මාසයේ ලියා පදිංචි කරලා තිබෙන Sinolanka Hotels and Spa (Pvt.) Limited කියන කොම්පැනිය තුළින්, පියදාස කුඩාබාලගේ, ආඩම්බරගේ මොහන් ද අල්විස් හා නීල් හපුවිතාරණ කියන පුද්ගලයෝ stated capital එකක් තිබෙන Ceylinco Celestial Residencies ආයතනයේ share එකක් රුපියල් 40 බැගින් අරගෙන තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I have three minutes.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, you have one more minute.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මිලියන 9,800කට විකුණන්න පුළුවන් කොම්පැනියක් මිලියන 3,800කට විකුණන්නේ කොහොමද? අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා ලියුමක් එවලා තිබෙනවා මේ කොම්පැනිය දළ වශයෙන් මිලියන 3,500කට විකුණන්න පුළුවන් කියලා. අපි ගරු ඇමතිතුමාගෙන් අහනවා, මේ කොම්පැනිය විවෘත ටෙන්ඩරයක් තුළින් විකුණන්න බැරි ඇයි කියලා. අද The Finance Company Limited එකේ අධ්‍යක්ෂවරු බවට මහින්ද ප්‍රීති ජයවර්ධන මහතා, අජිත් එල්.දේවසුරේන්ද්‍ර මහතා, වී.ඩබ්ලිව්. දිසානායක මහත්මිය, තිස්ස හඳා ඒකනායක මහතා, එන්. අනුර ප්‍රනාන්දු මහතා, රාමනාදන් නඩරාජා මහතා, ආචාර්ය තිරුසම්පන්දන් මහතා, සෙන්තිල්වර්ල් මහතා, කේ.ජේ. යටවල මහතා, වෙරිල් රෝසා මහත්මිය කියන අය පත් කරලා තිබෙන්නේ කවුද? නමුත් සුප්‍රීම් උසාවියෙන් නවත්වලා තිබෙනවා ලලිත් කොතලාවල, පද්මිණී කරුණානායකලාව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් කරන එක. එහෙම නම් කොහොමද මේවා වෙලා තිබෙන්නේ? මේ වාගේ අපරාධ නිසා තමයි The Finance Company Limited එකේ අධ්‍යක්ෂවරුන්ට අද ඒ සල්ලි ගෙවා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. Sinolanka Hotels and Spa (Pvt.) Limited තුළින් මේ කොම්පැනිය මිලියන 4,800ට අරගෙන, ඒකෙන් සෙලාන් බැංකුවට මිලියන 2,800ක් ගෙව්වාම මිලියන 2,000කින් මොනවාද කරන්න පුළුවන්?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, now please wind up.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සම්බන්ධයෙන් අපිට කියන්න පුළුවන් වෙන්නේ, එක පැත්තකින් පටි තද කරනවා කියා ගෙන යද්දී අපේ කොළඹ නගර සභාවේ හඳා ජයවර්ධන Commissioner හරහා අද නොයෙකුත් අක්‍රමිකතා සිදු වෙමින් පවතිනවා කියන එකයි.

ක්‍රිකට් සජීවී විකාශන අයිතිය අද රටේ රූපවාහිනියට ලබා ගන්න පුළුවන් අවස්ථාව සම්පූර්ණයෙන් නැති කරලා Carlton Sports Network කියන කොම්පැනියකට ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඉතින් මේවා තුළින්-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, now please wind up. Otherwise I will have to reduce that time from the time allotted to your party.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, just give me two more minutes and I will finish my speech within that time.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති මොහාන් සමරනායක මහතා සහ MTV ආයතනය දන්වලා තිබෙනවා, "කරුණාකරලා අපට මෙය විකාශනය කිරීමට අයිතිය දෙන්න" කියලා. ඒ අය ඊට වැඩිය හාර, පන්සිය ගුණයක් ඒ වෙනුවෙන් වියදම් කරන්න ඉදිරිපත් වෙලා ඉන්නවා. නමුත් Carlton Sports Network එකට මිලියන 125කට මේ විකාශන අයිතිය අවුරුදු 3කට දෙන කොට, IPL එකට ඉන්දියාවෙන් මාස දෙකකට මිලියන 500ක් ගෙවනවා. ඉතින් ඊට වැඩිය ගෙවන්න සූදානම් MTV එක වාගේ කොම්පැනි. ශ්‍රී ලංකා රූපවාහිනියත් කියලා තිබෙනවා ඊට වැඩිය ගෙවන්න ඕනෑ කියලා. ඉතින් අපි අහන්නේ, මොකක්ද මේ කරන්න හදන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි සරත් ෆොන්සේකා මැතිතුමාට කරපු දේ. ආර්ථික ඝාතකයෝ වාගේම දේශපාලන ඝාතකයෝත් ඉන්නවා. දැන් එතුමා එළියට ඇවිල්ලා ඉන්නවා. එතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා, එතුමාගේ අනාගතය සම්බන්ධයෙන්. නමුත් එතුමාත් එක්ක 238 දෙනෙකුගේ රක්ෂා නැති වුණා. නමුත් එල්ටීටීඊ එකට අල්ලස් දුන්නු අල්ලස්කාරයෝ සම්බන්ධයෙන් මොනවාද කරලා තිබෙන්නේ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ravi Karunanayake, now, you have to wind up your speech. Otherwise I will reduce that time from the time allotted to your party. You have almost taken 42 minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will take just one more minute. අද මේ රටේ ආර්ථිකය ඉතාම භයානක තත්ත්වයකයි තිබෙන්නේ. ශ්‍රීලංකන් ආයතනය පාඩු ලබනවා. පසු ගිය සුමානේ රගර් ක්‍රීඩාව සඳහා Carlton Super Seven Trophy එකක් තිබ්බා. නමුත් මේ ආයතනයෙන් ඒවාට මිලියන ගණනක් වියදම් කරනවා. රක්ෂණ සංස්ථාවේ සහ ශ්‍රීලංකන් ගුවන් සේවයේ මුදල් ඒවාට පාවිච්චි කරනවා. එක පැත්තකින් ඔබතුමන්ලා කියනවා වියදම අඩු කරන්න කියලා. නමුත් අනෙක් පැත්තෙන් අලාභ ලබන, ජනතාවගේ බදු සල්ලි තුළින් දුවන මේ වාගේ කොම්පැනිවල මුදල් ඒ තරගවලට වියදම් කරන්න ඔබතුමන්ලා කොයි ආකාරයෙන්ද ඉඩ දෙන්නේ? අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ රටේ ආර්ථිකය, ජාතික ආර්ථිකය ගැනයි. ඒ නිසා ඔබතුමාට වග කීමක් තිබෙනවා, අපි මේ ඉදිරිපත් කරලා තිබෙන තර්ක විතර්කවලට උත්තර ලබා දෙන්න.

අද මෙහෙම වියදම් අඩු කරන්නටය කිව්වත් කොළඹ නගර සභාවේ හඳා ජයවර්ධන මැතිනියට backup cars 4ක් තිබෙනවා. ඇමතිවරුන්ටවත් නැති දේවල් ඒ කොමසාරිස්තුමියට තිබෙනවා.

රක්ෂාවල් ඇති කරන්නටය කියා අද එතුමියගේ නංගිට, අක්කලාට රක්ෂා දී තිබෙනවා. අපි කියන්නේ වියදම් අඩු කරන්නටය කියායි. ජනතාව එක්සත් ජාතික පක්ෂය එතැනට පත් කරලා තිබෙන්නේ පිරිසිදු පාලනයක් ඇති කරන්නයි. ඒ සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ මේ රටේ ආර්ථිකය කඩා වට්ටන්න එපාය කියන එකයි. කරුණාකරලා මේ විධියට මේ දූෂණ වෙන එක නවත්වන්නටය කියා අපි කියනවා. රට ගැන හැඟීමක් තිබෙන නිසා තමයි අපි මේවා සාක්ෂි සහිතව ඉදිරිපත් කරන්නේ. ඔබතුමන්ලාට කියන්න පුළුවන් අරක වෙන්නේ නැහැ, මේක වෙන්නේ නැහැ, කුහකකමින් කථා කරනවාය කියලා. එවැනි අසත්‍ය කථාවලට රැවටෙන්න එපා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, please wind up now. You have almost taken four minutes extra.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපට අවශ්‍ය වෙන්නේ මේ රටේ ආර්ථිකය සවි ශක්තිමත් කරලා, ඔබතුමන්ලාටත් ජීවත් වෙන්න පුළුවන් ජීවන රටාවක් ඇති කරලා, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලු දෙනාට එකට ජීවත් වෙන්න පුළුවන් ශක්තිමත් ආර්ථිකයක් රටේ ඇති කරන්නයි. දූෂණය නැති කරලා, වංචාව, දූෂණය පැත්තකට දමලා කටයුතු කරන්න පුළුවන් අවස්ථාවක් ඇති කරන්නටය කියන එක කාරුණිකව මේ රජයට මතක් කරමින් වෙලාව නැති නිසා නිශ්ශබ්ද වෙනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී කියනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The Hon. Eran Wickramaratne is to second the Adjournment Motion. You have 19 minutes.

[අ.භා. 3.24]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා. ලංකාවේ ආර්ථිකය පිළිබඳව වාගේම ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති කරණ කොට ගෙන ඇති වී තිබෙන විපාක පිළිබඳව කරුණු රාශියක් මෙහි තිබෙනවා. විශේෂයෙන්ම ආර්ථිකයට වෙලා තිබෙන පාඩුව පිළිබඳවත්, ඒ වාගේම ජීවන වියදම තවදුරටත් ඉහළ යාමට බලපාන ආකාරය පිළිබඳවත් කරුණු සඳහන් වෙනවා.

අද අපට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගෙන් දීර්ඝ කථාවක් අහන්න ලැබුණා. එතුමා සඳහන් කළ කරුණු මම ස්ථිර කරනවා. ඒ වාගේම අපි පසු ගිය දවස්වල කොටස් වෙළෙඳ පොළ ගැනත් දීර්ඝව කථා කළා. NSB එකේ, TFC එකේ වෙලා තිබෙන ප්‍රශ්න පිළිබඳවත්, අර්ථ සාධක අරමුදලේ -EPF- එකේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය පිළිබඳවත් අපේ සහෝදර මන්ත්‍රීවරු කථා කරාවි.

අපි දන්නවා, දැන් මහ බැංකුවත්, රජයත් අලුත් දෙයක් පටන් අරගෙන තිබෙනවා. ඒ තමයි දවස් තුනෙන් තුනට වාගේ මෙවැනි යම්කිසි නිවේදන පළ කරන එක. ඊයේ හැන්දෑවේ -රාත්‍රි කාලයේදී වාගේ - මහ බැංකුවෙන් තවත් නිවේදනයක් නිකුත් කළා, මූල්‍ය ආයතනත්, රජයත් අස්ථාවරයට පත් කරන්න සැලසුමක් තිබෙනවාය කියා. ඒ නිවේදනය පළ කළේ මහ බැංකුවෙනුයි. ඇත්තෙන්ම මහ බැංකුවෙන් පළ කරන නිවේදනවලින් නම් කිසිම ප්‍රයෝජනයක් නැහැ. මොකද, "හොරාගෙ අම්මගෙන් පේන අහනවා වාගේ" වැඩක් තමයි මහ බැංකුවෙන් නිවේදන පළ කිරීම. ඇත්තෙන්ම අපි දිගින් දිගටම රජයෙන් ඉල්ලා තිබෙන්නේ අපි එල්ල කරන චෝදනා සම්බන්ධයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් මාර්ගයෙන් මේක විමසා සාකච්ඡා කරලා, මේකේ සත්‍යතාවක් නැත්නම් ඒක ඔප්පු කරන ලෙසයි. සත්‍යතාවක් තිබෙනවා නම් රජය මොනවාද ඒ ගැන කරන්නේ කියන එක අපට දැනගන්නට අවශ්‍යයි. මහ බැංකුව අමු අමුවේ රෙගුලාසි, මූලධර්ම උල්ලංඝනය කරනකොට, උදාහරණයක් හැටියට blue-chip companiesවල දමන්න ඕනෑකොට, red-chip companies ඒ කියන්නේ අලාභ ලබන කොම්පැනිවල ආයෝජනය කරනකොට අපට වගකීමක් තිබෙනවා ඒ ගැන ප්‍රශ්න කරන්න. ඒ වාගේම ලැයිස්තුගත කොටස්වල විතරක් නොවෙයි ලැයිස්තුගත නොවන කොටස් - non-listed shares -වලත් ආයෝජනය කරනකොට මාස 17කට පසුව, මීට දවස් කිහිපයකට උඩදී පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරපු අර්ථසාධක අරමුදලේ රපෝර්තුවේත් සඳහන් කරලා නැහැ, මොනවාද මේ ආයෝජන කියලා. විශාල ප්‍රශ්නයක් තිබෙනවා. කරුණු හුඟාක් අවශ්‍යයි. ඒ කරුණුත් නැහැ. ඒ නිසා අපි මේ ආයෝජන ගැන සොයා බලන්න අවශ්‍යයි. ඒ වාගේම මහ බැංකුවට වගකීමක් තිබෙනවා, "fit and proper" test එක අනුව මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂ තනතුරුවලටත්, ප්‍රධාන කළමනාකාර තනතුරුවලටත් පුද්ගලයන් පත් කරන්න.

මම එක උදාහරණයක් දෙන්න කැමැතියි. සෙලාන් බැංකුව අස්ථාවර වුණු අවස්ථාවෙන් පස්සේ ඒ බැංකුව ස්ථාවර කළාට පසුව එක පාරටම ඒ බැංකුවේ උසස් කළමනාකාරිත්ව ස්ථානවල හිටපු දෙදෙනෙක්ව බැංකුවෙන් ඉවත් කළා. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉඳලා අස්ථාවර වුණු අවස්ථාවට එන කල් ක්‍රියා කරපු නිසා දිගින් දිගටම ඒ අය අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න එක සුදුසු නැහැ කියලා ඒ අයව ඉවත් කළා. මොකක්ද ඒ අය කරපු වරද කියලා මම අහන්න කැමැතියි. සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ minutes බලපුවාම ඒ අය කොතලාවල මහතා සහ අනෙක් අධ්‍යක්ෂවරු ගත්තු තීරණවලට විරුද්ධව නැඟී හිටපු කළමනාකරුවන්. ඒ minutesවල සඳහන් කරලා තිබෙනවා, ඒ අය විරුද්ධ වුණා කියලා. නමුත් මහ බැංකුව තීරණයක් ගත්තා, ඒ අයවත් අයින් කරන්න. මොකද ඒ අය සුදුසු නැහැ කියලා; that they are not fit and proper කියලා. ඒ අවස්ථාවේදී එච්චර තීරණයක් මහ බැංකුවට ගන්න පුළුවන් වුණා නම් මම අහන ප්‍රශ්නය මෙයයි. අපේ ගරු මන්ත්‍රීවරුනුත් මේ ගැන සඳහන් කරලා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළේ හොරකම්වල යෙදී සිටින අය ගැන දැනටම ඔප්පු වෙලා තිබෙනවා. ඒ අය අදටත් මූල්‍ය සමාගම්වල තනතුරු දරනවා. මම අහන ප්‍රශ්නය තමයි, ඒ අය කොහොමද fit and proper වෙන්නේ කියලා. ඇයි ඒ අයව අස් කරලා නැත්තේ කියලා මම අහන්න කැමැතියි. හරි තීරණ ගන්නේ නැත්නම් දෙවිධියකට ක්‍රියා කරන බැංකුවක් නිකුත් කරන නිවේදනවලින් අපට කිසිම වැඩක් නැහැ.

අපට තිබෙන්නේ, ව්‍යවස්ථාදායක වගකීමකුයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට ඒ ව්‍යවස්ථාදායක වගකීම තමයි අපි ඉෂ්ට කරන්නේ. අපි මේ දේ දිගින් දිගටම ප්‍රශ්න කරන කොට ඒ තේරීම් කාරක සභාව පත් කරලා මේක ගැන තොරතුරු දැන ගෙන රටට එළිදරව් කිරීම අවශ්‍යයි.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මම කොටස් වෙළෙඳ පොළ ගැන කථා කරන්න යන්නේ නැහැ. මේ රටේ ඊට වඩා හුඟාක් ප්‍රශ්න තිබෙනවා. අපේ මුළු ආර්ථිකයම දිහා බැලුවොත් කොටස් වෙළෙඳ පොළේ සිදු වන දූෂණය නැත්නම් දුසැරිය බොහොම සුළු ප්‍රමාණයක් වෙන්නට පුළුවන්. "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ඉදිරිපත් කරන කොට එදා එහි සඳහන් කළා, අලුත් පාර්ලිමේන්තුවේ පළමු වැනි පනත විධියට අල්ලස හා දූෂණයට එරෙහිව පනතක් ගෙන එනවාය කියලා. ඒ විතරක් නොවෙයි "මහින්ද චින්තන ඉදිරි දැක්මේ" සඳහන් වෙනවා, ඒ පනත ප්‍රායෝගිකව ක්‍රියා කරන්න ඒ පනත ගෙනැල්ලා ඉවර වෙලා මාස තුනක් තුළදී රෙගුලාසිත් ගේනවා කියලා. නව පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භ කරලා දැනට අවුරුදු දෙකහමාරක් විතර වෙනවා. නමුත් මහින්ද චින්තනයෙන් වුණු පොරොන්දුව තවමත් එතැනට ඇවිල්ලා නැහැ. ඒක ජනතාවට වුණු පොරොන්දු උල්ලංඝනය කිරීමක් නැත්නම් කඩ කිරීමක් කියලා සඳහන් කරන්න ඕනෑ. නමුත් ජනාධිපති අපේක්ෂකතුමා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" වැඩ සටහනෙහි මෙහෙම පනතක් ගෙනෙනවා කියලා ඉදිරිපත් කරන කොට ඔහු එවකට හිටපු ජනාධිපතිතුමායි. මේ රටේ අල්ලස, දූෂණය නැත්නම් දුසැරිය ගැන ප්‍රශ්නයක් තිබෙනවා කියලා එතුමා පිළිගෙන තිබෙනවා. ඒකයි, එහෙම පනතක් ගෙනෙන්න යන්නේ කියලා සඳහන් වන්නේ. ඉතින් ඔහු ඒක පිළිගත්තා නම් ඇයි බලය ගත්තාට පස්සේ අවුරුදු දෙකකුත් පැනලා කිසිම ක්‍රියා මාර්ගයක් අරගෙන නැත්තේ? ක්‍රියා මාර්ගයක් අරගෙන නැතුවා විතරක් නොවෙයි අල්ලසට, දූෂණයට එරෙහිව තිබුණු කොමිෂන් සභාවේ ස්වාධීනත්වයත් කඩ කරලා තිබෙනවා. ඒ ස්වාධීනත්වය නැති කළා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කිරීමෙන්. ඉතින් ඉස්සර තිබුණු තත්ත්වය නොවෙයි දැන් තිබෙන්නේ. පොරොන්දුව මොනවා වුණත් ඉස්සර තිබුණු තත්ත්වයෙන් තවත් පස්සට ගිහිල්ලා තිබෙනවා කියලා සඳහන් කරන්න අවශ්‍යයි. අල්ලසට, දූෂණයට එරෙහිව කොමිෂන් සභාවක් තිබෙන කොට විශේෂයෙන්ම පොදු කාරණා තුනක් තිබෙන්නට ඕනෑ. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ 2002-2004 ආණ්ඩුව කාලයේදී -ඒ කෙටි කාලය තුළදී- යහ පාලනය පිළිබඳව වැදගත් දේවල් සෑහෙන ප්‍රමාණයක් අපි ඉෂ්ට කළා.

අපි දන්නවා, Fiscal Management (Responsibility) Act එක ගැන. අය වැය පරතරය පාලනය කිරීම පිළිබඳ වූ ඒ පනත අපි පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒක ගෙනාවේ යහ පාලනය ස්ථාපිත කරන්නයි. ඒ වාගේම රෝම ප්‍රඥප්තිය සම්බන්ධයෙන් කොපමණ බලපෑම් තිබුණත් එවකට හිටපු අගමැතිතුමා අත්සන් කළේ නැත්තේ මෙන්න මේ කාරණය නිසායි. අපි කිව්වා, "මේ රට යහ පාලනයට ගෙනෙන්න රට වැසියන්, ඒ වාගේම ජනතා නියෝජිතයන් වන අපි වගකීම ගන්න ඕනෑ. පිට රටියන් තුළ බලාපොරොත්තුව තබන්නට බැහැ. යහ පාලනය පිළිබඳ වගකීම අපි අරගෙන අපි ක්‍රියා කරන්න ඕනෑ"යි කියලා. ඒකයි අපි ඒකට අත්සන් කළේ නැත්තේ. ඒ වාගේම ඒ සමයේදී තිබුණු අපේ ආණ්ඩුවේ අගමැතිතුමාගේ බලපෑම තුළින් එවකට හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය 2004 දී United Nations Convention against Corruption එකට අත්සන් කළා. This Convention was also ratified. ඉතින් ඒ කෙටි කාලය තුළ මේ රට යහ පාලනයට ගෙන යන්නට එදා ඒ රජය සෑහෙන වෑයමක් දැරුවා. එම නිසා තමයි අද මා මේ ගැන විශේෂයෙන්ම කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සම්මුතියේ තිබෙනවා, මූල ධර්ම තුනක්. පළමුවන එක තමයි, අල්ලසට හා දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වන කොමිසමක් තිබෙනවා නම් ඒ කොමිසම සම්පූර්ණයෙන්ම විධායකයේ මැදිහත් වීමෙනුත්, ඇඟිලි ගැසීමෙනුත් තොරව ක්‍රියා කරන්න අවශ්‍යයි කියන එක. ඒක එක මූලික පදනමක්. ඒ පදනම කඩාකප්පල් වී තිබෙනවා. දෙවනුව, ඒකට පත් කරන නිලධාරින්ට ස්වාධීනව ක්‍රියා කරන්න නිශ්චිත කාල සීමාවක් තිබෙන්න ඕනෑ. තුන්වනුව, මුදල් පිළිබඳව ස්වාධීනත්වයක් ඒ කොමිෂන් සභාවට අවශ්‍යයි. මේ මූල ධර්ම තුන ඉෂ්ට වන්නට ඕනෑ.

මා දැන් මේ ගැන කථා කරන්න හේතුව මේකයි. තව අවුරුද්දකින් අපට කියන්නට එපා, අපි මේ අල්ලස, දූෂණය පිළිබඳව රජය අපහසුතාවට පත් කරනවාය කියලා. මීට මාස දෙකකට, තුනකට උඩදී ජිනීවා නුවරට ගිහිල්ලා මානව අයිතිවාසිකම් ගැන ලෝක ප්‍රජාවට උත්තර දෙන්න අපට සිද්ධ වුණා. මේ ලෝක ප්‍රඥප්තිය පිළිබඳවත් 2013 දී අපේ රජයට උත්තර බඳින්නට සිද්ධ වනවා. එම නිසා තමයි මා මේ කාරණය අද මතු කරන්නේ. ජාත්‍යන්තරයට මතු කරනවා වාගේ අපි මේ කාරණය පස්සේ මතු කරන්නේ නැහැ.

රට තුළ යහ පාලනය පිළිබඳව වග කීම තිබෙන්නේ අපටයි. එම නිසා රජය දැන් ක්‍රියා කරන්න අවශ්‍යයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමක් තිබෙන කොට පැරණි ක්‍රමය අනුව නම් ඒක විමර්ශනය කරන්නට පොලිස් නිලධාරින් පත් කරනවා. පොලිස් නිලධාරින් පත් කරලා මේ කටයුත්ත කරන්නට බැහැ. අද අල්ලස, දූෂණය පිළිබඳව සොයා බලන්න එක එක විශේෂඥයන් අවශ්‍යයි; ගණකාධිකාරිවරුන් අවශ්‍යයි; මූල්‍ය දැනුම තිබෙන අය අවශ්‍යයි; බැංකු පසු බිම් තිබෙන අය අවශ්‍යයි; නීතිඥවරුන් අවශ්‍යයි; බහු විශේෂඥ කණ්ඩායම් අවශ්‍යයි.

හොංකොං නුවර තිබෙන අල්ලස්, දූෂණ කොමිසම හොඳ මොඩලයක් හැටියට ලෝකයේ හැම තැනකටම වාගේ ඉදිරිපත් කරනවා. මොකද, ඒ රටේ අල්ලස, දූෂණය අවම කරලායි තිබෙන්නේ. සමහර අයගේ මතයක් තිබෙනවා, රටක් සංවර්ධනය වන කොට අල්ලස, දූෂණය පොඩ්ඩක් තිබුණාට කමක් නැහැ, රට සංවර්ධනය වනවා නම් කියලා. මේක ඇත්තටම වැරදි මතයක්. අල්ලස, දූෂණය අවම කරන තරමට තමයි රටක් සංවර්ධනය කරන්නට පුළුවන්. එතකොට තමයි, සෑම ආයෝජකයකුටම එක හා සමානව සැලකෙන්නේ. එම නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමත් පාර්ලිමේන්තුවට වග කියන්නට අවශ්‍යයි. විධායකය නොවෙයි, පාර්ලිමේන්තුවෙන් තමයි මුදල් වෙන් කරන්නට ඕනෑ. මේ සඳහා මුදල් වෙන් කරන්නට ඕනෑ විධායකය නොවෙයි. පාර්ලිමේන්තුවෙන්ම මුදල් වෙන් කරන්නට අවශ්‍යයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ ස්වාධීනත්වය කැඩිලා තිබෙනවා. අපට මතකයි, කලකට ප්‍රථමයෙන් පියසේන රණසිංහ කියා මහත්මයෙක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපති හැටියට පත් කළා. නමුත් ඊට පස්සේ ජනාධිපතිතුමා ඔහුව අයින් කළා. ඒකේ ස්වාධීනත්වයක් නැහැ. නියෝජ්‍ය ඇමති කෙනෙක් ගැන විමර්ශනය කරමින් යන කොට එක වරම ඒ විමර්ශනය කරන පොලිස් නිලධාරින්ව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් අයින් කළා.

ඒකේ ස්වාධීනත්වයක් නැහැ. ඒ බව අපට පෙනෙනවා. ඒ වාගේම හැකියාව ඇති විශේෂඥයන් මේකට අවශ්‍යයි. විශේෂයෙන්ම අල්ලස, දූෂණයට එරෙහිව ජනතාව දැනුවත් කරන්නට ඕනෑ. සිවිල් සමාජය එකතු කර ගන්නට අවශ්‍යයි. මේ අවස්ථාවේදී ප්‍රඥප්තියෙන් කොටස් කිහිපයක් කියවන්නට මම කැමැතියි.

Article 5.1 of the United Nations Convention against Corruption states, I quote:

> "Each State Party shall, in accordance with the fundamental principles of its legal system, develop and implement or maintain effective, coordinated anti-corruption policies that promote the participation of society and reflect the principles of the rule of law, proper management of public affairs and public property, integrity, transparency and accountability."

මේකේ සඳහන් වෙනවා, කළ යුතු දේ සම්බන්ධව. ඒ විතරක් නොවෙයි. පෞද්ගලික අංශයේ දූසැරිය අල්ලා ගන්න අපේ නීතිය තුළ ක්‍රමයක් නැහැ. අපේ නීතියේ වෙනස් වීමක් කරන්න ඕනෑ, පෞද්ගලික අංශයත් මේක තුළට ගෙනෙන්නට. 2009 දී හොංකොං නුවර දූසැරියෙන් සියයට 65ක්ම පෞද්ගලික අංශයෙන් තමයි අල්ලා ගත්තේ. රාජ්‍ය අංශයෙන් සියයට 28ක් පමණයි අල්ලා ගත්තේ. මේ වෙනස නීතියෙන්ම කරන්න අවශ්‍යයි. අපේ කොමිසමේ මහත්වරු තුන් දෙනෙක් ඉන්නවා. සාමාන්‍යයෙන් පත් කරන්නේ විශ්‍රාම ගිය අය. නමුත් අනෙක් රටවල සාමාන්‍යයෙන් පත් කරන්නේ ස්වාධීන වෘත්තීයවේදීන්; තවත් සෑහෙන කාලයක් වැඩ කරන්න පුළුවන් අය. සමහර රටවල එක් කෙනෙක් පමණයි - එක මහතෙක් පමණයි.- ඉන්නේ. නමුත් ඔහුට ස්වාධීනව ක්‍රියා කරන්න පුළුවන්. අපි දන්නවා, 2013 දී මේකට උත්තර බඳින්න අවශ්‍ය බව.

දැන් මොනවාද සිදු වන්නේ? Attorney-General's Department එකෙන් දෙදෙනෙක් පත් කර තිබෙනවා, මේකට උත්තර බඳින්න. ප්‍රශ්නයක් එනකොට හොඳ උත්තරයක් බඳින්න තමයි මේ රජය දිගින් දිගටම ක්‍රියා කර ගෙන යන්නේ. අල්ලස, දූෂණය කියන්නේ නීතිමය ප්‍රශ්න නොවෙයි. අල්ලස, දූෂණය - දූසැරිය- කියන එක සමාජයීය ප්‍රශ්න. ඒ නිසා මේකට සමාජ මට්ටමෙන් ක්‍රියා කරන්නට ඕනෑ. මේ ප්‍රඥප්තිය තුළ සඳහන් කර තිබෙනවා, අල්ලස, දූෂණය අවම කරන්න සිවිල් සමාජය එකතු කරන්නට ඕනෑ කියා. නමුත් අපේ රජය මොනවාද කරන්නේ? NGO කිය කියා අල්ලස දූෂණයට විරුද්ධව නැඟී සිටින යක්ෂයෙක් මවාගෙන. අද සඳහන් කළා, අපේ අමරසේකර මහතා ගෙන යන සටන ගැන. ඒ සම්බන්ධව ඔහුට සුබ ප්‍රාර්ථනා කරන්නට මම කැමැතියි.

Transparency International වැනි NGO ආයතනවලින් විශාල සේවයක් සිදු වෙනවා. ඒ වුණාට මොනවාද වුණේ? එතැන හිටපු අධ්‍යක්ෂතුමාගේ -ක්‍රිශාන්ත වැලිඅමුණ මහතාගේ- නිවසට බෝම්බ ප්‍රහාරයක් තමයි කලකට ප්‍රථමයෙන් ලැබුණේ. අපි සිවිල් සමාජය එකතු කර ගන්න අවශ්‍යයි. අවාසනාවකට මට මේක සිංහලෙන් කියවන්න බැරි වුණා. මොකද, මේක සිංහලටත් දෙමළටත් පරිවර්තනය කර නැති නිසා. මේක කොහොමද සිංහලෙන් දෙමළෙන් ලබා ගන්නේ? උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසමේ රපෝර්තුව තවම සිංහලෙන් දෙමළෙන් ලැබිලා නැහැ. ඇයිද කියා මම දන්නේ නැහැ. රටේ ජනතාව දැනුවත් වෙනවාට අකැමැත්තක් තිබෙනවාද කියා මම දන්නේ නැහැ. මොකද, මේවා අපේ භාෂාවලින් නැහැ.

මහජනතාව දැනුවත් කිරීමට රුපියල් මිලියන 2යි වෙන් කර තිබෙන්නේ. හොරකම, වංචාව රුපියල් බිලියනවලින් සිදු වන්නේ. දැනුවත් කිරීමට රුපියල් මිලියන 2යි. අපේ සහෝදර මන්ත්‍රීවරු පෙන්නුවා, කොටස් වෙළෙඳ පොළේ එක කොටසකින් රුපියල් බිලියන 1.5ක හොරකමක් සිදු වෙලා තිබෙන බව. නමුත් මහජනතාව දැනුවත් කිරීමට රුපියල් මිලියන 2ක් පමණයි වෙන් කර තිබෙන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම අවසන් කරනවා. මට දැන ගන්න අවශ්‍ය දෙයක් තිබෙනවා. මානව අයිතිවාසිකම රට තුළ විතරක් සීමා වෙලා. මානව අයිතිවාසිකම කියන්නේ ජාත්‍යන්තර දෙයක්. රටකට සීමා නැහැ. මේ ප්‍රඥප්තියේ තිබෙනවා අල්ලස, දූෂණය -දූසැරිය- ජාත්‍යන්තර ප්‍රශ්න බව.

මේවාට ජාත්‍යන්තර නීති තිබෙනවා. මොහොතකටවත් හිතන්න එපා සිංගප්පූරුවේ ගිණුමක හරි යුරෝපයේ ගිණුමක හරි මුදල් දාලා බේරෙන්න අවස්ථාවක් ලැබෙයි කියලා. අද ප්‍රංශයේ හොයලා බලනවා, අප්‍රිකාවේ අධිරාජ්‍යවාදීන් කර තිබෙන හොරකම් ගැන. ඒ අයව ගෙන්වනවා.

මේ රටටත් දවසක් එනවා. ජාතික ධනය හොරකම් කරපු අයව අල්ලන්න අවස්ථාවක් තිබෙනවා. මේක ජාත්‍යන්තර ප්‍රශ්නයක්. කියන්න එපා මේක රටකට සීමා කරලා තිබෙන ප්‍රශ්නයක් කියලා. එක රටක ධනය අරගෙන වෙන රටක හංගන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා කොටස් වෙළෙඳ පොළේ දූසැරිය විතරක් නොවෙයි, අනෙක් තැන්වල තිබෙන දූසැරිය ගැනත් සොයලා බලන්න කියලා වුවමනාවෙන් ඉල්ලමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 3.43]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය පැය එකහමාරක් තුළ අපට අහන්නට ලැබුණා වැදි බණ. ඇයි මම ඒවාට වැදි බණ කියලා කියන්නේ? සියලුම පස් පව් කරලා ඊට පස්සේ අනිත් අයට බණ දේශනා කරනවා. මම කියන්න කැමැතියි, විවෘත ආර්ථිකය ගෙනාපු එක්සත් ජාතික පක්ෂය තමයි මේ රටේ අන්ත දූෂිත හා මිනී මරපු පක්ෂය කියලා. මම තේරුම් කරලා දෙන්නම් කොහොමද ඒවා කළේ කියලා. දූෂණය තුළින් අපේ රණ විරුවෝ දහස් ගණනක් ඝාතනය කරපු පක්ෂය තමයි එක්සත් ජාතික පක්ෂය. ඒක මම තමුන්නාන්සේලාට පෙන්වලා දෙන්නම්.

අපේ පක්ෂයේ මහ ලේකම් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. ඒ වාගේම ගරු මංගල සමරවීර මැතිතුමාත් සිටියා නම් මම කැමැතියි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් ඉන්නවා. ඒ කාලයේ මොකක්ද සටන් පාඨය? "දුෂ්ට එක්සත් ජාතික පක්ෂයේ භීෂණය හා දූෂණය මේ රටින් තුරන් කරන්න" කියලා තමයි 1994 දී ජනතා වරම ඉල්ලුවේ. 1994 දී මේ රටේ ජනතාව නැඟිටලා කිව්වා, එක්සත් ජාතික පක්ෂයේ භීෂණ හා දූෂණ යුගය අවසන් කරන්න තමයි අපි ගිහිල්ලා ඡන්දය පාවිච්චි කරන්නේ කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා ඒ කාලයේ හිටියේ නැහැනේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, ඒ කාලයේ මම හිටියේ පිට රට. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මම කථා කරනවා. මොකක්ද අපි මේ කියන්න යන්නේ? හොඳට දැන ගන්න. එක්සත් ජාතික පක්ෂ කාලය තුළ ජනාධිපති කාර්යාලයේ වැඩ කරපු නිලධාරින් -තමුන්නාන්සේලා

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

වාගේ ඒ අයගේ නම් කියලා සැකයක් ඇති කරන්න මට වුවමනාවක් නැහැ. නම් කියන්නේ නැතුව මම කියන්නම්- යුද හමුදාවට අවශ්‍ය body armour ගෙන්වීමේදී සිදු කළ දූෂණ නිසා ඊළාම් යුද්ධයේදී ඒවා ඇඳගෙන ගිය අපේ සොල්දාදුවන් දහස් ගණනක් ඝාතනය වුණා. මේ ගොල්ලෝ නේද වැද්දෝ හැටියට අද අපට බණ කියන්නේ? සිරිකොතේ විදුලි බිල ගෙවා ගන්න බැරි, වතුර බිල ගෙවා ගන්න බැරි අය මේ සභාවට ඇවිල්ලා කළමනාකරණය ගැන උපදෙස් දෙන්න කථා කරනවා. හොඳට කල්පනා කරලා බලන්න. මේ රටට අන්ත දූෂණය ගෙනාවේ කවුද? ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා පොඩි බබ්බු. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා වැනි අයගෙන් අහන්න. මුලින්ම තමුන්නාන්සේලාගේ හොර අල්ලලා දුන්නේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමායි. ඩබ්ලිව්. තල්ගොඩපිටිය කොමිසම පත් කළේ කවුද කියලා ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කියන්න. එක්සත් ජාතික පක්ෂයේ හිටපු ඇමතිවරු කී දෙනෙක් ඒකට අහු වුණාද? එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය කාලය තුළ -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

The Thalgodapitiya Commission found some Ministers in the Bandaranaike Government guilty.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Some of them.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

No, no, others also.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Anyway, the Commission was appointed by the Hon. S.W.R.D. Bandaranaike.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order. ඔබතුමා මගේ නම සඳහන් කරපු නිසා කියන්නම්. තල්ගොඩපිටිය කොමිසමෙන් සිද්ධ වුණේ මොකක්ද? බණ්ඩාරනායක ආණ්ඩුවේම සී.ඒ.එස්. මරික්කාර් මහත්මයා, බෙලිගම්මන මහත්මයා -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ, බෙලිගම්මන නැහැ. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

කොහොම හරි බණ්ඩාරනායක ආණ්ඩුවේ ඇමතිවරු වැරදිකාරයෝ කෙරුවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ වුණාට ඒක පත් කළේ බණ්ඩාරනායක මහත්මයා. Are you denying that?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

That is true.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Let me continue.

ඒ කාරණාවටත් අමතරව මම කියන්නේ මේකයි. මේ ගොල්ලෝ මෙතැන කථා කරන්නේ උපාසකයෝ හැටියටයි. ඒ අවුරුදු 17 තිස්සේම විවිධාකාර දූෂණ පිළිබඳ නිදසුන් සිය ගණනක් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. තමුන්නාන්සේලා කථා කළා නිහාල් ශ්‍රී අමරසේකර මහත්තයා ගැන. අපි එතුමාට ගරු කරනවා. එතුමා මුලින්ම ජනතාවගේ අවධානයට ආවේ කොහොමද? එතුමා හිල්ටන් ගනුදෙනුව ගැන කරුණු ඉදිරිපත් කළා. අද ගලදාරි ගැන කථා කරනවා. තමුන්නාන්සේලා කරුණාකරලා මේ ගරු සභාවට කියන්න, ශතයක්වත් අය කරන්නේ නැතිව ගලදාරි ඉඩම දුන්නේ මොන පදනමක් මතද කියලා. ඒ කාලයේ හිටපු විදේශ කටයුතු ඇමති හමීඩ් මැතිතුමාගේ ගිණුමට ඒ කොටස් මුදල් ඇතුළු වුණේ කොහොමද? තමුන්නාන්සේලා හොඳට දන්නවා කොරියාවේ දානපතියෙක් මේ රටේ හාරිස්පත්තුව සංවර්ධන පදනමට රුපියල් 2,50,000ක් දුන්නා කියලා. මා හිතන විධියට ඔබතුමාත් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉන්න කාලයේ මේ පිළිබඳව කරුණු සොයා බැලුවා. රුපියල් 2,50,000ක චෙක්පත බාට්ලීට් බැංකුවේ ඔබතුමන්ලාගේ විදේශ කටයුතු ඇමතිතුමාගේ පෞද්ගලික ගිණුමේ තැන්පත් කළේ කොහොමද? ඒවා තමුන්නාන්සේලා දන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ අද ඊයේ පක්ෂයට ආපු අය. තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසය, දූෂණ ඉතිහාසයක් කියලා මම තමුන්නාන්සේලාට කියනවා.

තමුන්නාන්සේලා දූෂණය ගැන කථා කරනවා. ඊළාම් යුද්ධයේදී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට පත් වෙලා යුද්ධය කර ගෙන ගිය ආකාරය තමුන්නාන්සේලා ගහපු ගැහිලි එක්ක සංසන්දනය කරලා බැලුවාම එක වචනයක, අබමල් රේණුවක දූෂණයක් ගැන තමුන්නාන්සේලාට කථා කරන්න පුළුවන්ද? එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ යුද්ධය දිනන්න බැරි වුණේ ඇයි? තමුන්නාන්සේලාගේ නායකතුමාට ගිහිල්ලා ගිවිසුම් ගහන්න සිද්ධ වුණේ ඇයි? [බාධා කිරීමක්] අපි අවංකව කල්පනා කරලා බලන්න ඕනෑ. අපේ සොල්දාදුවන්ගේ ලොකු වෙනසක් තිබුණේ නැහැ. ඒ රජය ඒ අයට අවශ්‍ය උපකරණ හරියට දුන්නේ නැහැ. අවශ්‍ය body armours දුන්නේ නැහැ. අවශ්‍ය boots දුන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ කාලයේ අපේ යුද සෙබළුන්ට සිද්ධ වුණා, මිය ගිය සොල්දාදුවන්ගේ boots ගලවලා ඇඳ ගන්න. ඒ නිසා කරුණාකරලා තමුන්නාන්සේලා හොඳට මේක මතක තියා ගන්න. මේවා සුරංගනාවෝ - angelsලා - ඇවිල්ලා කථා කරන දෙයක් නොවෙයි. This is not a matter for demons and angels. මේක තමුන්නාන්සේලා මේ රටට ගෙනාපු ඉතිහාසය කියලා හොඳට මතක තියා ගන්න. ඒක තමයි පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මේකයි. අද අපට අහන්න ලැබුණ දේවල් දේශපාලන තර්කවත් ආර්ථික තර්කවත් නොවෙයි. මොනවාද

කිව්වේ? ජම්බු කඩනවා. අන්න අතැන අරක වුණා, මෙතැන මේක වුණා, අතැනින් ජම්බු ගෙඩියක් කඩා ගන්න පුළුවන්, මෙතැනින් වෙරළු ගෙඩියක් කඩා ගන්න පුළුවන්; මෙන්න මේ වාගේ ඒවා තමයි ඉදිරිපත් කළේ. තමුන්නාන්සේලා ආර්ථිකය ගැන කථා කරන්න. අරයා මෙහෙම කළාද, අරයා අර විධියට Board එකේ හිටියාද, නැද්ද අහනවා. අපි නැහැයි කියන්නේ නැහැ, ඒවාත් අවශ්‍යයි. කරුණාකරලා සාකච්ඡා කරන්න අද අපේ රට හරි ආර්ථික මාවතක ඉන්නවාද, නැද්ද කියලා.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ගැනත් මම කියන්න ඕනෑ. එතුමා හැමදාම කියනවා "අපේ ආණ්ඩුව ආවාම අපි මෙහෙම කරනවා, මෙහෙම කරනවා" කියලා. මම කියන්න ඕනෑ, අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ආණ්ඩුවේ ඉන්නවා නම් ඒ ආණ්ඩුවෙන් ඉස්සර වෙලාම පන්නා ගන්නේ රවි කරුණානායක මන්ත්‍රීතුමාවයි කියලා. ඉංග්‍රීසියෙන් මෙහෙම කථාවක් තිබෙනවා. අපේ මන්ත්‍රීතුමාට හොඳට තේරෙනවා ඇති.

He is like a turkey wishing for an early Christmas because if you ever gains power, he will be out of it. The Hon. Karunanayake talking about coming to power is like a turkey wishing and hoping for an early Christmas.

තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ ඉන්නකල් විතරයි ඔහොමවත් කථා කරන්න එතුමාට අවස්ථාවක් දෙන්නේ. බැරි වෙලාවත් -ලේකම්තුමා, මම නම් හිතන්නේ නැහැ එහෙම කවදාවත් වෙයි කියලා- තමුන්නාන්සේලා බලයට ආවොත්-[බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ආවොත්?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ආවොත් පැය 24න් එතුමාව ගෙදර යවනවා. දැන් මේ පැත්තේ ඉඳන් බඩ ගා ගෙන ඒ පැත්තට ගියාට සමහර විට එතුමා ආයේ ඒ පැත්තේ ඉඳන් මේ පැත්තට බඩ ගා ගෙන එන්න ඉඩ තිබෙනවා. ඒ හින්දා කරුණාකරලා අපි මේක වැදගත් තර්කයක් හැටියට ගන්නවා නම් ඒ විධියට ගනිමු. එක එක්කෙනාගේ වැරදි ලැයිස්තුවක් ගෙනැල්ලා මෙතැන කියවනවා නම් අපටත් 1977 ඉඳලා ඕනෑ තරම් කියවන්න පුළුවන්. සමහර විට මෙතැන තමුන්නාන්සේලාගේ මුල් පෙළේ ඉන්න අයටත් වෙවුලන්න දේවල් අපට කියවන්න පුළුවන්.

නමුත් අපි මේ තර්කය ගනිමු. ඔය කියපු හැම එකකටම ප්‍රධාන ප්‍රශ්නය මේකයි. අපේ ආර්ථිකය අද ශුභවාදී ගමනක් යනවාද? නැද්ද? ඒ ගමන අපි ලෝක පූජිත -ලෝකයම පිළිගන්න පුළුවන්- නිර්ණායකයන් අනුව සාර්ථකව යනවාද? නැද්ද? ඒ පිළිබඳව අපට සලකන්න පුළුවන් විවේචකයන්ගේ, විචාරකයන්ගේ, විමර්ශකයන්ගේ අදහස් මොනවාද? ඒ අනුව අපි ඉදිරි ගමන යන්නේ කොහොමද කියන එක තමයි ප්‍රශ්නය.

ඕනෑම රටක යම් යම් ප්‍රශ්න ඇති වනවා. ආර්ථිකයක නිරන්තරයෙන් ප්‍රශ්න ඇති වනවා. ගරු ඊරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා හොංකොං ගැන කථා කළා. හොංකොංවල කොම්පැනි ගැන හැම දාම ප්‍රශ්න ඇති වනවා. නැද්ද මන්ත්‍රීතුමා? කොම්පැනි කඩා ගෙන වැටෙනවා. උසාවිවලට යනවා. හොයලා බලනවා. බංකොලොත් වනවා. සිංගප්පූරුවේත් එහෙම වෙනවා. ඉතින් ඒ ආර්ථිකය තුළ එක එක ක්‍රියාකාරී තත්ත්වයන් -එක එක aberrations - ඇති වන්න පුළුවන්. නමුත් මූලික සාධකයන් මොනවාද කියලා අපි බලමු. මේ තරම් අර්බුදකාරී තත්ත්වයක් තියෙද්දිත් අපේ රටේ පසු ගිය අවුරුදු දෙක තුළ අවම සියයට අටක සංවර්ධන වේගයක් අපි ලබා ගත්තා. ඊට අවුරුදු තුන, හතරකට ඉස්සෙල්ලා අපි සියයට හයක අවම සංවර්ධන වේගයක් ලබා ගත්තා. ලෝකයේ කවුරුත් පිළිගන්නා සාධකයක් තමයි මේ GDP growth කියන එක. කෙනෙකුට මේ GDP එක සාධකයක් විධියට සලකා බැලීම හරිද වැරැදිද කියලා තර්ක කරමින් ටිකක් පොඩි thesis එකක් නැත්නම් tutorial එකක් ලියන්න පුළුවන්. එහෙම තර්ක කරන්න පුළුවන්. නමුත් දළ වශයෙන් අද ලෝකයම එක සාධකයක් හැටියට එය පිළිගන්නවා.

අද World Development Report එක ගත්තොත් ඔක්කොම බලනවා, මේ මේ රටවල මෙන්න GDP එක කියලා ඒ ගොල්ලන් සටහන් කරනවා. ඒක පොදුවේ පිළිගත් දෙයක්. එතකොට කාටවත් කියන්න පුළුවන්ද අපට ඒ සංවර්ධන වේගය නොලැබුණා කියලා. ඊට ඉස්සෙල්ලා තිබුණු සංවර්ධන වේගය කීයද?

මට මතකයි එක අවුරුද්දක -අපේ ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාටත් මතක ඇති- අපේ කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවක් යන අතරේ කටුනායකට ප්‍රහාරයක් එල්ල වුණා. ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමාද කොහෙද කැබිනට් රැස්වීමට නැවිත් කටුනායක ඉඳන් ටෙලිෆෝන් කළා මට මතකයි, මෙන්න මෙහෙමයි, මෙහෙමයි ප්‍රහාරයක් එල්ල වනවා කියලා. ඒ කාලයේ අපේ ආර්ථිකය සෘණ ආර්ථිකයක් බවට පත් වුණා. මොකද අපට ඒ එල්ටීටීඊ තර්ජනයට මුහුණ දෙන්න බැරි වුණා. කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවක් යන අතරේ කටුනායක ඉඳන් කැබිනට් මණ්ඩලයට වාර්තා කළා තවම වෙඩි තියනවා කියලා. දැන් එහෙම දෙයක් නැහැ.

දැන් අපි ආර්ථික ස්ථාවරභාවයක් අරගෙන තිබෙනවා. උතුරු නැගෙනහිර ආර්ථිකය අද හොඳට දියුණු වනවා. විශේෂයෙන් ගොවිතැන, එළවලු වගාව හා වෙනත් බෝග වගාවන් තුළින් ඒ ආර්ථිකය අපි අද ඒකාබද්ධ කරලා තිබෙනවා. දේශපාලන විසඳුම් මොනවාද, විමධ්‍යගත කිරීම් මොනවාද කියලා අපට කථා කරන්න පුළුවන්; සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් ඒ අතර තුර ආර්ථික වශයෙන් අපේ ඒකාබද්ධතාව ඉබේම ඇති වනවා. එහේ නිෂ්පාදන අද කොළඹ පැත්තට එනවා. අද අපි කෑමට ගන්නා එළවලු, හාල් විශාල ප්‍රමාණයක් නැගෙනහිරෙන් එන ඒවායි. අපි දන්නවා මාතලේ හරහා නැගෙනහිරෙන් ඒවා කොපමණ ප්‍රමාණයක් එනවාද කියලා. ඉතින් ඒ වාගේ සංවර්ධනයක් අපට පෙනෙන්න තිබෙනවා. යුද්ධයක් අවසාන වුණාම එහෙම සංවර්ධනයක් නැත්නම් අපි කනගාටු වෙන්න ඕනෑ. මොකද ඉස්සරට වඩා අපට දැන් වැඩ කරන්න පුළුවන්.

තමුන්නාන්සේලා මොනවා කිව්වත් අද ග්‍රාමීය අංශය දිහා බලන්න. අපි වෙන ඒවා අමතක කරමු. වාර්ෂිකව අපේ සහෝදර සහෝදරියන්ගේ ශ්‍රමයේ හැටියට මේ රටට එවන ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5ක් ගමේ ගොවි ජනතාවට, දුප්පත් ජනතාවට ලැබෙනවා.

මේ සභාවේ ඉන්න සියලු දෙනාම දන්නවා අද අපේ ගම්වල කොපමණ සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවාද කියලා. කරුණාකරලා මේ වාගේ කරුණු දිහා සාධාරණව බලන්න. හැම වෙලාවේම වපර ඇසින් බලන්න එපා. 2009 දී මේ රටට ආනයනය කර තිබෙන motorcycles ප්‍රමාණය බලන්න. 2009 දී motorcycles ආනයනය කළේ 139,000යි. 2010 වන විට මෙය 228,998ක් වුණා. 2011 වන විට එය 252,318ක් වුණා. ඒ දෙකම එකතු කළාම කීයද? එතැනම මිලියන භාගයක්. -ලක්ෂ 5ක්- මේ motorcycles පදින්නේ කවුද? ගම්බද දුප්පත් ළමයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒකෙන් ලොකු බද්දක් හම්බ වෙනවා නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක වෙනම කථාවක් නේ. මේ විධියට motorcycles ආනයනය කිරීම ගැන ඔබතුමා තර්ක කරන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද මේ රටට three-wheelers විශාල වශයෙන් ඇවිල්ලා තිබෙනවා. කවුද මේවා පාවිච්චි කරන්නේ? දුප්පත් මිනිස්සු. කොහොමද ඒ අයට ඒ ප්‍රාග්ධනය ලැබෙන්නේ? සමහර විට ඒ අයගේ ඥාතීන් රැකියා කර සල්ලි එවනවා. රජයේ ආධාර ක්‍රම තිබෙනවා. රජය සියයට 30ක් ණය දෙන්න කියලා බැංකුවට කිව්වාම, ඒ ණයවලින් විශාල ප්‍රමාණයක් පරිභෝජන භාණ්ඩවලට යනවා. අද ගිහින් බලන්නකෝ, ගම්වල කොච්චර ගෙවල් හදනවාද කියලා. මේ ළඟදී කළ සංගණනය අනුව අද ලංකාවේ මුළු ජනගහනය මිලියන 20යි. අද මිලියන 20කට වැඩිය telephones - mobile phones සහ ස්ථාවර දුරකථන- තිබෙනවා. මේ විධියට අපේ රටේ ලොකු වෙනසක් වේ ගෙන යනවා; මධ්‍යම පන්තියක් හැදෙනවා.

විශේෂයෙන්ම මේ පරිසරය තුළ මේ විවෘත වුණ ආර්ථිකයේ අවශ්‍යතා අනුව දේශීය ආයෝජකයින්, ගම්බද අය ඉදිරිපත් වෙලා ඒ අයගේ කොම්පැනි හදා ගෙන එන විට රජය උදවු කළාම මොකක්ද තිබෙන වැරැද්ද? දැන් මේගොල්ලෝ මෙතැනදී ලාෆ්, ලාෆ් කියලා හිනා වුණා. ලාෆ් එකට මේගොල්ලෝ හිනා වෙනවා. තමුන්නාන්සේලා දන්නවාද ඒකේ සභාපති, වෑගපිටිය මහත්මයා කවුද කියලා. පින්නවල ඉස්කෝලයේ ඉගෙන ගත්ත ගම්බද දරුවෙක්. එතුමාගේ දක්ෂතාව තුළින් විශ්වවිද්‍යාලයට ගිහින්, කොම්පැනිය හදලා, නොයෙක් විධියේ මූල්‍ය අවදානම් තත්ත්වයන්ට මුහුණ දීලා අද හොඳ, ලොකු ව්‍යාපාරයක් ආරම්භ කරලා තිබෙනවා. එවැනි ව්‍යාපාරවලට රජය සහයෝගය දෙන එක වැරදිද? ඒ වාගේම තමුන්නාන්සේලා ගලදාරි එකට බැන්නා. ගලදාරි එකේ අයිතිකාරයෝ කවුද? නවලෝක මුදලාලි මහත්මයා සහ එතුමාගේ පවුල. මේ රටේ විශාල දේශීය ආයෝජන කළ අය. අපි ඒ අයට සහයෝගය දෙන එක ගැන මොකක්ද තිබෙන අමාරුව? දැන් එක්සත් ජාතික පක්ෂය පිළිඅරගෙන තිබෙනවා blue -chip කොම්පැනිවල ආයෝජනය කළාට කමක් නැහැ, ඒක හොඳයි, ඒක වැදගත් කියලා. එහෙම නම් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය වැරදියිනේ. මේවායේ ආයෝජනය කරන්න එපා කියලා එක කොටසක් කියනවා. ඊයේ අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා මේක වැරදියි, ඒක නීත්‍යානුකූල නැහැ කියලා. ඒත් එක්කම මෙතැන කථා කළ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සහ අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කිව්වා, නැහැ, අපට ප්‍රශ්නයක් නැහැ, ලංකාව blue-chip companiesවලට සල්ලි දානවා නම් අපට ප්‍රශ්නයක් නැහැ කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I am getting 10 minutes from my Friend.

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
Yes, I will give him my time.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
පරණ විධියටම ඒ කොටස් මුදල්වලට සියයට 5ක නැත්නම් 7ක පොලියට ඒ සේවකයින්ට දෙනවාට වඩා, -ඒ අය ඒක ගන්නේ අස් වෙන වෙලාවේ- ඒවා ආයෝජනය කරලා, -පසු පස රජය ඉන්නවා- ඒ ආයෝජනවල ප්‍රතිලාභ මුදල් ඒ අයටත් ලැබෙන එක ඊට වඩා නරකද? නමුත් trust fund එකක් හැටියට මේකෙන් කොටසක්, -මුළු ප්‍රමාණයම නොවෙයි යම් කිසි කොටසක්- අවදානමක් නැති කොටසක් මේ රටේ කර්මාන්ත දියුණු කරන්න වැය කළාම මොකක්ද තිබෙන අමාරුව? ඒකේ අඩු පාඩුවක් තිබෙනවා නම් රජය ඒ ගණන ගෙවයි. දැන් මේ අය යොදන ක්‍රමවේදය කාටවත් පිළිගන්න බැරි ක්‍රමවේදයක්. මොකක්ද? යම් කිසි දවසක කොටස් මිලට ගන්නවා. එහෙම අරගෙන අද කොටස් මිල මෙච්චරයි කියලා ගණන් හිලවු කියනවා, මෙන්න වැඩි වීමක් නැත්නම් අඩුවීමක් කියලා. මගේ ළඟ තිබෙන සංඛ්‍යා ලේඛනවල හැටියට එක කාලයක අපට මේ ආයෝජනවලින් බිලියන 14ක් වැඩිපුර හම්බ වුණා. බිලියන 14ක් ධන පැත්තට ආවා. නමුත් මේවා margin trading නොවෙයි. මේවාට කියන්නේ long-term investment කියලා. අවුරුදු 20ක, 30ක කාලයකට මුදල් යොදවලා දේශීය කොම්පැනි දියුණු කරලා, ඒ තුළින් විශාල වාසියක් ඒ සාමාජිකයන්ට ලබා දෙනවා. ඒ නිසා ඒ සාමාජිකයන්ට ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. අපි ඒ ගොල්ලන්ගේ ආයෝජන සුරක්ෂිත කරලා තිබෙනවා. ඒක විතරයි මේ ගොල්ලෝ කියන්න කැමැති නැත්තේ. ඒ සාමාජිකයෙකුට ඉස්සර සියයට 5ක පොලියක් දුන්නා. ඊට පස්සේ එය සියයට 7ක් කළා. ඒ කාලයේ හැම දාම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු මොකද කිව්වේ? හැම දාම කිව්වා, "අයියෝ ඇයි, මේ සියයට 5ක පොලියක් දෙන්නේ, ඒක මදි, ඇයි මේ ගොල්ලන්ට ටිකක් වැඩි පොලියක් දෙන්න බැරි?" කියලා. ඊ ළඟට ඒ ප්‍රමාණය සියයට 7 දක්වා වැඩි වුණා. මේ විධියට අපට අනාගතයේදී ඊට වැඩිය වුණත් දෙන්න පුළුවන් වේවි. මේ pension funds, trust funds කියන ඒවා අලුත් දේවල් නොවෙයි. ඒවා ලෝකයේ හැම තැනම තිබෙනවා.

අද අපේ bonds වලටත්, ගුරුවරුන්ගේ funds, දොස්තරවරුන්ගේ funds, විශ්‍රාමිකයන්ගේ funds, එක එක ලොකු කොම්පැනිවල funds එක්කාසු කරලා වැඩි පොලියක් ගන්න එක එක රටවල ආයෝජනය කරනවා. මම හිතන හැටියට අපේ Sri Lanka Government Bonds, අපේ five-year bonds වාගේ ඒවාට ඒ ඒ රටවල විශ්‍රාමිකයන්ගේ ආයතන, එහෙමත් නැත්නම් ගුරුවරුන්ගේ ආයතන, එහෙමත් නැත්නම් ව්‍යාපාරිකයන්ගේ ආයතන ඒ ගොල්ලන්ගේ සල්ලි දමනවා. ඊට පස්සේ අපි ඒ ණය ගෙවන කොට ඒ කොටස්කරුවන්ගේ අතට වැඩි මුදලක් ලබා දෙනවා. මෙය ඉතාම සද්භාවයෙන්, හොඳ අවබෝධයෙන් කරන ආයෝජනයක්. අඩු ගණනේ හේතු දෙකක් මත තමයි එහෙම කරන්නේ. ඒ, එකක් අපේ දේශීය සංවර්ධනයට සහ දේශීය කොම්පැනිවලට අතහිත දීමට; අනෙක අපේ දායකයාට වැඩි මුදලක් ලබා දීමට. මොකක්ද, මේ ගැන ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය? කොහේ හෝ නීතියක් කඩ වෙනවා නම් උසාවියට ගිහින් පෙන්වලා දෙන්න "මේක වැරදියි" කියලා, මෙතැන ඇවිල්ලා කථා කරන්නේ නැතුව. No one has

challenged these decisions. අද මේ විධියට කටයුතු කරන එකේ පරමාර්ථය මොකක්ද? අද තමුන්නාන්සේලා කරන්න හදන්නේ මොකක්ද?

අපි එකක් කියන්න ඕනෑ. "කොතලාවල අධිරාජ්‍යය" කියන්නේ ලොකු අධිරාජ්‍යයක්. මේ ගොල්ලෝ දැන් එක එක ඒවා කියනවා. අමතක කරන්න එපා, 2005 ජනාධිපතිවරණයේදී හැම පත්තරයකම පිටුවක් සල්ලි දීලා අරගෙන, "රනිල් වික්‍රමසිංහට ඡන්දය දෙන්න" කියලා පැහැදිලිව අත්සන් කරලා දැන්වීම් දැම්මේ කවුද? තමුන්නාන්සේලාගේ ඒ මිත්‍රයා කවුද? ලක්ෂ ගණනින් මුදල් තැන්පත් කරපු මිනිස්සු ආණ්ඩුවත් එක්ක තරහ කිරීමද තමුන්නාන්සේලාගේ උපක්‍රමය? ගෝල්ඩන් කී සමාගමේ මුදල් තැන්පත් කළ අය, බැංකුවල මුදල් තැන්පත් කළ අය, ෆිනෑන්ස් කොම්පැනිවල මුදල් දාපු අය, ආණ්ඩුවත් එක්ක තරහ කරවලා ආණ්ඩු විරෝධී මතයක් හදන්න නේ මේ හදන්නේ. වැඩ පිළිවෙළේ හොඳ නරක නොවෙයි නේ මේ කියන්නේ. නමුත් ඒ අයට මේ පාර්ලිමේන්තුව තුළින් හා වේදිකා තුළින් අපි කියන්න ඕනෑ, "ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා ඔය යාළුවෝ කියලා අලුතින් හදා ගන්න හදන ඒ දායකයන්ගේ බෙල්ල කැපුවේ, ඒ ගොල්ලන්ට වළ කැපුවේ තමුන්නාන්සේලාගේ හිත මිත්‍රයායි; ජනාධිපතිවරණයේදී දැන්වීම් දාලා, එක්සත් ජාතික පක්ෂයට හා - විශේෂයෙන් නම් වශයෙන් කියලා- රනිල් වික්‍රමසිංහට ඡන්දය දෙන්න කියපු මිනිහායි" කියන එක. අද තමුන්නාන්සේලා කිඹුල් කඳුළු හළනවා, "අනේ! ගෝල්ඩන් කී කාරයන්ට මොකද වුණේ?", "අනේ! අරයාට මොකද වුණේ? මේකට මොකද වුණේ" කියලා. ඇයි ඒ කාලයේ -ඒ ගොල්ලන්ගේ සල්ලි ඔබලාගේ ප්‍රචාරක යන්ත්‍රණයට ගන්න වෙලාවේ- ඒවා කිව්වේ නැත්තේ? එතකොට ඒවා මොකුත් කිව්වේ නැහැ. ඒ නිසා හොඳට හිතේ තියා ගන්න, ඔය කිඹුල් කඳුළුවලින් මේ ප්‍රශ්නය විසඳන්න බැරි බව.

කරුණාකරලා සමස්ත ආර්ථිකය දිහාම බලන්න. අද ලෝකයේම ආර්ථිකය විමර්ශනය කරලා කාටත් පිළිගන්න පුළුවන් විනිශ්චය දෙන ආයතන තිබෙනවා. ඒ ගොල්ලෝ මොනවාද කියන්නේ? ඒ ගොල්ලන් කියන ඒවා තමුන්නාන්සේලාට පැහැදිලි කරලා දෙන්න අපට පුළුවන්. මේ බලන්නකෝ, එවැනි ආයතන කොච්චර තිබෙනවාද කියලා. Standard & Poor's, Fitch, Moody's කියන්නේ ලෝකයේ ආර්ථිකය විනිශ්චයට ලක් කරන, මූල්‍යමය ශක්තිය තිබෙන කොම්පැනි.

ඒ ගොල්ලන් ඇමෙරිකාවටත් භය නැහැ. ඒ අය ඇමෙරිකාවේ තිබුණු rating එක අඩු කළා; ග්‍රීසියේ rating එක සම්පූර්ණයෙන් එළියට දැම්මා; Euro Zone එකේ ratings විවේචනය කළා. ඉතින් ඒ ගොල්ලන්ම අපට හොඳ rating එකක් දෙනවා නම් කොහොමද තමුන්නාන්සේලා කියන්නේ අපේ ආර්ථිකය දියුණු වෙන්නේ නැහැ කියලා?

අද බැංකු වාර්තා බලන්න. අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීක්ෂණ බලන්න. ලෝක බැංකුවේ සමීක්ෂණ බලන්න. ආසියානු සංවර්ධන බැංකුවේ සමීක්ෂණ බලන්න. මේ හැම කෙනාම පිළිගන්නවා ලංකාව සියයට හතක, අටක වර්ධන වේගයක් තිබෙන ආසියාවේ ශීඝ්‍රයෙන් දියුණු වන රටක් කියලා. පස් වැනි පන්තියට හෝ අට වැනි පන්තියට හෝ ගිහිල්ලා, ප්‍රජාචාරය ඉගෙන ගෙන ආපු අය එක්ක Standard & Poor's, Fitch ගැන කථා කරන්න පුළුවන්ද? අපේ ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට නම් අඩු ගණනේ උපාධියවත් තිබෙනවා. නමුත් හය වැනි පන්තියේ ගණිතය ඉගෙන ගත්ත කෙනෙකුට මෙතැනට ඇවිල්ලා පුළුවන්ද මේ rating agencies වැරදියි කියලා කියන්න? කරුණාකර, කල්පනා කරලා බලන්න. සාධාරණ වෙන්න. අපේ නිෂ්පාදන ඒකක දිහා බලන්න.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, අවුරුදු කීපයකට ඉස්සෙල්ලා ඔබතුමා කෘෂිකර්ම ඇමති වෙලා හිටපු කාලයේ ලංකාවේ තේවලින් අපට කීයද හම්බ වුණේ? ඇමෙරිකන් ඩොලර් මිලියන 800යි. අද ඇමෙරිකන් ඩොලර් බිලියන 1.2ක් අපට තේවලින් හම්බ වෙනවා. ඒ කාලයේ කී දෙනාද පිට රටින් සල්ලි එව්වේ? අද මේ රටට බිලියන 5.5ක සල්ලි එනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා සංචාරක ව්‍යාපාරයෙන් අපට ලැබෙන මුදල් ප්‍රමාණයත් වැඩි කර ගන්න. අපට තියෙනවා ඒ වාගේ අංශ හයක්, හතක්. අපි ඒවා දියුණු කරලා ගන්න ඕනෑ. අපට billion-dollar enterprisesවලට යන්න පුළුවන් වෙන්න ඕනෑ. අපේ නව තාක්ෂණය - IT - දියුණු කරන්න ඕනෑ. ඒ විධියට අපි මේ ආර්ථිකය ක්‍රමානුකූලව ගෙන යන්න ඕනෑ.

ආර්ථික ක්ෂේත්‍රයේ යම් යම් තීරණ ගන්න කොට ඒවාට විවිධ interpretations දෙන්න පුළුවන්. ඒවාට විවිධ උපකල්පන, අර්ථකථන දෙන්න පුළුවන්. විරුද්ධ පක්ෂයේ තමුන්නාන්සේලාට මා කියන්න ඕනෑ, - එතුමන්ලා telephone එක කනේ තියාගෙන අරක මොකක්ද, මේක මොකක්ද කියලා එක එක අයගෙන් අහනවා- මේ මූල්‍ය ගනු දෙනුවලින් දිනන්නෝ සහ පරදින්නෝ ඉන්න බව. අපේ ගරු දයාසිරි ජයසේකර මැතිතුමා හොඳට දන්නවා, stock market එකේ මුදල් දැම්මාම stocks ඉහළ යනකොට හරි යන්න පුළුවන්. නැත්නම්-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

දැන් පැරදිලා ඉන්නේ. දිනන්නේ කවදාද කියලායි අපි අහන්නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඉන්නකෝ කියනකම්. මගේ තර්කය මේකයි. එතකොට අර වැරදිච්ච අය කියන දේ විතරක් අහලා,- [බාධා කිරීමක්] ඒක අද අපට විතරක් හසුරවන්න බැරි දෙයක් බව ඔබතුමා හොඳට දන්නවා. ඔබතුමන්ලා penny investorsලා වාගෙයි; "එදා වේල ටුවර්ස්" වාගේයි. උදේට කීයක් හරි දාලා සවසට කීයක් හරි ගන්න බලනවා. කොටස් වෙළෙඳ පොළ ගැන හුඟ දෙනකු හිතන්නේ එහෙමයි. නමුත් කොටස් වෙළෙඳ පොළ කියන්නේ දීර්ඝ කාලීන ආයෝජනයක් කරන තැනක්. "එදා වේල ටුවර්ස්" කරන්න බැහැ අපේ stock market එකත් එක්ක. ඒ නිසා එක් එක් කෙනා කියන දේවල් විතරක් අරගෙන අපට මේ අවසාන නිගමනවලට එන්න බැහැ. අද අපේ ආර්ථිකය හොඳ ගමනක් යනවා. විශේෂයෙන්ම අපට තව හුඟක් සංවර්ධනය කරන්න දේවල් තිබෙනවා. තව සකස් කරන්න දේවල් තිබෙනවා. අපි අද මේ කටයුතු කරන්නේ අමාරුම අවස්ථාවක.

දැන් බලන්න ජුනි 17 වැනිදා ග්‍රීසිය යනවා ඡන්දයකට. එතකොට මොකක්ද එන පිළිතුර? අපිත් හිතනවා සමහර විට ග්‍රීසිය Euro Zone එකෙන් එළියට යයි කියලා. එහෙම එළියට ගියොත් ඒ ගොල්ලන් "Drachma" කියන පරණ currency එකට යනවා. එතකොට මුළු Euro Zone එකම අර්බුදයට යනවා. ඉතින් ඒක අපට අදාළ වෙන්නේ අපේ භාණ්ඩ ගන්න තැන්වල ඒ ඉල්ලුම අඩු වන නිසා. එතකොට ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා.

දැන් ඉන්දියාව බලන්න. ඉන්දියාවේ එක කාලයක සියයට 10ක සංවර්ධන වේගයක් ඇති වුණා. ඊට පස්සේ සියයට 9කට ආවා. "මේ අවුරුද්දේ අපට සියයට 7.7ක සංවර්ධන වේගයක් ඇති කර ගන්න පුළුවන්" කියලා ඒ ගොල්ලෝ කිව්වා. නමුත් ගිය සුමානේ ඒ ගොල්ලන් කියනවා, මේ Euro Zone එකේ ප්‍රශ්නය නිසා සියයට 5.2ට revise කරන්න වෙනවා කියලා. ඉතින් මේක

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

නිතරම වෙනස් වන scenario එකක්. අපි එකක් කියන්න ඕනෑ. අපි රජයක් වශයෙන් -එක් එක් කෙනා එක එක ඒවා කරන්න පුළුවන්- කිසි විධියකට දූෂණයට ඉඩ දෙන්නේ නැහැ.

දැන් තමුන්නාන්සේලා බලන්නකෝ මේ stock market case එක සම්බන්ධයෙන්. අපේ රජය ඉතාම දැඩි ලෙස, ඉතාම දෘඪතර ලෙස මේ ප්‍රශ්නය විසඳා තිබෙනවා. NSB එකේ Chairman ඇතුළු මුළු Board එකම අයින් වුණා. ඒ ගොල්ලන්ට අයින් වෙන්න වුණා. ඒ සල්ලි ටික ආපසු වෙන කාටවත් දෙන්න ඉඩ දුන්නේ නැහැ. ඒක ඒ බැංකුව තුළම රඳා පවතිනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
You must give us the credit.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
No, no. Why should we give you the credit? You have to give us credit because the Government has taken the strongest possible action. You all mentioned that but we have to get the credit. ඉස්සර වෙලා මුළු Board එකම අයින් කළා. ඊට පස්සේ ඒ මුදල් වුවමනාවක් වුණේ නැහැ. SEC එකට ඒක භාර දීලා තිබෙනවා. ඒ ගොල්ලෝ දැන් ඒ පිළිබඳව කටයුතු කර ගෙන යනවා. [බාධා කිරීමක්] නැහැ, වැරැද්දක් වුණත් ඒ වැරැද්දට දැඩි පිළිතුරක්, අවංක පිළිතුරක් දුන්නා. රජය හැටියට අපට ඒ ගැන ආඩම්බර වෙන්න පුළුවන්.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු ඇමතිතුමනි, ඔබතුමා බොහොම වැදගත් ඇමතිවරයෙක්. මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
හා, කියන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මේකේ ක්‍රියාකාරී අධ්‍යක්ෂතුමා ඉල්ලා අස් වුණා. එතුමා මට කිව්වා මේ මණ්ඩලය වැරදි තීන්දුවක් ගත්තා කියලා. හැබැයි එතුමා කිව්වා ඊට පස්සේ මේ ගැන රටේ වැරදි මතයක් ඇති වෙලා - [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, එහෙම කියන්න බැහැ. තමුන්නාන්සේලා කියපු ගොඩක් දේවල්වලට අප මොකුත් කරලා තිබෙනවාද? නැහැ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Minister, you have only one more minute.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I will wind up now.

ඒ හින්දා අප ඒ ප්‍රශ්නය ආවාම අපේ colours හරියට පෙන්වලා තිබෙනවා. ඒකයි මට කියන්න තිබෙන්නේ. අප කෙළින්ම ඒ ගැන කටයුතු කරලා තිබෙනවා. කාටවත් වචනයක්වත් කියන්න බැහැ. යම් අය වැරැද්දක් කළා නම් ඒ අය එතැනින් අයින් කර දමා තිබෙනවා. දැන් තව පරීක්ෂණ කරගෙන යනවා. එක් කෙනෙක් suspend කරලා තිබෙනවා. වැරදි කරපු තව අය ඉන්නවා නම් ඒ ගොල්ලන්ටත් නියම දඬුවම් දෙයි. මේකෙන් දෙන්න පුළුවන් අර්ථ කථනය මොකක්ද? දෙන්න පුළුවන් අර්ථ කථනය තමයි, රජය ඉතාම දැඩි ලෙස හා ඉතාම නිවැරදි ලෙස කටයුතු කරන බව. ඒකයි අපට කියන්න තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා තමුන්නාන්සේලා එක එක්කෙනාට ජම්බු කඩන ව්‍යාපෘතිය නතර කරන්න. ඔය ජම්බු කඩන ව්‍යාපෘතිය කරන්න ගිහිල්ලා TV එකට ගිහිල්ලා පල් වෙලාම ගියා. මොකද අර වැරැද්ද මේ වැරැද්ද කියලා කියනවා. එහෙම නොවෙයි, අප සමස්ත චිත්‍රයම පෙන්වන්න ඕනෑ. ඔබතුමා අර්ථ ශාස්ත්‍රය දන්නවා නේ. සමස්ත චිත්‍රයම පෙන්වන්න. ජම්බු ගහ ගැන කථා කරලා තමයි ජම්බු ගෙඩිය කඩන්න ඕනෑ. එතැනට ගිය වෙලාවේ ඉදන්ම අතැන තිබෙන ජම්බු ගහ ගැන කියලා, අර අත්තෙන් එක ජම්බු ගෙඩියක්, මේ අත්තෙන් තව ජම්බු ගෙඩියක් කඩලා මේක කරන්න බැහැ. චිත්‍රයට යන්න. එහෙම ජම්බු ගෙඩි ගැන කථා කරන්න ගිහිල්ලා රූපවාහිනියේ පෙනී සිටිමින් මිනිසුන්ට මොනවාද මේ කියන්නේ? අපට තේරෙන්නේ නැහැ. "අරක වුණා, සපත්තු දෙකක් දුන්නේ නැහැ, uniform එක දුන්නේ නැහැ, පොත දුන්නේ නැහැ" කියලා අරවා මේවා කිව්වාට තේරෙන්නේ නැහැ. ඒ චිත්‍රය පෙන්වන්න ඕනෑ. ඒ හින්දා අප ඒ චිත්‍රය දිහා බලන කොට අපට කිසිම සැකයක් නැහැ, මොන මොන අඩු පාඩුකම් තිබුණත්, අපේ රජය හොඳ ගමනක යනවා; සාර්ථක ගමනක යනවා. ඒක කල් යැමේදී තමුන්නාන්සේලාට පෙනෙයි. තව නොබෝ කලකින් එක එක්කෙනා විරුද්ධ පක්ෂය පැත්තේ ඉඳලා ආණ්ඩුව පැත්තට ඇවිල්ලා අපේ ගමනටත් උදවු කරයි කියලා මට හැඟීමක් තිබෙනවා. එහෙම වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.4.14]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සරත් අමුණුගම අමාත්‍යතුමා කථා කරන කොට මට හිතුණා අප ඉන්නේ වෙන කොහේවත් පාර්ලිමේන්තුවක කියලා. නැත්නම් මට හිතුණා එතුමා කථා කරන්නේ ලංකාවේ ජනතාව ගැන නොවෙයි, වෙන රටක ජනතාව ගැන කියලා. මොකද ඇත්තටම රටේ සිද්ධ වෙමින් තිබෙන්නේ කුමක්ද? දැන් තමුන්නාන්සේලා රට සංවර්ධනය වුණාය කියන්න ප්‍රධාන ආර්ථික දත්ත කීපයක් ගේනවා නේ. එකක් තමයි ආර්ථික වර්ධන වේගය. ඔබතුමන්ලා හැම දාමත් පුන පුනා කියනවා එය අටට ආසන්න ප්‍රමාණයක පවත්වා ගෙන යනවා කියලා.

ඊළඟට තව දත්තයක් හැටියට තමුන්නාන්සේලා කියනවා උද්ධමනය තනි ඉලක්කමේ තියා ගෙන යන්න සමත් වුණා කියලා. ඒ වාගේම තව දත්තයක් හැටියට කියනවා ඒක පුද්ගල ආදායම 2,800ට කිට්ටු කරලා ඉන්නේ කියලා. ඒ වාගේම ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, මා දැක්කා ඔබතුමා ළඟදී කියලා තිබුණා ගම්වල කාන්තාවෝ වැඩිපුර jeans අඳින්න පටන් අරගෙන

තිබෙනවා, ඒ jeans අඳින එකෙන් පෙන්නුම් කරන්නෙත් ආර්ථිකයේ වර්ධනයක් අත් පත් කරගෙන තිබෙන එක කියලා. මම දන්නේ නැහැ ඒක කවුරු හොයා ගනිපු එකක්ද කියලා. ඒ jeans ඇඳීම ආර්ථික වර්ධනයක සාධකයක් හැටියට හඳුන්වන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. ඒක මොන ආර්ථික විශේෂඥයාද කිව්වේ කියලාත් මම දන්නේ නැහැ. ඒක "Amunugama Theory" එක වන්න ඕනෑ. [බාධා කිරීමක්]ඒක "Amunugama Theory" එක.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ, "Ranil Wickremasinghe Theory." එක

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

"Amunugama Theory" එක අනුව තමයි කාන්තාවෝ jeans අඳින ප්‍රමාණය වැඩි වුණාම එයින් රටක ආර්ථික වර්ධන වේගය පෙන්නුම් කරලා තිබෙනවා කියලා කියන්නේ. හැබැයි ඇත්තටම පෙන්නුම් කරන්නේ මොකක්ද? ඇත්තටම පෙන්නුම් කරමින් තිබෙන්නේ ඒක නොවෙයි. සැබැවින්ම ඇති වී තිබෙන තත්ත්වය තමයි ගොවි ජනතාවට සිදු වී තිබෙනවා තමන්ට ලැබෙන ආදායම තමන්ගේ ජීවිතය පවත්වා ගෙන යන්න ප්‍රමාණවත් නැහැ කියලා හඬ නඟන්න. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ වැඩ කරන සේවක සේවිකාවන්ගේ අඳෝනාවක් බවට පත් වී තිබෙන්නේ තමන්ට ලැබෙන මාසික වැටුප ඒ මාසය තුළ ජීවිතය පවත්වා ගෙන යන්න ප්‍රමාණවත් නොවනවා කියන එක. තරුණ තරුණියන්ගේ මූලික වුවමනාව බවට පත් වී තිබෙන්නේ තමන් හදාරා තිබෙන අධ්‍යාපනයට සරිලන රැකියාවක් නොමැතිකම.

තරුණ තරුණියන් රැකියාවක් නොමැතිකමින් පෙළෙනවා නම්, ගොවි ජනතාව අස්වැන්න විකුණා ගන්න බැරිව ආදායමක් නැතුව පෙළෙනවා නම්, සාමාන්‍යයෙන් ගත්තොත් රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් තමන්ගේ වැටුප ප්‍රමාණවත් නැහැ කියලා කෑ ගහනවා නම් ඉතින් ඔබතුමා කියන ජනතාව ඒ ගොවියොත් නොවෙයි, රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සේවක සේවිකාවනුත් නොවෙයි, ඒ අය තරුණ තරුණියොත් නොවෙයි. ගොවියොත් නොවන, රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ වැඩ කරන සේවක සේවිකාවොත් නොවන, රැකියාවක් අපේක්ෂාවෙන් ඉන්න තරුණ තරුණියොත් නොවන, මුහුදු රස්සාව කරන ධීවරයනුත් නොවන, තේ වත්තේ තේ දළු කඩන කම්කරුවාත් නොවන, රබර් වත්තේ කිරි කපන කම්කරුවාත් නොවන , ගල් වළේ ගල් කඩන කම්කරුවාත් නොවන, පාරේ තාර එළන කම්කරුවාත් නොවන වෙන කොට්ඨාසයක් ගැන තමුන්නාන්සේ කථා කරනවා, "සංවර්ධනය" කියලා. සංවර්ධනයේ ප්‍රතිලාභ එහෙම නම් එහි ජනතාවට යන්න ඕනෑ. සංවර්ධනයේ ප්‍රතිලාභ එහි ජනතාවට යන්නේ නැත්නම් කියන්නේ ලැබෙන සංවර්ධනය පවුලක් සහ පිරිසක් ඒක රාශි කර ගන්නවාය කියන එකයි. ඒක නේ වෙන්න ඕනෑ. සංවර්ධනයේ ප්‍රතිඵලය යන්න එපායැ, තමුන්නාන්සේලා කියන විධියට. එහෙම වෙලා නැහැ නේ.

අද තමුන්නාන්සේ පොළොන්නරුවේ උගස් බඩු කඩේකට ගිහිල්ලා බලන්න. පොළොන්නරුවේ උගස් බඩු කඩේකට ගිහිල්ලා බැලුවොත් අක්කර පහක විතර පරිශ්‍රයක උගසට අරගත් ට්‍රැක්ටර් නඟලු දමා තිබෙනවා, ට්‍රැක්ටරයේ නඟුල උගස් තියනවා. ට්‍රැක්ටරයේ wheel එක උගස් තියනවා. කනේ කරාබු දෙක උගස් තියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර බැංකුවලට ඊයේ රුපියල් දාහට කරාබු දෙක උගස් තියලා අද ඇවිල්ලා තව රුපියල් පන්සීයක් ගන්න බැරිද කියලා අහනවා. ඒක තමයි අද ජනතාව මුහුණ දීලා තිබෙන ගැටලුව. තමුන්නාන්සේ කථා කරන ඒ පාර්ලිමේන්තුව එක්කෝ වෙන පාර්ලිමේන්තුවක් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් තමුන්නාන්සේ වෙන ජනතාවක් ගැන කථා කරන්න ඕනෑ. ඒක නේ සිද්ධ වෙලා තිබෙන්නේ. අර්බුදයන් බලන්න. 2011 වසර තමයි දැවැන්තම වෙළෙඳ ශේෂ හිඟය ඇති කරපු වර්ෂය. ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, ඔබතුමා ඒක පිළිගන්නවා. ආසන්න වශයෙන් ගත්තොත් ඔබතුමාගේ වාර්තාවල ඒ ගැන තිබෙනවා. මොකක්ද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මොකක්ද වෙලා තිබෙන්නේ? අම්මා දරුවා අරගෙන ගඟේ පනිනවා. සමහර අය පොල් ගස් උඩ නැඟලා. සමහර අය සිය දිවි හානි කර ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ දවසකට මිනිස්සු 120 දෙනෙකු සිය දිවි හානි කර ගන්න උත්සාහ කරනවා කියලා වාර්තාවක් පිට වුණා. ඒ අයගෙන් 12 දෙනෙකු මිය යනවා. මේ, දවසකට 12 දෙනෙකු සිය දිවි හානි කර ගන්න රටක්; 120 දෙනෙක් ස්වේච්ඡාවෙන් මැරෙන්න උත්සාහ කරන රටක්;ජීවත් වෙන්න විධියක් නැතිව, දරුවෝ අරගෙන ගඟේ පනින රටක්.

දැන් ගරු සරත් අමුණුගම ඇමතිතුමා ඇවිල්ලා වෙන ජනතාවක් ගැනයි කථා කළේ. ඒකයි මා කියන්නේ, රටේ ප්‍රශ්න ඊට වැඩිය වෙනස් කියලා. මොකක්ද වුණේ? දැවැන්ත අර්බුදයක් තමුන්නාන්සේලා හැදුවා. අවුරුදු 5ක්, වැරදි ආර්ථික ප්‍රතිපත්තියක්, එතෙක් අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තියම ලෝකයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව අපට බෙදා හරින ආර්ථික වට්ටෝරුව ක්‍රියාත්මක කරමින් රටත්, ජනතාවත් විශාල දුෂ්කරතාවලට සහ ගැටලු සමුදායකට ගිල්වා තිබෙනවා. කල්පනා කරලා බලන්න, වෙළෙඳ ක්ෂේත්‍රයේ ඇති වුණු අර්බුදය මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආසන්න වශයෙන් ගත්තොත් අපේ රටේ සියයට සියයක වෙළෙඳ ශේෂයක් හැදුවේ 2011 වර්ෂයේ. අපනයන ආදායම ඩොලර් බිලියන 10ට ආසන්න වන කොට ආනයන වියදම ඩොලර් බිලියන 20ක් දක්වා ගියා. ඩොලර් බිලියන 10ක හිඟයක් තිබුණා. ඒ හිඟය පියවා ගන්නයි

[ගරු අනුර දිසානායක මහතා]

ග්‍රාමීය වශයෙන් ජීවත් වන තරුණ තරුණියන්, ග්‍රාමීය වශයෙන් ජීවත් වන කාන්තාවන් රට පැටවීම කරන්නේ. ඒක තමයි තමුන්නාන්සේලාගේ එකම උත්තරය බවට පත් වුණේ. අද තමුන්නාන්සේලාගේ ආර්ථිකයේ ප්‍රධාන සාධකය බවට පත් වී තිබෙන්නේ විදෙස්ගත සේවක සේවිකාවන් මහන්සි වෙලා මෙහාට එවන මුදලුයි. ගරු අමුණුගම ඇමතිතුමාත් කිව් පරිදිම ගිය අවුරුද්දේ ඔවුන් ඩොලර් බිලියන 5.5ක් එවලා තිබුණා. ජනාධිපතිතුමාගේ කථාවේදී කිව්වා, ආසන්න වශයෙන් ගත්තොත් ලක්ෂ 30ක් පිට රට ජීවත් වනවාය කියලා. පවුල් ඉන්නේ ලක්ෂ 48යි. ලක්ෂ 30ක් පිටරට ජීවත් වනවා. කෘෂි කර්මාන්තයේ ඇති වෙච්ච වර්ධනයන්, කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති වෙච්ච වර්ධනයන්, සේවා ක්ෂේත්‍රයේ ඇති වෙච්ච වර්ධනයන් නොවෙයි, අද මේ රටේ ආර්ථිකය පවත්වාගෙන යන්නේ. ඕමාන් රටේ, අරාබිකරයේ, ඒ වාගේම කටාර් රාජ්‍ය වැනි ඈත මැද පෙරදිග රාජ්‍යයන් ඇතුළේත්, යුරෝපා රාජ්‍යයන් ඇතුළේත් තමන්ගේ ශ්‍රමය විකුණන මේ රටේ අහිංසක අම්මලා තාත්තලාගේ ශ්‍රමය, ඒ දරුවන්ගේ ශ්‍රමය හරහා තමයි තමුන්නාන්සේලා රට ගෙනි යන්නේ.

අද තමුන්නාන්සේලා දිරි පිට දිරි දෙන සංචාරක ව්‍යාපාරයේ ආදායම කීයද? ගිය අවුරුද්දේ ආදායම ඩොලර් මිලියන 800යි. ඒකට තමයි පහසුකම් දෙන්නේ. ඉඩම් දෙන්නේ; බදු පහසුකම් දෙන්නේ; හෝටල් දෙන්නේ. සියල්ල දෙන්නේ ඒකටයි. හැබැයි ආදායම කීයද? ඩොලර් මිලියන 800යි. රට පටවන අයගෙන් කීයක් ගන්නවාද තමුන්නාන්සේලා? ඩොලර් මිලියන 5,500ක් ගන්නවා. ඒ නිසා අද ආර්ථිකයේ එකම පැවැත්ම බවට පත් වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලාගේ කෙරුවාවල් නොවෙයි. කර ගන්න දෙයක් නැතුව තමන්ගේ දරු පවුල අත් ඇරලා පිට රට යන අම්මාගේ ආදායමෙන්; පිට රට යන කාන්තාවගේ ආදායමින්; ඒ දරුවන්ගේ ආදායමින් මේ රට ගෙනි යනවා. එය තමුන්නාන්සේලාගේ තිබෙන මහ ලොකු ආර්ථික ක්‍රියාවලියක හෝ සැලැස්මක ප්‍රතිඵල නොවෙයි. තමුන්නාන්සේලා ඒ වෙනුවට මොකක්ද කළේ? නාස්තිකාර වියදම් කරලා, මහ දැවැන්ත අර්බුදයක් හදලා විශාලම ලෙස අපේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ අර්බුදයක් හැදුවා. මූල්‍ය ක්ෂේත්‍රයේ අර්බුදයට තමුන්නාන්සේලාට උත්තර තිබුණේ නැහැ. වෙළෙඳ ශේෂයේ ඩොලර් බිලියන 10ක හිඟය ලංකා ඉතිහාසයේ වාර්තා වී තිබෙන වැඩිම හිඟය.

ඒ අනුව එළඹෙන නොවැම්බර් මාසයේ දැවැන්ත ගෙවුම් ශේෂ හිඟයක් ඇති වන්නට ඉඩ තිබුණා. එම නිසා තමුන්නාන්සේලා ගිහින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ඉල්ලුවා. තෙල් බිලක් ගෙවන්නට තිබුණා. විදේශ බැඳුම්කර මාර්තු මාසයේ 31වන දාට සම්පූර්ණ වෙලා තිබුණා. ඔක්තෝබර් මාසයේ ගෙවන්නට තිබෙනවා, HSBC බැංකුවෙන් සියයට 6.5ක අධික පොලියට ගත් ණය සඳහා ඩොලර් මිලියන 500ක්. තමුන්නාන්සේලාට විදේශ සල්ලි නැතිව ගියා. ඊට පස්සේ ගිහින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඉල්ලුවා, අපට විදේශ සල්ලි දෙන්නය කියා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කොන්දේසි දැම්මා.

වචන දහයක් කථා කළොත් දේශ ප්‍රේමීත්වය. ඇඳුමක් ඇන්දොත් සාටකය. කැවේ කුරහන් තලප. මේ ඔක්කොම කයිවාරු ගහපු නායකයෝ මොකක් ද කළේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කිව්වා, "රට ගෙනියන්න බැහැ, අපට ඩොලර් දෙන්න"ය කියා. ඩොලර් දෙන්නට එකඟතාවකට ආවා. කිව්වා, "ඩොලර් දෙන්නම්. තමුන්නාන්සේලා ඩොලර් නාස්ති කරනවා. මහ බැංකුවේ තිබෙන ඩොලර් එළියට දාලා තමයි රුපියලේ අගය පවත්වාගෙන යන්නේ. මහ බැංකුව මැදිහත් වීම අත් හරින්න"ය කියා. තමුන්නාන්සේලා අත හැරියා. මොකද වුණේ? ඩොලරය අගය රුපියල් 111 සිට 134 ට ගියා. මොකක් ද සිද්ධ වුණේ? රුපියල පාවෙන්න හරින්න කලින්, පිට රටින් සැමන් ටින් එකක් ඩොලරයට ගෙනාවා නම් වෙළඳ පොළේ එය රු.111යි. දැන් පිට රටින් සැමන් ටින් එකක් ඩොලරයකට ගෙනාවොත් රු.134යි. රුපියල් 23කින්- ආසන්න වශයෙන් ගත්තොත් සියයට 23කින්- සියලු භාණ්ඩවල මිල ඉහළ යන්නට බල පෑවා. මේ තීන්දු තීරණ කාගේද? මේ අමාත්‍යවරු වාහන පිරිවරාගෙන, ආරක්ෂාව දා ගෙන, නිල නිවාස පාවිච්චි කරමින්, විදේශ සංචාර හොබවමින් රට පාලනය කරනවාය කියා පෙන්නුම් කරන්න ද? මොන රට පාලනය කිරීමක් ද තමුන්නාන්සේලා කරන්නේ? තමුන්නාන්සේලා ජත්‍යන්තර මූල්‍ය අරමුදල දුන් වට්ටෝරුව අනුව කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. කැබිනට් මණ්ඩලයේ එක ඇමතිවරයෙක් ඒක දන්නේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම එක්ක සාකච්ඡා කළේ නැහැ. ගත යුතු තීන්දුව හොඳ ද නරක ද කියා ආර්ථික විශේෂඥයන්ගෙන් උපදෙස් ගත්තේ නැහැ.

මොකක් ද කිව්වේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල? සල්ලි දෙන්න නම් රුපියල පාවෙන්න හරින්න කිව්වා. රුපියල පාවෙන්නඇරියා. මොකක් ද සිද්ධ වුණේ? ඩොලරය 134ට නැග්ගා. තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්තිය ඒකයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හදන වට්ටෝරුවට අනුව කටයුතු කරනවා. එම නිසා තමයි මහා පරිමාණ ඉඩම් දෙන්නේ. ඩෝල් සමාගමට අක්කර පන් දාහක් දුන්නා සෝමාවතියෙන්. ඩෝල් සමාගමටම අක්කර 2500ක් දුන්නා පැල්වත්තෙන්. කල්පිටියේ අගනා දූපත් 16න් 14ක් වික්කා. ඒ විධියටම තමයි ෂැන්ග්‍රි-ලා කොම්පැනියට කොළඹ නගරයේ වටිනා ඉඩම් අඩු මුදලට - තුට්ටුවට දෙකට- දුන්නේ. ඒ අනුවම තමයි අපේ රටේ තෙල් සම්පත බදු රහිතව නෙළා ගන්නට කායින් ලංකා පුද්ගලික සමාගමට වරප්‍රසාද දුන්නේ මේ පාර්ලිමේන්තුවට බදු නිදහස් කිරීමේ පනත් ගෙනැවිත්. ඒ අනුව තමයි IOC එකට අවුරුදු 10කට බදු සහනය දීලා තිබෙන්නේ. එම නිසා තමුන්නාන්සේලා කාටද මේ සලකන්නේ? මේ රටේ ගොවි ජනතාවට නොවෙයි. මේ රටේ වැඩ කරන ජනතාවට නොවෙයි. මේ රටේ රැකියා විරහිත තරුණ තරුණියන්ට නොවෙයි. මේ රටේ ගල් වලේ කල් කපන කම්කරුවාට නොවෙයි. මේ රටේ තේ වත්තේ තේ දළු කඩන කම්කරුවාට නොවෙයි. තමුන්නාන්සේලා සලකන්නේ බටහිර අධිරාජ්‍යවාදින්ගේ වුවමනාවන් අනුව කටයුතු කරන ආර්ථික න්‍යාය පත්‍රයෙන් වැජඹෙන, ඒ සඳහා සැලසුම් හදන කොම්පැනිකාරයින්ටයි. එහෙම සලකන ආණ්ඩුවක්. එහෙම ඇවිල්ලා ආර්ථිකයේ ප්‍රතිලාභ ගැන සාකච්ඡා කරමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. එක පැත්තකින් වෙළඳ ශේෂයේ හිඟය. අනෙක් පැත්තෙන් අර්බුදයක් ඇති කළා. ඒ මොකක්ද? මේ දැවැන්ත අර්බුදය. ඊළඟට, තමුන්නාන්සේලාගේ නාස්තිකාර වියදම්. දැයට කිරුළ හැදුවා. රුපියල් කෝටි 2600ක් වියදම් කළා. මහා රූස්ස වනාන්තරයක් තිබුණ ඔයාමඩුවේ අක්කර 600ක් ඩෝසර් කළා. කම්බි වැටක් ගහලා වෙන් කළා, අක්කර 600ක්. දැවැන්ත වනාන්තරයක්. අවුරුදු තුන් සියයක් හාර සියයක් පැරණි ගස් එහි තිබුණා. ඒ සියල්ල විනාශයට පත් කර තමුන්නාන්සේලා සැණකෙළියක් කළා. සැණකෙළියක් කරලා එතැන හැදුවා, වී ගබඩාවක්. ආසියාවේ ලොකුම වී ගබඩාවය කිව්වා. ඇමතිවරු රොත්ත පිටින් ම ගිහින් විවෘත කළා. ටීවී එකේ "ප්‍රෝග්‍රෑම්" හදලා පෙන්නුවා, ආසියාවේ ලොකුම වී ගබඩාව හදලාය කියා. දැන් ගිහින් බලන්න. ආසියාවේ ලොකුම වී ගබඩාවේ වී ඇටයක් නැහැ. වතුර ගලනවා, පොළොවට. වී ටිකක් ගබඩා කර තියන්නට බැහැ. ගබඩාව අස්සේ වී පැළ වෙනවා. ඒක මඩ කුඹුරක් වාගෙයි. මුදල් වියදම් කළා. මුදල් නාස්ති කළා. තමුන්නාන්සේලාගේ නාස්තිකාර වියදම්වල බරත් රටේ ජනතාවට පටවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම විදේශ සංචාර. කෝහේ හෝ හෝටලයකින් කවුරු හෝ වැටිලාය කියා ප්‍රවෘත්තියක් ගියොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳට බලන්න ඕනෑ. ෂුවර් එකට ලංකාවේ ඇමති කෙනෙක් වන්නට ඕනෑ. පසු ගිය දා ඉතාලියේ හෝටලයක තුන්වන තට්ටුවෙන්

පුද්ගලයෙක් වැටිලාය කියා පත්තරයේ ප්‍රවෘත්තියක් තිබුණා මා දැක්කා. බලා ගෙන යනකොට මොකක්ද? කටුනායකින් ඇමතිවරයෙක් එනවා, කිහිලිකරුවෙන්. මේවා අපේ සල්ලි. තව ඇමතිවරයෙක් ඕස්ට්‍රේලියාවේ හෝටලයකින් වැටුණා. තව ඇමතිවරයෙක් ගිහින් තමිල්නාඩුවේ හෝටලයක සේවය කරන කාන්තාවක් පැහැර ගෙන යන්න හදලා. මොන ලජ්ජා නැති වැඩක් ද? තමිල්නාඩුවේ මහ ඇමතිවරිය මැතකදී ප්‍රකාශයක් කර තිබුණා. මොකක් ද? ලංකාවේ ප්‍රභූවරයෙක් එනවා නම් කලින් තමිල්නාඩුවට කියන්න කියලා. ගැහැණු ළමයි ටික හංගන්න ද කොහේද. ලජ්ජා නැහැ. මේ විධියට මේ රටේ මහජනයාගේ සල්ලි තමුන්නාන්සේලා නාස්ති කරනවා. ඒවායේ බරත් මේ රටේ ජනතාව මත පැටවිලා තිබෙනවා. ඊට පස්සේ මොකක්ද කළේ?

රගර් වසන්තයක් ගෙනාවා. කාටද වසන්තය? රගර් ක්‍රීඩා කරන දරුවන් මේ රටේ දාහක් ඇති. රගර් ක්‍රීඩාව ජාතික ක්‍රීඩාවක් හැටියට ඔසවා තබන්නට නම්, ඒ පිළිබඳව ප්‍රතිපත්තියක් ඇතිව වැඩ කරමු. හැබැයි කාගේ වුවමනාවටද? කාගේ සල්ලි ද ? අප තමුන්නාන්සේලාගෙන් අහනවා, කාගේ සල්ලි ද වියදම් කළේ කියා. "එයාර් ලංකා" එකේ තරුණ තරුණියන් බෝලයක් -රගර් බෝලය- උස්සා ගෙන ඉන්න "කට්අවුට්" එකක් කොළඹ නගරයේ හැම තැනම ගහලා තිබෙනවා මා දැක්කා. ඒ එකකට වියදම රුපියල් ලක්ෂ 100යි, 150යි. මේවා කාගේ සල්ලි ද?

ජාතික රක්ෂණ සමාගමෙන්, ලංකා බැංකුවෙන් අනුග්‍රහය. කාගේ සල්ලිද තමුන්නාන්සේලා වියදම් කළේ? මේ රටේ මහජනයාගේ සල්ලි. නුවර මැච් එක බලන්න ගෙන්වුවා, කාවද? ප්‍රීටි සින්ටා, විවේක් ඔබරෝයි දෙදෙනාව. පළමුවැනි පන්තියේ ටිකට් එක, තරු පහේ හෝටලය, බෙන්ස් කාර් එකේ ගමන. මේ පහසුකම් ඔක්කොම දීලා, නුවර පිට්ටනියේ පැය දෙකක් හිටගෙන සිටියාට යනකොට කෝටි එකහමාරක් දුන්නා, සාක්කුවට. කාගෙද මේ සල්ලි? මොන ලජ්ජාවක්ද තිබෙන්නේ? සමහර ඇමතිවරුන් ප්‍රීටි සින්ටා වටේ කැරකි කැරකී සිටියා. ප්‍රීටි සින්ටා වාඩි වෙලා, ඇමතිවරුන් ඒ වටා කැරකි කැරකී සිටියා. තමුන්නාන්සේලා නැති කරන්නේ රටේ අභිමානය. මොනවා වුණත් තමුන්නාන්සේලා මේ රටේ ඇමතිවරුන්. මොන ලජ්ජා නැති වැඩක්ද? කාගේ සල්ලිද මේ වියදම් කරන්නේ? මේ රටේ මහජනයාගේ සල්ලි. අපි කියන්නේ, තමුන්නාන්සේලා ඒ නාස්තිකාර වියදම් දැන් මේ රටේ ජනතාව පිට පටවලා තිබෙනවා කියලා යි.

ඒ විතරක්ද? පසු ගිය සති දෙකක් තිස්සේ කොළඹ නගරයේ සවස 7.00න් පසුව පාරවල් වැහුවා. පාරවල් වහලා මුළු කොළඹ නගරයම දවාලේ වාගේ ඒකාලෝක කළා. දවල් වාගේ ඒකාලෝක කරලා, වැලි කොට්ට පුරවලා, ටයර් පුරවලා, පාරේ car race පැවැත්වුවා. කාටද? කාගේ දරුවන්ටද car race මේනියාවක් තිබුණේ? විදුලිබල ඇමතිවරයා ඉස්කෝල ගාණේ ගිහිල්ලා කියනවා, විදුලි බලය පරිස්සම් කරන්න කියලා. ගෙදර පත්තුවෙන බල්බ් එක නිවන්න කියනවා. ලංකාවේ නායකයන්ගේ දරුවෝ කොළඹ නගරයේ මහ දවල් වාගේ ලයිට් පත්තු කරලා car race පවත්වනවා. Car race යන්නේ දෙහිඅත්තකණ්ඩිය අම්මාගේ, තාත්තාගේ දරුවෝද? මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන සේවක සේවිකාවන්ගේ දරුවෝද? නැහැ, ඒ තමුන්නාන්සේලාගේ දරුවෝ. ඒ නිසා මේ රටේ ඒ නාස්තිකාර වියදම් ජීවන බරට එකතු කරලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලක් පවත්වා කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති කළා, නායකයන්ගේ දරුවන්ගේ දොළ දුක් සංසිඳුවන්නට. ඒ වාගේම IIFA උළෙලක් පැවැත්වුවා. කෝටි ගණන් වියදම් කළා. මොකක්ද මේ කරලා තිබෙන්නේ? මොනවාද ප්‍රතිලාභ? [බාධා කිරීමක්] එච්.ආර්. මිත්‍රපාල නියෝජ්‍ය ඇමතිතුමා මොකක්ද කළේ? මෙතුමා කරන දේ තමයි තමන්ගේ හරක් ටික බලා ගන්න එක. [බාධා කිරීමක්] ඔව්. බත් කාලා නිදා ගන්න වෙන්නේ අපේ දරුවන්ට.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
සංස්කෘතිය වෙනස් වෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සංස්කෘතිය වෙනස් වෙනවා. හැබැයි ඒක ගමේ දරුවාට අයිති නැහැ. ඒක පොළොන්නරුවේ දරුවාට අයිති නැහැ. කුඹුරට බැහැලා ආදායම් උපයන, ඒ ගොවි අම්මා තාත්තාගේ දරුවන්ට ඒක අයිති නැහැ. තේ වත්තේ තේ දළු කඩන, ඒ අම්මා තාත්තාගේ දරුවන්ට ඒක අයිති නැහැ. ඒක අයිති එක පැළැන්තියකටයි. එක පැළැන්තියකට පමණක් සීමා කරලා සැණකෙළි පවත්වනවා. අපේ රටේ මහා බර, මහා ධනස්කන්ධයක් නාස්ති කරනවා. මොනවා කළත් කමක් නැහැ, තමන්ගේ ඉඩම් විකුණලා කරනවා නම්. තමන්ගේ වලව් විකුණලා කරනවා නම් කමක් නැහැ. මේ නාස්ති කරන්නේ මේ රටේ ජනතාවගේ බදු සල්ලි. මේ රටේ ජනතාව පිට අසීමිත බදු බරක් පටවලා, ජනතාව මත අසීමිත බරක් එළලා, ඒ එකතු කර ගන්නා ලද මුදල්වලින් තමයි තමුන්නාන්සේලා සැණකෙළි පවත්වන්නේ. මේ නාස්තිකාර වියදම් අද මේ රටේ ජනතාවට බරක් කරලා තිබෙනවා. සීනි කිලෝ එක වැඩි කරනකොට, පරිප්පු කිලෝ එක වැඩි කරනකොට, ඒක අස්සේ ප්‍රීති සින්ටාට වියදම් කළ ගණනත් තිබෙනවා. ඒක අස්සේ විවේක් ඔබරෝයිට වියදම් කළ ගණනත් තිබෙනවා. ඒක අස්සේ car raceවලට වියදම් කළ ගණනත් තිබෙනවා. අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? ඒ බර අද මේ රටේ ජනතාව මත තමුන්නාන්සේලා පටවලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි මහා නාස්තිකාර ව්‍යාපෘති, ප්‍රතිඵලයක් නැති ව්‍යාපෘති හදලා තිබෙනවා. ඒ ව්‍යාපෘති නිකම් concrete කඳු විතරයි. ඒ concrete කඳුවලින් ප්‍රතිඵලයක් නැහැ. නිකම් අර farm එකක් හදලා, මාස හයක් ගියත් කිකිළියෝ බිත්තර දමන්නේ නැහැ වාගේ ව්‍යාපෘති හැදුවා. ඒ ව්‍යාපෘතිවලින් ලැබෙන ප්‍රතිඵල මොනවාද? අධිවේගී මාර්ගයක් තිබෙනවා. එදිනෙදා වාහන යනවාද ඒ පාරේ? කවුද ඒකේ එදිනෙදා යන්නේ, එන්නේ? අපේ රටේ අධිවේගී මාර්ගයක් තිබෙනවා, බලන්න යන්න. ලෝකයේ පාරවල් තිබෙන්නේ යන්න එන්න. අපේ රටේ තිබෙන්නේ බලන්න යන්න. කල්පනා කරලා බලන්න. ඒ නිසා රටක ප්‍රමුඛතාව කුමක්ද කියලා හඳුනා ගන්නට ඕනෑ. අවශ්‍යතාවන් මොනවාද කියලා හඳුනා ගන්නට ඕනෑ. ප්‍රමුඛතාවන් මොනවාද? අපේ රටට ප්‍රශ්න බාස්කට් එකක් තිබෙනවා. සල්ලි බාස්කට් එකකුත් තිබෙනවා. ඒ සල්ලි බාස්කට් එක මදි, ප්‍රශ්න බාස්කට් එකේ තිබෙන ප්‍රශ්න විසඳන්න. ප්‍රශ්න බාස්කට් එකේ ප්‍රශ්න ටික ගන්නට ඕනෑ එළියට. අරගෙන, ප්‍රමුඛතාවන් අනුව ඒවා විසඳන්නට ඕනෑ. ඒ වෙනුවට මොකක්ද කරන්නේ? නාස්තිකාර පුතුන්ගේ, නාස්තිකාර ඇමතිවරුන්ගේ ඔළුවට එන සිතුවිලි ක්‍රියාත්මක කරනවා. IIFA කෝච්චිය කාටද? කෝච්චිය විවෘත කළා, අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? කෝච්චිය දුවන්නේ නැතිව දැන් කටුනායක ගුවන් තොටුපොළේ ගාල් කරලා තිබෙනවා. කටුනායක ගුවන් තොටුපොළේ දැන් ගුවන් යානාත් තිබෙනවා, කෝච්චියකුත් තිබෙනවා. ගුවන් යානායි, කෝච්චියි දෙකම එකට තිබෙන ලෝකයේ පළමු වැනි ගුවන් තොටුපොළ. මොනවාද මේවාට කළේ? විවෘත කළා. ලෝකයේ තිබෙන්නේ දුවන කෝච්චි. අද අපේ රටේ ගුවන් තොටුපොළේ තිබෙන කෝච්චිය දුවන්නේ නැහැ, නතර කරලා තිබෙන්නේ. දුවන්නේ නැතිව නිකම් තියන්න හදපු නාස්තිකාර කෝච්චි. කෝටි ගණන් මුදල් වියදම් කරලා සුඛෝපභෝගී කෝච්චියක් හදලා, අද ඒක නිකම් නතර කරලා තිබෙනවා. කෝහේද ඒක දුවන්නේ? කවුද

[ගරු අනුර දිසානායක මහතා]

ඒවා දුවවන්නේ? මොකටද ඒක කළේ? අර ඉන්දියාවේ නළු නිළියන් ටිකක් ගෙනෙන්න දැම්මා, සුඛෝපභෝගී කෝච්චියක්. මේවා කාගේ සල්ලිද? මේ වියදම් කරලා තිබෙන්නේ අපේ මහජනයාගේ සල්ලි. එක පැත්තකින් තමුන්නාන්සේලාගේ නාස්තිකාර ජීවිත; නාස්තිකාර වුවමනාවන්. අනෙක් පැත්තෙන් නාස්තිකාර ව්‍යාපෘති. අනෙක් පැත්තෙන් මහා පරිමාණ වංචා, දූෂණ.

කල්පනා කරලා බලන්න, පැල්වත්ත සීනි සමාගමයි, සෙවණගල සීනි සමාගමයි ගැන. ඒක දීපු විධියත් වැරැදියි. අපට ඒ පිළිබඳ විවේචනයක් තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලා පවරාගත්තු විධියත් වැරැදියි. තමුන්නාන්සේලා පවරා ගන්නකොට කිව්වේ, පැල්වත්ත සීනි සමාගමයි, සෙවණගල සීනි සමාගමයි ඌන ක්‍රියාකාරී සමාගම්, ඒ නිසා හොඳ ක්‍රියාකාරීත්වයට ගෙනෙන්න ඕනෑ කියලා පවරා ගන්නා බවයි. පවරාගෙන මොකක්ද කළේ? මුදල් අමාත්‍යාංශයෙන් කෝටි 20ක් දුන්නා එහි වැටුප් ගෙවන්න. අපිට කිව්වේ මොකක්ද? මේක ඌන ක්‍රියාකාරී සමාගමක්, මේකෙන් හොඳ ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ;

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියපු ආයෝජනය ඇවිල්ලා නැහැ; අවශ්‍ය රක්ෂා ප්‍රමාණය දීලා නැහැ; ඒ නිසා මේ ඌන ව්‍යාපෘතිය සම්පූර්ණ ව්‍යාපෘතියක් කරන්න ඕනෑ කිව්වා. සම්පූර්ණ ව්‍යාපෘතියක් කරන්න ඒක අරගෙන දැන් මොකක්ද කරන්නේ? මහා භාණ්ඩාගාරය මහජනයාගේ බදු මුදල්වලින් කෝටි 20ක් වෙන් කරනවා පඩි ගෙවන්න. ඉස්සර ලාභ හෝ පාඩු පෞද්ගලිකව මුදලාලි දරා ගත්තා. සෙවණගල සීනි කර්මාන්තශාලාව අයිතිකරු ලාභය හෝ පාඩුව ඔහු විසින්ම දරා ගත්තා. පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ හිමිකරු ලාභය හෝ පාඩුව ඔහු විසින්ම දරා ගත්තා. තමුන්නාන්සේලා ඒවා ඌන ව්‍යාපෘති කියලා පවරා ගත්තා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් පාඩුව දමන්නේ කාටද? මහජනයාගේ බදු බරට. කෝටි 20ක් වෙන් කළා පඩි ගෙවන්න.

එයාර් ලංකා ආයතනයේ පාඩුව කීයද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය අවුරුද්දේ පාඩුව කෝටි 1,900යි. අවුරුද්දකට සමෘද්ධි සහනාධාරය දෙන්න වෙන් කරන්නේ කෝටි 900යි. ලංකාවේ ඉස්පිරිතාලවලට අවුරුද්දකට වෙන් කරන්නේ කෝටි 1,300යි. පොහොර සහනාධාරය දෙන්න අවුරුද්දකට වෙන් කරන්නේ කෝටි 1,350යි. හැබැයි එයාර් ලංකා ආයතනයේ පාඩුව කෝටි 1,900යි. මේක සාධාරණද කියා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. මහජනයාගේ මුදල් නාස්ති කරන බහිරවයෝ වාගේ ආයතන ටිකක් හදා ගෙන, ඒකට බහිරවයෝ වාගේ නිලධාරි ටිකක් පත් කර ගෙන තිබෙනවා. තමන්ට ඥාතිකම් තිබෙන, තමන්ට කොමිස් ගන්න උදව් කරපු, තමන්ට ශාස්ත්‍ර කියන නිලධාරින් ටිකක් ඒවායේ දමා ගෙන මහජනයාගේ මුදල් කාබාසිනියා කරනවා. ඒවායේ බර අද කාටද ඇවිල්ලා තිබෙන්නේ? ඒවායේ බරත් අද මේ රටේ ජනතාවටයි. එක පැත්තකින් ලෝක බැංකුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් දෙන ආර්ථික වට්ටෝරුව නිසා කඩා වැටෙන ආර්ථිකයේ බරත් ජනතාවටයි. නාස්තිකාර වියදම්වල බරත් ජනතාවටයි. නාස්තිකාර ව්‍යාපෘතිවල බරත් ජනතාවටයි. මහා පරිමාණ වංචා දූෂණවල බරත් ජනතාවටයි. ලබා ගන්නා මහා අධික ණය කඳුවල බරත් ජනතාවටයි. ණය කඳු ගොඩ ගහන රටක් මේක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කල්පනා කරලා බලන්න. ආණ්ඩුව උපයන සෑම රුපියලකින්ම ශත 89ක් වෙන් කරනවා ණය ගෙවන්න. ඒ රට කවර රටක්ද? ගෙදරකට මෙහෙම වුණොත් මොකක්ද වෙන්නේ? ගෙදර ආදායම රුපියල් 1,000ක් වන කොට රුපියල් 890ක් ණය ගෙවනවා නම් මොකද වෙන්නේ? ආණ්ඩුවේ ආදායම රුපියල් 100ක් නම් ණය ගෙවනවා රුපියල් 89ක්. ආදායමෙන් සියයට 89ක් ණය ගෙවන රටක්. පසු ගිය අවුරුද්දේ කෝටි 92,000ක් ආදායම උපයන කොට කෝටි 84,000ක ණය සහ පොලී වාරික ගෙව්වා. ඉතුරු වෙන්නේ කෝටි 8,000යි. ඊට පස්සේ මොකද කරන්නේ? නැවත කෝටි 100,000ක් ණයට ගත්තා. මොන රටක්ද මේක? ඊළඟට මේ අවුරුද්දේ ඇස්තමේන්තු කරලා තිබෙනවා කෝටි 113,000ක් ණයට ගන්න. රජයේ ආදායමට වැඩියෙන් ණයට ගන්න. රජයේ ආදායමට කිට්ටු මුදලක් ණය සහ පොලී වාරික ගෙවනවා. තමුන්නාන්සේලාගේ මහා ආර්ථික කළමනාකරණය, මහා ආර්ථික දැක්ම ඒකයි. රට ගෙනැල්ලා තිබෙන්නේ එතැනටයි. එහි ණය බර, පොලී බර අද අපේ රටේ ජනතාව මත පටවලා තිබෙනවා. ඒ බර හේතු කොට ගෙන තමයි අද රටේ ජනතාවට මේ ආර්ථික පීඩනය ඇති වෙලා තිබෙන්නේ. රැකියා නැතිකම, වී ටික විකුණා ගන්න බැරි කම, කිරි ටික ගඟට හළන එක, මේ ඔක්කොම ප්‍රශ්න පතුලේ තිබෙන්නේ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය. මේකෙන් ගැලවෙන්නට ඕනෑ. කොහොමද ගැලවෙන්නේ? අපේ රට නිෂ්පාදනය දිශාවට මාරු වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා මොනවාද නිෂ්පාදනය කරන්නේ?

අපේ රටේ සීනි අවශ්‍යතාවයෙන් සියයට 83ක් පිට රටින් ගෙනෙනවා. 2008 අවුරුද්දේ මොකක්ද කිව්වේ? සීනි නිෂ්පාදනය වැඩි කරන්නය කියලා පිට රටින් ගෙනෙන සීනිවලට බදු ගැහුවා. බදු ගහලා කිව්වා සීනි නිෂ්පාදනය වැඩි කරනවා කියලා. වැඩි කළාද? සියයට 80ක් කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන පිට රටින් ගෙනෙනවා. මොන රටක්ද මේක? තමන්ගේ රටට අවශ්‍ය කිරි ටික, සීනි ටික නිෂ්පාදනය කර ගන්න බැරි රටක් මේක. ආණ්ඩුවේ වාර්තා මොකක්ද කියන්නේ? කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන ගෙනෙන්න ඩොලර් බිලියන 346ක් ගිහින් තිබෙනවා. සීනි සඳහා ඩොලර් මිලියන 444ක් ගිහින් තිබෙනවා. අනෙකුත් ආහාර ද්‍රව්‍ය සඳහා ඩොලර් මිලියන 884ක් ගිහින් තිබෙනවා. ඒ කියන්නේ ලංකාවේ ආහාර සඳහා පමණක් -කිරි, සීනි සහ අනෙකුත් ආහාර සඳහා පමණක්- ඩොලර් මිලියන 1,674ක් වියදම් කරන රටක් මේක. මොන රටක්ද මේක? තමුන්නාන්සේලා ජාතික නිෂ්පාදනය වැඩි කරනවාය කිව්වා; නිෂ්පාදනයට මහා දිරි දීමක් දෙනවාය කිව්වා. නමුත් තමුන්නාන්සේලා ජාතික නිෂ්පාදනය වැඩි කරලා නැහැ. රෙදිපිළි නිෂ්පාදනය වර්ධනය කරලා නැහැ. කෘෂි කාර්මික නිෂ්පාදනය වර්ධනය කරලා නැහැ. කිරි නිෂ්පාදනය වර්ධනය කරලා නැහැ. මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය කරලා නැහැ. අපේ රටේ කර්මාන්තකරණයක් දැකලාවත් නැහැ. මොන කර්මාන්තද අලුතින් ඇති කරලා තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි ජාතික නිෂ්පාදනය පදනම් වෙච්ච ආර්ථිකයකට මේ රට මාරු කරන්න ඕනෑ. මා කියන්නේ සියල්ලම නොවෙයි, රටේ නිෂ්පාදනය කළ හැකි දේ නිෂ්පාදනය කරන තැනකට යන්න ඕනෑ. හැබැයි මොකක්ද වෙලා තිබෙන්නේ? නිෂ්පාදනය කළාට වැඩක් නැහැ. කිරි නිෂ්පාදනය කරන ගොවියා කිරි ටික ගඟට හළනවා. කෙසෙල් නිෂ්පාදනය කරන ඇඹිලිපිටියේ ගොවියා කෙසෙල් ටික පොළොවේ ගහනවා. තක්කාලි නිෂ්පාදනය කරන දඹුල්ලේ ගොවියා තක්කාලි ටික කුණු කූඩයට දමනවා. දඹුල්ලේ ආර්ථික මධ්‍යස්ථානයේ රටේ එළවලු ටික කුණු ලෙස බැකෝවලින් එකතු කරනවා. රටේ ඇති වන නිෂ්පාදනයවත් කළමනාකරණය කරලා බෙදා හරින්න තමුන්නාන්සේලාට බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිරි අතිරික්තයක් වුණොත් අර්බුදය අපිට තේරුම් ගන්න පුළුවන්. හැබැයි අපේ රටේ කිරි අතිරික්තයක් නැහැ. රටේ අවශ්‍යතාවෙන් සියයට 20යි කිරි නිෂ්පාදනය කරන්නේ.

සියයට 80ක් පිට රටින් ගෙන්වනවා. පහෙන් එකයි හදන්නේ. එක්කෙනෙකුට හදනකොට පස් දෙනෙක් බොන්න ඉන්නවා. පස් දෙනෙක් බොන්න හිටියත් එක්කෙනෙකුට හදන කිරි ටික විකුණා ගන්න බැරි රටක්. මොන කළමනාකරණයක්ද, මොන විද්‍යාවක්ද, මොන තාක්ෂණයක්ද, මොන බෙදා හැරීමක්ද, මොන දැක්මක්ද තිබෙන්නේ? එක් කෙනෙකුට ප්‍රමාණවත්ව හදන කිරි ටිකවත් විකුණා ගන්න බැහැ. ඒ නිසා තමයි නුවරඑළියේ කිරි හළන්නේ.

නුවරඑළියේ කිරි හළන එක පත්තරේ ඡායාරූප සහිතව පළ වුණා. රූපවාහිනියෙන් පෙන්නුවා. ආණ්ඩුව දැන් මොකද කරන්නේ? නුවරඑළියේ කිරි අරගෙන ගිහින් පොළොන්නරුවේදී හළනවා. සාක්ෂි සහිතවයි මම මේ කියන්නේ. මිල්කෝ ආයතනයට අයිති බවුසර් හතක කිරි පොළොන්නරුවේදී හැළුවා. එහෙම කරන්නේ රටේ කිරි අතිරික්තයක් ඇති වෙලා නොවෙයි. ආණ්ඩුව කියනවා, "මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ මහින්ද චින්තනයේ ප්‍රතිඵල අනුව කිරි නිෂ්පාදනය වැඩි වී ඇත" කියා. මොන වැඩි වීමක්ද? කිරි නිෂ්පාදනය වැඩි වෙලා නොවෙයි මේ අර්බුදය තිබෙන්නේ. තවමත් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සියයට 80ක් පිටරටින් ගෙන්වනවා. මේ රටේ හදන්නේ සියයට 20යි. හදන සියයට 20ත් විකුණා ගන්න සැලැස්මක් හදා ගන්න බැරි ආණ්ඩුවක් මේක. එක පැත්තකින් ඇඹිලිපිටියේ ජනතාව වෙහෙස මහන්සි වෙලා වගා කරන කෙසෙල් ටික විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. අනික් අතට වගා කරපු එළවලු ටික කුණු කූඩෙට යවන රටක් මේක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ආර්ථිකය මාරු කරන්න ඕනෑ. නිෂ්පාදනය මත ආර්ථිකය පදනම් වෙන්න ඕනෑ. ඊළඟට ඒක සැලසුම් කරන්න ඕනෑ. මොන සැලසුමක්ද තිබෙන්නේ?මොනවාද අවශ්‍යතා? අපේ රටේ මත්ස්‍ය නිෂ්පාදනය ගෙන යන්න ඕනෑ කොතැනටද, අපේ රටේ කිරි නිෂ්පාදනය ගෙන යන්න ඕනෑ කොතැනටද, අපේ රටේ අනිකුත් නිෂ්පාදන ගෙන යන්න ඕනෑ කොතැනටද, 2015 වනකොට ඉලක්කය මොකක්ද, ඒකට රාජ්‍ය අංශයේ දායකත්වය මොකක්ද, ඒකට පෞද්ගලික අංශයේ දායකත්වය මොකක්ද, ඒකට මූල්‍ය සමාගම් සහ බැංකු වැනි ණය දෙන ආයතනවල දායකත්වය මොකක්ද, ඒවාට දෙන ඉලක්කය මොකක්ද? එතැනටයි තමුන්නාන්සේලා රට මෙහෙයවන්න ඕනෑ. හැබැයි තමුන්නාන්සේලාගේ වාර්තා අනුව මොකක්ද තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා කෘෂිකර්මාන්තයේ මහා නවෝදයක් ගැන කථා කළා. හැබැයි ගිය අවුරුද්දේ වාණිජ බැංකුවලින් දීපු ණයවලින් කෘෂිකර්මාන්තයට දී තිබෙන්නේ සියයට 1.01යි. මස් හා කිරි කර්මාන්තයට දී තිබෙන්නේ සියයට 0.35යි. ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් දී තිබෙන්නේ සියයට 0.29යි. වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් දී තිබෙන්නේ සියයට 2.96යි. වැවිලි ක්ෂේත්‍රයේ අපේ නිෂ්පාදනය, ධීවර ක්ෂේත්‍රයේ අපේ නිෂ්පාදනය, කිරි ක්ෂේත්‍රයේ අපේ නිෂ්පාදනය, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ අපේ නිෂ්පාදනය, මත්ස්‍ය ක්ෂේත්‍රයේ අපේ නිෂ්පාදනය සඳහා වාණිජ බැංකුවලින් දී තිබෙන්නේ කොච්චරද? මුළු ණයවල එකතුව සියයට 5කටත් අඩුයි. වාණිජ බැංකුවලට මොකක්ද දීපු න්‍යාය පත්‍රය? පෞද්ගලික ආයෝජකයාට මොකක්ද දීපු න්‍යාය පත්‍රය? රාජ්‍ය සැලැස්ම මොකක්ද? මත්ස්‍ය නිෂ්පාදනය මෙතැනට ගෙනෙනවා, මෙන්න පෞද්ගලික අංශයේ කොටස, මෙන්න රාජ්‍ය අංශයේ කොටස; කෘෂිකාර්මික නිෂ්පාදන අපි මෙතැනට ගෙනෙනවා, මෙන්න රාජ්‍ය අංශයේ කොටස, මෙන්න පෞද්ගලික අංශයේ කොටස; මෙන්න බැංකුවල කාර්යභාරය; එහෙම කියා තිබෙනවාද? මොන බැංකුවටද කථා කරලා කිව්වේ අපේ රටේ මෙවැනි ඉලක්කයක් හදා තිබෙනවාය, ඒ ඉලක්කය ජය ගැනීම වෙනුවෙන් තමුන්නාන්සේලා ණය දෙන්නය කියා. මොන ව්‍යාපාරිකයාද කැඳවලා කිව්වේ අපේ රටේ නිෂ්පාදනය අපි මෙතැනට ගෙනෙනවා, ඒ නිසා තමුන්නාන්සේලා ඒ දිසාවට ආයෝජනය කරන්නය කියා. තමුන්නාන්සේලා ඒ අය කැඳවා එක්කෝ කොමිස් ගන්න කථා කරනවා. එක්කෝ ව්‍යාපෘතියක් පාස් කරන්න සල්ලි ගන්න කථා කරනවා. ඕකයි තමුන්නාන්සේලාගේ duty එක. රටේ පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය මැදිහත් වෙලා රටේ නිෂ්පාදනය ඉදිරියට ගෙන යනවා වෙනුවට නිෂ්පාදනය කරන කෙනාගේ නිෂ්පාදනය වට්ටන්න, ඒවායින් යමක් හොයා ගන්න, ඒකෙන් කොමිස් එක ගන්න, ඒ මුදලාලිගෙන් රට යන්න ticket එක ගන්න, එයාගෙන් car permit එකක් ගන්න කථා කරනවා. ඔය වාගේ දේවල්වලට තමයි තමුන්නානසේලා ව්‍යාපාරිකයා පාවිච්චි කරන්නේ. අපි නිෂ්පාදනය ඉලක්ක කර ගන්න ඕනෑ. නිෂ්පාදනය ඉලක්ක කර ගෙන විතරක් වැඩක් නැහැ. ඒක සැලසුම් කරන්න ඕනෑ. තමුන්නාන්සේලාට නිෂ්පාදන ඉලක්කයකුත් නැහැ, සැලසුම්කරණයකුත් නැහැ.

ඒ විතරක් මදි. නිෂ්පාදනයට ජනතාව හවුල් වෙන්න ඕනෑ. කොහේද හවුල් වෙලා තිබෙන්නේ? අපේ රටේ මුළු ජාතික නිෂ්පාදනයෙන් සියයට 51ක් දෙන්නේ බස්නාහිර පළාතෙනුයි. උතුරු මැද පළාත දෙන්නේ සියයට 4යි. වයඹ පළාත දෙන්නේ සියයට 9යි. ඌව පළාත සියයට 4යි. දකුණු පළාත සියයට 9යි. එතකොට මොකක්ද වෙලා තිබෙන්නේ? රටේ මුළු මහත් ජාතික නිෂ්පාදනයෙන් සියයට 50ක් දෙන්නේ බස්නාහිර පළාතෙනුයි. උතුරු මැද පළාතේ විශාල ඉඩම් තිබෙනවා, ලොකු ශ්‍රම බලකායක් ඉන්නවා. හැබැයි රටේ ජාතික නිෂ්පාදනයට එකතු කරන්නේ සියයට 4යි. ඌව පළාතේ දැවැන්ත නිෂ්පාදනයක් කෙරෙනවා, විශාල ඉඩම් තිබෙනවා, ශ්‍රම බලකායක් ඉන්නවා, හැබැයි රටේ ජාතික නිෂ්පාදනයට එකතු කරන්නේ සියයට 4යි. වයඹ පළාතත් සශ්‍රීක ප්‍රදේශයක්. දකුණු පළාතේ දැවැන්ත මුහුදු තීරයක් තිබෙනවා. හොඳ සශ්‍රීක ප්‍රදේශයක්. හැබැයි ජාතික නිෂ්පාදනයට දෙන්නේ සියයට 9යි. මොකක්ද වෙලා තිබෙන්නේ? නිෂ්පාදනය ප්‍රසාරණය වෙලා නැහැ. ආර්ථිකය ප්‍රසාරණය වෙලා නැහැ. කොළඹ කේන්ද්‍ර කර ගත්තු, මුදලාලිලා කිහිප දෙනෙක් කේන්ද්‍ර කර ගත්තු ආර්ථිකයක් තමුන්නාන්සේලා හදා තිබෙනවා. ඒ ආර්ථිකයෙන් වැටෙන මස් කටු ටික සූප්පු කරන්න ජනතාවක් හදා තිබෙනවා. ආර්ථිකය ප්‍රසාරණය කරන්න ඉලක්කයක් නැහැ. ඒ නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? රටේ ජාතික නිෂ්පාදනයෙන් සියයට 50ක් බස්නාහිර පළාතෙන් දෙන කොට උතුරු මැද පළාතෙන් දෙන්නේ සියයට 4යි. ආර්ථිකය විහිදෙන්න ඕනෑ. රක්ෂා හැදෙන්න ඕනෑ ඒවා ඇතුළේ. තමුන්නාන්සේලා රක්ෂා දෙන්නේ කොහොමද? උපාධිධාරින් 40,000ක් අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිරෙව්වා. රුපියල් 10,000 පඩියට උපාධිධාරින් තව කොටසක් ගත්තා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුරවලා. සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල උපාධිධාරින් 100යි. තරුණ ශ්‍රමය. අවුරුදු හතරක් ඉගෙන ගෙන උපාධිය අරගෙන, අවුරුදු 3ක් ගෙදර ඉඳලා රක්ෂාවක් හොයලා තරුණ දැනුම, තරුණ ශ්‍රමය තියා ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගිහිල්ලා වාඩි වෙන්න පුටුවක් නැතිව ඉන්නවා.

කොහේද රස්සා දෙන්නේ? එහෙම රස්සා දීලා වැඩක් තිබෙනවාද? උපාධිධාරින් අරගෙන වාඩි වෙන්න බංකුවක් නැතුව, වාඩි වෙන්න පුටුවක් නැතුව, රාජකාරියක් නැතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුරවලා තිබෙනවා.

හැබැයි එතැන නොවෙයි රස්සා දෙන්න ඕනෑ. රස්සා නොවෙයි, නිෂ්පාදනයයි දෙන්න ඕනෑ. නිෂ්පාදනය ඇතුළේ කර්මාන්ත හැදෙන්න ඕනෑ. කර්මාන්ත ඉංජිනේරුවාගේ job එක, supervisorගේ job එක, කම්කරුවාගේ job එක, මුරකරුවාගේ job එක, ලියන මහත්මයාගේ job එක ආදී විධියට තමයි රැකියා ටික නිර්මාණය වෙන්න ඕනෑ. හැබැයි තමුන්නාන්සේලා එහෙම නොවෙයි නිර්මාණය කරන්නේ. එහෙම දැක්මක්වත් නැහැ; හිතන්නේවත් නැහැ. මොකක්ද කරන්නේ? ඔක්කෝම AGA officeවලට පටවනවා. ඔච්චරයි කරන්නේ. උපාධිධාරින් ටික ගන්නවා; ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පටවනවා; වාඩි වෙන්න පුටු නැතුව main hall එකේ වාඩි වෙලා ඔහේ ඉන්නවා; ඕමි ගහනවා; දාම් අදිනවා; කැරම් ගහනවා. මේ, අපේ රටේ උපාධිධාරින්. මේ, තමුන්නාසේලාගේ දැක්ම. අඩුම තරමේ අපේ රට නිෂ්පාදනය මත පදනම් වෙච්ච ආර්ථිකයකට, සැලසුම්කරණය කරන ලද ආර්ථිකයකට, ප්‍රසාරණය වෙන ලද ආර්ථිකයකට මාරු වෙන්න ඕනෑ. ඒ විතරක් මදියි. සාධාරණව බෙදෙන්න ඕනෑ. මේ බෙදෙන විධිය සාධාරණද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බෙදෙන විධිය අතිශය අසාධාරණයි.

[ගරු අනුර දිසානායක මහතා]

අපේ රටේ ඉහළ පවුල් සියයට 10 රටේ ජාතික ආදායමෙන් සියයට 38.4ක් භුක්ති විඳිනවා. පහළම පවුල් සියයට 10ට හම්බ වෙන්නේ රටේ ජාතික ආදායමෙන් සියයට 1.1යි. සාධාරණද? එක පැළැන්තියක් -ඉහළම පවුල් සියයට 10- රටේ ජාතික ආදායමෙන් සියයට 38.4ක් භුක්ති විඳිනවා. පහළම පවුල් සියයට 10ට හම්බ වෙන්නේ රටේ ජාතික ආදායමෙන් සියයට 1.1යි. පවුල් සියයට 10ක් රටේ ජාතික ආදායමෙන් සියයට 1.1ක් ගන්න කොට, තව පවුල් සියයට 10ක් රටේ ජාතික ආදායමෙන් සියයට 38.4ක් ගන්නවා. සාධාරණද? ඒක සාධාරණව බෙදන්න ඕනෑ. අපි කියන්නේ සාමානව බෙදන්න නොවෙයි. සාධාරණව බෙදන්න ඕනෑ.

මේ ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණව බෙදෙන්නේ නැත්නම් ගොවියාට ගොවියාගේ පංගුව, වී එකතු කරන්නාට වී එකතු කරන්නාගේ පංගුව, වී මෝල් හිමියාට වී මෝල් හිමියාගේ සාධාරණ පංගුව, තොග වෙළෙන්දාට තොග වෙළෙන්දාගේ සාධාරණ පංගුව ලැබෙන්නේ නැහැ. පොළොන්නරුවේ මහා මිනිස් සමුදායක් මාස තුනක් තිස්සේ අවු කාෂ්ටකයේ වෙළිලා මහා දැවැන්ත කෘෂි නිෂ්පාදනයක් කරනවා; මහා දැවැන්ත වී නිෂ්පාදනයක් කරනවා. ගොවියාට කන් හැන්දෙන් බෙදනවා. මුදලාලිට සවලෙන් බෙදා ගන්නවා. සාධාරණද? කවුද පොදිය එක් රැස් කරගෙන තිබෙන්නේ? ගොවියාට නොදී ඉන්නේ නැහැ; ටිකක් දෙනවා. ඇයි? ඊ ළඟ කන්නයෙත් ගොවියාගෙන් වැඩ ගන්න ඕනෑ. තමුන්නාන්සේලා ශ්‍රමිකයාට බෙදන්නේ ඊ ළඟ කන්නයේ වැඩට එන්නට පුළුවන් ගණනට විතරයි. ඔවුන්ගේ විනෝදාංශය, ඔවුන්ගේ සංස්කෘතිය, ඔවුන්ගේ අනෙකුත් පහසුකම්, ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය, ඔවුන්ගේ සෞඛ්‍ය ගැන තමුන්නාන්සේලාට කිසි තැකීමක් නැහැ. මොකක්ද කරන්නේ? ඊ ළඟ කන්නයේ කුඹුරු වගා කරන්න අවශ්‍ය ප්‍රමාණයට විතරක් ගෙවීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් ඊ ළඟ කන්නයේ කුඹුරු වගා කරන්නේත් හරි අමාරුවෙන්. කරාබු දෙක උකස් කරලා, chain එක උකස් තියලා, ටැක්ටරය, නඟුල උකස් තියලා, three-wheeler එක උකස් තියලා, වතුර මෝටරය උකස් තියලා තමයි කුඹුරු කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර තැන්වල කුඹුර තැන් දෙකකට උකස් කරලා තිබෙනවා. එක කුඹුර දෙන්නෙකුට උකස් කරලා ගොවියා වගා කරනවා. වී පංගුව අර උකස්කාරයටත් ගෙවනවා; මේ උකස්කාරයාටත් ගෙවනවා. එහෙම තැනකට තේ මේ ගොවි ජනතාව පත් කරලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉතින් එහෙම තැනකට ගොවි ජනතාව පත් කරලා ආර්ථිකයේ මහා පුරාජේරුවක් ගැන කථා කරනවා. මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ? ආර්ථිකය සාධාරණව බෙදෙන්න ඕනෑ. ගොවියාට ගොවියාගේ පංගුව, වී එකතු කරන්නාට වී එකතු කරන්නාගේ පංගුව, වී මෝල් හිමියාට එයාගේ සාධාරණ පංගුව දෙන්න ඕනෑ. හැබැයි අද අතිශය අසාධාරණ විධියට ගොවියාට කන් හැන්දෙන් දීලා, වී මෝල් හිමියා සවලෙන් බෙදා ගන්නා ආර්ථික ක්‍රමයක් හදලා තිබෙනවා. මේක අතිශය අසාධාරණ ආර්ථික ක්‍රමයක්. මේ ආර්ථිකයේ සාධාරණත්වය හදන්නේ නැතුව, අධ්‍යාපනයේ සාධාරණත්වයක් දරුවන්ට දෙන්න බැහැ. අධ්‍යාපනයේ සාධාරණත්වයක් හදන්නේ නැතුව නීතියේ සාධාරණත්වයක් දරුවන්ට දෙන්න බැහැ. අධ්‍යාපනයේ සාධාරණත්වයක් හදන්නේ නැතුව, ආර්ථික සාධාරණත්වය හදන්නේ නැතුව සාධාරණ සමාජයක් හදන්න බැහැ. මේක අතිශය අසාධාරණ සමාජයක්. එක දරුවන් කොට්ඨාසයකට ගුරුවරයා නැති ඉස්කෝලේ; අනෙක් දරුවන්ට සුපිරි අධ්‍යාපනය. එක දරුවෙකුට හදවතේ රෝගයක් හැදුණොත් බෙහෙත් පෙත්ත නැති ඉස්පිරිතාලේ; තවත් දරුවන්ට සිංගප්පූරුවේ ඉස්පිරිතාලේ. සාධාරණද මේක? ඒ දරුවන්ගේ ජීවිත, ජීවිත නොවෙයිද? එක පරම්පරාවකගේ, එක පවුල් සමුදායකගේ ජීවිත විතරද ජීවිත? නැහැ. මේ රටේ හැම අම්මා තාත්තාම, හැම දරුවාම මේ රටේ ජීවිතයි. එහෙම සැලකිල්ලක් කරන සාධාරණ ආර්ථිකයක් ඕනෑ. ඒකට හඬ නඟන්න ඕනෑ. මේ ආර්ථිකයේ සාධාරණත්වය හදන්නේ නැතුව, නීතියේ සාධාරණත්වයක් එන්නේ නැහැ; අධ්‍යාපනයේ සාධාරණත්වයක් එන්නේ නැහැ; සෞඛ්‍ය සේවයේ සාධාරණත්වයක් එන්නේ නැහැ. ආර්ථිකයේ සාධාරණත්වයක් වෙනුවෙන් හඬ නඟන ගොවි ජනතාවක්, ආර්ථික සාධාරණත්වය වෙනුවෙන් හඬ නඟන වැඩ කරන ජනතාවක්, ආර්ථික සාධාරණත්වය වෙනුවෙන් හඬ නඟන තරුණ පරම්පරාවක් අද නිර්මාණය වෙමින් තිබෙනවා. තමුන්නාන්සේලා අතේ තිබෙන දේවල් බෙදන්න. ඔතරම් පොදි ගහ ගන්නේ මොකටද? මොකක් වෙනුවෙන්ද? තමුන්නාන්සේලා පාලනය හොබවන්නේ කවුරු වෙනුවෙන්ද? මේ පොදු මහජනයා වෙනුවෙන් නොවෙයි. අර ඉහළ ඉන්න සියයට 10 ආරක්ෂා කරන්නයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ ඉහළ ඉන්න පවුල් සියයට 10 ආරක්ෂා කරන්න එහෙම නැත්නම් ඒකට පනින්න තමයි තමුන්නාන්සේලා පාලනය හොබවන්නේ. තමුන්නාන්සේලා පාලනය හොබවන්නේ මේ රටේ බහුතර ජනතාවට ආර්ථිකයේ සාධාරණත්වය, අධ්‍යාපනයේ සාධාරණත්වය, සෞඛ්‍යයේ සාධාරණත්වය, නීතියේ සාධාරණත්වය, සමාජ සාධාරණත්වය ගෙන ඒම වෙනුවෙන් නොවෙයි. තමුන්නාන්සේලා පාලනය හොබ වන්නේ ඉහළ ඉන්න පවුල් පැළැන්තියක් නඩත්තු කරන්නයි.

ඔවුන්ගේ සුඛවිහරණයට, ඔවුන්ගේ ජීවිත රකින්න, එක්කෝ ඒකට පනින්න තමයි පාලනය හොබ වන්නේ. ඒ සඳහා මේ අර්ථ ක්‍රමයේ, මේ පාලන ක්‍රමයේ වෙනසක් නොකර මොන දත්ත කිව්වත් වැඩක් නැහැ.

මේ රටේ ඒකපුද්ගල ආදායම ඩොලර් 2,738ක් වන කොට, රටේ ජනගහනයෙන් සියයට 42කගේ දෛනික ආදායම ඩොලර් 2කට අඩුයි. ඉතින් ඒ බෙදීම සාධාරණ නැහැ; අතිශය අසාධාරණයි. එම නිසා මේ වෙනස් කිරීම සඳහා වූ ප්‍රවේශයකුයි ඕනෑ. හැබැයි අපි ඒක තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, තමුන්නාන්සේලා පාලනය හොබ වන්නේ ඒක වෙනස් කරන්න නොවෙයි; අර සියයට 10 රකින්නයි, එක්කෝ ඒ සියයට 10ට පනින්නයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වඩා වෙනස් ක්‍රමයක අවශ්‍යතාව තමයි අද රටේ පැන නැඟලා තිබෙන්නේ. බොහොම ස්තුතියි.

[අ.භා. 4.48]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මට අවස්ථාවක් ලබා දීම ගැන. මෙපමණ වේලා මා මේ විවාදය අහගෙනයි සිටියේ. මේ කල් තැබීමේ යෝජනාව සඳහා ඉදිරිපත් කළ කාරණා හැර අනික් සියලුම කාරණා ගැනයි එතුමන්ලා කථා කළේ. විවාදය ලබා ගත්තේ, පසු ගිය දිනක අපේ අත්තිකාරම් ගිණුම් සීමා වැඩි කිරීම පිළිබඳව විවාද කරන්නයි. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගැන හැරෙන්න අනික් සියලුම දේවල් ගැන එතුමන්ලා කථා කළා. විපක්ෂයේ දේශපාලනය සඳහා ප්‍රයෝජනයක් ගන්න එතුමන්ලා යොදා ගත් වැඩ පිළිවෙළක් හැටියට තමයි මා මේ විවාදය දකින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැඩසටහනේදී අපි අත්තිකාරම් ගිණුම් සීමාවන් වෙනස් කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත්තා. අපේ රටේ පසු ගිය කාල වකවානුවේ ඇති වුණු යම් යම් වෙනස් වීම්වලට අවශ්‍ය කරන මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත්තා.

අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින් කියා සිටියා, ඇමතිවරුන්ගේ දීමනාවනුත් වැඩි කරලා තිබෙනවාය කියලා. මා දන්නේ නැහැ, එතුමා ඒ තොරතුරු ලබා ගත්තේ කොහෙන්ද කියලා. මෙම විවාදය ඒ වාගේ අසත්‍ය ප්‍රකාශ කරලා ජනතාව සම්පූර්ණයෙන් නොමඟ යැවීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළක් හැටියට තමයි මා එතුමාගේ කථාවෙන් දැක්කේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ යුතුකමක් තිබෙනවා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය කිරීම පිළිබඳ වැඩසටහනකට ගියේ ඇයි කියන කාරණය මේ ගරු සභාවට පැහැදිලි කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයට නිෂ්පාදන ගොවි පොළවල් 19ක් සහ උද්‍යාන විද්‍යා ගොවි පොළවල් 8ක් තිබෙනවා. මූලික බීජ නිෂ්පාදනය කිරීම සඳහා මේ ස්ථානවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරලා, බීජ නිෂ්පාදකයන්ටත්, ඒ වාගේම ගොවියන්ටත් සාධාරණ මිල ගණන් යටතේ අළෙවි කිරීම සඳහා තමයි අපි මේ වැඩසටහන ක්‍රියාත්මක කළේ. 2011 වසරේදී අත්තිකාරම් ගිණුමේ උපරිම සීමාවන් ඉක්මවා ගියා. 2011 වසරේදී අත්තිකාරම් ගිණුමේ අනුමත හර සීමා වියදම රුපියල් මිලියන 300ක් වුණා. ඒ රුපියල් මිලියන 300, රුපියල් මිලියන 355 දක්වා වැඩි කිරීමටයි අපි ඉල්ලුවේ. ඒක තමයි පාර්ලිමේන්තුවෙන් අනුමත වුණේ. ඒ සම්බන්ධයෙන් අපි මහා භාණ්ඩාගාරයට කරුණු ඉදිරිපත් කරලා, ඒ වැඩි කිරීම සාධාරණීකරණය කරලා, අපේ රටේ තිබෙන නීති සියල්ලටම ගරු කරලා, රුපියල් මිලියන 54ක්ව තිබුණු ඉක්ම වීම සඳහා අවශ්‍ය කරන මුදල තමයි අපි ලබා ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට හේතු කිහිපයක් තිබෙනවා. එහෙම වැඩියෙන් වියදම් කරන්න සිද්ධ වුණේ මෙන්න මේ කාරණා නිසායි. ඔබතුමා දන්නවා, ගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනයෙන් අපට ඉලක්කයන් කිහිපයක් ලබා දුන්නු බව. ඒ ඉලක්කයන් කරා යෑමට බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහාත්, වී, අතිරේක ආහාර බෝග, එළවලු හා අර්තාපල් වගාවන් සඳහාත් ගොවි පොළවල්වල වපසරිය අක්කර 406කින් වැඩි කළා. එසේ වැඩි කළේ රටේ අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගන්නයි. මොකද, මේ ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න පසු ගිය කාල වකවානුව තුළ මුදල් ලබා දීලා තිබුණේ නැහැ. මේ ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් වාගේ දිගටම අමතක කරලා තිබුණා, අවශ්‍ය තරම් මුදල් ලබා දෙන්නේ නැතුව. එම නිසා මේ ක්ෂේත්‍රය තුළ විශාල වැඩ කොටසක් කරන්නේ නැතුව, අවශ්‍ය යටිතල පහසුකම් නැතුව නිෂ්පාදන කටයුතු කිරීමට නොහැකි වන නිසා 2015 දී අපේ රජය බලාපොරොත්තු වන ඉලක්කය කරා යන්නට අපට මොනම හැකියාවක්වත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර ගොවි පොළවල්වලට ජලය ලබා ගන්න විධියක් නැහැ.

අපේ මන්ත්‍රීතුමා දන්නවා, සීතාඑළිය රජයේ ගොවි පොළට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා මූලික පහසුකම් තිබුණේ නැති බව. මේ ගොවිපොළවල වැටවල් තිබුණේ නැහැ; ඒවා ඇතුළේ යන්න පාරවල් තිබුණේ නැහැ. ඒවා නඩත්තුවෙන් තොරව තිබිලා, සම්පූර්ණයෙන් විනාශ වෙලා ගිහින් නිෂ්පාදනය සඳහා කිසිම දායකත්වයක් ලබා දෙන්න බැරි තරමට දුර්වල වෙලා තිබුණා. තිබුණු වාහන ඔක්කොම කැඩිලා බිඳිලා ගිහින්. සමහර ඒවා උදේට වැඩ පටන් ගත්තාට පස්සේ සවස් වන තුරුම නවත්වන්න බැහැ. ආහාර ගන්නා වෙලාවේත් ඇන්ජිම දුවන්න ඕනෑ. නැත්නම් ඒ වාහන ඉදිරියට ගෙන යන්න බැහැ. ඒ වාගේ ප්‍රශ්න රාශියක් තිබුණා. ඒ වාගේ දේවල්වලට අමතර වියදම් දරා ගෙන අපි කර ගෙන ගිය වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අපට සිද්ධ වුණා.

වී, අතිරේක භෝග, එළවලු, අර්තාපල් වගා වපසරිය අක්කර 406කින් වැඩි කිරීම නිසා අපට රුපියල් මිලියන 43ක අමතර වියදමක් දරන්න සිද්ධ වුණා. 2010 වසරට සාපේක්ෂව 2011 වර්ෂයේ කම්කරු වැටුප් රජය මඟින් වැඩි කළ බව තමුන්නාන්සේ දන්නවා. ඒ වාගේම දීමනාත් වැඩි කළා. ඒ වැඩි කිරීම් අපේ අය වැය ලේඛනයේ ඇතුළත් වෙලා තිබුණේ නැහැ. ඒ නිසා ඒකට විශේෂයෙන් මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට සිද්ධ වුණා. සියයට 6ක වැටුප් වැඩි කිරීමක් ලබා දෙන්න සිද්ධ වුණා. ඒ වාගේම නිෂ්පාදනය වැඩි කරන කොට බිම සකස් කිරීම විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් අවශ්‍යතා රාශියක් තිබෙනවා. බීජ අවශ්‍යතාව, කෘෂි රසායනික ද්‍රව්‍යවල අවශ්‍යතාව වාගේම අනෙකුත් යෙදවුම්වල මිල වැඩි වීමත් සිද්ධ වෙනවා. රටේ සිද්ධ වන මිල උච්චාවචනයන්ට සාපේක්ෂව ඒවායේත් මිල වැඩි වීම් නිසා ඒ සඳහාත් අපි බලාපොරොත්තු වුණාට වඩා මුදලක් වියදම් කළා.

ඒ නිසා මහා භාණ්ඩාගාරයට කරුණු ඉදිරිපත් කරලා ණය සීමාව, අත්තිකාරම් ගිණුම් සීමාව වැඩි කිරීමේ අවශ්‍යතාව අපට ඇති වුණා. ඒ අවශ්‍යතාවන් භාණ්ඩාගාරයෙන් අනුමත කරලා, පාර්ලිමේන්තුවෙන්ද අනුමත කර ගත්තා. එහෙම නොවුණා නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 වන විට බලාපොරොත්තු වන ඉලක්කය කරා බීජ නිෂ්පාදනය කර ගැනීමත්, ඒ සඳහා ගොවිපොළවල් සකස් කර ගැනීමත් සම්පූර්ණයෙන්ම අඩාල වන තත්ත්වයකට පත් වෙන්නට ඉඩ තිබුණා. නමුත් දැන් ඒ තත්ත්වය නැති කර ගෙන අපේ ඉලක්ක කරා ශීඝ්‍රයෙන් ගමන් කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම බීජ විකුණලා අපේ දෙපාර්තමේන්තුව විවිධ ක්ෂේත්‍රවලින් යම් කිසි ආදායමක් ලබනවා. ඒ කාල සීමාව තුළ ආදායමේ අඩුවීමකුත් සිදු වුණා. අපි බලාපොරොත්තු නොවුණු ප්‍රශ්න කිහිපයකට අපට මුහුණ දෙන්න

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

සිදු වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එකක් තමයි, 2010-2011 වර්ෂයේ මහ කන්නයේ අධික වර්ෂාවෙන් රජයේ ගොවිපොළවල් හයක වී අස්වැන්න අපට සම්පූර්ණයෙන්ම නැති වුණා. වී බුසල් තිස් තුන්දහස් ගණනක් සම්පූර්ණයෙන්ම විනාශ වුණා. එයිනුත් අපිට විශාල පාඩුවක් සිද්ධ වුණා. ඒ වාගේම තමුන්නාන්සේ දන්නවා, පසු ගිය වර්ෂයේ මුල් කාර්තුවේ විශාල වර්ෂාපතනයකට අපට මුහුණ දෙන්න සිදු වුණා; ගංවතුරකට මුහුණ දෙන්න සිදු වුණා. ඒ හැම එකකින්ම අපේ ගොවිපොළවල් විනාශ වුණා; අපේ ගබඩා විනාශ වුණා. තමුන්නාන්සේට මතක ඇති, අලි ගහගෙන ගිය ගංවතුරකට අපට මුහුණ දෙන්න සිද්ධ වුණු බව. ඒ විනාශ සම්පූර්ණයෙන් මකා ගන්න සිද්ධ වුණේ භාණ්ඩාගාරයෙන් විශේෂ ආධාර මුදල් අනුමත කර ගෙනයි. ඒ වාගේ හේතු කිහිපයක් නිසා තමයි අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනයකට යන්න අපට සිද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හැම දෙයකම අවසාන අරමුණ වන්නේ මේ රටේ නිෂ්පාදනයට දායක වීමයි. මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවන් සම්පූර්ණ කරනවා වාගේම, කෘෂි ක්ෂේත්‍රයට වුවමනා කරන නිෂ්පාදන ඉහළ නැංවීමේ ඉලක්කයක් කරා යන ගමනකදී බීජ නිෂ්පාදනය වාගේම, ඊට ආනුශංගික අනෙකුත් අංශවල කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා මූලික ආයෝජනයක් කරන්න අපට සිද්ධ වුණා. එහෙම අවශ්‍ය වන්නේ නැහැ, දිගින් දිගටම මේ ගොවිපොළවල් ඒ ආකාරයෙන් නඩත්තු කර ගෙන තිබුණා නම්. තමුන්නාන්සේ දන්නවා, සමහර ගොවිපොළවල් කැළෑවට වැදිලා තිබෙන්නේ. මහ කැළෑවක් දැක්කාම අපි දන්නවා ඒක රජයේ ගොවිපොළක් කියලා. පසු ගිය කාලයේ ඒ තත්ත්වයෙන් තමයි රජයේ ගොවිපොළවල් විනාශ වෙලා තිබුණේ. ඒවා නැවත පුනරුත්ථාපනය කරන්න, ඒවා නැවත ගොඩ නඟන්න, ඒවා නැවත අපේ ඉලක්ක කරා ගෙන යන්න අවශ්‍ය කරන මූලික නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පත් කරන්න අපට ඒ තීරණය ගන්න සිද්ධ වුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
***Question put, and agreed to.***

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථා කරමින් සිටියේ මූලික අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය කිරීමට අවශ්‍ය හේතු වුණු කාරණා පැහැදිලි කරමින්. මේ මුදල් අරගෙන අපි මේ රටේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රජයේ ගොවිපොළවල් මෙහෙයවීමේ මහා කාර්යභාරයක මේ වන විට යෙදිලා ඉන්නවා. මේ ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය හැටියට අපි අද වීවලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. ඒක තමුන්නාන්සේලා දැක්කා. ඒ වාගේම අපි බඩ ඉරිඟුවලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. මේක අවුරුද්දකින්, දෙකකින්, මාසයකින් කරපු කාර්යයක් නොවෙයි. කාලයක් තිස්සේ දැරූ විශාල උත්සාහයක ප්‍රතිඵලයක් හැටියට තමයි අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අද අපේ රටට වුවමනා කරන බීජ වී, එළවලු බීජ, ඒ වාගේම අවශ්‍ය කරන තවත් බීජ වර්ග විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදනය කරලා මේ වෙන කොට අපි ලබා දීලා තිබෙනවා. විශේෂයෙන් "දිවි නැඟුම" වැඩසටහනට වුවමනා කරන බීජ සියල්ලම අපේ දෙපාර්තමේන්තුවෙන් පසු ගිය කාල වකවානුවේ ලබා දුන්නා. ඉතින්, මේ වාගේ වැඩ පිළිවෙළකට දායක වීම විශාල කාර්යභාරයක්.

මුළු දිවි නැඟුම වැඩ සටහනටම අවශ්‍ය කරන සියලුම බීජ ලබා දෙන්න පසු ගිය කාලයේ අපේ දෙපාර්තමේන්තුවට හැකි වුණා. ඉතින්, මේ සියලුම කටයුතුවලට දායක වෙන්න පුළුවන් වුණේ කාලයක් තිස්සේ කර ගෙන ආපු මේ වැඩ පිළිවෙළ නවීකරණය කරලා මේ සෑම ගොවිපොළකම විශාල වැඩසටහනක් අපි ක්‍රියාත්මක කළ නිසායි. මහඉලුප්පල්ලම ගොවිපොළත්, සීතාඑළිය බීජ ගොවිපොළත් ඇතුළු රටේ තිබෙන බීජ ගොවිපළවල් දහඅටේම මූලික පහසුකම් සකස් කර ගෙන, ඉදිරි කාල සීමාව සඳහා රටට අවශ්‍ය කරන බීජ නිෂ්පාදනය කිරීම සඳහා දැන් අපි කටයුතු සකස් කරලා අවසානයි. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ ඉදිරි වසර තුන ඇතුළත අපි දිගටම ක්‍රියාත්මක කළොත්, අපේ රට මේ ක්ෂේත්‍රයෙන් ස්වයංපෝෂිත කරන්න පුළුවන්. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන්, මේ රටේ වගා කරන්න පුළුවන් සියලුම කෘෂි නිෂ්පාදනවලින් අපි ස්වයංපෝෂිත වීමේ ඉලක්කය කරා අපි ගමන් කරමින් සිටින බව මේ අවස්ථාවේ මම තමුන්නාන්සේට ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ක්ෂේත්‍රය සඳහා අපට මේ වර්ෂයේ වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 290ක් මේ අවුරුද්දේ අපට ලබා දීලා තිබෙනවා. ඒක ගිය අවුරුද්දේ වෙන් කළ මුදලට වඩා සියයට 10ක වැඩි වීමක්. මීට පස්සේ අපට යම් අනපේක්ෂිත හේතුවක් නිසා මිස, ණය අත්තිකාරම් ගිණුම් සීමා වැඩි කර ගැනීමට නැවතත් පාර්ලිමේන්තුවට එන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියලා මම හිතනවා. ඒ තරමට අපේ රජය, මුදල් අමාත්‍යවරයා හැටියට අපේ අතිගරු ජනාධිපතිතුමා අපට ලබා දෙන්න පුළුවන්, කෘෂිකර්ම ක්ෂේත්‍රයට ලබා දෙන්න පුළුවන් උපරිම මුදල් සම්භාරය ලබා දෙනවා වාගේම, අපි ඉල්ලපු සෑම මුදලක්ම අපට ලබා දීලා තිබෙනවා.

මට නියමිත කාලය අවසන් වී ඇති බව මේ අවස්ථාවේ ඔබතුමා ප්‍රකාශ කරන නිසා ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ. භා. 5.00]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට කලින් කථා කළ ගරු ඇමතිතුමා කිව්වා, අද බොහෝ මන්ත්‍රීවරු කථා

කළේ, කථා කළ යුතු දේට වඩා එහාට ගිය දේවල් පිළිබඳව කියලා. මාත් ඒ පිළිබඳව එතුමාත් එක්ක යම් කිසි ප්‍රමාණයකට එකඟ වෙනවා. නමුත්, කවුරුත් කථා කළේ සමස්ත ආර්ථිකයේ සිද්ධ වන දේවල් පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාත් අද මාතෘකාව පිළිබඳව වචන කීපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. විසර්ජන පනතේ 240වැනි වැය ශීර්ෂය පිළිබඳව සභාව කල් තැබීමේ මේ යෝජනාවේ සඳහන් වෙනවා. එතැන මොකක්ද වෙමින් පවතින්නේ කියන එක පිළිබඳව විවාද කරන්න අවශ්‍යයි කියලා තිබෙනවා. මේ ගැන කථා කිරීමේදී අපි නැවතත් 2008 අවුරුද්දට යන්න ඕනෑ.

2008 අවුරුද්දේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ටී.එල්.බී. හුරුල්ලේ මැතිතුමාත්, නිහාල් ශ්‍රී අමරසේකර මැතිතුමාත් සුප්‍රිම් උසාවියට ගියා. සුප්‍රිම් උසාවියට ගිහිල්ලා 2009 විසර්ජන පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියලා නඩුවක් දැම්මා. ඒ නඩුවේ තීන්දුව මා ළඟ තිබෙනවා. එහි දිනය 2008.10.24. මෙහිදී මොවුන් තර්ක කරන්නේ, "ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149 සහ 150 ව්‍යවස්ථාවලින් පාර්ලිමේන්තුවට දී තිබෙනවා රාජ්‍ය මූල්‍ය පිළිබඳව සම්පූර්ණ වගකීම. එහිදී කවුරු හරි ඒ වගකීම පාර්ලිමේන්තුවෙන් ඉවත් කර වෙනත් තැනකට දමනවා නම්, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ මුළු බලතලය ක්‍රියාත්මක වන්න ඉඩ දෙන්නේ නැති වන විධියට වැඩ කරනවා නම් එතැනදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වෙනවා" කියලායි.

ප්‍රධාන වශයෙන් කාරණා දෙකක් ගැන තමයි ඒ නඩුවේදී කථා වුණේ. එක කාරණයක් තමයි රජය මේ පාර්ලිමේන්තුවට විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු වෙලාවේ මුළු වියදම ජනතාවට පෙන්නුවේ නැහැයි කියන එක. එහි 2(1) වගන්තිය. දෙවන කාරණය වුණේ ඒ විසර්ජන පනත් කෙටුම්පතේ 240 වැය ශීර්ෂය යටතේ ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩ සටහන හා සංවර්ධන වැඩ සටහන්වලින් ඒ මුදල් අයුතු ලෙස පාවිච්චි කරන්න ආණ්ඩුව සූදානම් වුණාය කියලායි. නිහාල් ශ්‍රී අමරසේකර මැතිතුමාත්, තේමිය හුරුල්ලේ මැතිතුමාත් ඉදිරිපත් කරපු ඒ පෙත්සම - ඒ චෝදනාව- හරියි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගත්තා. ඒ අනුව 2009 වසර සඳහා ඉදිරිපත් කරපු විසර්ජන පනත් කෙටුම්පත සංශෝධනය කරන්න කියලා සුප්‍රිම් උසාවියෙන් නියෝග කළා. ප්‍රධාන වශයෙන් සංශෝධන දෙකක් කරන්නට ආණ්ඩුවට සිද්ධ වුණා. එහෙම කළොත් පමණයි මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන්නේ කියලා සුප්‍රිම් උසාවියෙන් කිව්වා. එකක් තමයි, මේ විසර්ජන පනත් කෙටුම්පතට දෙවැනි උපලේඛනය විධියට "නීතිය මඟින් බලය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු රජයේ වියදම්" කියලා නව කොටසක් ඇතුළත් කරන්න කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනදී තමයි රටේ ලොකුම වියදම සඳහන් වන්නේ. 2012 අවුරුද්දට - ඒ ගැන නේ අද අපි මේ විවාද කරන්නේ- මුළු වියදම රුපියල් කෝටි 91,400ක්. රුපියල් කෝටි 91,400ක මුදලක් විසර්ජන පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න ඕනෑ කියලා සුප්‍රිම් උසාවියෙන් අණ කළා. එහෙම නැත්නම් රජයේ මුළු වියදම ඒකෙන් පෙන්වන්නේ නැහැයි කියලා කිව්වා. ඉතින් ඒක කරලා තිබෙනවා. 6(1) වගන්තියෙන් තමයි 240 වැනි වැය ශීර්ෂය පිළිබඳව සුප්‍රිම් උසාවිය නියෝගයක් දුන්නේ. ඒ නියෝගය තිබෙන්නේ මෙහෙමයි. ඉංග්‍රීසියෙන් ඒක තිබෙන්නේ. ඉතාමත්ම කෙටියෙන් ඒක කියවන්න අවශ්‍යයි.

On page 10 of the Determination of the Supreme Court on the Appropriation Bill 2008, it is stated, I quote:

"Accordingly, we are of the opinion that the inconsistency with Articles 148 and 160 would cease if clause 6(1) is amended by the inclusion of a specific provision that the money so transferred shall be deemed to be a supplementary allocation made to the particular Ministry and the transfer including the reasons therefor are reported to Parliament within a period of two months from the date such transfer is affected."

ඒ ගැන තමයි අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා කථා කළේ. එතකොට මෙතැනින් කියන්නේ මේ 240 වැනි වැය ශීර්ෂයේ මෙහෙයුම් වැඩ සටහනින් හරි, සංවර්ධන වැඩ සටහනින් හරි යම්කිසි මුදලක් මාරු කළා නම් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්න ඕනෑ කියලායි. ඒකට මාස දෙකක කාලයක් ඉඩ දීලා තිබෙනවා. මේ නඩු තීන්දුව දෙන කොට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියපු එක වගන්තියක් මම කියවන්නට ඕනෑ. අටවන පිටුවේ සඳහන් වනවා, විසර්ජන පනතේ 240 වැය ශීර්ෂයේ තිබෙන මුදල් හදිසි අවශ්‍යතාවක් මත පමණයි වෙන වැය ශීර්ෂයකට මාරු කරන්න පුළුවන් වෙන්නේ කියලා. මෙතැනදී සුප්‍රිම් උසාවිය මෙසේ කියනවා.

On page 8, it is stated, I quote:

"The transfers reveal that many of them…"

"..them..." meaning the moneys reallocated from Head 240,

"…have been for foreign travel, purchase of vehicles and for other miscellaneous items of expenditure far removed from 'Development Activities.' "

අපි මෙතැනින් ගන්න අවශ්‍ය මූලික දේ තමයි, සංවර්ධන කටයුතු සඳහා ද මේ හදිසි වියදම් සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක. මේ සභා ගර්භයේ අපේ මේස උඩ 2012 ජුනි මාසයේ 05වන අඟහරුවාදා, "අද දින පිළිගන්වන ලිපි ලේඛනාදිය" කියලා, මේ ලේඛනය තබා තිබුණා. ඒක අපි අද සාකච්ඡා කෙරෙනවා. මෙහි තිබෙනවා, මේ මාරු කරපු මුදල් සහ මාරු කරපු අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ඇයි මේ මාරු කිරීම සිද්ධ කළේ කියලා.

මේ පිළිබඳව කථා කරන්න කලින් හොඳ දේට හොඳයි කියන්න මම කොයි වෙලාවකවත් පැකිළෙන්නේ නැති බව කියන්න ඕනෑ. ඉස්සෙල්ලා කථා කරපු ගරු ඇමතිවරයෙක් කිව්වා, අපි දැන් පිළිඅරගෙන තිබෙනවා කියලා අර්ථසාධක අරමුදලේ මුදල් මේ blue-chip companies එහෙමත් නැත්නම් ප්‍රධාන කොම්පැනිවල ආයෝජනය කළාට කමක් නැහැ කියලා. එය දැන් පිළිගත් දෙයක් නොවෙයි. ඕනෑ කෙනෙකුට අපේ හැන්සාඩ් වාර්තා කියවා බලන්න පුළුවන්, 2010 අපි මේ ගැන කථා කරන්න පටන් ගත් දවසේ ඉඳලා අපි එය කියලා තිබෙනවා. ජෝන් කීල්ස් සමාගම, හේලීස් සමාගම වාගේ ප්‍රධාන සමාගම්වල අර්ථසාධක අරමුදලේ මුදල් ආයෝජනය කිරීම පිළිබඳව අපේ කිසි ගැටලුවක් නැහැ. මම කලිනුත් කිව්වා, අර්ථසාධක අරමුදලේ මුදල් කොටස් වෙළඳ පොළේ තෝරා ගත් ප්‍රධාන සමාගම්වල ආයෝජනය නොකරන්න කියලා කියන්න තරම් අපි බංකොලොත් තත්ත්වයට පත් වෙලා නැහැ කියලා. මම මේ කියන්න හදන්නේ හොඳ දේ හොඳයි කියලා කියන්නත් අපි හැම වෙලාවේම ලෑස්ති වෙලා ඉන්නවා කියලායි.

මේ නඩු තීන්දුවත් එක්ක ආණ්ඩුව අපට මාස දෙකක් ඇතුළත මේ ලිය කියවිලි ඉදිරිපත් කරලා තිබෙනවා. එතකොට 2008 නඩු ගිය හේතුව දැන් වෙන කොට ආණ්ඩුව විසින් හරි ගස්සලා තිබෙනවා. ඒක හොඳයි. එහෙම තමයි මේ රටේ රාජ්‍ය මූල්‍යයේ යම් කිසි හෝ විනිවිදභාවයක් පාර්ලිමේන්තුවටත්, ජනතාවටත් ඉදිරිපත් කරන්නේ.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

දැන් මම කථා කරන්න ඕනෑ අර සුප්‍රිම් උසාවියේ තීන්දුවේ කියපු කථාව. That is, purchase of vehicles and other expenditure which is far removed from development purposes.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාට කණ්ණාඩි දමන්න ඕනෑ නැහැ, දැන් මෙය බලන ඕනෑ කෙනෙකුට පහත සඳහන් කාරණා පෙනෙනවා. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, වාහනයක් මිලදී ගැනීම, රුපියල් මිලියන 10ක්. තවත් එකක් තිබෙනවා, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, වාහනයක් මිලදී ගැනීම, රුපියල් මිලියන 10ක්. තවත් මිලියන දෙකක්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නිල නිවස අලුත්වැඩියා කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ඉතා හදිසි අවශ්‍යතා කියලා මම හිතන්නේ නැහැ. විසර්ජන පනතේ 240 වැය ශීර්ෂයෙන් මුදල් වෙන තැනකට මාරු කරන්න පුළුවන් වන්නේ හදිසි අවශ්‍යතාවලට පමණයි. ඊළඟට තිබෙනවා, විදේශ කටයුතු අමාත්‍යාංශය වාහනයක් මිලදී ගැනීම. ඊළඟට තවත් එකක් තිබෙනවා, රුපියල් මිලියන 200ක් පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තශාලාවන්හි පුනරාවර්තන වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන සැලසීම සඳහා කියලා. මේවා හදිසි අවශ්‍යතා වෙන්න බැහැ. දැන් ආණ්ඩුව වෙනුවෙන් කිව්වා, "බලන්න පෞද්ගලික අංශය මේ සීනි ආයතන හරි විධියට ක්‍රියාත්මක කරන්නේ නැහැ ආණ්ඩුවට ගත්තොත් මේ සීනි සමාගම් ඉතාමත්ම හොඳට කළමනාකරණය කරලා දියුණු කරන්න පුළුවන්" කියලා. පස්සේ මෙතැනට ඇවිල්ලා අපට කියනවා, රුපියල් මිලියන 200ක් -පොඩි ගණනක් නොවෙයි- සෙවණගලටයි, පැල්වත්තටයි පඩි ගෙවන්න අනුමත කරන්න කියලා. මේක හදිසි අවශ්‍යතාවක් කියලා කියනවා. මට කනගාටුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ නැහැ, මේ පනත තුළිනුත් සුප්‍රිම් උසාවියෙනුත් හම්බ වෙලා තිබෙන තීරණය අනුව මේ වාගේ කටයුතු කරන්න පුළුවන්ය කියා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මෙය අනවශ්‍ය දෙයක් නොවෙයි. සීනි ඕනෑ. සීනි නැතිව කොහොමද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, මම කියන්නේ ඒක නොවෙයි. ආණ්ඩුව පැල්වත්තයි, සෙවණගලයි ගන්න කොට අපට කිව්වේ මේ කටයුත්ත හොඳට කරන්න ආණ්ඩුවට පුළුවන් කියලායි. [බාධා කිරීමක්] රජයේ සල්ලි අවශ්‍ය නැහැ නේ. එතැන සල්ලි තිබෙනවා නේ. ගරු ඇමතිතුමා, ඒ ලාභ ලබපු ආයතන දෙකක් නේ. [බාධා කිරීමක්] පැල්වත්ත සහ සෙවණගල කියන ආයතන දෙකම ලාභ ලබපු ආයතන. [බාධා කිරීමක්] නැහැ, නැහැ. පැල්වත්ත සහ සෙවණගල කියන ආයතන දෙකම ලාභ ලබපු ආයතන. නමුත් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා, ඒ කටයුත්ත සාර්ථකව කර ගෙන යන්න. දැන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා පැල්වත්තටයි, සෙවණගලටයි පඩි ගෙවන්න රුපියල් මිලියන 200ක් අනුමත කරන්න කියලා යෝජනාවක් හදිසි අවශ්‍යතාවක් හැටියට. ජනතාව තීරණය කරයි කවුද මෙතැන හරි, කවුද වැරදි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මෙයයි. අපි විසර්ජන පනත් කෙටුම්පත ගැන මාසයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ විවාද කරනවා. ඇයි? කොපමණ වියදම් කරන්න ඕනෑද, මිලියන 50ක් මෙතැනින් තව තැනකට දාන කොට ඒකට පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න ඕනෑ වාගේ නොයෙකුත් දේවල් ගැන. වියදම ගැන අපි මෙතැන ගොඩක් විවාද කරනවා. නමුත් මම කියන්න කැමැති කාරණයක් තිබෙනවා. මම කියන දේ පාර්ලිමේන්තුවේ පක්ෂ භේදයකින් තොරව පිළිගනී කියලා මම බලාපොරොත්තු වෙනවා. අපේ ණය ගැනීම පිළිබඳව එක වාක්‍යයයි විසර්ජන පනතේ තිබෙන්නේ. එකම එක වාක්‍යයයි. මම කියවන්නම්. 2011 ඔක්තෝබර් 18 වෙනි දින ඉදිරිපත් කළ 2012 විසර්ජන පනතේ කියන්නේ මෙහෙමයි:

> " ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් කෝටි එක්ලක්ෂ පහලොස් දහසක් නොඉක්මවන සේ, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ලබා ගන්නා මුදල්වලින්,......"

ඉන් පසුව කියනවා ඒවා පාවිච්චි කරන්න පුළුවන් කොහොමද කියලා. එච්චරයි අපි කථා කරන්නේ. හැම දාම රටේ මිනිස්සු කථා කරන්නේ මොකක්ද? ණය. අපේ රට ණය වෙලා. අපේ රට අච්චර ණය වෙලා, මෙච්චර ණය වෙලා. අතැනට ණය වෙලා, මෙතැනට ණය වෙලා. ඒ විධියට ණය බර ගැන හැම දාම කථා කරනවා. නමුත් පාර්ලිමේන්තුව හැටියට කොයි වාගේ තැනකින්ද අපි ණය ගත යුත්තේ, ඒ ණය ගැනීමට පෙර යම් කිසි විධියකට පාර්ලිමේන්තුවට මේ පිළිබඳව ලියවිල්ලක් හෝ ඉදිරිපත් කළ යුතුද, එහෙමත් නැත්නම් කිසියම් කමිටුවකට මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබා දිය යුතු ද කියන කාරණා පිළිබඳව අපි කවදාවත් මේ පාර්ලිමේන්තුවේදී කථා කරලා නැහැ. මම හිතනවා අපට යුතුකමක් තිබෙනවා කියා. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවෙන් අපට සම්පූර්ණ වගකීම දීලා තිබෙනවා නම්, ඒ වගකීම වියදමට පමණක් නොවෙයි, ආදායමට පමණක් නොවෙයි ණය පිළිබඳවත් තිබෙනවා කියන එක තමයි මගේ තර්කය වෙන්නේ. ඒ නිසා මම පක්ෂ භේදයකින් තොරව පෞද්ගලිකව මට හිතෙන දේ ඔබතුමන්ලා ඉදිරියේ තබනවා. අපට ඉදිරියේදී ණය ගැනීම පිළිබඳව සාකච්ඡා කරලා, යම් කිසි විධියක සම්මුතියකට, යම් කිසි ක්‍රමවේදයකට, යම් කිසි රාමුවකට එකතු වෙන්න පුළුවන්ද කියලා බලමු.

ඊයේ-පෙරේදා අපට ලැබුණා, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2011 වාර්ෂික වාර්තාව. මම එක කාරණයක් පමණක් කියන්න බලාපොරොත්තු වෙනවා. හුඟක් වෙලාවට අපිට ආණ්ඩුවෙන් කියනවා, චීනයේ ආධාරවලින් අපි මේක කළා, චීනයේ ආධාරවලින් අපි අරක කළා කියා. ඇත්ත වශයෙන්ම අපි ගිය අවුරුද්දේ වැඩිපුරම මූල්‍ය එකඟතා ඇති කර ගෙන තිබෙන්නේ චීනයත් එක්ක.

සියලුම මූල්‍ය එකඟතාවල වටිනාකම ඇමෙරිකන් ඩොලර් මිලියන 2,076යි. මේ ඩොලර් මිලියන 2,076 න් වැඩිපුරම අරන් තිබෙන්නේ -නොම්මර එකට ඉන්නේ- චීනයෙන්. 2011 දී එකඟ වෙලා තිබෙනවා, චීනයෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 784.7ක් ලබා ගන්න. මට නැවතත් මේ දේ කියන්න සිද්ධ වෙනවා. ගිය අවුරුද්දෙත් මම මේ දේ කිව්වාම මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා එය දැඩි ලෙස විවේචනය කළා; මට කෑ ගැහුවා. නමුත් මෙවරත් කියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඔය ඇමෙරිකන් ඩොලර් මිලියන 784.7න් එක ශත පහක්වත් අපට ප්‍රදාන හැටියට ලැබිලා නැහැ. එක ශත පහක්වත් ලැබිලා නැහැ. ඔක්කොම ණය.

අනෙක් කරුණ, මෙයින් සහනදායී ණය තිබෙන්නේ ඉතාම සුළු ප්‍රමාණයයි. වැඩි හරියක් තිබෙන්නේ වාණිජමය ණය. "චීනයෙන් අපි මුදල් ආධාර ගන්නවා" කියලා ජනතාවට කියන්නේ ඇත්ත කථාව නොවෙයි කියන එක කනගාටුවෙන්

හෝ කියන්න සිද්ධ වනවා. ඇත්ත වශයෙන්ම ජනතා නොමඟ අරිනවා, "අපි චීනයෙන් ආධාර ගන්නවා"යි කියලා. චීනයෙන් ලැබෙන්නේ ආධාර නොවෙයි, එක ශත පහක්වත් ආධාර හැටියට ලැබිලා නැහැ, ණය හැටියටයි ලැබිලා තිබෙන්නේ. මේක ඉතාමත්ම පැහැදිලියි.

අපට ඔක්තෝබර් මාසයේදී ඇමෙරිකන් ඩොලර් මිලියන 500ක් ගෙවන්න වෙනවා. ඒකට කියන්නේ "bullet payment" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට ණයක් - සංවර්ධනය සඳහා ගත්තා යැයි කියන ණයක්- එක වාරිකයකින් ගෙවන්න තියෙනවා. සාමාන්‍යයෙන් සංවර්ධනයකට ගන්නා ණයක් අවුරුදු පහකට ගන්නේ නැහැ. නමුත් කෙසේ හෝ ගත්තා යැයි කියමු. ඇමෙරිකන් ඩොලර් මිලියන 500ක් පොලිය සියයට 8.25කට ගත්තේ. එක වාරිකයකින් ගෙවන්න ඕනෑ. ඉතින් එක වාරිකයකින් ගෙවන්න නම් මේ ඩොලර් මිලියන 500 පාවිච්චි කරලා ලබා ගත්ත වාසිය මොකක්ද? අපට එය ගෙවන්න තිබෙන හැකියාව මොකක්ද?

මේ ළඟදී ඉඳලා හැම තැනම සාකච්ඡා වෙන දෙයක් තමයි, බැඳුම්කර ඉදිරිපත් කරලා ඇමෙරිකන් ඩොලර් බිලියන ගණන් ණය අපි මේ අවුරුදු තුනට අරන් තිබෙන බව. ඔය ණය ගන්න කොට කිසිම විධියකට සාකච්ඡාවකට භාජනය වන්නේ නැහැ. එතකොට මේ තීරණ ගන්නේ කවුද? මේ තීරණ ගන්න ඔවුනට පාර්ලිමේන්තුවෙන් දීලා තිබෙන අනුමැතිය මොකක්ද? මම හිතන්නේ මේ පිළිබඳව අපි ඉතාමත්ම ගැඹුරින්, පක්ෂ භේදයකින් තොරව කල්පනා කරලා බලන්න ඕනෑ. අද විතරක් නොවෙයි, හෙටටත් අනිද්දාටත් අපට මේ දේට මුහුණ දෙන්නට වන නිසා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ වැදගත් දෙයක් තිබෙනවා. පෙරේදා හැන්සාඩ් වාර්තාවේ draft එකක් මා ළඟ තිබෙනවා. මුදල් නියෝජ්‍ය අමාත්‍ය ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් කියලා තිබෙනවා, අද්භූත කථාවක්; කවදාවත් අහලා නැති කථාවක්. අපි කවුරුත් දන්නවා, අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් මේ රටේ ලොකු සංවාදයක් ගොඩනැඟෙමින් පවතින බව. ඒකට අපිත් දායක වෙලා ඉන්නවා. වැඩ කරන ජනතාවගේ මුදල් ප්‍රධාන නොවන -blue chip නොවන- ආයතනවල ආයෝජනය කිරීම කොතරම් දුරට සාධාරණද කියන තර්කය අපි ඉදිරිපත් කරනවා.

සරත් අමුණුගම මැතිතුමා, වැගපිටිය මැතිතුමා ගැන කථා කළා. එතුමා මගේ හොඳ යාළුවෙක්. එතුමාට අපි ගරු කරනවා. එතුමා ලාෆ් ආයතනය ඉතාමත් හොඳට ගොඩනඟලා තිබෙනවා. අපට ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. සරත් අමුණුගම මැතිතුමා ගලදාරි හෝටලය ගැන කථා කරන කොට නවලෝක මුදලාලි ගැන කථා කළා. අපට පුද්ගලිකව ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ ගැන නොවෙයි අපි කියන්නේ. අපි කියන්නේ නීතිය කාටත් නීතිය; කවුරු හෝ ආයතනයක් හදපු පළියට එහෙමත් නැත්නම් ඔවුන් දේශීය ව්‍යාපාරිකයන් වෙච්ච පළියට නීතිය වෙනස් වෙන්න බැහැයි කියන එක. එතැනයි අපේ තර්කය.

අපේ තර්කය කොටස් දෙකක් වුණා. එකක් තමයි අර්ථසාධක අරමුදලට හැකියාවක් නැහැ, බැංකුවල සහ මූල්‍ය ආයතනවල ආයෝජනය කරන්න. ඒකට හේතුව හැටියට අපි ඉදිරිපත් කරලා තිබෙනවා, පිළිගත්ත ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය.

දෙවැනි තර්කය වුණේ, කඩා වැටෙන ආයතනවල එහෙමත් නැත්නම් ප්‍රධාන පෙළේ නොවන ආයතනවල අර්ථසාධක අරමුදලට ආයෝජනය කරන්න හැකියාවක් නැහැ කියන එකයි. ඔය තර්ක දෙක තමයි අපි ඉදිරිපත් කළේ. ඒ තර්ක දෙක ඉදිරිපත් කරන්න අපි පාදක කර ගත්තේ, 2002 වර්ෂයේ මහ බැංකුවෙන් පිළියෙළ කරපු, "සේවක අර්ථසාධක අරමුදල - ශ්‍රී ලංකා මහ බැංකුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය" කියන ලියවිල්ලයි.

දැන් බලන්න, පෙරේදා ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා මෙන්න මෙහෙම කථාවක් කියා තිබෙනවා:

"The Investment Policy Statement and Standards of Professional Conduct of EPF issued in 2002, which stated that the EPF could not invest in stocks of the banking and financial sectors, is now updated and the EPF has invested in the banking sector since 2009, following the decisions taken by the Monetary Board".

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසියේම ගරු නියෝජ්‍ය ඇමතිවරයා කියනවා, "අපි මේක 2009 වෙනස් කළා"ය කියලා. ඒක පුදුම කථාවක්. පුදුම කථාවක් වෙන්නේ කොහොමද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. දැන් බලන්න, 2010 ඉඳලා මම මේ ප්‍රශ්නය අහනවා. 2010 අගෝස්තු මාසයේ තමයි ඉස්සෙල්ලාම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. අපි මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙනවා දහ වතාවකට වඩා. මේ සම්බන්ධයෙන් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පමණක් බර ගණනක් අහලා තිබෙනවා. නමුත් අද වනකම් මෙහෙම කථාවක් කිව්වේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුව නිවේදන පිට නිවේදන නිකුත් කරනවා. අපට චෝදනා කරලා ඊයේ හැන්දෑවෙත් නිවේදනයක් නිකුත් කරලා තිබුණා. නමුත් මෙච්චර වැදගත් දෙයක් වෙනස් කළාය කියලා කිසිම විධියකට මහ බැංකුව නිවේදනයක් නිකුත් කරලා නැහැ. ඊළඟට 2010 අගෝස්තු 23වැනි දා ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මැතිතුමා -මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති සහ අර්ථ සාධක අරමුදලේ Investment Committee එකේ සභාපතිතුමා- ලිපියක් ලියලා දීර්ඝව විග්‍රහ කර තිබෙනවා, මහ බැංකුවේ අර්ථසාධක අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය පිළියෙළ කළේ ඇයි, මොකක්ද මේකට හේතු වුණේ, මොකක්ද මේකේ logic එක, ඇයි මේ වාගේ නීති රීති, රෙගුලාසි ගෙනාවේ කියලා. 2010 ඔක්තෝබර් මාසයේයි එතුමා එය ලියා තිබෙන්නේ. ඒත් එතුමා මොන ආයෝජන ප්‍රතිපත්තිය ගැනද කථා කර තිබෙන්නේ? 2002 ආයෝජන ප්‍රතිපත්තිය ගැනයි එතුමා කථා කරන්නේ. කිසි විටෙකත් 2009 ආයෝජන ප්‍රතිපත්තියේ වෙනස් කිරීමක් පිළිබඳව ජනතාව හෝ කිසිම කෙනෙක් දැනුවත් කරලා තිබුණේ නැහැ.

එච්චර කල් යන්න ඕනෑ නැහැ, 2011 ජුනි මාසයේ 13 වැනිදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF - නිකුත් කර තිබෙන ප්‍රකාශනය බලන්න. Brian Aitken කියන ඒ delegation එකේ ප්‍රධානියායි ඒ ප්‍රකාශය කර තිබෙන්නේ.

I quote :

"Investing EPF funds in banking stocks could be misconstrued and raises the potential for negative perceptions."

එහෙම නම් මහ බැංකුව ඒ ප්‍රතිපත්තිය වෙනස් කරලා තිබුණා නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට උත්තරයක් දෙන්න තිබුණා. මේක අපි නොවෙයි අහලා තිබුණේ. නමුත් කිසි විටෙකත් 2009 මේ ප්‍රතිපත්තිය වෙනස් කළා කියලා කිව්වේ නැහැ.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ගාව තියෙනවා, සේවක අර්ථසාධක අරමුදලේ 2009 වාර්ෂික වාර්තාව. ඒ වාර්තාවේ රූපා ධීරසිංහ මහත්මිය මෙන්න මෙහෙම කියා තිබෙනවා :

"ආයෝජන කමිටුවේ උපදෙස් අනුව පිළියෙළ කොට මුදල් මණ්ඩලයේ අනුමැතිය ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය සහ මහ පෙන්වීම අනුව ආයෝජන කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ."

මේ 2009 වාර්ෂික වාර්තාවේ කිසිම විධියකින් කියලා නැහැ ආයෝජන ප්‍රතිපත්තියේ මෙච්චර ලොකු වෙනසක් කළාය කියලා. ඊළඟට 2010 වාර්තාව ආවා. 2010 වාර්තාවේත් කිසිම විධියකින් ඉදිරිපත් කරලා නැහැ, 2009 මේ ආයෝජන ප්‍රතිපත්තිය වෙනස් කළාය කියලා. එහෙම නම් කවදාද මේක කළේ? කවුද මේක කළේ? නිවේදන පිට නිවේදන නිකුත් කරන මහ බැංකුවට බැරි වුණාද, අවුරුදු තුනක් තිස්සේ පාර්ලිමේන්තුව ඇතුළේත්, එළියෙත්, ජාත්‍යන්තරයේත් මෙච්චර ප්‍රශ්න අහන කොට මේ ගැන නිවේදනයක් නිකුත් කරන්න? ඇයි හදිසියේම පෙරේදා රෑ මෙතැන කවුරුත් නැති වෙලාවේදී ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා මෙහෙම කථාවක් කියලා තියෙන්නේ? මට සමා වෙන්න. මේක පිළිගන්න බැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

You can call the officials of the Monetary Board ask about it.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Yes. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා කියන දේ මම පිළිගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මට කියනවා මුදල් මණ්ඩලයේ ඒ කට්ටිය කැඳවා මේ minutes සම්බන්ධයෙන් අහන්න කියලා. මේක කවදාද කළේ? මෙහෙම කළා නම් එසේ කිරීමට පාදක වුණේ මොකක්ද?

මුදල් මණ්ඩලය කලින් ගත්ත මෙච්චර වැදගත් තීරණයක් හදිසියේම වෙනස් කළේ ඇයි? වෙනස් කළා නම් ඇයි ඒක කිව්වේ නැත්තේ? ඇයි ඒක සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට දැන්වූයේ නැත්තේ? ඇයි මේ පිළිබඳව ජනතාව දැනුවත් නොකළේ? ඇයි අවුරුදු තුනක් තිස්සේ මේ සාකච්ඡාව මේ විධියට ඇදෙන්න ඉඩ දුන්නේ? මම හිතන්නේ නැහැ මේක ඇත්ත වශයෙන්ම කරලා තිබෙනවා කියලා. කරලා තිබෙනවා නම් මේක ජනතාවට සහ අනික් නියාමන ආයතනවලට අවුරුදු තුනක් යනකම් හංගන්න කිසිම හේතුවක් නැහැ. ඉතින් මා හිතන විධියට ආණ්ඩුව කර ගෙන තිබෙන ලොකුම වැරැද්ද තමයි මේ ප්‍රශ්නය තුළ මේ වාගේ නිවේදනයක් නිකුත් කිරීම. ඇත්ත වශයෙන්ම එය නිවේදනයක් නොවෙයි පාර්ලිමේන්තුවේ හැන්සාඩගත කිරීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. හැන්සාඩ් වාර්තාවේ draft copy එක හම්බ වුණේ මේ දැන් ටිකකට කලින්. එතකොට තමයි අප මේක දැක්කේ. අප මේ පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කර තිබෙනවා. ඒ නිසා හැකි ඉක්මනින් -වහාම- මෙහි සත්‍ය තත්ත්වය අපට ඉදිරිපත් කරන්න වනවා. මොකද මේක අද වෙන කොට ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේ ගැන හැමෝම කථා කරනවා, දූෂණයක් වෙනවාද, නැද්ද කියලා.

මේ අර්ථසාධක අරමුදල රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කැඳවන්න කියලා මම පෙබරවාරි මාසයේ ඉඳලාම ගරු සභාපතිවරයාට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා. අද වන තුරු ඔවුන් Public Accounts Committee එකට ඇවිල්ලා නැහැ. මම මේක ගැන මීට වඩා අද කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අප ආණ්ඩුවට අවස්ථාව දෙනවා මේ පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න. බොහොම ස්තුතියි.

[අ. භා. 5.29]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට සහභාගි වීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මෙම යෝජනාවට අදාළ අත්තිකාරම් ගිණුම් යෝජනා ඉදිරිපත් කළේ 2012 මැයි 22වැනි දිනයි. එදින මේ පාර්ලිමේන්තුව විවාදයකින් තොරව පරිපූරක ඇස්තමේන්තු අයිතම 7ක් යටතේ මුදල් ප්‍රතිපාදන අනුමත කර ගැනීම නිසා ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ යුතුය කියන කරුණත් මේ සභාව කල් තැබීමේ යෝජනාවේ ඇතුළත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ගරු සභාව තුළදී පසු ගිය දිනවල සාකච්ඡාවට භාජනය වුණු කරුණු කීපයක් පිළිබඳවත් මේ සභාව කල් තැබීමේ යෝජනාවට ඇතුළත් කර තිබෙනවා. මේ සියලුම දේවල් පිළිබඳව තමයි අද මේ යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගෙන් නම් මේ යෝජනාවේ තිබෙන කරුණු කීපයක් පිළිබඳව හෝ අදහස් ඉදිරිපත් වුණා. නමුත් මේ යෝජනාව ඉදිරිපත් කළ රවි කරුණානායක මන්ත්‍රීවරයාවත්, ඊට පසුව කථා කළ විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙක්වත් මේ යෝජනාවට අදාළව, මේ යෝජනාවේ අඩංගු කරුණු පිළිබඳව කථා කළේ නැහැ; කරුණු ඉදිරිපත් කළේ නැහැ. මෙය මේ උත්තරීතර සභාවට කරන අගෞරවයක් විධියටයි මා පෞද්ගලිකව දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදින ඉදිරිපත් කළ පරිපූරක ඇස්තමේන්තු යෝජනා තුළ නිවාස හා ඉදි කිරීම් අමාත්‍යාංශය යටතේ තිබෙන රජයේ කර්මාන්තශාලාවේ අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනයකුත්, ඒ වාගේම ගබඩා අත්තිකාරම් ගිණුම් සංශෝධනයකුත් ඇතුළත් වෙලා තිබෙනවා. අද අප රටේ සිදු වන දැවැන්ත සංවර්ධනයේ -විශේෂයෙන්ම ඉදි කිරීම් ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන දැවැන්ත සංවර්ධනයේ හා වාරි කර්මාන්තය තුළ ඇති වෙලා තිබෙන දැවැන්ත සංවර්ධනයේ- කොටස්කරුවෙකු විධියට රජයේ කර්මාන්තශාලාවත් මේ රටේ වාරි කර්මාන්තයේ සහ විවිධ ක්ෂේත්‍රවල ඒ කටයුතුවල නියැලී සිටින බැවින්, පෙරට වඩා වැඩි කාර්යයක් ඒ ආයතනයට කරන්න සිදු වීම නිසා ඒ වැඩියෙන් කරන්න තිබෙන කොටසට අදාළ වියදමත්, ඒ සඳහා අවශ්‍ය කරන කාරක ප්‍රාග්ධනයත් කියන කරුණු පදනම් කරගෙනයි එම පරිපූරක ඇස්තමේන්තු යෝජනාව ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ.

සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මෙම යෝජනාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරපු සමහර ගරු මන්ත්‍රීතුමන්ලා හුවා දක්වන්න හදපු එක කරුණක් තමයි, මෙවැනි පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම රජයේ අකාර්යක්ෂමතාව, ඒ වාගේම ආර්ථිකය නිසියාකාරව කළමනාකරණය කර ගන්න නොහැකි

වීම නිසා සිදු වන දේවල් කියලා. අපේ රටේ අය වැයක් හැටියට ඉදිරිපත් කරන්නේ ඇස්තමේන්තුවක්; ඒක බලාපොරොත්තුවක්. මා හිතන හැටියට පාර්ලිමේන්තුවේ පමණක් නොවෙයි, ප්‍රාදේශීය සභාවකවත්, පළාත් සභාවකවත් සම්මත වුණු කිසිදු අය වැයක ඊ ළඟ අවුරුද්දේ ආදායම හා වියදම සමාන වෙලා නැහැ. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ පමණක් නොවෙයි, අපේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේත්, ලෝකයේ සෑම රටකමත් ඉදිරිපත් කරපු මෙවැනි පරිපූරක ඇස්තමේන්තු තුළින් අය වැය අයිතමයන් යටතේ ආදායම් වියදම් සංශෝධනය කර ගැනීම් සිදු වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේත් පරිපූරක ඇස්තමේන්තු අනන්තවත් මේ ආකාරයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. එම නිසා මේ සමස්ත ක්‍රියාවලියත් එක්ක කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේත්, දුම්රිය දෙපාර්තමේන්තුව යටතේත්, අපේ අමාත්‍යාංශය යටතේත් මේ ඉදිරිපත් කරපු සියලුම සංශෝධනයන් නිසා මා හිතන හැටියට ජනතාවට අලුතින් බරක් පැටවෙන්නේ නැහැ. ඒ බව අප බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

අය වැයේ ආදායම සහ වියදම දක්වා තිබෙනවා. ආදායම් වියදම් ඒ ආකාරයෙන් තිබෙන අතර ඒ අයිතමයන් සහ විවිධ මාතෘකා යටතේ වෙන් කරපු මුළු වියදම තුළ තමයි මේ වියදම් සංශෝධනයන් විශේෂයෙන්ම සිද්ධ වන්නේ. ඒ වාගේම ඊට සාපේක්ෂව ආදායමත් වැඩි වෙලා තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම මේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම නිසා මොනම ආකාරයකින්වත් ජනතාවට අලුතින් වැය බරක් ඇති වන්නේ නැති බවත්, ඉදිරි කාලයේදී තවත් මෙවැනි පරිපූරක ඇස්තමේන්තු අනිවාර්යයෙන්ම ඉදිරිපත් කරන්න මේ පාර්ලිමේන්තුවට සිදු වන බවත් කියන්න ඕනෑ. ඒක සාමාන්‍ය සම්ප්‍රදාය තුළ අපේ රටේ ඉතිහාසයේත් සිදු වුණා. ඉදිරියටත් ඒ කාර්යය සිදු වෙනවා. ඒක මොනම ආකාරයෙන්වත් රජයේ අකාර්යක්ෂමතාව නිසා සිදු නොවන බවත් අප සියලු දෙනාම අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

විපක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලා මෙම කල් තැබීමේ විවාදයේදී මෙම මාතෘකාවට මොනම ආකාරයෙන්වත් අදාළ නොමැති කරුණු කාරණා ගණනාවක් පිළිබඳව වෛරයෙන්, ක්‍රෝධයෙන් කථා කරපු ආකාරය අප දැක්කා. විපක්ෂයේ අපේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන වෙලාවේ මා මන්ත්‍රීවරුන්ගේ භෝජන ශාලාවේයි හිටියේ. එහි වැඩ කරන කෙනෙක් මගෙන් ඇහුවා, "අද මොකක්ද විවාදය" කියලා. ඒ අය පවා මවිත වනවා, මේ ඉදිරිපත් කරන කරුණුවලට. එම නිසා මා එක පුංචි උදාහරණයක් කියන්නම්. එතුමාගේ කරුණු ඉදිරිපත් කිරීමේදී කිව්වා, "මේ රජයේ අකාර්යක්ෂමතාව නිසාත්, ආර්ථික ප්‍රතිපත්තියක් නොමැති වීම නිසාත්, අපේ රටේ මුළු ජාතික ආදායමින් සියයට 50ක් බස්නාහිර පළාතින් තමයි නියෝජනය වන්නේ" කියලා. ඒක වරදක් විධියට එතුමා දැක්කා. එතුමා මේ කාරණය මේ සභාවේදී කිව්වා. හැන්සාඩ් වාර්තාව අරගෙන අපට එය බලන්න පුළුවන්. දැන් මේ කරුණු රටට යනවා. එතුමන්ලා මේ වාගේ කරුණු ඉදිරිපත් කරනවා. එතුමා කියපු විලාශයෙන් තේරුම් ගියේ මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මුළු ජාතික නිෂ්පාදනයෙන් සියයට 50ක් බස්නාහිර පළාතෙන් නියෝජනය වීමක් සිද්ධ වුණාය කියලායි.

ගරු අනුර දිසානායක මැතිතුමා අපේ ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමති වෙලා ඉන්න කොටත් මීට වඩා වැඩි ප්‍රතිශතයක් බස්නාහිර පළාතෙන් දායක වුණා. සැබෑ තත්ත්වය නම් ඉතිහාසයේ ප්‍රථම වතාවට රටේ සංවර්ධනය සඳහා අඩුම දායකත්වයක් තමයි මේ වන විට බස්නාහිර පළාතෙන් ලැබී තිබෙන්නේ.

අද වෙනත් පළාත්වල ජාතික නිෂ්පාදනයේ දායකත්වය ඉහළ ගිහින් තිබෙනවා. අද බස්නාහිර පළාතේ දායකත්වය පෙර අවුරුදුවලට වඩා අඩු වී තිබෙනවා. මෙකයි සත්‍යය තත්ත්වය. නමුත් එතුමා මේ සභාවේදී කරුණු ඉදිරිපත් කළේ බස්නාහිර පළාතේ දායකත්වය සියයට 50යි; මේක අඩුවක්; මේක ආර්ථික ප්‍රතිපත්තියේ වැරැද්දක් කියලායි. මේක ද ආර්ථික ප්‍රතිපත්තිය කියන එකයි එතුමන්ලා විමසීම් කළේ. මේ ආකාරයේ විවේචනයන් තමයි අද විවාදයේ තිබුණේ.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, සේවක අර්ථසාධක අරමුදල පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට ආවේ නැහැ කියා. කැඳෙව්වා නම් සියලුම ආයතන එනවා. මේ කාරක සභා බොහොම පැහැදිලිව ආණ්ඩු පක්ෂයට විතරක් තිබෙන ඒවා නොවෙයි. රජයේ ගිණුම් කාරක සභාව වන්නට පුළුවන්; පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව -කෝප් එක- වන්නට පුළුවන්; මේ කාරක සභාවලට කැඳවන්නට බැරි ආයතනත් අප කැඳෙව්වා.

විශේෂයෙන්ම ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කෝප් එකට යෝජනා කළා, ක්‍රිකට් බෝඩ් එකේ විවිධ වංචාවන් තිබෙන බවට විශාල චෝදනාවන් තිබෙනවා, ඒ නිසා ඒ ආයතනය කැඳවන්නට ඕනෑය කියා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව, ක්‍රිකට් පාලක මණ්ඩලය කෝප් එකට කැඳවන්නට බැහැ. නමුත් අප ඒ ආයතනය කැඳවන්නට ඉඩ දුන්නා. කැඳවන්නට ඉඩ දීලා ඒ සියලුම අයට කථා කරන්නට අවස්ථාව ලබා දුන්නා. නමුත් එතැනදී නිසි කරුණු ඉදිරිපත් වීමක් ඇත්තවශයෙන්ම සිද්ධ වුණේ නැහැ. අප රජයක් විධියට තමුන්නාන්සේලා ඉදිරිපත් කරන මොනම ආකාරයක හෝ සාධාරණ යෝජනාවලට, චෝදනාවලට ඇහුම්කන් දෙනවා. ඇහුම්කන් දීලා ඒවාට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. අඩු පාඩුකම් සිද්ධ වෙලා ඇති. නමුත් ඒ සෑම අඩු පාඩුකමකටම අවශ්‍ය ක්‍රියාමාර්ග අප අරගෙන තිබෙනවා. බොහොම පැහැදිලිව ඒ ගැන අප අවධානය යොමු කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම ආණ්ඩුවක අඩු පාඩුකම් තිබෙන්නට පුළුවන්. අඩු පාඩුකම් තිබිලා තිබෙනවා. ආණ්ඩුවක නොවෙයි. පුද්ගලයෙකුගේ වුණත් අඩු පාඩුකම් තිබෙනවා. සෑම පුද්ගලයෙක්ම සියයට සියයක්ම සර්ව සම්පූර්ණ නැහැ. මගේ වුණත් අඩු පාඩුකම් තිබෙන්නට පුළුවන්. ඒවා නිවැරදි කර ගැනීම අපේ වග කීමක්; යුතුකමක්. එම නිසා අපේ ආණ්ඩුවේත් අඩු පාඩුකම් තිබෙන්නට පුළුවන්. ඒ අඩු පාඩුකම් නිහතමානීව පිළි අරගෙන ඒවා නිවැරදි කර ගැනීම සඳහා අනන්තවත් අවස්ථාවල අප කටයුතු කර තිබෙනවා. ඉදිරියටත් ඒ ආකාරයෙන් අප කටයුතු කරනවා. නමුත් මේ රටේ ආර්ථිකය කඩා වැටිලා; මේ රටේ ආර්ථිකයන් ගොඩ නැඟුවේ එක්සත් ජාතික පක්ෂයයි; ඒ අයට තමයි රටේ ආර්ථිකයන් ගොඩනගන්නට පුළුවන් කියන දේ තමයි හැම දාම අහන්නට ලැබුණේ.

2001 දී ආර්ථිකය ගොඩ නැගුවා. නමුත් මෙතැන කථා කිරීම තුළින් නොවෙයි මේවා මනින්නේ. ආණ්ඩුව විසින් කරන වැඩවල මිම්ම මණින එක සධකයක් තමයි ඡන්දය. ඒක අමතක කරන්නට එපා. මේ රටේ ජනතාවයි තීන්දු තීරණ ගන්නේ. ජනතාව බුද්ධිමත්. අවුරුදු 2ක් තුළ ඒ අයගේ ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මේ රටේ ජනතාව දුන් තීන්දුව මොකක්ද? ඒක අද එක්සත් ජාතික පක්ෂයට අමතක වෙලා. අපි වග කිව යුතු රජයක් විධියට අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මහින්ද චින්තන වැඩසටහන -ප්‍රතිපත්තිය- තුළ මේ රට සමාජමය, දේශපාලනමය, ආර්ථිකමය, සංස්කෘතිකමය වශයෙන් අද සැබෑ සංවර්ධනයක් කරා ගෙන ඇවිත් තිබෙනවා. ඒ සංවර්ධනය ඉදිරියටත් මේ රට තුළ සිද්ධ වෙනවා. ජනතාවට ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න විසඳිය යුතුයි. ප්‍රශ්නවලට විසඳුම් ලබා දිය යුතුයි. නමුත් මේ ඉදිරිපත් කරන කරුණු දිහා බැලුවාම අප දකින්නේ වෙන වෙන දේවල්.

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

ගරු රෝසි සේනානායක මන්ත්‍රීතුමිය අද කිව්වා, ගණිතය විෂයයෙන් මේ රටේ දරුවන් සමත් වන්නේ සියයට 50යි කියා. මෙහෙම කිව්වාම හිතන්නේ කලින් සියයට 75ක් සමත් වුණා: දැන් සමත් වන්නේ සියයට 50 යි කියලායි. සියයට 50 තමයි සමත් වන්නේ. ඇත්ත. 1993 දී සියයට 17යි ගණිතය සමත් වුණේ. අවුරුදු 17ක් එක්සත් ජාතික පක්ෂය මේ රට පාලනය කළ කාලයේ ගණිතය විෂයයෙන් සමත් වුණේ සියයට 17යි. අද සියයට 53ක් සමත් වනවා. එතකොට සියයට 47ක් අසමත්. නමුත් අද කියනවා, ගණිතය විෂයයෙන් සියයට 47ක් අසමත් කියා. ඇත්ත. කලින් සියයට අසූතුනක් අසමත් වුණු එකයි අද සියයට 47ක් අසමත් වන්නේ.

අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, බස්නාහිර පළාතේ දායකත්වය සියයට 50යි කියලා. ඒක ඇත්ත. නමුත් මීට වැඩියෙන් තිබුණු ඒ දායකත්වය අඩු නිසා තමයි, නගරයේ සංවර්ධනය ගමටත් ගෙන යන්න ආණ්ඩුවක් විධියට, රටක් විධියට අද අපි කටයුතු කරලා තිබෙන බව පෙනෙන්නේ. එම නිසා අපට ඒ ගැන විශාල විශ්වාසයක් තිබෙනවා. අපට ඒ ගැන ආත්ම ශක්තියක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු මොන මොන කතන්දර කිව්වත්, ජනතාව අද ඒවා පිළිගන්නට සූදානම් නැහැ. ඒක අපි දන්නවා. අද ජනතාව මේවා පිළිබඳව ඉතාම හොඳ අවබෝධයකින් සිටිනවා. ජනතාවට අද අවශ්‍ය වන්නේ මොකක්ද, ජනතාව බලාපොරොත්තු වන්නේ කුමක්ද කියන එක පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා පුමුඛ අපේ රජයට දැක්මක් තිබෙනවා. එම නිසා මේ රට ආසියාවේ ආශ්චර්යය කරා යැම වළක්වන්න කාටවත් පුළුවන් වන්නේ නැහැ. සෞඛ්‍ය අතින් වන්නට පුළුවන්, අධ්‍යාපනය අතින් වන්නට පුළුවන්, සීඝ්‍ර දියුණුවක් අද මේ රටේ ඇති වෙලා තිබෙනවා.

අද ලෝකයේ විවිධ රටවල්වල ඉතිහාසය ගැන කථා කරමින් අපට විවිධ චෝදනා කරනවා. ආර්ථික වර්ධනය, ඒක පුද්ගල ආදායම කියන මේවා පිළිබඳව විවිධ විවේචන කරනවා. ඉතින් ඉතිහාසයේදීත් මේ මිම්මෙන්ම තමයි මේවා මැන්නේ. ඉතිහාසයේ දී ආර්ථික වර්ධනය මැනපු ආකාරයට, ඉතිහාසයේ දී ඒකපුද්ගල ආදායම මැනපු ආකාරයට තමයි අදත් ඒ මිනුම් කටයුතු කරන්නේ. අනෙක් අතට, එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ තිබුණ ආර්ථික වර්ධනය ගැන කථා කරන්නට හොඳයි. නමුත් අද ආර්ථික වර්ධනය ගැන කථා කිරීම රුස්සන්නේ නැහැ. ඒක වැරැදියි. ඒක යථාර්ථය නොවෙයි. ඒ වාගේම ආදායම් බෙදී යැමේ විෂමතාව ගැනත් අද කථා කළා. එසේ වුවත් ආදායම් බෙදී යාමේ විෂමතාව අද අඩුයි. ඉහළ පැළැන්තිය රටට දරන දායකත්වය පෙරට වඩා අද අඩුයි. ඒකයි ඇත්ත කථාව. එම නිසා මේ සෑම අංශයක් ගැනම කථා කරන්නට අපි සූදානම්.

වෛරයෙන්, ක්‍රෝධයෙන්, මඩ ගැසීමේ චේතනාවෙන් ඉදිරිපත් කරන, සභාව කල් තැබීමේ මේ යෝජනා විවාදයට අරගෙන විශේෂයෙන්ම මේ අය කරන්නේ වැරැදි තොරතුරු ඉදිරිපත් කිරීමයි. මේ රට හමුවේ කරන ඒ බොරුව පිළිබඳව සමස්ත ජනතාව ඉතාම හොඳ අවබෝධයක් ලබා ගෙන තිබෙන බවට අද අප තුළ විශ්වාසයක් තිබෙනවා. මේ සියලුම කරුණු කාරණා පිළිබඳව ඉතාම හොඳ අවබෝධයකින් යුතුව, මේ රටේ ඉදිරි සංවර්ධනය, ඉදිරි දියුණුව සඳහා ආණ්ඩුවක් විධියට, රටක් විධියට අපි කටයුතු කරනවාය කියන ඒ පණිවුඩය මේ අවස්ථාවේ දී දෙමින් මා නිහඬ වනවා.

[අ. භා. 5.45]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාතෘකාව සම්බන්ධයෙන් කාරණා කීපයක් මතු කරන්නට මා කැමැතියි. අද දින මේ සාකච්ඡාවේ දී මතු කරන්නට බලාපොරොත්තු වන මූලික කාරණයක් විධියට විශේෂයෙන්ම සේවක අර්ථ සාධක අරමුදල ගැන කියන්නට ඕනෑ. සේවක අර්ථ සාධක අරමුදලේ තත්ත්වය පිළිබඳ විශාල ප්‍රශ්න ගණනාවක් පසු ගිය කාලයේ අපි ඉදිරිපත් කළා. සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් ආයෝජනය කිරීම සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ මුදල් ආයෝජනය කිරීම අතර තිබෙන වෙනස ගැන යම් කිසි ආකාරයක කරුණු පැහැදිලි කිරීමක් කරන්නට මා කැමැතියි. ඇත්ත වශයෙන්ම අපට අද තත්ත්වය හිතා ගන්නටවත් බැහැ. මූලික වශයෙන් ගත්තොත් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සම්බන්ධව පාලන කටයුතු කරන්නේ කම්කරු කොමසාරිස්වරයා. නමුත් සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නේ මහ බැංකුව. මහ බැංකුවේ තිබෙන ඒ ආයෝජනය කිරීමේ මණ්ඩලය සහ කම්කරු කොමසාරිස්වරයා පිළිබඳව කථා කරද්දී, ඇත්ත වශයෙන්ම මුදල් පිළිබඳව සහ මුදල් ආයෝජනය කිරීම සම්බන්ධව කම්කරු කොමසාරිස්වරයාට තිබෙන දැනුම පිළිබඳව අපි දන්නා විධියට පරස්පරතාවක් තිබෙනවා. කම්කරු නීතිය පිළිබඳව හෝ කම්කරු ක්‍රියා මාර්ග ගැන එතුමා දන්නා දේට වඩා, මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් එතුමාට තිබෙන්නේ යම් කිසි විධියේ අඩු අත් දැකීමක් කියලා තමයි අපි විශ්වාස කරන්නේ. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. මෙච්චර මහා ලොකු ආර්ථික විශේෂඥයන් සිටින රටක - හැබැයි, අපේ ලංකාවේ මහා බැංකුවට නම් එහෙම එකක් නැහැ. Accountant කෙනෙක් මහා බැංකුවක අධිපති කෙනෙක් වුණාම රටට අත් වන ඉරණම තමයි අද මේ අත් වෙලා තිබෙන්නේ- මහා ආර්ථික විශේෂඥයෝ හිටපු මහ බැංකුව අද පෙරේතයෝ රඟන තැනක් බවට තමයි පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මම කියන්නේ දෙවියෝ පය ගහපු තැන අද පෙරේතයෝ රඟපානවා කියලා. ඒක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය.

අපි බලමු, 2009 සහ 2010 වර්ෂවල දී සේවක අර්ථසාධක අරමුදලේ මුදල් කොටස් වෙළෙඳ පොළ තුළ ආයෝජනය කිරීමෙන් කොපමණ ප්‍රතිලාභයක් ලැබිලා තිබෙනවාද කියලා. අපි 2009 වර්ෂය ගත්තොත්, සේවක අර්ථසාධක අරමුදලේ මුදල් කොටස් වෙළෙඳ පොළ තුළ ආයෝජනය කිරීමෙන් හම්බ වෙලා තිබෙන්නේ සියයට 3.73යි. 2010 දී සියයට 4.20යි. ඒ 2009 සහ 2010 අවුරුදු දෙක ඇතුළත. ඒ දෙකම එකතු කළාම දළ වශයෙන් සියයට 4.11ක් තිබෙනවා. හැබැයි ඇත්තටම ඒ ආයෝජනයෙන් ලැබෙන්න ඕනෑ ආදායම සියයට 103.66ක්. නමුත් ඒක ලැබිලා නැහැ. ඇත්ත වශයෙන් ලැබෙන්න ඕනෑ ප්‍රමාණය අපි හරියට ගණන් හදලා බැලුවොත්, ඒ ආයෝජනයෙන් සේවක අර්ථසාධක අරමුදලට ලැබෙන්න ඕනෑ බිලියන 54ක්. නමුත් ලැබිලා තිබෙන්නේ බිලියන 2.2යි. එතකොට 2009, 2010 වර්ෂවලදී සේවක අර්ථසාධක අරමුදලේ මුදල් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කිරීමෙන් බිලියන 40ක පාඩුවක් තමයි අපිට තිබෙන්නේ.

අපි අනෙක් පැත්තෙන් මේ කාරණයම සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල පැත්තෙන් කල්පනා කරලා බැලුවාම, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල - ETF එක- 2009 දී තමන්ගේ ආයෝජනවලින් අරගෙන තිබෙනවා සියයට 11.9ක්. 2010 වන කොට අරගෙන තිබෙනවා සියයට 26ක්. 2009 දී සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ආයෝජනයෙන් සියයට 11.9ක ආදායමක් අරගෙන තිබෙනවා. හැබැයි සේවක අර්ථසාධක අරමුදලින් අරගෙන තිබෙන්නේ සියයට 3.7ක ආදායමක්. 2010 වර්ෂයේදී සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සියයට 26ක් උපයන කොට, සේවක අර්ථසාධක අරමුදල උපයන්නේ සියයට 4.2යි. ඉතින් මේ වෙනස සාධාරණීකරණය කරන්නේ කොහොමද? මේ ක්‍රියාදාමය තුළ කාටද කියන්න පුළුවන්, මහා මොළකාරයෝ ඉන්නවාය කියන, ආර්ථික විශේෂඥයෝ ඉන්නවාය කියන මහ බැංකුවේ, ඔවුන් ගන්නා තීන්දු අනුව සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ආයෝජනය කිරීම සාර්ථකව සිද්ධ වෙලා තිබෙනවාය කියලා? ඒ නිසායි මම මෙහිදී විශේෂයෙන් කියන්නේ, මෙතැන යම් කිසි විධියේ අන්තර් ගනුදෙනුවක් තිබෙනවා කියලා. එහෙම නැත්නම් මෙවැනි තත්ත්වයක් ඇති වෙන්න විධියක් නැහැ.

අපි කවුරුත් කරන්න ඕනෑ රටට සේවය කිරීමක් නේ. රාජ්‍ය නිලධාරින් විධියට, මහ බැංකුවේ අධිපතිවරයා විධියට අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමන්ලා, ඒ ඉන්න මුදල් මණ්ඩලය - Monetary Board එක- කටයුතු කරන්න ඕනෑ රටට ආර්ථික වශයෙන් ශක්තිමත් තැනක් ලබා දෙන්නයි. දැන් තමුන්නාන්සේලා අපි ඔක්කෝම මෙතැනට ඇවිල්ලා පැය ගණන් සාකච්ඡා කරන්නේ මොකටද මේ? වෙන අමාරුවකට නොවෙයි නේ. ඒ මේ රට හොඳ තැනකට තල්ලු කරන්නයි. ඉතින් අපි මේ වැරදි පෙන්වා දුන්නාම තමයි තමුන්නාන්සේලා අපට චෝදනා කරන්න එන්නේ. අපි මේවා පෙන්වා දුන්නාට පස්සේ, පසුව දා උදේ මොනවා හෝ අලාභයක් වුණොත් ඒ ගැන අපට චෝදනා කරන්න විධියක් නැහැ. ඒවාට අපි වග කියන්න ඕනෑ නැහැ. අපි පෙන්වා දුන්නොත් තමයි තමුන්නාන්සේලා මේ වැරදි හදා ගන්නේ.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ -NSB එකේ- වෙච්ච ගනුදෙනුව අපි දිගටම පාර්ලිමේන්තුවේදී පෙන්වා දුන්නා. විශේෂයෙන් අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා, රවි කරුණානායක මැතිතුමා, ඉරාන් වික්‍රමරත්න මැතිතුමා, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ඇතුළු සියලු දෙනා දිගින් දිගටම, දිගින් දිගටම මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කළ නිසා, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපතිවරයාටයි, අධ්‍යක්ෂ මණ්ඩලයටයි ඉල්ලා අස් වෙන්න සිද්ධ වුණා. නැතුව ඔබතුමන්ලා ඒ අය ඉවත් කළා නොවෙයි. ඊයේ ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කියලා තිබුණා, ඒ ගොල්ලන්ව ඉවත් කරලායි තිබෙන්නේ කියා. ඉවත් කළා නොවෙයි, ඉවත් කරන්න සිද්ධ වුණා, අපි මේ විධියට කෑ ගහපු නිසා; දිගින් දිගටම ඒ වැරැද්ද අපි පෙන්වලා දුන්නු නිසා. හැබැයි මතක තබා ගන්න, මේ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් විතරක් ඒ ප්‍රශ්නය අවසන් වෙන්නේ නැති බව.

අපි අහන්නේ මෙතැනින් එහාට තමුන්නාන්සේලා ගත්තු තීන්දු, තීරණ මොනවාද කියායි. දැන් මේ අයින්වීම සිද්ධ වෙලා සති ගණනාවක් වෙනවා. රජය විධියට තමුන්නාන්සේලා අරගෙන තිබෙන පියවර මොනවාද කියා මම අහනවා. What action have you taken? මේ අයට විරුද්ධව නීතිමය වශයෙන් - legally - ඔබතුමන්ලා අරගෙන තිබෙන පියවර මොකක්ද කියා මම තමුන්නාන්සේලාගෙන් අහනවා. කිසි පියවරක් අරගෙන නැහැ. ඉල්ලා අස් වුණා. දොර වහලා දැම්මා. අශ්වයා පැනලා ගියායින් පස්සෙ ඉස්තාලය වහලා දැම්මා වාගෙයි. එච්චරයි. මම අහන්නේ මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේලා අනාගතයේ ගන්නා තීන්දුව මොකක්ද කියායි. මේ ගනුදෙනුව පිටුපස ඉන්නා අය සම්බන්ධයෙන් නීතිමය වශයෙන් තමුන්නාන්සේලා අරගෙන තිබෙන පියවර මොකක්ද කියා මම අහන්න කැමැතියි. නීතිමය වශයෙන් පියවර අරගෙන තිබෙනවාද කියා මම අහනවා. මෙයින් සිද්ධ වෙන්නේ වෙන දෙයක් නොවෙයි. සභාපතිවරයා ඉවත් කරලා එතුමා මේ වැඩේට fix කළාය කියායි මම කියන්නේ. එතුමා මේකට හිර කරලා, මේ රටේ උත්තරීතර අධිකරණයට ස්වාධීනව කටයුතු කරන්න තිබෙන අයිතිය අහෝසි කරන වැඩ පිළිවෙළකට තමයි තමුන්නාන්සේලා ගිහින් තිබෙන්නේ. ඇයි? ඒක මම මෙතැනදී කියන්නේ නැහැ, එහෙම කිව්වොත් ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න සිද්ධ වෙන නිසා. මේ සභාපතිවරයා පත් කරනකොට ආණ්ඩුව දැන ගන්න ඕනෑ, කාගේ කවුරුද මේ පත් කරන්නේ කියලා. අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉතාමත් බුද්ධිමත් කාන්තාවක්. එතුමිය විශ්වවිද්‍යාලයේදී මටත් උගන්වපු ගුරුවරියක්- teacher කෙනෙක්-. දුක් විඳලා, මහන්සි වෙලා, පාඩම් කරලා ඉතාම ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා බොහොම අමාරුවෙන් ඒ තනතුරට ආපු කෙනෙක්. ඒ මිසක් නිකම් පන්දම් අල්ලලා ඒ තනතුරට ආපු කෙනෙක් නොවෙයි. එතුමියගේ ස්වාමි පුරුෂයා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ - National Savings Bank එකේ- සභාපති ධුරයට පත් කරනකොට ආණ්ඩුව කල්පනා කළ යුතුව තිබුණා, ඒ වැඩේ වැරදියි කියලා. ඒ තනතුර බාර ගන්නකොට ඒ සභාපතිතුමාත් කල්පනා කළ යුතුව තිබුණා, තමන්ගේ භාර්යාව ඒ වාගේ උසස් තනතුරක් දරනකොට එතුමා මේ තනතුර භාර ගන්න එක වැරදියි කියලා. හැබැයි එහෙම සිද්ධ වුණේ නැහැ. දැන් වැඩේ වෙලා ඉවරයි.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ආණ්ඩුව මේ පත් කිරීම කරනකොට අපි දැන ගත්තා, යම්කිසි විධියක ලොකු විනාශයක් සිද්ධ වුණොත් අවසානයේ බලපෑමක් වෙන්නේ මේ රටේ ස්වාධීන අධිකරණ ක්‍රියාවලියටය කියන එක. අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අද මේ සභාපතිවරයා ඉවත් කිරීම ගැන මම කියන්නේ, he was fixed. මම කියන්නේ එතුමා එතැනට තල්ලු කරලා, එතුමා මේ ගනුදෙනුවේ කොටස්කාරයෙක් බවට පත් කරලා, අද ඒ මගින් මේ රටේ අධිකරණයට ඇඟිලි ගැසීම් කරන්න පුළුවන් තත්ත්වයකට අද මේ පත් කිරීම් එක්ක මේ ආණ්ඩුව කටයුතු කර තිබෙනවාය කියන එකයි. අද ඒකයි සිද්ධ වෙලා තිබෙන්නේ. අද කුඩු කාපු අය වාගේ තමයි මේ අය සද්ද නැතිව ඉන්නේ.

සේවක අර්ථසාධක අරමුදලේ වැඩ කටයුතු ටික කර ගෙන යනකොට අද සිද්ධ වෙලා තිබෙන දෙය බලන්න. රාජ්‍ය සුරැකුම් ගැන බැලුවාම 2009-2010 සේවක අර්ථසාධක අරමුදල - EPF එක - invest කරලා ඒ අය අරගෙන තිබෙන ප්‍රමාණය බලන්න. සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල - ETF එක- 2009 දී සියයට 5ක් invest කරලා බිලියන 43.7ක් අරගෙන තිබෙනවා. 2009 දී සියයට 1.3ක් invest කරලා බිලියන 9.8ක් ගන්නවා. 2010දී සියයට 5ක් invest කරලා බිලියන 43.7ක් ගන්නවා. තමුන්නාන්සේලා මේ ගැන කල්පනා කර බලන්න. මම ඒකයි කියන්නේ. මේ වෙන කථාවක් නොවෙයි. වෙන ඇඟිලි ගැසීම් කරන්න දෙයක් නොවෙයි. කරුණාකරලා මේවා ගැන කල්පනා කරලා තීන්දුවක් ගන්න. සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට - ETF එකට- පුළුවන් නම් යම්කිසි විධියක ලාභයක් ලබා ගන්න, මම අහනවා මහ බැංකුවේ අධිපතිවරයා ඇතුළු සියලු දෙනා මුදල් මණ්ඩලයේ ඉඳගෙන ගන්නා තීන්දුවේ ප්‍රතිඵලය ලෙස මොකක්ද වෙලා තිබෙන්නේ කියා. අද මේකෙන් දැවැන්ත විනාශයක් සිද්ධ වෙලා තිබෙනවා.

මේ සමඟම මම කියන්න කැමැතියි, ඊයේ හම්බන්තොට වරායට වාහන 1,000ක් රැගත් නැවක් ආපු එක ගැන. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. මාස 18කට පසුව හරි, ප්‍රතිඅපනයනය සඳහා නැවක් ඇවිල්ලා තිබෙනවා. කොළඹට පටවපු එක තමයි ඇවිල්ලා තිබෙන්නේ. එහෙම නැතිව හම්බන්තොටටය කියා වෙනම එකක් ඇවිල්ලා නැහැ.

හම්බන්තොටට ආවා නම් හම්බන්තොට ඉඳන් එහේ යන්න ඕනෑ. කොළඹින් භාගයක් පටවලා හම්බන්තොට භාගයක් බාන්නයි, කොළඹ භාගයක් බාලා හම්බන්තොටින් භාගයක් පටවන්නයි එහෙම ක්‍රමයක් නැහැ නේ. නැව් ටික ආවා, ඒක හොඳයි. මම කාටවත් දෝෂාරෝපණය කරන්නේ නැහැ. අපි දිගින් දිගටම කිය කියා හිටියේ, මේ වාගේ වැඩ පිළිවෙළක් තුළ මොකක්ද සිද්ධ වෙන්නේ කියලායි. මම දැන් තමුන්නාන්සේලාගෙන් මේ කාරණය අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නැවේ ගෙනාවා, වාහන දාහක්. එක වාහනයකින් ගන්නේ ඩොලර් 30යි. මම දන්න විධියට කොළඹ වරාය නම් සාමාන්‍යයෙන් බෑවුම්, පැටවුම් කුලිය ලෙසට ගන්නේ ඩොලර් 30යි. නමුත් හම්බන්තොටට ගෙනෙන කොට විශේෂ වාසි ලැබිලා මේක ක්‍රියාත්මක වෙනවාය කියලායි මම හිතන්නේ. මම දන්නේ නැහැ, එක වාහනයකින් ඩොලර්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

පහක්වත් ගත්තාද කියලා. අපි ඒ ගැන බලන්න එපා යැ. වාහන දාහක් හම්බන්තොට වරායට ආවාය කියන එක තමයි news එක. හැබැයි ඒකේ ඇතුළේ තිබෙන ප්‍රශ්නය මොකක්ද?

අපි හිතමු, කොළඹ වරායේ ගන්න විධියටම එක වාහනයකින් බෑම්, පැටවුම් කුලිය සඳහා ඩොලර් 30 ගණනේ ගන්නවාය කියලා. එතකොට වාහන දාහට කීයද? ඩොලර් 30,000යි. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, ඒක rocket science නොවෙයි කියලා. මේ හම්බන්තොට වරායේ තිබෙනවා, tug එකක්. ඒ tug එක අයිති ඉන්දියන් ජාතිකයෙකුටයි. ඒ tug එක දවසකට පාවිච්චි කරන්නේ ඩොලර් 5,000කටයි. ඒක ආපහු යන්නේ නැහැ. ඒක දිගටම හම්බන්තොට වරායේයි තිබෙන්නේ. ආපසු යන්නේ නැහැ. කොළඹ තිබෙනවා, ලංකාවේ වරායට අයිති ඒ වාගේ tugs හතරක්. අපේ ලංකාවේ වරායට අයිති තවම අලුත්වැඩියා නොකරපු tugs හතරක් තිබෙනවා. අපේ tug එකක් ගිහිල්ලා මාසයක් විතර තියා ගෙන හිටියාට අපට ප්‍රශ්නයක් නැහැ. මේකෙන් සිදු වන්නේ මොකක්ද? දැනට තීරණය කරලා තිබෙන විධියට ප්‍රතිඅපනයනය සඳහා හම්බන්තොට වරායට සතියකට නැව් එකයි එන්නේ. වාහන අරන් එනවා. තවම වාහන අරන් එන නැව් විතරයි එන්නේ. තවම පිටි, සීනි අනෙක් ඒවා බෑවේ නැහැ. තවම වෙන වෙන කන්ටේනර්ස් ආවේ නැහැ. ඒ වාහන නැව විතරයි ආවේ. එතකොට මේ tug එකට එක දවසකට ඩොලර් 5,000 ගණනේ ගන්නවා. සතියකට කීයද? සතියකට ඩොලර් 35,000යි. සතියකට නැවකින් වාහන දාහක් ගෙනාවම ඔබතුමන්ලාට ලැබෙන්නේ ඩොලර් 30,000යි. ඩොලර් 5,000ක් පාඩුවට තමයි ඒ කටයුතු සිදු වන්නේ. ඒ ගණනටත් වඩා අඩුවෙන් තමයි හම්බන්තොට වරායේ බෑම්, පැටවීම් කරන්නේ. පළමුවැනි නැව නිසා ඒක පොඩ්ඩක් ජනප්‍රිය කරන්නත් එපා යැ. ඩොලර් 35,000යි tug එකට. ඒ බඩු ටික බාලා, පටවලා යවනවාට තමුන්නාන්සේලාගේ ආදායම ඩොලර් 30,000යි. මම අහනවා, අඩුම තරමේ අපට තිබෙන ලාභය මොකක්ද කියලා.

මහා ලොකුවට කෑ ගහලා, කෑ ගහලා, කෑ ගහලා මී පැටියෙකු වැදුවා වාගේ වැඩක් තමයි මේ තිබෙන්නේ. විලි ලා, විලි ලා මී පැටියෙකු වැදුවා වාගේ වැඩකුයි මේ තිබෙන්නේ. මහ ලොකුවට කයිය ගහනවා, ඔන්න අද ඇරියා, මින් පස්සේ මාගම්පුර වරායට ලොකුවට ඕනෑ දෙයක් ගේන්න පුළුවන් කියලා. හැබැයි ආපු නැවේ ගණනට වියදම බැලුවාම ඊට වැඩිය වැඩියි. අනෙක් වියදම් ටික අත හැරලායි මම කියන්නේ. මේක පටන් ගත්ත එක හොඳයි. තමුන්නාන්සේලා වරාය විවෘත කරලා මාස 18කට පස්සේ දෙයියනේ කියලා නැවක් ආවා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. ඒක ඊර්ෂ්‍යාවකින්, වෛරයකින් කථා කරන එකක් නොවෙයි. හැබැයි ඒකේ ප්‍රතිඵලයයි මම මේ කියන්නේ. ඒ නිසා මෙන්න මේක තමයි අද ඇති වෙලා තිබෙන වාතාවරණය. මේ සල්ලි වියදම් කරන කොට අපි කල්පනා කරන්න එපා යැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් සෝනු නිගම් ගෙන්වූවා. ඒ ගැන ඔබතුමාත් දන්නවා. අපේ කට්ටියට තිබෙනවා, බොහොම ලොකු අමාරුවක්. සමහරුන්ට තිබෙනවා, හෙලිකොප්ටර් ගායක්. හෙලිකොප්ටර් ගායක් තිබෙන්නේ පොඩි මන්ත්‍රීවරුන්ටයි. ඒ අය හම්බන්තොට යනවා. කොළඹ එනවා. කොළඹින් යාපනය යනවා. යාපනයෙන් කිලිනොච්චි යනවා. කිලිනොච්චියෙන් කොළඹ එනවා. කොළඹින් කුරුණෑගල යනවා. කුරුණෑගලින් බදුල්ලට යනවා. ඔක්කෝම යන්නේ හෙලිකොප්ටර්වලින්. එහාට මෙහාට යන වියදම කවුද ගෙවන්නේ? මේ කාගේ සල්ලිද? මේ රටේ අහිසංක දුප්පත් මිනිසුන්ගේ සල්ලි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෝනු නිගම් ගෙන්වූවා. විමල් වීරවංශ ඇමතිතුමා සෝනු නිගම් කියන ගායකයා ගෙන්වූවා. දැන් දවස ගණනේ ගෙන්වන්නේ ඉන්දියන් කට්ටිය නේ. ප්‍රීති සින්ටා කියයි. එක එක ජාතියේ කට්ටිය නේ ගෙන්වන්නේ. මේ අයව ගෙන්වලා-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බැරි වෙලාවත් ඔබතුමා බලන්න යන්නේ නැද්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බලන්න යන්න ඕනෑ. අපට වුවමනාව තිබුණත් අනුන්ගේ සල්ලිවලින් ඒවා බලන්නේ නැහැ. අනුන්ගේ සල්ලිවලින් නොවෙයි, අපේ සල්ලිවලින් තමයි අපි බලන්න යන්නේ. ජනතාවගේ සල්ලිවලින් නොවෙයි. අනුන්ගේ සල්ලිවලින් ප්‍රීති සින්ටාත් එක්ක වෙන වෙන වැඩ කරන්න අපට වුවමනාවක් නැහැ. අපේ සල්ලිවලින් තමයි මොකක් හරි කළොත් කරන්නේ. ඒ කියන්නේ පාටියක් වාගේ එකක් දාන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෝනු නිගම් ගෙන්වා පැවැත්වූ ප්‍රසංගයෙන් කොළඹ මහ නගර සභාවට ගෙවන්න තිබුණු මුදල් ටික ගෙවලා නැහැ. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, බස්නාහිර පළාතේ හිටපු මහ ඇමතිතුමා විධියට ඔබතුමා දන්නවා නේ විනෝද බද්ද කියන එක. විනෝද බද්ද වශයෙන් විශාල මුදලක් කොළඹ මහ නගර සභාවට ගෙවන්න තිබුණා. විනෝද බද්ද ගෙව්වේ නැහැ. බලහත්කාරකම් කරලා ඒක නතර කර ගෙන තිබෙනවා.

පසු ගිය 16 වන දා Carlton Super Sevensවලට උදිත් නාරායන් ගෙන්වූවා. දැන් මුළු ලංකාවම කාල්ටන්කරණය වෙලා නේ තිබෙන්නේ. දැන් ළදරු පාසලක් නොවෙයි, මොකක් කළත් ඒකට දමන්නේ කාල්ටන් කියලායි. පසු ගිය 16 වන දා කාල්ටන් ක්ලබ් එකෙන් උදිත් නාරායන් ගෙන්වූවා. ඒකේ ටිකට් එකක මිල රුපියල් 5,000යි. ඒකෙන් ශත 05ක් ගෙව්වේ නැහැ, කොළඹ මහ නගර සභාවට. [බාධා කිරීමක්] උදිත් ලොකුබණ්ඩාර ගෙන්වලා සින්දුවක් කිව්වා නම් කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ මහ නගර සභාවට ලැබෙන්න තිබෙන විනෝද බද්ද ශත 05ක්වත් ගෙවන්නේ නැතුව තමයි මේ වැඩ පිළිවෙළ කළේ. දැන් මේකට සල්ලි දුන්නේ කවුද? මේකට මුදල් දුන්නේ කවුද? මටත් ඒකට ආරාධනා කළා. මා කිව්වා, "මම පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධයෙන් විවේචනය කරන්න යනවා. එම නිසා මට එතැනට ඇවිත් ඉඳ ගෙන ඉඳලා පසුව දා උදේට ගිහින් ගුණ මකුවකු වාගේ ඒක විවේචනය කරන්න බැහැ"යි කියලා. එහෙම නැත්නම් අපිත් හොඳට විනෝද වන කට්ටිය. එහෙම ප්‍රශ්නයක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට හොඳ ගීතයක් ගයන්න තිබුණු හොඳ අවස්ථාවක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මටත් හිතුණේ ඒක තමයි. එක ගීතයයි කියන්න තිබෙන්නේ. ඒ සින්දුව මෙහෙමයි තිබෙන්නේ:

"ඒයි ජීනීවා,
අපි දැන් මරන්නෙ නැහැ
අපි දැන් කනව විතරමයි
කන කොට ඌරො ලස්සණයි
කන කොට කුකුල්ලු ලස්සණයි
පන්සල්වලට අරක්කු
රටටම පිරිත් පැන්
අපි මොකටද ණයක් ගන්නෙ

අපට කවුද ණයක් දෙන්නෙ
ඒයි ජීනීවා,
අපි දැන් මරන්නෙ නැහැ"

ඒක තමයි සින්දුව. ඔබතුමාට මීට වඩා හොඳට ඒ සින්දුව කියන්න පුළුවන්ය කියා මා විශ්වාස කරනවා. මූලික වශයෙන් මා කිව්වේ වෙන කාරණයක් නොවෙයි. මා මේ ආණ්ඩුවෙන් ඉල්ලනවා, කොළඹ මහ නගර සභාවට අයිති වන්න තිබෙන මුදල් ටික කරුණාකරලා ලබා දෙන්න කියලා. මොකද, කොළඹ මහ නගර සභාවට බදු ගෙවන ජනතාවගේ මුදල් ටික තමයි මේ පැහැර ගනිමින් තිබෙන්නේ. Carlton Super Sevensවලට, රග්බි තරගාවලිවලට ඉන්දියන් නළු නිළියන් ගෙන්වලා රුපියල් කෝටි ගණන් -රුපියල් කෝටි 100, 200 ගෙවන්නේ, රුපියල් කෝටි 15, 20- ගෙවන්නේ මේ රටේ අහිංසක, දුප්පත් මිනිසුන්ගේ සල්ලිවලින්. මේවාට කවුද වග කියන්නේ?

ඔබතුමා දන්නවා, මොබිටෙල් ආයතනය. මොබිටෙල් ආයතනය තමයි එක sponsor කෙනෙක්. ඒක පෞද්ගලික ආයතනයක් නොවෙයි. ඒක ලංකාවේ රාජ්‍ය ආයතනයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දුප්පත් මිනිස්සු දවසින් දවස දුප්පත්කමට වැටෙන කොට ආණ්ඩුවේ මේ නාස්තිකාර වියදම් ටික අහෝසි කරන්න කියන ඉල්ලීම තමයි මා කරන්නේ. අවසාන වශයෙන් මා ඔබතුමාගෙන් විනාඩියක් ඉල්ලනවා. අද රුපියලට අත් වෙලා තිබෙන ඉරණම සම්බන්ධව මට පොඩි ලිපියක් ලැබුණා, එක පුද්ගලයකුගෙන්. ඒකේ රුපියලේ ලාංඡනය දමලා මෙන්න මෙහෙම සඳහන් වෙලා තිබෙනවා:

**"අනිච්චාවත සංඛාරා!**
රු පියල්
ලංකා මාතාවගේ පුතණුවන් වූද, දිළිඳුගේ ස්වාමිපුරුෂයා වූද, ජනතාවගේ සහෝදරයා වූද, දරිද්‍ර, සකල ජන හා දුගීගේ මස්සිනා වූද, රු පියල් මහතා බලහත්කාරයෙන් පා කොට ගිල්වා ඝාතනය කරන ලදී. අවසන් කටයුතු මහ බැංකු පරිශ්‍රයේදී සිදු කෙරේ."

මෙන්න මේක තමයි අද ලංකාවේ රුපියලට අත් වෙලා තිබෙන ඉරණම. මේක අපේ නිවාඩ් කබ්රාල් මහතාගේ රුපියල බවට පත් වෙලා ඉවරයි. දැන් ඒකේ අවසාන කටයුතු සිද්ධ වනවා, මහ බැංකුවේදී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 6.06 ]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂය විසින් ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ යෝජනාව මූලික වශයෙන් ඉලක්ක කරලා තිබුණේ පරිපූරක ඇස්තමේන්තු සම්බන්ධයෙන් වන විවාදයක් හැටියටයි. කොහොම වුණත් ඊට පරිබාහිර වූ කරුණු ගණනාවක් අද මෙම ගරු සභාවේදී ඉදිරිපත් වුණා. මා මුලින්ම කියන්න අවශ්‍යයි, මහ බැංකු වාර්තාව අනුව 2005 වර්ෂයේ අපේ රටේ GDP එක රුපියල් බිලියන 2,453ක් වූ බව. අවුරුදු 6කට පසුව 2011 වන විට එය රුපියල් බිලියන 6,543ක් බවට පත් වෙලා තිබෙනවා.

ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර්වලින් ගත්තොත් 2005 සිට 2011 දක්වා අවුරුදු හයක කාල සීමාව තුළ ඩොලර් 1241 සිට 2836 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම සමාජයීය සංවර්ධන සාධක ගත්තොත් ඒ සෑම එකක්ම මේ වසර හය තුළදී සැලකිය යුතු වර්ධනයක් අත් කර ගෙන තිබෙනවා. මා හිතන විධියට අවුරුදු හයක් තුළදී ඉතිහාසය පුරාවට අපේ රටේ ඒක පුද්ගල ආදායම දෙගුණයකට වඩා වැඩි වුණේ මේ කාල පරිච්ඡේදයේදී පමණයි.

අනෙක් පැත්තෙන් 2005 සිට 2011 දක්වා අපනයනයන් ඩොලර් මිලියන 6347 ඉඳලා ඩොලර් මිලියන 10559 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඊට සාපේක්ෂව ආනයනයන් ඩොලර් මිලියන 8863 ඉඳලා 20269 දක්වා වැඩි වෙලා තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අවසාන වශයෙන් කියපු ශෝක ප්‍රකාශයට හේතු වුණු සාධකය මෙතැනයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 30ක් තිස්සේ මේ රටේ තිබුණු යුද වාතාවරණය, සාමකාමී පරිසරයක් නොමැති වීම, ඒ තුළ සංචාරක ව්‍යාපාරය අඩාළ වීම, අපනයනයන් නිසියාකාරයෙන් සිදු නොවීම, ජනතාව තුළ තිබුණු බිය සැකයන්, ව්‍යාපාරිකයන් තුළ තිබුණු බිය සැකයන් යනාදී හේතූන් නිසා ජනතාව සතු යම් ඉතිරි කරපු මුදලක් තිබුණා නම් ඒක පවා ආයෝජනය කරන්න එහෙම නැත්නම් වෙනත් සංවර්ධනයක් සඳහා යොදන්න මැළි වුණා. මේක තමයි තිබුණු තත්ත්වය. 2007, 2008 වන විට පහත රට තේ මිල රුපියල් 22ට 20ට වැටෙනකොට, රබර් මිල රුපියල් 180ට 200ට වැටෙනකොට, විපක්ෂයේ දේශපාලනඥයෝ මුල් වෙලා ගාලු දිස්ත්‍රික්කයේ ඇල්පිටිය, බද්දේගම ආදී ප්‍රදේශවලින් තේ කොළ ගෙනැවිත් පාරේ හැළුවා මට මතකයි. ලෝක ආර්ථික අවපාතයත් එක්ක බොර තෙල් බැරල් එකක මිල ඩොලර් 147ට යනකොට එපමණින්ම අපේ රටේ තෙල් මිල එදා වැඩි නොකළත් රුපියල් 157 දක්වා තෙල් මිල ඉහළ ගියා. හැබැයි, ඊට පස්සේ ඒක රුපියල් 110 දක්වා අඩු කළා. ඒ වෙලාවේ මූල්‍ය ආයතන දැඩි අර්බුදයකට මුහුණ පෑවා.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අද මේ ගරු සභාවේදී සෙලාන් බැංකුව ගැන කථා කළා. ඒ වකවානුවේ ඇමෙරිකානු එක්සත් ජනපදයේ බැංකු ගණනාවක් කඩා වැටුණා; මහා බ්‍රිතාන්‍යයේ බැංකු ගණනාවක් කඩා වැටුණා. ඒ නිසා එදා ඒ රජයන්ට සිදු වුණා, ඒ රටවල ව්‍යවහාරික මුදල බිලියන ගණනින් ඒවාට සපයන්න. හැබැයි, එදා අපේ ආණ්ඩුව -මහ බැංකුව මැදිහත් වෙලා- සෙලාන් බැංකුව වැටෙන්න නොදී ආරක්ෂා කළා. එහි සභාපතිවරයෙක් පත් කරලා, අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරලා අද වන විට සාර්ථකව ව්‍යාපාර කර ගෙන යන බැංකුවක් බවට පරිවර්තනය කර ගන්න පුළුවන්කම ලැබුණා. එදා ඒක නොකරන්නට සෙලාන් බැංකුව වැටුණා නම්, තව මූල්‍ය ආයතන කිහිපයක් තිබුණු තත්ත්වයෙන් අපි ගොඩ ගත්තේ නැත්නම්, ඒවා වැටුණා නම් අනෙකුත් බැංකු පද්ධතිය පුරා මූල්‍ය ආයතන රාශියකට ඒකේ බලපෑම නිසා බටහිර සහ යුරෝපයේ විවිධ රටවල මතු වූ තත්ත්වයට අපටත් පත් වෙන්න තිබුණා. ඒ අවස්ථාවේදී පොහොර සහනාධාරයන් දුන්නා. අපනයනකරුවන්ට යම් සහනයන් ලබා දුන්නා.

එදා අලුත් මූල්‍ය ප්‍රතිපත්ති ගණනාවක් රජයක් හැටියට මහ බැංකුව හරහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් නිසා තමයි ඩොලර් බිලියන 1.2ට ඒ කියන්නේ පහළට වැටිලා තිබුණු අපේ සංචිත

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ඊළඟ අවුරුදු තුන හතර ඇතුළත ඒ කියන්නේ 2009 අප්‍රේල් මාසය වන විට ඩොලර් බිලියන 6නුත් එහාට 8 දක්වා වැඩි කර ගන්න පුළුවන්කම ලැබුණේ. ඒ තුළ තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පහසුකම් පවා අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණේ.

ඒ නිසා තමයි සංචාරක ව්‍යාපාරයේ සියයට 47ක ප්‍රගතියක් මේ අවුරුදු දෙක තුළ ලබා ගන්න පුළුවන්කම ලැබුණේ; ඒ නිසා තමයි විදේශ ආයෝජන ගෙන ඒම සඳහා අවශ්‍ය වන්නා වූ විශ්වාසනීයත්වය ගොඩ නඟන්න පුළුවන්කම ලැබුණේ; ඒ නිසා තමයි කොටස් වෙළෙඳපොළ ඉතිහාසයේ කවරදාකවත් නොවූ විරූ මට්ටමකට ඉහළට ගියේ. මෙවැනි ප්‍රතිලාභ රාශියක් ඒ වකවානුව තුළ අපි අත් පත් කර ගෙන තිබෙනවා.

තව කාරණයක් ගැන මම කියන්න ඕනෑ. 2011 වර්ෂයේ අපේ රටේ මුළු ආනයනවල වටිනාකම අමෙරිකානු ඩොලර් මිලියන 20,269යි. එයින් හතරෙන් එකක් තෙල් සඳහායි වැය වන්නේ. ඇයි? අපි බොර තෙල් සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 1.6ක් වැය කරනවා. තවත් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.4ක් පිරිපහදු කරපු තෙල් මිලදී ගන්න වැය කරනවා. එතකොට තෙල් පරිභෝජනයෙන් සියයට 33ක් මොනවාටද යන්නේ? ආනයන තෙල් බිල ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් නම්, එයින් තුනෙන් එකක් වැය වන්නේ විදුලිබල ක්ෂේත්‍රයටයි. 1995 වන තෙක් ඉතාම සුළු ප්‍රතිශතයක් තමයි තාප විදුලිය නිෂ්පාදනය කළේ. රටක සංවර්ධනයක් ඇති වන කොට, ගම්-දනව් කරා විදුලිය ලබා දෙන කොට, පැය 24 පුරාම විදුලිය ලබා දෙන කොට, ඒ සඳහා තිබෙන්නා වූ සම්පත් ප්‍රයෝජනයට ගන්න අපට සිදු වෙනවා. අලුතින් ආරම්භ කරපු ඉහළ කොත්මලේ ජලාශයත් ඇතුළුව සියලුම ජලාශ පිරිලා තිබෙනවා නම් අපේ රටේ උපරිම ජල විදුලිය නිෂ්පාදනය මෙගාවොට් 1,250යි. නමුත් දවසකට, සවස 6 පහු වෙන කොට day demand එක මෙගාවොට් 2,400ක්, 2,500ක් බවට පත් වෙනවා. එතකොට විදුලිය මෙගාවොට් 300ක් නිපදවන ගල් අඟුරු විදුලි බලාගාරය හැරුණාම අනෙක් සියල්ලම -තාප විදුලිය, ඩීසල් තෙල්, ඉහළ සල්ෆර් ප්‍රතිශතය සහ අඩු සල්ෆර් ප්‍රතිශතයත් එක්ක- සියයට 55ක්, 60ක් විදුලිය උත්පාදනය කරන්නේ තෙල්වලිනුයි. එතකොට පිරිපහදු කළාට පස්සේ එන ඩීසල් තෙල්වල මිල අපි ආනයනය කරන බොර තෙල්වලට වඩා මිල අඩුයි.

කෙරවලපිටිය West Coast Power බලාගාරයේ මෙගාවොට් 300ක් නිෂ්පාදනය කරනවා. මේ වාගේ සවස් වෙලාව වන විට baseload එක ගන්න ඒවා අවශ්‍ය වෙනවා. ඒකට තමයි අනෙක් ඒවා එකතු කරලා, එකතු කරලා peak hour එක එන කොට උපරිමයට යන්නේ. අද වෙන කොට සියයට 80ක් විදුලි බලය නිෂ්පාදනය කරන්නේ තෙල්වලින්. හැබැයි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඒ තෙල්වල පිරිවැයට නොවෙයි විදුලිබල ක්ෂේත්‍රයට තෙල් සපයන්නේ. ආනයනය කරන පහළ සල්ෆර් ප්‍රතිශතය තිබෙන තෙල් බැරල් එකක් බාන අවස්ථාව වන විට මිල - landed cost එක- රුපියල් 102ක් වුණාට, අපි රුපියල් 75කටයි විදුලිබල ක්ෂේත්‍රයට ලබා දෙන්නේ. අවසාන වශයෙන් වසරකට, දෙකකට වතාවක් මේ සියල්ල අවශෝෂණය කර ගෙන තෙල් සංස්ථාව ඒ ණය බරින් මුදවන්න මහා භාණ්ඩාගාරයට සිදු වුණා. රුපියල් බිලියන 60ක බැංකු බැඳුම්කර නිකුත් කරලා තමයි අපට 2010 දෙසැම්බර් මාසය දක්වා තිබුණු ඒ අවාසිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉවත් කර ගන්න පුළුවන්කම ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කිසි විධියකින් පැය 24ම විදුලිය නොදුන්නා නම්, විපක්ෂය මොකක්ද කියන්නේ? 1995, 1996, 1997 වන කොට දැඩි නියඟය එක වර ආවාම පැය 2, 4, 6, 8 ආදී වශයෙන් ලයිට් කැපුවා. එතකොට මොකක්ද එන ප්‍රශ්නය? සංචාරක ව්‍යාපාරයට බලපානවා. කර්මාන්තශාලා ක්‍රියාත්මක කරන්න බැහැ. තේ කර්මාන්තශාලා ක්‍රියාත්මක කරන්න බැහැ. ඊළඟට අපනයනයට බලපානවා; සමස්ත ආර්ථිකයටම ඒක බලපානවා. ඊයේ ගරු විදුලිබල හා බලශක්ති ඇමතිතුමා මේ සභාවේදී ප්‍රකාශ කළා, මේ කලාපයේ පැය 24ම විදුලිය ලබා දෙන එකම රට ලංකාවයි කියලා.

අද ඉන්දියාවට ගිහිල්ලා බැලුවොත්, ප්‍රාන්තයෙන් ප්‍රාන්තයට පැය ගණන වෙනස් කරමින් විදුලිය කපනවා. නේපාලයේ පැය 14ක් විදුලිය කපනවා. පාකිස්තානයේ පැය 14ක් විදුලිය කපනවා. මේක තමයි තත්ත්වය.

තමුන්නාන්සේලාට මතක ඇති, 2001 අපේ රට සෘණ ආර්ථිකයකට ගියා. ඒකට බලපාපු හේතු මොනවාද? නියඟයත් එක්ක ආපු විදුලිය කැපීමත් ඒකට බලපෑවා. නිෂ්පාදනය පහත වැටුණා. අපනයනය පහත වැටුණා. ත්‍රස්තවාදයට අමතරව මේ හේතූන් නිසා සංචාරක කර්මාන්තය බිඳ වැටුණා. එදා නම් පවා පටබැන්දා. හැබැයි, අද ඒ තත්ත්වය නැහැ. ඩොලර් මිලියන 20,000ක ආනයනයන්ගෙන් 1/4ක් තෙල්. ඒ 1/4න් 1/3ක් විදුලිය නිෂ්පාදනය කරන්න වැය වනවා, අඩු මිලට. නියම පිරිවැයට දුන්නා නම් විදුලිය ඒකකයක පිරිවැය මීට වඩා වැඩි වෙනවා. ඒ බර ජනතාවට යැව්වේ නැහැ. හැබැයි, ඒක පෙනෙන්නේ නැහැ. පෙනෙන සහනාධාරයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොරත් එහෙම නේ. රුපියල් 3,500ක් විතර වටිනා පොහොර මිටියක් රුපියල් 350ට දෙනවා. ඒ මිල වෙනස් වෙනවා. දළ වශයෙන් රුපියල් 3,000යි කියා ගණන් බැලුවොත් රුපියල් 3,000ක පොහොර මිටියක් රුපියල් 350කට දෙන කොට එක මිටියකට රුපියල් 2,650ක් ආණ්ඩුව අතින් දීලා තිබෙනවා. ඒකම තමයි පසු ගිය කාලයේ තෙල්වලටත් වුණේ. රුපියල් 110ක් වන ඩීසල් ලීටර් එකක් රුපියල් 84ට දුන්නා. හැබැයි අපි රුපියල් 26ක් දෙන බව කවුරුවත් දන්නේ නැහැ. ඇයි ඒක අතට ලැබෙන්නේ නැහැ නේ. අදත් එහෙමයි. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල පහත යනවා, ඒ අනුව තෙල් මිල පහත නොදමන්නේ ඇයි කියලා පසු ගිය සති කිහිපය පුරාම පුවත් පත්වල අහලා තිබෙනවා මම දැක්කා. පෙබරවාරි 12 වැනිදා අපි සංශෝධනය කරන කොට පිරිපහදු තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 121-125ත් අතරයි තිබුණේ. ඊළඟ සති දෙකේදී 135 දක්වා වැඩි වුණා. හැබැයි, අපි නැවතත් තෙල් මිල සංශෝධනය කළේ නැහැ. ඒ පාඩුව දරා ගෙන හිටියා. ඒක කාටවත් පෙනෙන්නේ නැහැ. අඩු වෙන කොට අඩු නොකරන්නේ ඇයි කියලා ප්‍රශ්න කරනවා. අපි කිව්වා මැයි මාසයේ 2වන සතියේ ඉඳලා අඩු වෙන්න පටන් ගත්තා කියලා. ඊයේ මොකද වුණේ? ඊයේ -එක දවසක් තුළ- Brent crude oil බැරල් එකක මිල ඩොලර් 7කින් ඉහළ ගියා. දැන් කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ නේ. මම දැන් පළමුවැනි වතාවට කියන තෙක් කිසි කෙනෙක් කිව්වෙත් නැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ, අපි මේ ගැන අපි බලා ගෙන යනවා; මේ තත්ත්වය තවදුරටත් පැවතුණොත් අපි ඒ අනුව පියවරක් ගන්නවා කියලා.

ඒක වුණේ ඇයි? ඇමෙරිකාව තෙල් සංචිත එළියට දැම්මා. යුරෝපා රටවල ආර්ථික අර්බුදයක්, මැද පෙරදිග රටවල දේශපාලන අර්බුදයක් තිබුණා. චීනය සහ ඉන්දියාව ඒ ගොල්ලන්ගේ ආර්ථික සංවර්ධන වේගය downgrade කළා. ඒ එක්කම ඉල්ලුම අඩු වෙලා සැපයුම වැඩි කරපු ගමන් තෙල් මිල පහළ යන්න පටන් ගත්තා. හැබැයි, දැන් මොකද වුණේ? අද පුවත් පත්වල තිබෙනවා, ඊයේ ඇමෙරිකාව තෙල් සංචිත එළියට දැමීම සීමා කළා කියලා. සීමා කරපු ගමන් එක දවසට තෙල් බැරල් එකක මිල ඩොලර් 7කින් වැඩි වුණා. ඒ නිසා සතියකදී, දවස් කිහිපයකදී තෙල් මිල අඩු වුණාට වෙළෙඳ පොළේ තිබෙන්නා වූ අවිනිශ්චිතතාවය නිසා ඊළඟ දවස දෙක තුන ඇතුළත දී නැවත වතාවක් වැඩි වෙනවා. ඉතින් මේවා සලකා බැලීමෙන් පසුව තමයි අපට තීන්දු තීරණ ගන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියන් තෙල් සමාගම ඩීසල් රුපියල් 2කින් වැඩි කරන කොට අපි ඒකට ඉඩ දුන්නේ ඇයි කියලා ප්‍රශ්නයක් ඇහුවා. අපි ඉඩ දෙන්න අවශ්‍යත් නැහැ, ඉන්දියන් තෙල් සමාගම අහන්න අවශ්‍යත් නැහැ. 2002 දී තෙල් සංස්ථාව පෞද්ගලීකරණය කරන අවස්ථාවේ දී ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාවේම තිබෙනවා, "Liberalization of Petroleum Sector" කියලා. ඒකෙම සඳහන් වෙනවා, නිදහස් කිරීම ගැනත්. නිදහස් කරලා මොකද කළේ? ඉන්දියන් තෙල් සමාගම, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ හදන්න හිටපු සමාගම කියන තුනට 1/3 බැගින් කොටස් දුන්නා. එතකොට තුන් දෙනා equal playersලා. ඒ ගොල්ලන් වෙළෙඳ පොළේ සමාන ලෙස වෙළෙඳාම් කළා. ඒ තරගය තුළින් තමයි තෙල් මිල තීන්දු වන්නේ. අද දවසේ ඉන්දියාව ගත්තොත් රිලයන්ස්, බාරත් පෙට්‍රෝලියම් - BP, හින්දුස්ථාන්, ෂෙල් කියන මේ ඔක්කොම ගත්තාට පස්සේ එකම මංසන්ධියක, එකම නගරයක සමාගම් දෙකක petrol sheds දෙකක් අතර මිලේ පරතරයක් තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ -වොෂිංටන් නගරයේ- එසෝ, කැල්ටෙක්ස්, ෂෙල් වාගේ සමාගම් තුනකට ගියොත් මිල ගණන් තුනක් තිබෙන්නේ.

මේ විධියට කිලෝමීටර් 10ක් ඇතුළත මිල ගණන වෙනස් වෙලා තිබෙනවා. සමහර රටවල උදේ තිබෙන මිල නොවෙයි හවස තිබෙන්නේ. ඒ විධියට වෙනස් වනවා. මොකද ඒ වෙළඳ පොළ සකස් කරලා තිබෙන්නේ ඒ level playersලාගේ හැටියටයි. එහෙම තමයි ඒක සඳහන් වුණේ.

එදා විදුලිබල හා බලශක්ති ඇමතිවරයා හැටියට කරු ජයසූරිය මැතිතුමා ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකා තුනේම ඕක සඳහන් කරලා තිබුණා. මේ ආයතනය පෞද්ගලීකරණය කරන අවස්ථාවේදී මේකට නියාමන කොමිසමක් - regulator එකක්- හැදුවේ නැහැ. මේ අවුරුදු 10 තුළම petroleum sector එකට නියාමන කොමිසමක් හෝ නියාමනයක් තිබුණේ නැහැ. එහි ප්‍රතිඵලය හැටියට එය පාලනය කරන්න කෙනෙක් නැහැ. ඒක තමයි නෛතික තත්ත්වය. ඒක තමයි එදා ඒ පෞද්ගලීකරණය කිරීමේ සංකල්පය. දැන් කෙනෙක් අහන්න පුළුවන්, "ඇයි තමුන්නාන්සේට ඒක වෙනස් කරන්න බැරි" කියලා. එතකොට විපක්ෂයෙන් ඊළඟට අහනවා, "දැන් තමුන්නාන්සේලා කොහොමද ආයෝජකයින් ගෙන්න ගන්නේ. මෙහෙම ආයෝජකයෝ එයිද " කියලා. ඒ ප්‍රශ්නය ඊළඟට මතු කරනවා.

ඒ නිසා මම මේ පැහැදිලි කිරීම කරන්න ඕනෑ. මොකද, මම නම සඳහන් කරන්නේ නැහැ, විපක්ෂයේ අපේ හිතවත් ගරු මන්ත්‍රීතුමෙක් මේ ළඟදී පුවත් පත් සාකච්ඡාවක් තියලා මේකට යමක් කියලා තිබුණු බව මම දැක්කා. අපි ඒකට ඒ පුවත් පත්වලට පිළිතුරක් යැව්වා. මම මේ තත්ත්වය පැහැදිලි කළේ ඇයි? තෙල් මිල සංශෝධනය කරන වෙලාවේ -පෙබරවාරි 12 වැනිදාත්- ඉන්දියන් තෙල් සමාගම ඛනිජ තෙල් සංස්ථාවට වඩා රුපියල් අටක් වැඩියෙනුයි ඩීසල් විකිණුවේ. භූමිතෙල් පාඩු නිසා භූමිතෙල් ගෙනාවේම නැහැ. භූමිතෙල් විකිණුවෙත් නැහැ. ඒක තමයි තිබුණු තත්ත්වය. මීට පෙර ඉතිහාසයෙත් විවිධ අවස්ථාවල ඉන්දියන් තෙල් සමාගම මෙහේ ඇවිල්ලා තිබෙන්නේ සහනාධාර දෙන්න නොවෙයි. රාජ්‍ය ආයතනයක් හැටියට අපි -තෙල් සංස්ථාව- රජයේ ප්‍රතිපත්තීන් අනුව සහනාධාර දෙනවා. විදුලි බල ක්ෂේත්‍රයටත් දෙනවා, ජනතාවටත් දෙනවා. එහෙම දුන්නා. හැබැයි වෙනත් ව්‍යාපාරිකයින් මෙහෙට ඇවිල්ලා ඒ සහනාධාර දෙන්න සූදානම් නැහැ. ඉතින් ඒක නිසා ඒ අය පවතින මිල වැඩි කරලා අලාභයක් නොවන විධියට ඒවා පවත්වා ගෙන යනවා.

ඊළඟට අපට චෝදනා කරනවා, මේ රාජ්‍ය ආයතන පාඩු ලබනවා කියලා. ඉතින් ඒකට කෝකටත් තෛලය වාගේ යොදා ගන්නවා, "දූෂණ වංචා" කියන වචනය. ඒක පොදු වචනයක්. හැබැයි මේක විග්‍රහ කළාට පස්සේ තෙල් බැරල් එකක ලෝක වෙළඳ පොළේ මිල, ඒකට එන අධිභාරය එකතු කරලා, අපි තෙල් ගන්නේ ණයට, -අඩුම තරමේ මාස හතර හෝ හයට- ඒකට පොලිය එකතු කරලා, ගොඩ බාන මිල අරගෙන රුපියල්වලට පරිවර්තනය කරලා මෙහේ එකතු කරන tax ටික එකතු කළාම සරල අංක ගණිත ආකාරයට අර ගණක යන්ත්‍රයක් තියා ගත්තාම ඕනෑම කෙනෙකුට මිල තීන්දු කරලා කියන්න පුළුවන්, මෙන්න මේකයි මිල කියලා. මේක කිසි කෙනෙකුට හංගන්න දෙයක් නැහැ. ඉතාම විවෘතයි. මේක මම පැහැදිලි කළේ විවිධ චෝදනා එල්ල වන නිසායි.

ඊළඟට, පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම. පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම අද අලුතෙන් වෙච්ච දෙයක් නොවෙයි. මේ රටේ ඉතිහාසය තුළ අපේ පුස්තකාලයට ගිහිල්ලා හැන්සාඩ් වාර්තා ගත්තොත් නිදහසෙන් පස්සේ පත් වූ ආණ්ඩු හැම දාම පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරලා තිබෙනවා. ඇස්තමේන්තු වෙනස් වෙනවා. යම් පුරෝකථනයක් කළාම ඒ පුරෝකථනය වෙනස් වෙන්න පුළුවන්. ලෝක ආර්ථිකයේ සිදු වන වෙනස්කම්, දේශපාලන ප්‍රශ්න මේ සියල්ල අනුව වෙළෙඳ පොළවල් වෙනස් වෙනවා. එතකොට ඒ අනුව ඇස්තමේන්තු වෙනස් කරන්න වෙනවා. ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්න වෙනවා. මේක අද-ඊයේ පමණක් සිද්ධ වෙච්ච දෙයක් නොවයි.

මට ඇහුණා, ලංගම ගැන කථා කරනවා. දැන් ලංගමට මොකද වුණේ? 1977 වෙන කොට ලංගම ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වුණා. ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක දිවංගත අගමැතිතුමා එදා බස් ජනසතු කරලා, ඊට පස්සේ ලංකා ගමනාගමන මණ්ඩලය හදලා, එදා අනිල් මුණසිංහ වැනි සභාපතිවරුන් යටතේ ඉතාම සාර්ථකව මේ රටේ ගමනාගමන මණ්ඩලය ක්‍රියාත්මක වුණා. මොකද වුණේ? 1977න් පස්සේ ආපු ආණ්ඩුව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියට ගිහිල්ලා ලංගමයේ බස් ටික වෙන්දේසි කළා. වෙන්දේසි කරලා පෞද්ගලික බස් සේවාවක් ආරම්භ කළා.

අද පෞද්ගලික අංශයට බස් 18,000ක් තිබෙනවා. අද ලංගමයට තිබෙන්නේ 6,000කට ආසන්න බස් ප්‍රමාණයක්. එතකොට එදා ගත්ත සේවක සංඛ්‍යාව එහෙමම ඉන්දෙද්දි බස් ටික වෙන්දේසි කළා. Spare parts, engines පවා වෙන්දේසි කළා. හැබැයි සේවකයෝ එහෙමම හිටියා. දැන් සේවකයෝ එහෙමම ඉන්නවා, බස් ටික නැහැ. ඕකමනේ තෙල් සංස්ථාවටත් කළේ. තෙල් සංස්ථාව තුනට කඩලා තුනෙන් එකක් වික්කා. සේවකයෝ 6,000ක් හිටියා. තවම ඒ ගණන ඉන්නවා. එහෙම නම් 2,000ක් ගෙදර යවන්න තිබුණා නේ. එදා ගෙදර යවන්න තමයි හිටියේ.

2004 එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව ආවේ නැත්නම් තෙල් සංස්ථාව කියලා එකක් අද නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කැබිනට් පත්‍රිකාවේම තිබෙනවා තෙල් සංස්ථාව SriLankan Airlines වාගේ public company එකක් බවට -පොදු සමාගමක් බවට- පරිවර්තනය කරන්න ඕනෑ කියලා. ඒක තමයි එදා තිබුණේ. හැබැයි මේ රජයන් දෙක අතර ප්‍රතිපත්තිමය වෙනසක් තිබෙනවා. අපි මහජන දේපල විකිණුවේ නැහැ; සේවකයෝ ගෙදර ඇරියේ නැහැ. එදා ලක්ෂ 3කින් අඩු කරන්නට නිමිතව තිබුණ රාජ්‍ය සේවක සංඛ්‍යාව අද අපි මිලියන 1.2 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ සියලු දේවල් අපි කරලා තිබෙනවා.

ලංගමයට වුණේ එදා හොඳට තිබුණ ලංගමය මරලා දැම්ම එකයි. එහෙම කරලා දැන් අපි පරිපූරක ඇස්තමේන්තුවක් ගේන කොට ඒකට එරෙහිව කථා කරනවා. අපි හදන්නේ ලංගමයත් ආරක්ෂා කර ගෙන, ජනතාවට ඕනෑම වෙලාවක -රෑ- ගමන් කරන්න පුළුවන් විධියට සේවය ලබා දෙන්නයි. පෞද්ගලික අංශයේ බස් එහෙම දුවන්නේ නැහැ නේ. ලාභදායී නැත්නම් දුවන්නේ නැහැ. මගීන් හතර පස් දෙනෙකුට පෙට්‍රල් ගහ ගෙන

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

නිකම් දුවන්නේ මොකටද කියලා ඒ අය බස් දුවන්නේ නැහැ. හැබැයි ලංගමය එහෙම කළේ නැහැ. ඒක තමයි වෙනස. රජයන් දෙකක, ප්‍රතිපත්තීන් දෙකක් අතර වෙනස. එතුමන්ලාගේ ප්‍රතිපත්තිය මත ඉඳ ගෙන එතුමන්ලා මෙහෙම විවේචනය කරන එක සාධාරණයි. එතුමන්ලා අනාගතයේ යම් කිසි දවසක බලයට අවොත් කරන දේ තමයි ඔය කියන්නේ. ජනතාව තීන්දුවක් ගන්න ඕනෑ ඒ ක්‍රමයට යනවාද, නැත්නම් මේ ක්‍රමය යටතේ සුබ සාධන රාජ්‍ය ක්‍රමයක් තුළ තිබෙන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවාද කියන කාරණය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට කොටස් වෙළෙඳ පොළ ගැන බලමු. කොටස් වෙළෙඳ පොළ සම්බන්ධයෙන් මහ බැංකුවේ මැදිහත් වීම සම්බන්ධව තමයි අද මේ විවාදයේ වැඩිම වෙලාවක් කථා කළේ. පෙරේදා මුදල් රෙගුලාසි යටතේ පැවැති විවාදයේත් වැඩිම වෙලාවක් ඒ ගැන කථා කළා. ඊට පෙරත් එහෙමයි. හැබැයි ඕකට අපේ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා මේ සභාවේදීම පිළිතුරු දීලා තිබෙනවා. හැම දාමත් පිළිතුරු දෙනවා. කාලය නාස්ති කරමින් ඒ ගැන මීට වඩා යමක් කියන්න අවශ්‍ය වන්නේ නැහැ කියා මම හිතනවා.

කොළඹ මහ නගර සභාව ගැනත් කථා කළා. කොළඹ මහ නගර සභා ප්‍රදේශයේ කුණු ටික ඇදෙන්නේ, පාරේ කුණු ටික නියමිත වෙලාවට ඉවත් කෙරෙන්නේ, ක්‍රීඩා පිට්ටනි ටික සකස් වෙන්නේ, කොළඹ නගරය මේ ආකාරයෙන් පිරිසිදුව පවතින්නේ කවදා ඉඳලාද? ඉතිහාසය පුරාවටම -ගරු ෆවුසි ඇමතිතුමා හිටපු මාස කිහිපයක් ඇරුණාම- තිබුණේ එක්සත් ජාතික පක්ෂ පාලනයනේ. දැනට අවුරුදු දෙකහමාරකට, තුනකට කලින් නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශය යටතට ආවාට පසුවයි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා මැදිහත් වෙලා බ්ලූමැන්ඩල් කුණු කන්ද අයින් කළේ. එතෙක් කුණු ටික ඇද ගන්න බැරි වුණා නේ. තව ලොකු දේවල් කථා කරනවා. කොළඹ මහ නගර සභාවේ ආදායම කොපමණද? ඒ ආදායමත් එක්ක, ඒ ටිකවත් කරන්න බැරි වුණා.

අද කොළඹ නගරය මේ තිබෙන මට්ටමට ඇවිල්ලා තිබෙන්නේ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ මහ පෙන්වීමෙන් එම කාර්ය මණ්ඩලය යොදවලා, මේවා පිරිසිදු කරලා, නියමිත වෙලාවට කටයුතු කිරීම නිසායි. දැන් විනෝද බද්දක් අල්ලා ගෙන කථා කරනවා. විනෝද බද්ද මොකක්ද? විනෝද බද්ද වාගේ කී ගුණයක් මුදල් කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධනයට අද රජය යොදවලා තිබෙනවාද? මේ සංවර්ධනයට රජය මේ මුදල් යෙදවූයේ නැත්නම් අද කොළඹ මහ නගර සභාව කොහොමද? එතකොට මොකද කියන්නේ? ඒක නිසා අපි මේවා ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ. එක පැත්තක්, එක ඉලක්කයක් ගැන විතරක් හිතලා හරි යන්නේ නැහැ. විපක්ෂයේ කාර්ය භාරය තමයි එතුමන්ලා ඉටු කරන්නේ කියලා අපි දන්නවා. එදිනෙදා මතු වන කාරණයක් අල්ලා ගෙන ඒක එතුමන්ලා ප්‍රස්තුතයක් කර ගන්නවා. හැබැයි සමස්තයක් වශයෙන් මේ කාල සීමාව තුළදී ලෝක ආර්ථික අවපාතයන්, දේශපාලන ප්‍රශ්න, ලෝකයේ විවිධ රටවල ඇති වන යුද්ධයන් වාගේ සියල්ලත් එක්ක රටේ ආර්ථික සංවර්ධනය කළමනාකරණය කර ගෙන යෑම පිළිබඳව නැවත හිතන්නයි කියන කාරණය ඉතාමත් පැහැදිලිව මේ අවස්ථාවේදී සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහාම ස්තුතියි, ගරු ඇමතිතුමා. මී ළඟට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලබා දී තිබෙනවා.

[අ. භා. 6.32 ]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ඉඳලා මේ විවාදය පවත්වන්නේ පරිපූරක ඇස්තමේන්තු ගැනයි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

About Advance Accounts.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Yes, about Advance Accounts. I am sorry. අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කිව්වා වාගේ හැම ආණ්ඩුවකින්ම සිද්ධ වෙන කාරණයක් මේක; හැම ආණ්ඩුවකින්ම මෙවා අනුමත කර ගන්නවා. හැබැයි විරුද්ධ පාර්ශ්වයේ අපේ යුතුකම තමයි ඒවායේ සීමාව ඉක්මවා ගියාම ඒ සම්බන්ධයෙන් කථා කිරීම.

අද ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කථා කළා, මේ රටේ සංවර්ධනය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසු ගිය අවුරුද්ද දිහා හැරිලා බැලුවොත් මේ රටේ තිබෙන හැම ගෘහයකම - household - වියදම සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. මම හිතන්නේ මහා ආර්ථික විශ්ලේෂණ අවශ්‍ය නැහැ ඒක කියන්න. පසු ගිය අවුරුදු එක හමාර තුළ ඕනෑම ගෘහයක වියදම සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. ඒක නැහැයි කියලා කාටවත් කියන්න බැහැ. ඉතින් අපි අහන්නේ වියදම සියයට 50කින් වැඩි වුණාම, ඒ අයගේ ආදායම - household income - සියයට 50කින් වැඩි වෙලා තිබෙනවාද කියලායි. මේක බොහොම සරල ප්‍රශ්නයක්. අපි යන යන තැන අපට ඇහෙන්නේ, "ජීවත් වන්න බැහැ" කියන එක. සමහර පවුල්වල දෙන්නෙක් රැකියා කරනවා. ඒත් ජීවත් වන්න බැහැ. ඉතින් මේකට ආණ්ඩුව උත්තරයක් දෙන්න ඕනෑ. හැම ගෘහයකම වියදම සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. සමහර අවස්ථාවල සියයට 60 දක්වාත් වැඩි වෙලා තිබෙනවා. නමුත් අපේ ආදායම වැඩි වෙලා නැහැ. ඉතින් මේ ප්‍රශ්නයට තමයි ආණ්ඩුව උත්තරයක් දෙන්න ඕනෑ.

අද දවසේ කරපු කථා දිහා බැලුවාම අපට පෙනෙන්නේ අපේ රට විශාල ණය උගුලක -debt trap එකක- හිර වෙලා ඉන්න බවයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ ආදායම මදි, අපි අරගෙන තිබෙන ණයයි, පොලියයි ගෙවන්න. අපේ රටේ අවුරුද්දේ ආදායම මදි, අරගෙන තිබෙන ණයවල වාරිකයයි පොලියයි ගෙවන්න. එතකොට technically, අපේ රට බංකොලොත් කියලා තමයි ගණන් ගන්නේ. මොකද, ඕනෑම කෙනකුගේ ණය වාරිකයයි, පොලියයි ගෙවන්න ඔහුගේ ආදායම මදි නම්, අධිකරණය වුණත් ගණන් ගන්නේ ඒ පුද්ගලයා බංකොලොත් කියලායි. ඒක තමයි අද අපේ රටේ තත්ත්වය. මාස හයකට සැරයක් එක්කෝ වාණිජ බැංකුවකින්, එහෙම නැත්නම් ලෝක බැංකුවෙන්, එහෙමත් නැත්නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණයක් ගත්තේ නැත්නම් ආණ්ඩුව පවත්වා ගෙන යන්න බැහැ. මෙන්න මේක තමයි සත්‍යය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුරෝපය හොඳ පූර්වාදර්ශයක් දීලා තිබෙනවා. අයිස්ලන්තය තමයි යුරෝපයේ බංකොලොත් වුණ පළමුවන රට. Iceland is the first country to go bankrupt in Europe. අයිස්ලන්තය ප්‍රජාතන්ත්‍රවාදී රටක්; මැතිවරණ පවත්වන රටක්; නීතියේ උත්තරීතරභාවය තිබෙන

රටක්. යුරෝපීය ප්‍රමිතීන් - European standards - අනුව ඒ රට පාලනය වනවා. නමුත් අයිස්ලන්තයේ හිටපු අගමැතිවරයාට විරුද්ධව අද අධිකරණයේ නඩුවක් දාලා. අයිස්ලන්ත අධිකරණයේ ඔහුට විරුද්ධව නඩුවක් දාලා උත්තර දෙන්න වෙලා තිබෙනවා. ඔහුට තිබෙන පළමුවන චෝදනාව මොකක්ද? පළමුවන චෝදනාව තමයි, අයිස්ලන්තය ණය උගුලක පැටලවීම. රටට ගෙවා ගන්න බැරි ණය අරගෙන, රට ණය උගුලක පැටලවීම තමයි අයිස්ලන්තයේ හිටපු අගමැතිවරයාට තිබෙන පළමුවන චෝදනාව. දෙවන චෝදනාව තමයි ප්‍රතිලාභ නැති ව්‍යාපෘතිවලට මුදල් යෙදවීම. තුන්වන චෝදනාව තමයි ඒ ගත් ණය මුදල්වලින් සියයට 30ක් දූෂණය හරහා නාස්ති කිරීම.

අපි දන්නා විධියට ප්‍රථම වතාවට, ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන, නීතියේ උත්තරීතරභාවය තිබෙන බටහිර රටක හිටපු පාලකයකුට විරුද්ධව නඩු දාලා අද ඔහුට උත්තර බඳින්න සිද්ධ වෙලා තිබෙනවා. මේක අපේ රටට කොච්චර ගැළපෙනවාද කියන එක අනාගතයේදී අපට බලාගන්න වෙයි.

මා කලින් කිව්වා වාගේ අපේ රටේ අවුරුද්දක ආදායම මදි, ලබා ගත් ණය වාරිකයි පොලියයි ගෙවන්න. එතකොට දැන් ආණ්ඩුවට සල්ලි නැහැ. දැන් කොහේද සල්ලි තිබෙන්නේ කියලා හැම තැනම හොය හොයා යනවා. ඒක තේ කරන්නේ. කොහෙද සල්ලි තිබෙන්නේ? එතකොට අර්ථසාධක අරමුදල දැක්කා; ඒකට අනින්න හැදුවා. හොඳ වෙලාවට මේ රටේ මහා විරෝධයක් ඇවිල්ලා ඒක නැවැත්තුවා.

ඊට පස්සේ බැලුවා, තව කොහේද සල්ලි තියෙන්නේ කියලා. එතකොට දැක්කා NSB එක. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ - NSB - accounts මිලියන 16ක් තිබෙනවා. There are 16 million accounts. සල්ලි නැති නිසා ආණ්ඩුව දැන් මේක දිහා ඇහ ගහගෙනයි ඉන්නේ. ඉතින් මේ විධියට කොච්චර කල් කරන්නද? සේවක අර්ථසාධක අරමුදලේ මුදල් සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුදල් කාබාසිනියා කෙරුවොත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. මට මතක විධියට ජාතික ඉතිරි කිරීමේ බැංකුව 1970 ගණන්වලයි පටන් ගත්තේ. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට සල්ලි තැන්පත් කළාට පස්සේ පොලියක් දුන්නේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන්. මම නීති විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ තමයි ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ඇවිල්ලා ඒ බැංකුවේ ශාඛාවක් මහනුවර විවෘත කළේ. දැන් ආණ්ඩුවට සල්ලි නැති නිසා, සල්ලි තියෙන තැන් හොයා ගෙන හොයා ගෙන යනවා. ඒකයි අද වෙන්නේ. තමුන්නාන්සේලාගේ හදවත්වලට තට්ටු කරලා බැලුවොත් තේරෙයි, ඒක තමයි අද වෙන්නේ කියලා.

දැන් තමුන්නාන්සේලා සංවර්ධනයක් ගැන කථා කරනවා. කොහේද කර්මාන්තශාලාවක් ඇරලා තිබෙන්නේ රක්ෂාවල් දෙන්න? මට එකක් කියන්න. තමුන්නාන්සේලා කියනවා සංවර්ධනය වෙනවා කියලා. කොහේද කර්මාන්තශාලාවක් ඇරලා තිබෙන්නේ? එකක්වත් නැහැ. මහින්ද චින්තනයේ කිව්වා, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම කර්මාන්ත ශාලාවක් ඇරලා රැකියා 500ක් දෙනවා කියලා. මගේ දිස්ත්‍රික්කයේ -මහනුවර- ඇඟලුම් කර්මාන්තශාලා 30, 40ක් වහලා තිබෙනවා ගිය අවුරුදු පහ ඇතුළත. පල්ලේකැලේ නිදහස් වෙළෙඳ කලාපයේ තිබුණා computer chip හදන විශාල කර්මාන්තශාලාවක්. එක වතාවක 4000ක පිරිසක් එම කර්මාන්තශාලාවේ වැඩ කෙරුවා. ඒක අද වහලා. කලුතර දිස්ත්‍රික්කයේ කර්මාන්තශාලා ඇරලා තිබෙනවාද? උතුරේ ඇරලා තිබෙනවාද? එහෙම ඇරලා තිබෙනවා නම් තමයි සංවර්ධනය කියන්නේ. මොකද, කර්මාන්තශාලාවක් ඇරියාම තමයි රැකියා හම්බ වෙන්නේ. ඒ වාගේම නිෂ්පාදනයක් ඇති වෙන්නේ. ඒ නිෂ්පාදන අපට අපනයනය කරන්න පුළුවන්. ඉතින් මොකක්ද දැන් මේ තිබෙනවාය කියන සංවර්ධනය?

අද කෘෂිකාර්මික දියුණුව ගැන කථා කරනවා. ඔබතුමන්ලා අක්කර සිය දහස් ගණන් කෘෂිකර්මයට යට කරලා තියෙනවාද? කොහේද ගොවි ගම්මාන විවෘත කරලා තිබෙන්නේ? මහවැලියේ ඉඩම් තිබෙනවා විශාල වශයෙන්. නමුත් කොහේද ගොවි ගම්මාන විවෘත කරලා තියෙන්නේ? ඉතින් මොකක්ද අද වෙලා තිබෙන්නේ? අද ගොවීන්ට වී විකුණා ගන්න බැහැ. මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේ මිනිපේ, හසලක ජනපද ව්‍යාපාර තිබෙනවා. මට ඒ අය ඊයේ දුරකථනයෙන් කථා කරලා කිව්වා, 2010 සහ 2011 යල් කන්නයේ වී මේ වන විටත් ගබඩාවල තියෙනවා කියලා. මෙම කන්නයේ වී තවමත් නොගන්නේ මෙම ගබඩා හිස් නොවූ නිසාය කියනවා. එතකොට මොකක්ද මේ කියන සංවර්ධනය? අපේ ගොවි ජනතාව ගැන තමුන්නාන්සේලා ලොකුවට කථා කරනවා, "වැවයි, දාගැබයි - ගමයි, පන්සලයි" කියලා. නියර උඩින් දුවනවා පෙන්වනවා. නමුත් අපේ අහිංසක ගොවීන්ගේ වී ටික විකුණා ගන්න බැහැ. දැන් තමුන්නාන්සේලා මැතිවරණ ගැන කථා කරනවා. එක් මන්ත්‍රීවරයෙක් කථා කරලා කිව්වා ආණ්ඩුව ජනප්‍රියද, නැද්ද කියලා මනින්න පුළුවන් එකම දේ මැතිවරණ ජයග්‍රහණයයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ලියුමක් කියවන්නම්. මේක උතුරු මැද පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් ලියාපු ලියුමක්. උතුරු මැද පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනා අත්සන් කරලා ජනාධිපතිතුමාට ලියුමක් ලියලා තිබෙනවා. මම මේ ලියුමේ වගකීම භාර ගන්නවා. "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, ජනාධිපති මන්දිරය, කොළඹ" කියන ලිපිනයට තමයි ලියලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මොකක්ද ඔය පත්තරේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
It is a letter.

"නියමිත කාලයට පෙර පළාත් සභා විසුරුවා මැතිවරණයකට යෑමෙන් වළකින ලෙස කරනු ලබන ඉල්ලීම." මේක ලියලා තිබෙන්නේ උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරු. මේ ලිපිය අධිකරණයටත් ඉදිරිපත් කෙරුවා. මම මේ ලිපියේ වගකීම භාර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ලිපියේ සඳහන් වෙනවා, "උතුරු මැද පළාත් සභා මැතිවරණය නියමිත කාල සීමාවට ප්‍රථම පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇති බව විවිධ ජනමාධ්‍ය ඔස්සේ මේ දිනවල ප්‍රචාරය වෙමින් පවතී. මේ පිළිබඳව 2012.04.09 වැනි දින උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය සමඟ පැවැති ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ රැස්වීමේදී එතුමාද ප්‍රකාශ කර සිටියේ එවන් වාතාවරණයක් නිර්මාණය වෙමින් පවතින බවයි. මේ පිළිබඳව අප ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සියලු දෙනාගේම අදහස වූයේ මෙම වකවානුව තුළ උතුරු මැද පළාත තුළ පවතින දේශපාලන වාතාවරණය කිසි සේත්ම මැතිවරණයකට නුසුදුසු බවයි. වී අළෙවි කිරීම සම්බන්ධයෙන් මෙන්ම එළවලු අළෙවිය, ජීවත් වීමේ ප්‍රශ්න, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පිළිබඳ ගැටලු රැසක් උද්ගත වී ඇත. මේ දිනවල ඉන්ධන මිල ඉහළ යෑම වැනි කරුණු නිසා අවාසි සහගත තත්ත්වයක් ඇත. එබැවින් මේ පිළිබඳ විධිමත් අවධානයකින් පසු හදිසි මැතිවරණයකට නොගොස් නියමිත කාලයට මැතිවරණය පැවැත්වීමට කටයුතු කරන ලෙසට ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු. එසේම හදිසි මැතිවරණයකට මුහුණ දීම සම්බන්ධයෙන් අප දැඩි අපහසුතාවකට පත් වී ඇති බව දන්වමු." කියා.

බර්ටි ප්‍රේමලාල් දිසානායක මහ ඇමතිතුමා ඇරෙන්න අනික් සියලු දෙනාම මේ ලියුමේ අත්සන් කර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නමුත් නඩු තීන්දුව වෙනස් නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නඩු තීන්දුව වෙනස්. මම නඩු තීන්දුව ගැන කථා කළේ නැහැ. මම කිව්වේ උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරු ජනාධිපතිතුමාට ලියන ලද ලියුමක් ගැනයි. ඉතින් මේ ලිපියෙන් පෙනෙනවා, උතුරු මැද පළාත් සභාවේ තිබෙන තත්ත්වය. මෙය තමයි නියම තත්ත්වය. උතුරු මැද කියන්නේ තමුන්නාන්සේලාගේ හදවත; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හදවත. ඉතින් හදවතේ මන්ත්‍රීවරු ඒ අයගේ ප්‍රශ්න ගැන කියනවා නම් අනික් පළාත්වල අය ගැන කථා කරන්න අපට අවශ්‍යතාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කලිනුත් කිව්වා. ඒ තමයි රජයේ ආදායම සහ වියදම. දැන් බලන්න සංස්ථා දිහා. සංස්ථා සියයට 95ක් පාඩු ලබනවා. Ninety five per cent of the corporations are running at a loss. එතකොට කොහොමද ආණ්ඩුවක් පවත්වාගෙන යන්නේ? මම පුදුම වුණා, අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කථා කරන කොට. රාජ්‍ය ආයතන ආරක්ෂා කරනවා කියලා එතුමා කිව්වා. රාජ්‍ය ආයතන ආරක්ෂා කරන්න ඕනෑ. මම ඒක පිළිගන්නවා. නමුත් හැම ආයතනයක්ම පාඩුවට දුවනවා නම් කොහොමද ආණ්ඩුවක් පවතින්නේ? අප මේ සංස්ථාවලට විරුද්ධ නැහැ. නමුත් ඒවා ලාභදායී විධියට දුවන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලංකාවේ විතරක් නොවෙයි, සිංගප්පූරුවේත් රාජ්‍ය ආයතන තිබෙනවා. බටහිර රටවලත් රාජ්‍ය ආයතන තිබෙනවා. නමුත් ඒවා ලාභයටයි දුවන්නේ. දැන් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? මැතිවරණ දිනන්න කිසිම සීමාවකින් තොරව රැකියා දුන්නා. ඒක ඇත්ත නේ, අසත්‍යයක් නොවෙයි නේ.

අප COPE එකේ රැස්වීම්වලට ගියාම මට හැම දාම හිතට එන එක දෙයක් තිබෙනවා. ඒ මොකක්ද? මේ ආයතන තිබෙන්නේ ඒ ආයතන තුළ වැඩ කරන අයට විතරයි කියන එක. ඒවායින් මහජනතාවට සේවයක් වෙනවා. නමුත් ඒ සේවයට අධික මිලක් අපට ගෙවන්න වෙලා තිබෙනවා. සාධාරණ මිලක් නොවෙයි අධික මිලක් ගෙවන්න වෙලා තිබෙනවා. එතකොට සංස්ථා සියයට 95ක් බංකොලොත් වෙනවා නම් ආණ්ඩුවක් පවත්වාගෙන යන්නේ කෙහොමද? පසු ගිය මැතිවරණ කාලයේදී ගිය පාර්ලිමේන්තුවේදී අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමාම කිව්වා, " බහිරවයෝ 150ක් ඉන්නවා" කියලා. ඒ රාජ්‍ය ආයතන. එතුමාම කිව්වා. අවුරුද්දේ ආදායම මදි ණය වාරිකයි, පොලියයි ගෙවන්න. සංස්ථාවලින් සියයට 95ක් බංකොලොත්.

අපේ ගොවීන්ගේ වී ටික විකුණා ගන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න දැන් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල දිහා. හැම නිවසකම වියදම සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. අධ්‍යාපනය බලන්න. අද නිදහස් අධ්‍යාපනයක් තිබෙනවාද? ළමයා ඉස්කෝලෙට ඇතුළු කරන දවසේම සල්ලි දෙන්න ඕනෑ. රෝහල්වල තත්ත්වයත් එහෙමයි. ඉස්පිරිතාලයකට නවතින්න ගියොත් ඇඳක් දෙනවා. බෙහෙත් පිටින් ගන්න ඕනෑ. එතකොට ඉන්ධන මිල, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල කොච්චර ඉහළ ගිහින්ද? මට ආරංචියක් ලැබුණා. එය ඇත්තද දන්නේ නැහැ. මට ලජ්ජා හිතුණා. ආණ්ඩුව කොච්චර බංකොලොත්ද කියලා හිතෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට වැඩියෙන්ම ආදායම එන්නේ විදේශ රටවලට අපේ කාන්තාවෝ යවන එකෙන් නේ. ඒ අය එවන මුදල්. ඒ අය ගිහිල්ලා ඒ රටවල කම්කරුවෝ හැටියට වැඩ කරනවා. මා දන්නේ නැහැ, මෙය නිවැරදිද කියලා. මට විශ්වාසවන්ත තොරතුරක් ලැබුණා. මේ විදේශ රැකියා සමාගම්වලට කියලා තිබෙනවාලු, අවුරුද්දකට මෙච්චර ප්‍රමාණයක් අනිවාර්යයෙන්ම පිට රට යවන්න ඕනෑය කියලා. They have made it compulsory for employment agencies to send a minimum number of females abroad. අවුරුද්දකට කාන්තාවෝ මෙච්චර ප්‍රමාණයක් පිට රට යවන්න ඕනෑ, නැත්නම් Licence එක cancel වනවාය කියලා කියා තිබෙනවාලු. සදාචාරය ගැනයි කථා කරන්නේ. වේදිකාවට නැඟලා දේශීයත්වය ගැනයි කථා කරන්නේ. මේ වාගේ තත්ත්වයක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ වේලාව අවසන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will conclude. එක මන්ත්‍රීවරයෙක් කථා කරලා කිව්වා, COPEඑකට ගියාම අපට ප්‍රශ්න අහන්න පුළුවන්, ඒ ප්‍රශ්නවලට උත්තර ලැබෙනවාය කියලා. දැන් එතුමා මෙතැන නැහැ. මා එතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණය ගැන දන්නවාද? දැන් මැතිවරණය ගැන කථා කළා නේ. මැතිවරණයක් පවත්වන කොට ක්‍රීඩා පිටිය සමව තිබෙන්න ඕනෑ. There must be a level playing field. 2005 ඉඳලා 2010 දක්වා මේ එක්සත් ජනතා නිදහස් සන්ධානය දැන්වීම් දාන්න රූපවාහිනිය පාවිච්චි කළ බව ඔබතුමා දන්නවාද? නමුත් එක ශතයක් ගෙවලා නැහැ. They have not paid one cent for Rs. 47 million worth of advertisements. 2005 ඉඳලා 2010 දක්වා මිලියන 47ක් ගෙවලා නැහැ. මා රූපවාහිනියේ සභාපතිගෙන් ඇහුවා, ඇයි මේ මුදල අය කර ගත්තේ නැත්තේ කියලා. කට උත්තර නැහැ. Rs. 47 million. ඒ අවස්ථාව අපට තිබෙනවාද? ඒ කරපු සේවයට ඒ සභාපතිවරයාට පිට රට තානාපතිකමකුත් දුන්නා. අප මේවා ඉදිරිපත් කරන්නේ රට වෙනුවෙන්. NSB එක -ජාතික ඉතිරි කිරීමේ බැංකුව- වාගේම අර්ථසාධක අරමුදලේත් විශාල අර්බුදයක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ වේලාව අවසන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will finish. හැබැයි මෙතැන නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු දේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ. The law must follow.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකමක් කරලා හොරා අහු වුණාට පස්සේ හොරා කියනවා, "මම බඩු ටික ආපසු දෙනවා. මට කරදර කරන්න එපා." කියලා. It cannot so happen. ඒ විධියට වෙන්න බැහැ. He cannot return the goods and say - හොරකම් කරපු බඩු ටික ආපසු දීලා කියන්න බැහැ, "මට නීතියෙන් කටයුතු

කරන්න එපා." කියලා. ඒ වාගේ තත්ත්වයක් තමයි දැන් නිර්මාණය වෙමින් යන්නේ. ආණ්ඩුව කියනවා, "අප ඒක නැවැත්තුවා. ඒ මුදල් ගනුදෙනු නැවැත්තුවා." කියලා. It is a clear case of insider trading.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ වාගේ ගනුදෙනු වුණාම ආයෝජකයන් අපේ රටට එයිද? රජයේ ප්‍රතිපත්තිය හරියට තිබෙන්න ඕනෑ. මා හැම දාම මේ පාර්ලිමේන්තුවේදී කියලා තිබෙනවා, මේ රටට ආයෝජකයන් එන්න නම් ඉස්සෙල්ලාම කරන්න ඕනෑ නීතියේ උත්තරීතරභාවයක් ඇති කරන එකයි කියලා. There must be a rule of law. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයෝජකයෙක් ලංකාවට ඇවිල්ලා ඔහු මුදල් වැය කරලා ව්‍යාපාරයක් පටන් ගත්තාට පස්සේ ඒක පවරා ගන්න යනවා නම් කවුද ලංකාවට එන්නේ? තමුන්නාන්සේලාම නීතියක් ගෙනාවා, ව්‍යාපාර පවරා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ළඟ දී සිංගප්පූරුවේ ඇමතිවරයෙක් ලංකාවට ආවා. මා හිතන්නේ Minister of Foreign Affairs. මා දැක්කා, පුවත් පතක ඒ ගැන කියලා තිබෙනවා. ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ එතුමාගේ යාළුවකුගේ ව්‍යාපාරයකුත් පවරා ගන්න ගියාය කියනවා. එතකොට කොයි ව්‍යාපාරිකයාද ලංකාවට එන්නේ? මට නම් තේරෙන්නේ නැහැ, මේ විධියට ව්‍යාපාරිකයෝ ඇද ගන්න කටයුතු කරන්නේ කොහොමද කියලා. මේ සම්බන්ධයෙන් අපට උදේ වන තුරු කථා කරන්න පුළුවන්. මට වේලාව ලබා දීම ගැන මගේ ස්තුතිය පළ කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ගීතාංජන ගුණවර්ධන ඇමතිතුමා.

[අ. භා. 6.52]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප මේ විවාදය ආරම්භ කරන්නට යෙදුණේ රජය ඉදිරිපත් කරපු අත්තිකාරම් ගිණුම් ගැන සහ ඒ පිළිබඳව කරුණු කාරණා සාකච්ඡා කරලා ඒ තුළ ආපු එකඟතාවක් තුළයි. නමුත් විරුද්ධ පක්ෂය ඉදිරිපත් කළ මේ කල් තැබීමේ අවස්ථාවේ යෝජනාව තුළ, තවත් අතිරේක කාරණා ඉදිරිපත් කිරීම තුළ මෙහි ප්‍රධාන කාරණාව හැටියට අත්තිකාරම් ගිණුම් ගැන කියවුණාය කියන ටික කියන්නටත් අමාරු තරම්. මා හිතන විධියට ඉදිරිපත් කර තිබෙන කාරණා පැහැදිලිවම අමාත්‍යාංශ ගණනාවකට අයිතියි. ප්‍රවාහන අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඇතුළු මේ සියලු අමාත්‍යාංශවල වැටුප් අත්තිකාරම් පිළිබඳව ඉදිරිපත් කළ ඒ කරුණු කාරණා ගැන අප කථා කළේ නැහැ. මෙය සම්මත කළ අත්තිකාකරම් ගිණුමක් ගැනයි කියන ටික අප දන්නවා. ඒ උඩ ලබා දුන් කල්තැබීමේ විවාදය තුළ විශේෂයෙන් මෙම කරුණු ගැඹුරින් සාකච්ඡා නොකිරීම පිළිබඳව මෙහි යම් එකඟතාවයක් වන්නට පුළුවන් පළ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළමුවන වතාවට නොවෙයි. මෙය මීට පෙරත්, 2011 වර්ෂයේත්, එලෙසම සම්මත කර තිබෙනවා. මෙම අත්තිකාරම් ගිණුම් පිළිබඳව, එනම් 2010 වර්ෂයේ ඒ සීමාවන් ඉක්ම ගිය ආකාරය පිළිබඳව කරුණු කාරණා සාකච්ඡා කොට -2011 ජුනි මාසයේ 21වැනි දා හැන්සාඩ් වාර්තාව -199 වන කාණ්ඩය - 11 වන කලාපයේ 1552 තීරුව- සම්මත කර තිබෙනවා. ඒ නිසා තවදුරටත් ඒ පිළිබඳව කථා කිරීම නොවෙයි මගේ බලාපොරොත්තුව. විශේෂයෙන් ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා හිටපු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා විධියට මෙම විවාදයේ අවසාන කථාවේදී තවත් කරුණු පැහැදිලි කරාවිය කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මවපු චිත්‍රය ගැන පළමුව අප මතක් කරන්නට ඕනෑ. චීන ආධාර ගැන තමයි දැන් තිබෙන භීතිකාව. It is a China syndrome. ඒක තමයි විපක්ෂයට හැදිලා තිබෙන භීතිකාව. චීනය ගැන තිබෙන භීතිකාව. චීන ණය ගැන තිබෙන භීතිකාව. 1952 එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ආර්.ජී.සේනානායක මැතිතුමා අමාත්‍යවරයා හැටියට චීනය සමඟ ඇති කරගත් රබර්-සහල් ගිවිසුමේ සිට අප චීනයත් සමඟ මේ කාරණා ඉදිරියට ගෙන ගොස් තිබෙනවා. එතුමා 1956 රජයේ වෙළඳ අමාත්‍යවරයා හැටියට මේ ගිවිසුම ඉදිරියට ගෙන යමින් 1956 රජය ඇති කර ගත් චීන සබඳතා සහ චීනය සමඟ ඇති කර ගත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිළිබඳව දුර දැක කටයුතු කළා.

එදා මහජන එක්සත් පෙරමුණු රජය හැටියට බණ්ඩාරනායක අගමැතිතුමා, ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා, ආර්.ජී සේනානායක මැතිතුමා, ටී.බී ඉලංගරත්න මැතිතුමා ඇතුළු ප්‍රගතිශීලි නායකයින් විසින් ඈත බලා ගත් මේ පියවර අද දහසක් වටිනවාය කියන ටික තමයි අප මතක් කරන්නට ඕනෑ. බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ ඒ පියවර තවත් ඉදිරියට ගෙන යමින් චීන - ලංකා සබඳතාවය තවත් දියුණු කළා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ -ජේ.ආර්.ජයවර්ධන මැතිතුමාගේ කාලයේත්- මේ සබඳතා කඩ කරන්නට හැකි වුණේ නැහැ. අධිකරණ සංකීර්ණය වාගේ දේවලුත් ඇති කරන්නට සහ එලෙසම චීනය සමඟ තිබෙන මිත්‍රත්වයත්, එම ආධාරත්, ණයත් එලෙසම දිගටම ගමන් කළා. ඉන් අනතුරුව චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමියගේ කාලයේත්, අපේ අතිගරු ජනාධිපතිතුමා අග්‍රාමාත්‍යවරයා හැටියට කටයුතු කරපු කාලයේත්, ඉන්පසුව 2005 වසරේ සිට එතුමා ජනාධිපතිවරයා හැටියට කටයුතු කරන කාලය තුළත් මේ සබඳතා දියුණු කර ගනිමින් අප චීනය සමඟ ඇති කර ගෙන තිබෙන මිත්‍රත්වය ඉතා විශ්වසනීය මට්ටමකට ගෙන එන්නට හැකි වෙලා තිබෙනවා. චීනය අපේ දුකේදීත් සැපේදීත් යන දෙකේදීම අපේ මිත්‍රයකු බවට පත් වෙලා තිබෙනවා. ඒ ටික අමතක කරලා තමයි අද චීන භීතිකාවක් පතුරුවන්නට හදන්නේ.

රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා අත්සන් කරපු, ලංකාවේ තුනෙන් එකක භූමි ප්‍රමාණයක් සහ වෙරළෙන් තුනෙන් දෙකකුත් ප්‍රභාකරන්ට ලියා දීපු ගිවිසුම ගැන අද කථා කරන්නේ නැහැ. ප්‍රභාකරන් එක්ක ඒ ගිවිසුමට එදා අත්සන් කළා. ප්‍රභාකරන්ගේ අවශ්‍යතාව සහ බටහිර ලෝකයේ -ජාත්‍යන්තරයේ- අවශ්‍යතාව එදා ඉෂ්ට වුණා නම්, අද අපට මෙලෙස සම්පත් සහ ආර්ථික වර්ධනයක් ගැන කථා කරන්නට බැරි වනවා. නමුත් අද ඒ හෙලුව වසා ගන්නට විවිධ ඇඳුම් අඳිනවා. ඒ තුළ තමයි අද මේ රජය ගෙන යන ආර්ථික වර්ධනය පිළිබඳව උගත් යයි කියා ගන්නා සමහර අය වෙනත් අරමුණු ඔස්සේ මේවා විවේචනයට ලක් කරන්නේ. නමුත් පැහැදිලිව මේ රටට ආදරයක් තිබෙන, මේ රට ගැන, මේ ජනතාව ගැන සිතන සහ මේ ජනතාව ගැන ආදරයක් තිබෙන, පිට රට කුමන්ත්‍රණවලට කත් අදින්නේ නැති පිරිස ඒ ගැන ඉතා පැහැදිලිව හඳුනා ගෙන තිබෙනවා.

අද මේ විවාදය පටන් ගත් අවස්ථාවේ ඉඳලා අපි කියපු දේවල් එදත් අපි කිව්වා. චීන ආධාර පිළිබඳව 2011 ජනවාරි මාසයේ 29වැනිදාත් අපි පැහැදිලි කරලා තිබෙනවා. මේක "බීරි අලින්ට වෙණ ගායනා කරනවා" හා සමානයි. කොච්චර කිව්වත් එය

[ගරු ගීතාංජන ගුණවර්ධන මහතා]

පිළිගන්නේ නැහැ. මොකද, අර වෙනත් හාම්පුතුන් කෙරෙහි විශ්වාසය තබලා, ඒ පැත්තටමයි මේ සියල්ල අදින්නේ. 1951, 1952 කාලයට පසුව චීනය ගැන හිතන අය බලන්න. අද ඔවුන් අපට කියනවා, ලෝකයේ දෙවැනි ආර්ථික බලවතා බවට පත්වෙලා තිබෙන, ආසියාවේ පළමු වැනි ආර්ථික බලවතා බවට පත්වෙලා තිබෙන චීනයත් සමඟ මිතු දමක් ඇති කර ගන්නට යන්න එපා කියලා. අපි චීනය සමඟ විතරක් නොවෙයි, ආසියාවේ අනෙක් රටවල් සමඟත් එවැනිම මිත්‍රත්වයක් තුළ කටයුතු කරමින් සිටිනවා. කොරියානු ආධාරත් අපි ලබා ගන්නවා. ඒ වාගේම ජපන් ආධාරත් අපි ලබා ගන්නවා. ඉන්දියානු ආධාරත් ලබා ගන්නවා. අපේ මිත්‍රත්වය එලෙස සීමා කරලා නැහැ. අන්න ඒ නිසායි මහින්ද චින්තන ආර්ථික ප්‍රතිපත්තිය තුළ මේ රටේ ස්වාධීනත්වය එලෙස ආරක්ෂා කරගෙන අපේ මේ ආර්ථික ගමන් මඟේ අද පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කරන්නේ. 2000 වසරේ අප ලැබූ ඩොලර් 899ක ඒක පුද්ගල ආදායමක සිට 2011 වනකොට එය ඩොලර් 2836ක ඒක පුද්ගල ආදායමක් දක්වා ගමන් කරලා තිබෙනවා. එතකොට අපට මේ චෝදනා නඟන අය එය වැරැදියි කියලා කිව්වාට, අපට ණය දෙන රටවල්, ණය දෙන මූල්‍ය ආයතන, ලෝක බැංකුව සහ අනෙකුත් සියලුම රටවල් එය පිළිගන්නවා. මේ වර්ධනය දරා ගන්නට බැරි වන්නේ හෙලුව වසාගන්න දඟලන අයට පමණයි.

ඒ තුළ අපේ මේ වර්ධනයත්, ඒ වාගේම ඒ වර්ධනයේ ප්‍රතිලාභ ලබන අයත් බලන්න. මා සංඛ්‍යා ලේඛන කිහිපයක් විතරක් දක්වන්නම්. විදුලි බලය ලබා දීම සම්බන්ධයෙන් ගත්තොත්, 2005 වසර වනකොට විදුලි බලය ලබා දුන් පවුල් සංඛ්‍යාව සියයට 77ක් තිබුණු එක, ඒ වර්ධනයත් සමඟ අද වනකොට විදුලි බලය ලබන පවුල් සංඛ්‍යාව සියයට 91ක් බවට පත් වෙලා තිබෙනවා. දුරකථන ලබා දීම සම්බන්ධයෙන් අපේ රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා කියයි. මා ඒ ගැන වැඩිපුර සඳහන් කරන්නේ නැහැ.

දුරකථන පහසුකම් ලබා දීමේ වර්ධනයත් එලෙසමයි. ඒ වාගේමයි ජල සැපයුම. 2005 දී සියයට 75ක තිබුණු ජල පහසුකම අද වන කොට සියයට 84 දක්වා වර්ධනය කරලා තිබෙනවා. රට බංකොලොත් ලු. කවුද බංකොලොත් කියන එක තමයි අපිත් අහන්නට ඕනෑ. රටේ විරැකියාව වැඩියි ලු. කර්මාන්තශාලා ඇති කරලා නැහැ ලු. රැකියා අවස්ථා ඇති කරලා නැහැ ලු. නමුත් 2000 දී සියයට 7.6ට තිබුණු විරැකියා අනුපාතය 2011 දී සියයට 4.2 දක්වා අපි අඩු කරලා තිබෙනවා. ඒ වර්ධනය පිළිබඳව ඉතා පැහැදිලි සංඛ්‍යා ලේඛන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා අපේ රාජ්‍ය ණය පිළිබඳව පැහැදිලි කළා. එදා, 2000 දී සියයට 96.9ක්ව තිබුණු රාජ්‍ය ණය අද සියයට 78.5 දක්වා අපි අඩු කර ගෙන තිබෙනවා. ඒ නිසා කවුරුත් පිළිගන්නට ඕනෑ අපි යම් ඉලක්කයක් තුළ ගමන් කර තිබෙන බව. මෙතුමන්ලා කියනවා, අපි චීනයට යනවා, ණය අර ගන්නවා, රටේ සංවර්ධනයක් නැහැ කියලා. අපි මේවා හංගලා නැහැ. ඔබතුමන්ලා වෙත බෙදා දී තිබෙන, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් සකස් කරපු "සංවර්ධනයෙහිලා ගෝලීය සහයෝගීතාවය" කියන පොතේ 38 වන පිටුව බලන්න. ඒකේ චීන ආධාර පිළිබඳව පැහැදිලිව තිබෙනවා. මම ඒ ටික කියවන්නේ නැහැ. මොකද, කියෙව්වොත් මට ආපහු කියන්න වෙන්නේ, "බීරි අලින්ට වෙණ ගායනා කරනවා වාගේ" කියලායි. ඒ වාගේම මම පැහැදිලිව කියනවා -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Will you reply to the question regarding the ETF matter?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I am not speaking in a UNP courthouse; I am speaking in Parliament.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Yes, I know that. But, we have questioned you -

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

You have the questions and we have the answers. I have answered you three times. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please!

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Answer the question.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කථා කරන කොට මම සවන් දුන්නා. මම හිතන්නේ එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් ඇවිල්ලා දැන් අවුරුදු දෙකකට වැඩියි. ඒ නිසා පාර්ලිමේන්තු සම්ප්‍රදාය ඉගෙන ගන්න කාලය තිබුණා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

You are wasting time.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි- [බාධා කිරීමක්] ඔබතුමා කථා කරන කොට මම සවන් දුන්නා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔබතුමා උත්තර දෙන තුරු මම හිටියේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

All right. Let the Hon. Deputy Minister speak.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ඒ නිසා මම ඉතා පැහැදිලිව කියනවා, මම එදා-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Sir, I am the only Opposition Member who is here now. I have had the courtesy to stay. So, he should have the courtesy to reply to what I asked.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I have not finished my speech. Why do you not have the patience to wait till I finish?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

That is why I am here.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

So, listen to me.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Go ahead.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්නට ඕනෑ මේ කාරණය. මෙතුමන්ලා වීන හීතිකාවත් එක්ක දැන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ සේවක අර්ථසාධක අරමුදල වැනි මේ රටේ ප්‍රධාන රාජ්‍ය ආයතන පහක් පිළිබඳ හීතිකාවක් ජනතාව තුළ ඇති කරන්නයි හදන්නේ. ටී.බී. ඉලංගරත්න මැතිතුමා ඇති කරපු, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙන් තමයි එදා වන තෙක් තමාගේ විශ්‍රාමය ගැන විශ්වාසයක් නොතිබුණු ජනතාවට අලුත් විශ්වාසයක් ඇති වුණේ. අද වන කොට ඒ විශ්වාසය තහවුරු කරලා එහි තැන්පතු ප්‍රමාණය ට්‍රිලියනය දක්වා ගමන් කරලා තිබෙනවා. මම ඒ ගැන එක වචනයක් ආපහු කියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 ජුනි 05 දින හැන්සාඩ් වාර්තාවේ අංක 155 සිට 159 දක්වා තීරුවල සඳහන් මා මේ පිළිබඳව කරපු කථාව **සභාගත*** කරනවා.

මම ඒ හැම වචනයක්ම නැවත ස්ථිර කරනවා, මා කියපු ඒ එක වචනයක්වත් වෙනස් නැහැයි කියලා. ඒ නිසා මම පැහැදිලිව කියන්න ඕනෑ, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5(ඉ) වගන්තිය යටතේ මේ බලය මුදල් මණ්ඩලය වෙත තිබෙනවාය කියලා. ඒ කාරණය මේ දැනුත් මුදල් මණ්ඩලය මට සනාථ කරලා එවා තිබෙනවා. මම ඒ ටික ඉතා පැහැදිලිව කියනවා. 2002 වන තෙක් තිබුණු ඒ Investment Policy එක වෙනස් කරලා අද වෙනත් Investment Policy එකක් ඒක යටතේ ක්‍රියාත්මක වනවාය කියන එක ඉතා ඕනෑකමින් මතක් කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Will you table that, Hon. Deputy Minister?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I am quoting from Section 5 (1)(e) of the Employees' Provident Fund Act, No. 15 of 1958. - [*Interruption.*] There is no need to table an Act of Parliament.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, when the Deputy Minister says that he is quoting, that ends there.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I am not talking about an Act of Parliament.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I am speaking on that.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I am talking about your new revise.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Member, please allow him to wind up his speech.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I am just asking whether he will table those so-called investment guidelines.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

When he says he is quoting, you have no other alternative. He says that he is quoting.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලිව කියන්නේ මෙකයි. 2002 දීත් Investment Policy එකක් ඇති කර තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

2002 දී මාරු කළා නම් අද වන තෙක් පොල් ගෑවද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
පොඩ්ඩක් ඉන්න. 2002 Investment Policy එකේත් මේ පිළිබඳව ප්‍රකාශ වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] 2002 Investment Policy එක රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් ඉල්ලා ගන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Hon. Deputy Minister, may I ask you a question?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
No, I am not giving way.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
He is not giving way. Please let the Deputy Minister speak.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Will you table -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! You cannot disturb him that way.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මම ඒක එදා table කළා. ආපහු table කරන්නේ නැහැ. [බාධා කිරීමක්] මම මුළු කථාවම table කළා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Will you table it? Do you have the courage to table it? Do you have the decency to table it?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
I have tabled the documents earlier. You must be decent enough to read them and accept it.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you must accept what the Deputy Minister says. That is, Parliamentary procedure.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I am asking him to table it.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
If he is not doing that, the matter ends there. If he is not acceding to your request, that is all. Anyway, you cannot disturb him. - [*Interruption.*] Order, please! It is very late in the evening, otherwise I can send you home. Please sit down.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
This is a national matter.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතා පැහැදිලිව කිව්වේ - [බාධා කිරීමක්] මේක නැවත වරක් 2011දීත් වෙනස් කිරීමට යෝජනා කර තිබෙනවා. මේ හැම වතාවකදීම හැම යෝජනාවක් පිළිබඳවම කළමනාකාර මණ්ඩලයෙන් ගන්නා වූ තීරණ 1958 අංක 15 දරන පනතේ 5(ඉ) වගන්තියට අදාළව මුදල් මණ්ඩලය මඟින් ස්ථිර කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය අලුත් දෙයක්ය කියායි මෙතුමන්ලා හිතන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
He has to divulge this. This is public information. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Will you table this so-called document?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you cannot force the Deputy Minister or another speaker to do that.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
Sir, I have tabled my speech.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
You have to table it because this is public interest.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you must follow Parliamentary procedure.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I have tabled my speech, which includes the tabled document contents. What else?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Are you tabling the 2009 -

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I have tabled it. I started my speech saying that and I am tabling the speech and the document that I tabled in my speech last time.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Okay. Hon. Deputy Minister, you address the Chair and wind up your speech.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

What did you table?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

You read my speech. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අලුත් දෙයක් නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, why do you have a sudden rush of blood?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අලුත් දෙයක් නොවෙයි. Employees' Provident Fund එකේ මෙය සඳහන් වෙලා තිබෙනවා. ඊට ඉස්සෙල්ලා අර්ථසාධක අරමුදලේ වාර්තාවල මේ සියලුම කොටස් පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. මේක හොරෙන් කරපු දෙයක් නොවෙයි. මුළු ජනතාවටම මේක ප්‍රකාශ කරලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Why do you not table the minutes of the meeting where you changed the policy?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවසර දෙන්න. මේක පාර්ලිමේන්තුව. මම මන්ත්‍රීවරයෙක්. මම බල්ලෙක් බුරන කොට බුරන්නේ නැහැ. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

මේ කාරණා දෙක තමයි විශේෂයෙන්ම කියන්න ඕනෑ වෙලා තිබුණේ.

මම කියා ගෙන ආවේ රාජ්‍ය බැංකු පෞද්ගලීකරණය සඳහා එක්සත් ජාතික පක්ෂය දරපු උත්සාහය ගැනයි. මේ රටේ මහ භූමියත්, සම්පතුත් විකුණන්නට දරපු උත්සාහය අපි පරාජය කළා. අපි නැවත වරක් අවස්ථාව දෙන්නේ නැහැ, මේ රටේ ජනතාව නොමඟ යවන්න. මේ රටේ ජනතාව නොමඟ යවන්න අවස්ථාව දෙන්නේ නැහැ. පළාත් සභා මැතිවරණ, මහ මැතිවරණ, ජනාධිපතිවරණ තුළින් ජනතාව ඔවුන්ගේ ජන වරම දුන්නා. මේ රට විකුණා ගෙන කන යූඑන්පී කුමන්ත්‍රණයෙන් රට ආරක්ෂා කරන්නටයි ජනතාව මේ රජයට වරම් දුන්නේ. ඉතා පැහැදිලිව ඒ ජනතාව තෙවරක් -තුන්වරක්- එය අනුමත කරන්න කටයුතු කරලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි. ගරු ඇමතිතුමාට කථා කරන්න අවස්ථාව දෙමු.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මේ අවස්ථාවේ වැරදි මතයක් රටට ඉදිරිපත් කරන්නට, විදේශයන්ට ඉදිරිපත් කරන්නට දරන උත්සාහය අපි ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. අවසාන වශයෙන් මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙනවා, විවිධ අමාත්‍යාංශවල අය මෙලෙස අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පැවති විවාදයට අදාළ වන කරුණු ගැන සවන් දෙන්නට පැමිණීම ගැන. ඒ වාගේම ඉදිරිපත් කරපු යෝජනාවට අදාළව විපක්ෂයෙන් කරුණු ඉදිරිපත් නොකිරීම පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ තුළ ඒ කාර්ය භාරය එලෙස ඉටු කරන ගමන් ජනතාවගේ සම්පත්, ජනතාවගේ ජයග්‍රහණ සහ ජනතාවගේ අයිතිවාසිකම් එලෙසම රකින්නට කැප වෙනවාය කියන ටික මතක් කරමින් මම නිහඬ වෙනවා. ඔබතුමාට ස්තුතියි.

[අ. භා. 7.13]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්නට කොපමණ වේලාවක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, විනාඩි 16ක් තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාතෘකාව දුටු විට මා සිතුවේ සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ඉතාම වැදගත් යෝජනාවක්; ඒ පිළිබඳව පිළිතුරු කථාව කරන්න ලැබීමත් සතුටක් කියලායි.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

හැබැයි සිරිත් පරිදිම යෝජනාව ඉදිරිපත් කරපු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැහැ. ඒක මේ ගරු සභාවේ සිරිතක් බවට අද පත් වෙලා තිබෙනවා. මම සතුටු වෙනවා, අඩු ගණනේ ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා -අපේ මිත්‍රයා- මේ අවස්ථාවේ මේ ගරු සභාවේ සිටීම ගැන. එතුමා, මුළු විපක්ෂයම වෙනුවෙන් සාවධානව අසා සිටිවී කියලා මම හිතනවා. විපක්ෂය උත්සාහ කරලා තිබුණේ මේ අත්තිකාරම් ගිණුමේ සීමාවන් විචලනය කිරීම තුළින් ජීවන වියදම වැඩි වුණා කියලා පෙන්වන්නයි. මගේ කථාව ආරම්භ කරද්දීම කියනවා, මේ විවාදය විපක්ෂයට පුස්ස බින්දා වාගේ එකක් කියලා. මේ විවාදය තුළින් විපක්ෂයේ -එතුමන්ලාගේ- අරමුණට කිසිසේත්ම ළඟා වෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විවාදය අස්සෙන් දාලා එතුමන්ලා තව දේවල් කිහිපයක් ගැන කථා කරන්න උත්සාහ කළා. අවිනිශ්චිත ගිණුම ගැන, රජයේ ආයතන තම අරමුදල් ආයෝජනය කිරීම වාගේ දේවල් කිහිපයක් පිළිබඳව කථා කළා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විවාදය මම පැය කිහිපයක් අසා ගෙන සිටියා. මේ විවාදයේදී ඉදිරිපත් කරපු කරුණු හා ඔවුන්ගේ ඒ අරමුණු මේ සභාවට ලිඛිතව ඉදිරිපත් කරලා අප වෙත එවපු කාරණාත් එක්ක කොතෙක් දුරට ගැළපුණාද කියලා ඔබතුමා අසාගෙන ඉන්න ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් කථා කළේ කිසිම ගැළපීමක් නැති, ඔවුන්ගේ මනසේ නිර්මාණය වුණු, රජයට මඩ ගැසීම සඳහා වූ කාරණාවන්ය කියන එක මම කියන්න අවශ්‍යයි. ගරු රවි කරුණානායක මැතිතුමා මුලින්ම කියලා තිබෙනවා, මේ රජයේ වියදම් විචල්‍ය වීම නිසා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා; වියදම් වැඩි වෙලා කියලා. වියදම් විචල්‍ය වීම කියන අරමුණෙන් තමයි අපි අත්තිකාරම් ගිණුමක් ආරම්භ කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නැත්නම් අත්තිකාරම් ගිණුමක් අවශ්‍ය වෙන්නේ නැහැ.

අපි මුලින්ම යම් කිසි විචල්‍යතාවකට ඉඩ දීලා, ඊට යම් කිසි සීමාවන් යොදනවා. නමුත් ඒ අවශ්‍යතාව නිසි පරිදි ඉෂ්ට කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් තමයි අපි අත්තිකාරම් ගිණුමක් කියලා කියන්නේ. එතුමාගේ මූලික චෝදනාව තිබෙන්නේ ඒ විචල්‍යතාවකට ඉඩක් තියලා තිබෙනවා කියන එකයි. හැබැයි මහා භාණ්ඩාගාරය පැහැදිලි සීමාවන් දාලා තිබෙනවා, වියදම් කළ හැකි සීමාවන් මෙච්චරයි, ණයට යන්න පුළුවන් සීමා මෙච්චරයි, හර ශේෂය මෙච්චරයි කියලා. ඒ සීමාවන් දාලා විචල්‍යතාව ආරක්ෂා කරලා දීලා තිබෙනවා. මේ විචල්‍යතාව මේ සීමාවන් තුළ යන්න පුළුවන්. ඒක තමයි අත්තිකාරම් ගිණුමක් කියන්නේ. නැත්නම් අත්තිකාරම් ගිණුමක් අවශ්‍ය වෙන්නේ නැහැ නේ.

අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ තිබෙනවා, බීජ නිෂ්පාදනය පිළිබඳ අත්තිකාරම් ගිණුමක්. රටේ අවශ්‍යතාව අනුව එහාට මෙහාට කර ගන්න පුළුවන්. අපේ තිබෙනවා, රාජ්‍ය සේවකයන්ගේ ණය පිළිබඳ අත්තිකාරම් ගිණුමක්. අවශ්‍යතාව අනුව ඒ සීමාවන් තුළ වෙනස් කර ගන්න පුළුවන්. මේ විවාදය ආරම්භ කරලාම තිබෙන්නේ වැරැද්දකින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අත්තිකාරම් ගිණුමක මේ විචල්‍යතාව තිබෙන්න ඕනෑ. අත්තිකාරම් ගිණුමක් යනු කුමක්ද කියන එක පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරලා තිබෙනවා, අපේ මුදල් රෙගුලාසිවල 255වැනි පිටුවේ VIIIවැනි පරිච්ඡේදයේ "අත්තිකාරම් ගිණුම්" කියන මාතෘකාව යටතේ. මම ඔබතුමාගෙන් ඉල්ලනවා, එම කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරන්න මට ඉඩ දෙන්න කියලා.

එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ඉදිරියේදී මේක කියවන්න පුළුවන්.

ඉතා සරලව කිව්වොත්, අත්තිකාරම් ගිණුමක් කියන්නේ, විශේෂිත වූ කටයුතු සඳහා ගෙවීම් කිරීම සඳහා විවිධ සීමාවන් යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ගිණුම් විශේෂයක්. මෙහි උපරිම වියදම් සීමාව, අවම ලැබීම් සීමාව, උපරිම හර හා බැර ශේෂ සීමා පාර්ලිමේන්තුව මඟින් අනුමත කෙරෙනවා. ඉතින් මේක ඇතුළේ විචලනයක් වනවා. ඒකට තමයි අත්තිකාරම් ගිණුම හදා තිබෙන්නේ. මා කියන්න උත්සාහ කළේ ඒ කාරණාවයි.

අත්තිකාරම් ගිණුම් පවත්වා ගෙන යන්නේ ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? විශේෂිත කටයුතු වෙනමම පවත්වා ගෙන යෑම සඳහායි. උදාහරණයක් හැටියට, නාවික හමුදාවට අවසර දීලා තිබෙනවා, බලපත්‍රලාභීන්ට ගිනි අවි විකුණන්න හා වෙඩි බෙහෙත් විකුණන්න. අන්න ඒ සඳහා අත්තිකාරම් ගිණුමක් නාවික හමුදාවට දීලා තිබෙනවා, අවශ්‍ය පරිදි විචලනය කර ගන්න. අපි ඒකට සීමාවන් දීලා තිබෙනවා.

අපේ රටේ 1950 ගණන්වල ඉඳලා පාවිච්චි කළ පැරණි දුම්රිය එන්ජින් තවම පාවිච්චි කරනවා. ඒ සඳහා අවශ්‍ය අමතර උපකරණ ගන්න අඛණ්ඩ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. සමහර විට සමහර දුම්රියකට නිෂ්පාදකයාට කියලා ඒවා නිෂ්පාදනය කරන්න වන්නේ ඒ දුම්රිය සඳහා පමණයි. එම නිසා මේක අඛණ්ඩව ගෙන යන්න සීමාවන් ඇතුළත වෙනම ගිණුමක් ඔවුන්ට හදා දීලා තිබෙනවා. ඒක දෙවන කාරණාවයි.

ඒ විතරක් නොවෙයි. භාණ්ඩාගාරයේ මූල්‍ය පාලනයක් තබා ගන්න අවශ්‍යයි. එහෙම නැතුව අවශ්‍යතාව නිසා අවශ්‍ය පරිදි අත දිග හැරලා ගෙවන්න කියලා අපට කියන්න බැහැ. භාණ්ඩාගාරය නිසි පරිදි මූල්‍ය විනයක් තබා ගන්න අවශ්‍යයි. එම නිසා තමයි අත්තිකාරම් ගිණුමක් හදලා, අර මා කිව්ව සීමාවන් දමලා, දුම්රිය දෙපාර්තමේන්තුවට කියන්නේ, මෙන්න මේ සීමාවන් තුළ ඔබේ අවශ්‍යතාවන් ඉෂ්ට කර ගෙන මහ ජන සේවය කරන්න කියලා. ඒකට තමයි අත්තිකාරම් ගිණුමක් තිබෙන්නේ.

නිෂ්පාදන හා වෙළෙඳ ස්වභාවයේ කටයුතු බාධාවකින් තොරව කරන්න ඕනෑ. මා කිව්වා, බීජ නිෂ්පාදනයට අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඉඩක් දීලා තිබෙනවාය කියලා. ඒක රටේ අවශ්‍යතාව. පසු ගිය දවස්වල එළවලු ගණන්, එළවලු ගණන් කියලා මෙතුමන්ලා කෑ ගැහුවා. අපි ඒ සඳහා වැඩ පිළිවෙළක් යෙදුවා. ඒ වැඩ පිළිවෙළට බීජ අවශ්‍යතාව විශාල වශයෙන් ඇති වුණා. ඒකත් එක්ක මේ දෙපාර්තමේන්තුව කටයුතු කරන්න අවශ්‍යයි. එම නිසා එවැනි අවශ්‍යතාවන් සඳහා අපි ඔවුන්ට ඉඩක් දීලා තිබෙනවා, ඒවා වෙනස් කරලා මෙන්න මේ සීමාවන් තුළ කටයුතු කරන්න කියලා. එම නිසා තමයි අපි අත්තිකාරම් ගිණුම් පවත්වා ගෙන යන කාරණා පිළිබඳව ඉතාමත් සරලව මේ සභාවට පැහැදිලි කරන්න මා උත්සාහ කළේ. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම, වෙළෙඳ අත්තිකාරම් ගිණුම, භාණ්ඩාගාර විවිධ අත්තිකාරම් ගිණුම කියලා අත්තිකාරම් ගිණුම් වර්ග ගණනාවක් තිබෙනවා. මේ කාරණා ගැන තමයි අද මේ මහා විවාදය ගෙන යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතුමන්ලා කිව්වා, මේ නිසා මහා වියදමක් වැඩි වෙලා තිබෙනවාය කියලා. කිසි සේත්ම නැහැයි කියලා මා ඉතාමත් පැහැදිලිව කියන්න අවශ්‍යයි. සමස්තයක් වශයෙන් අපි මේවා කථා කරන්න අවශ්‍යයි. සමස්තයක් වශයෙන් අත්තිකාරම් ගිණුමට පසු ගිය 2011 අය වැය ලේඛනය තුළ උපරිම වියදම් සීමාව හැටියට දීලා තිබෙනවා, රුපියල් 17,066,921,000ක්. නමුත් සත්‍ය වියදම මූලාසනාරූඪ

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 15,000,932,000කට අපි සීමා කර ගෙන තිබෙනවා. අපි වියදම අඩු කර ගෙන තිබෙනවා. අපි වියදම වැඩි කර ගෙන නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් කෑ ගහන්න අවශ්‍ය වන්නේ අපි වියදම වැඩි කර ගෙන තිබෙනවා නම්. මේ සභාවේ අවසරය ගත්ත වියදම් කළ යුතු ප්‍රමාණය අපි අඩු කර ගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතින් එතුමා තර්ක කරන්නේ මේ වියදම වැඩි කිරීමෙන් අපි ජනතාවට බරක් පැට වූ බවටයි. කිසි සේත්ම නැහැ. සරලව කිව්වොත් 17ක් වියදම් කරන්න අවසර තිබෙනවා. නමුත් අපි 15යි වියදම් කරලා තිබෙන්නේ.

අපේ ආදායම් පැත්ත බැලුවොත්, අපි ආදායම් පැත්තටත් සීමාවක් දමා ගෙන තිබෙනවා, මෙපමණ ආදායමක් ඉපැයිය යුතුයි කියලා. සරලව කිව්වොත් අවම වශයෙන් 13ක් ආදායම උපයන්න කියලා අපි මේ සභාවේ අනුමැතිය අරගෙන තිබෙනවා. සරලව කිව්වොත් අපි උපයා තිබෙනවා, 15ක්. 13ක් උපයන්න අවශ්‍ය එකට 15ක් උපයා තිබෙනවා. අපි හැම විටම ජනතාවගේ පැත්තෙන් ජයග්‍රහණ ලබා දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කෑ ගහන්න දෙයක් ඉතුරු වෙලා නැහැ. සමස්ත රාමුව තුළ අපි යම් යම් විචලනයන් ඇති කර ගෙන තිබෙනවා. ඒක ඇති කර ගන්න ඉඩක් තිබෙනවා. අපි හැම විටම ආර්ථික තීන්දුවක ඉන්නේ, ආර්ථික උපකල්පනයක යෙදෙන්නේ අනාගතය සඳහායි. එම නිසාම අපට බොහෝ විට යම් කිසි තීන්දු තීරණ ඒ කාලයට ගැළපෙන විධියට, ඒ අවශ්‍යතාව පරිදි වෙනස් කර ගන්න අවශ්‍යයි. හැබැයි, අපි වග කීමෙන් ඇති කර ගත්ත ප්‍රධාන රාමුව ඇතුළත ඉඳ ගෙන, අවශ්‍ය පරිදි ඒ ඒ කාරණා සඳහා අවශ්‍ය වෙනස්කම් රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන්, එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් කර ගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාරණයද වරදක් හැටියට අරගෙන මහ ලොකු කතන්දරයක් රටට කියන්න උත්සාහ කරන්නේ කියලා මම විපක්ෂයෙන් අහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතුමා සභාව කල් තැබීමේ විවාදය තුළදී කථා කර තිබුණා, වැය ශීර්ෂ 240 යටතේ ඇති අරමුදල් කිසිදු බියකින් හෝ සැකයකින් තොරව අනිසි ලෙස වියදම් කරනවා කියලා. ඒක සම්පූර්ණ වැරදි, සාවද්‍ය කථාවක් බව මම කියන්න අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම කාලයකුත් තිබුණා. නමුත් අපි අවිනිශ්චිත ගිණුමෙන් කරන වියදම් මාස දෙකකට වරක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණු පැහැදිලි වීම සඳහා ශීර්ෂය 240 - ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ සාරාංශය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

වැය ශීර්ෂය 240 අවිනිශ්චිත ගිණුමෙන් වියදම් කරන්නේ කොහොමද කියන එක අපි කල් ඇතුවම කියලා තිබෙනවා. අපි ඒ කල් ඇතුව කියපු කරුණු මාස දෙකෙන් දෙකට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ හිටියා නම් මම එතුමාට කියන්න කැමැත්තෙන් හිටියේ, කරුණාකර මේවා අධ්‍යයනය කරන්න කියලා. එතුමා මේ කරුණු දැන ගෙන මේ කල් තැබීමේ යෝජනා ඉදිරිපත් කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් නොදැන ඉදිරිපත් කරනවා නම් මේ කරුණු අධ්‍යයනය කරන්න.

වැය ශීර්ෂ 240, අවිනිශ්චිත ගිණුමෙන් අපි කොහොමද වියදම් කරන්න බලාපොරොත්තු වන්නේ, මොන ශීර්ෂය යටතේද අපට වියදම් කරන්න අවසරය තියෙන්නේ කියන කාරණය අපි හංගලා නැහැ. අපි ඒක මේ ගරු සභාවට කියලා මේ ගරු සභාව හරහා රටටම දන්වලා තිබෙනවා. 2011 ඇස්තමේන්තු පොතේ පළමු වෙළුමේ 212වන පිටුව කියවා බලන්න කියලා ඒ ගරු මන්ත්‍රීතුමාටත් විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුන්ටත් මම කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසු ගිය දා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2011 ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ ඉතා පැහැදිලිව තිබෙනවා, ඇස්තමේන්තුවලින් ඉදිරිපත් කරපු කරුණු 2011 වර්ෂයේදී කොහොමද ක්‍රියාත්මක කළේ කියලා. මෙම වාර්ෂික වාර්තාවේ 134වන පිටුවේ ඉඳලා 147වන පිටුව දක්වා බලන්න කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම කියනවා. එහි ඉතා පැහැදිලි විස්තරයක් තිබෙනවා. 240 වන වැය ශීර්ෂය නැත්නම් අවිනිශ්චිත ගිණුම කියලා ඉතා සරලව කියන මේ කාරණයේදී රජයේ වියදම් වගකීමෙන් කරලා තිබෙනවාද නැද්ද කියලා බලන ලෙස මම එතුමන්ලාට ආරාධනා කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන කාරණාවක් හැටියට මේ යෝජනාවේ සඳහන් වනවා, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා සේවක අර්ථ සාධක අරමුදල වැනි රජය භාරයේ ඇති අරමුදල්, බැංකුවල සහ වෙනත් ආයතනවල කොටස් ඉතා අධික මිලකට මිලදී ගැනීමට යෙදවීම නිසා, අවසාන වශයෙන් රජයට, තැන්පත්කරුවන්ට සහ සේවක අර්ථ සාධක අරමුදලට දායක වී ඇති සේවකයන්ට අවැඩක් කරනවා කියලා. නමුත් ඉතාම පැහැදිලිව කියනවා නම් සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් ආයෝජනය කරන්න පුළුවන්. යම් ආයෝජනයක සියයට 8ක ආයෝජනය කිරීමට අවසරය තිබෙනවා. ඒ අනුව මේ මුදල් සියයට 5.9ක් ආයෝජනය කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් නීතියේ හැටියට සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයකුට තමන්ගේ තැන්පතු නැත්නම් අරමුදලේ තමන්ට අයිති කොටස වෙනුවෙන් සියයට 3ක පොලියක අයිතිවාසිකම් තිබෙනවා. අපි ආසන්නතම වර්ෂ බැලුවොත්, 2009 දී සියයට 13.75ක් සාමාජිකයන්ට පොලිය වශයෙන් ලැබිලා තියෙනවා. 2010 දී සියයට 12.5ක්, 2011සියයට 11.5ක් ලැබිලා තිබෙනවා. සාමාජිකයන්ට මේ මුදල් ලැබුණේ කොහොමද? ඒ මුදල් ලැබුණේ භාණ්ඩාගාර බිල්පත්වල හෝ කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කිරීම තුළින්.

රටක පොලී අනුපාතය ඉහළ ගිය අවස්ථාවක කොටස් වෙළෙඳ පොළ පහළට එනවාය කියන එක අමුත්තක් නොවෙයි. ඒක සාමාන්‍ය දෙයක්. හැබැයි, ආයෝජකයෙක්, ඒ කියන්නේ සේවක අර්ථ සාධක අරමුදල වෙන්න පුළුවන්, ආයතනයක් වෙන්න පුළුවන්, පෞද්ගලික කෙනෙක් වෙන්න පුළුවන්, යම් ආයෝජනයක් කරද්දී කලාප කීපයක් තෝරා ගත යුතුයි. ඒ අනුව ඔහුට එක පැත්තකින් බැංකුවල ආයෝජනය කරන්න පුළුවන්. තවත් පැත්තකින් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන්න පුළුවන්. ඒ අනුව පොලී අනුපාතය වැඩි වෙන වෙලාවක බැංකුවේ ආයෝජනයෙන් ඔහුගේ ආදායම වැඩි වනවා. හැබැයි, කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය යම් ප්‍රමාණයකට අඩු වන්න පුළුවන්. එහෙම අවස්ථා තිබෙනවා. ඒකෙන් අදහස් කරන්නේ නැහැ, ඒ දවසේ කොටස් ටික විකුණලා අලාභය විඳින්න ඕනෑ කියලා.

සේවක අර්ථ සාධක අරමුදල කියන්නේ දැවැන්ත ආයෝජනයක්. ඔවුන්ට පුළුවන්, සමතුලිතභාවය සඳහා කළ ආයෝජනය තමන්ගේ අවශ්‍යතාව එනතුරු, මිල වැඩි වනතුරු ආරක්ෂා කර ගන්න. එහෙම තිබියදී, කොටස් වෙළෙඳ පොළ පහළට ඇවිත් තිබෙන වෙලාවක, සමතුලිතභාවය සඳහා සියයට 5.9ක් කළ ආයෝජනය පෙන්වලා -ඒක අරගෙන- මහා භාහුවක්

---

***** කථාව අවසානයේ පළ කර ඇත.**

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

රටට කියන්න හදනවා නම්, සේවක අර්ථසාධක අරමුදලේ ඉන්න සාමාජිකයෝ බිය වද්දන්න හදනවා නම්, ඒක නෙමෙයි විපක්ෂයක වගකීම. විශේෂයෙන් උගත් මන්ත්‍රීවරුන්ගේ වගකීම ඒක නොවෙයි. මේ වෙලාවේ ඒක නොවෙයි විය යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ආයෝජන කළඹ" කියලා දෙයක් තිබෙනවා. ඒ ආයෝජන කළඹ නිසි පරිදි කළමනාකරණය කරලා, හැම පළාතකටම බෙදා හැරලා, එක පැත්තකින් අඩු වෙන කොට, අඩු වන පැත්ත තව පැත්තකින් ආවරණය කරනවා. හැබැයි, ඒ කොටස් මිල අඩු වන කොට, අඩු වෙච්ච දවසේම ඒ කොටස් විකුණලා සාමාජිකයාට පාඩු කරන්න කවුරුත් බැඳිලා නැහැ. ඒ කොටස් මිල වැඩි වෙච්ච දවසකයි අළෙවි කරන්නේ. අන්න ඒ පණිවිඩය අපි මේ රටේ මේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට ලබා දෙන්න ඕනෑ. ඒ අය මේ රටේ වැඩ කරන මිනිස්සු. ඒ අය අනවශ්‍ය විධියට බිය කරන්න අවශ්‍ය නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ලොකු සූදානමකින් ආවේ මේ ගැන කථා කරන්න. නමුත් මේ වන විට මට නියමිත කාලය හුඟක් ගත වෙලා.

මේක තමයි පසු ගිය දා මුදල් අමාත්‍යාංශය ඉදිරිපත් කරපු වාර්ෂික වාර්තාව. මේක මේ රටට ආදරය කරන මිනිස්සු අකුරක් ගණනේ කියවන්න වටිනා වාර්තාවක්. වෙනත් අරමුණුවල ඉන්න, බලයට එන්න මොනවා හෝ දෙයක් කියන්න බලාපොරොත්තු වන අය නොවෙයි, මේ රටට ආදරය කරන අය තමයි මේක කියවන්න ඕනෑ. විශේෂයෙන්ම ජනතා නියෝජිතයෝ මේ රටට ආදරය කරනවා නම් ඒ අය මේක කියවන්නම අවශ්‍යයි. මොකද, ශ්‍රී ලංකාව පිළිබඳව සැකෙවින් විස්තරයක් මේකේ ඉතාම පැහැදිලිව තිබෙනවා. 2005 සහ 2011 වර්ෂවලට අදාළව කරුණු අරගෙන ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මෙයින් කරුණු කීපයක් කිව්වා. අපි 2005 දී කොතැනද හිටියේ, 2011 දී කොතැනද හිටියේ කියලා ඉතාම පැහැදිලිව මෙහි තිබෙනවා. එම නිසා මම මේ වාර්තාව ඔබතුමාගේ අවසරය ඇතිව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම පිණිස **සභාගත*** කරනවා.

මේ වාර්තාව කියවන්න. මම ඉතා පැහැදිලිව මාධ්‍යවේදී සහෝදරයන්ටත් ඒක කියන්න කැමැතියි. බොහෝ අය කියනවා මාධ්‍ය නිදහස නැහැ කියලා. ආර්ථිකය ගැන විතරක් නොවෙයි මේ වාර්තාවේ තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන විතරක් කියලා කථාව නවත්වන්න ඔබතුමාගේ අවසරය ඉල්ලනවා.

ආර්ථික ප්‍රගමනයට සමානව, ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන කාරණාවක් විධියට මාධ්‍ය සලකන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ කාසියක එක පැත්තක් නම් මාධ්‍ය අනෙක් පැත්ත හැටියට සලකන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005 ඉඳලා 2011 දක්වා මාධ්‍ය පැත්තෙන් බැලුවොත්, 2005 දී තිබුණු පුවත් පත් සංඛ්‍යාව 90යි. අද ඒ සංඛ්‍යාව 167යි. ඉතින් මේ රටේ මාධ්‍ය නිදහස නැද්ද? විද්‍යුත් මාධ්‍ය අරගෙන බැලුවොත්, 2005 දී රූපවාහිනී සේවා 13යි, අද 21යි. පෞද්ගලික රූපවාහිනී සේවා පමණක් 2005 දී 9ක් තිබුණා. අද ඒ ගණන 15ක් වෙලා තිබෙනවා. අද සමහර අය කෑ ගහනවා, මාධ්‍ය නිදහස නැහැ, ප්‍රජාතන්ත්‍රවාදය නැහැ කියලා.

2005 දී තිබුණු ගුවන් විදුලි නාලිකා සංඛ්‍යාව 32යි, 2011 දී 52යි. 2005 දී තිබුණු පෞද්ගලික ගුවන් විදුලි නාලිකා සංඛ්‍යාව12යි, 2011 දී 31යි. මේ අනුව මේ රට ඉතාම පැහැදිලි ගමනක යෙදෙන බව පෙනෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආර්ථිකය පැත්තෙන් පමණක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙනුත් පැහැදිලි ගමනක් යනවා. අන්න ඒ සඳහා ගොනු වෙන්න අපි මේ හැම අවස්ථාවක්ම ප්‍රයෝජනයට ගනිමු කියලා ඉල්ලා සිටිමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා

**** සභාමේසය මත තබන ලද ලේඛන:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:*
** Documents tabled:*

මුදල් රෙගුලාසි 255

## VIII වැනි පරිච්ඡේදය

## අත්තිකාරම් ගිණුම්

**මු. රෙ. 500. (1) අධිකාර බලය හා විෂය සීමාව.**- අත්තිකාරම් ගිණුම් සඳහා විසර්ජන පනතින් අධිකාර බලය දෙනු ලබන අතර ඒ සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල 2 වැනි කොටස යටතේ මුදල් ප්‍රතිපාදනය කෙරේ. (මු.රෙ.17(2) බලන්න.) අත්තිකාරම් ගිණුම් සම්බන්ධ මුදල් ගනුදෙනු කරනු ලබන්නේ විසර්ජන පනතේ විධිවිධානවලට යටත්ව ය.

(2) *අත්තිකාරම් ගිණුම්වල ලැබීම් හා ගෙවීම්.*- අත්තිකාරමක් පිට පවත්වා ගෙන යනු ලබන එක් එක් කටයුත්තෙහි ලැබීම් හා ගෙවීම් යන දෙකම ඊට නියමිත සීමාවන් ඇතුළත (මු.රෙ.17(2) බලන්න.) තදෝචිත අත්තිකාරම් ගිණුම යටතේ ගිණුම් ගත කරනු ලැබේ. මේ ක්‍රියා පිළිවෙළ හේතුකොටගෙන, ඒ කටයුත්තේ මුදල් ගනුදෙනු භාණ්ඩාගාරයට අදාළ වන තාක් දුරට එක් ගිණුමක් යටතට පත්වෙයි.

(3) *අත්තිකාරම් වොරන්ට් බලපත්‍ර.*- අත්තිකාරම් ගිණුමක් සඳහා ප්‍රතිපාදන අන්තර්ගත අත්තිකාරම් වොරන්ට් බලපත්‍රයක් හෝ විශේෂ වොරන්ට් බලපත්‍රයක් හෝ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබ ඇත්තේ නම් මිස වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත අත්තිකාරම් ගිණුමකට කිසිම මුදලක් හර නොකළ යුතුය. (මු.රෙ.90 බලන්න.)

(4) අත්තිකාරම් ගිණුම් කටයුත්ත සඳහා වූ ප්‍රාග්ධන වියදම් සියල්ලම ඇස්තමේන්තුවල ඒ සඳහා නිශ්චිතව සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදනවලින් දැරිය යුතු වන බැවින් එම වියදම් අත්තිකාරම් ගිණුමට හර නොකළ යුතුය. ප්‍රාග්ධන වස්තුව ප්‍රතිසම්පාදනය පිළිබඳව ක්‍රියා කළ යුත්තේ 509 වැනි මු.රෙ. දක්වනු ලැබ ඇති පරිද්දෙනි.

(5) *ගිණුම් ඉදිරිපත් කිරීම.*- අත්තිකාරම් ගිණුම් කටයුත්තක මුදල් ගනුදෙනු භාණ්ඩාගාරයේ පොත්වල සටහන් කරන්නේ අදාළ අත්තිකාරම් ගිණුමට කැරෙන හරකිරීම් හා බැරකිරීම් වශයෙනි. එහෙයින්, අත්තිකාරම් ගිණුම් කටයුත්තක ගනුදෙනු භාණ්ඩාගාරයේ පොත්වල අන්තර්ගත කරනු පිණිස දෙපාර්තමේන්තු විෂය ගිණුම්වලට ඇතුළත් කරනු ලබන විට, ඒවා පෙන්විය යුත්තේ එකී අත්තිකාරම් ගිණුමට කැරෙන හර සහ/හෝ බැර වශයෙනි.

**මු. රෙ. 501. අත්තිකාරම් ගිණුම් කටයුතු වර්ග.**- එක් එක් ප්‍රධාන අත්තිකාරම් ගිණුම් ගණය (මු.රෙ.17 බලන්න) යටතේ පවත්වා ගෙන යනු ලබන අත්තිකාරම් ගිණුම් කටයුතු පහත දැක්වේ :-

(අ) *ගබඩා අත්තිකාරම් ගිණුම්.*- මේවා වූකලී ස්වභාවයෙන් අවිනිශ්චිත ගිණුම්ය. ප්‍රවාහන පිරිවැය පැටවුම් හා බෑම් කුලී වැනි ආනුෂංගික වියදම්ද ඇතුළුව, දෙපාර්තමේන්තුවකට අවශ්‍ය වන්නාවූ බඩුබාහිර සඳහා වන පිරිවැය පළමුකොට දරනු ලබන්නේ අදාළ ගබඩා අත්තිකාරම් ගිණුමෙනි. යථෝක්ත බඩු බාහිර දෙපාර්තමේන්තුවලට හෝ දෙපාර්තමේන්තුවල අංශවලට හෝ නිකුත් කරනු ලබන කල්හි,

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

ඒවායේ සම්පූර්ණ වටිනාකම ඇස්තමේන්තුවල ඊට අදාළ ප්‍රතිපාදනයෙන් (හෝ ඒ බඩුබාහිර සපයන ලද්දේ යම් කටයුත්තකට නම් එම කටයුත්ත සඳහා වන ප්‍රතිපාදනයෙන් හෝ) අයකර සාමාන්‍ය ගබඩා අත්තිකාරම් ගිණුමට බැර කරනු ලැබේ. සාමාන්‍යයෙන් ගබඩා අත්තිකාරම් ගිණුම්වලින් පාඩු සිදුවීමක් අපේක්ෂා නොකෙරේ. එසේම ඒ ගිණුම් මෙහෙයවනු ලබන්නේ ලාභයක් උපයන අදහසින් ද නොවේ. මෙහිලා සාමුද්‍රික හානි හා ගින්නෙන් සිදුවන හානි වැනි අසාමාන්‍ය ගණයේ අලාභහානි අයකරගනු ලබන්නේ ඇස්තමේන්තුවල 1 වැනි කොටසේ අදාල වැය ශීර්ෂයෙහි අදාල වැය විෂය සංඛ්‍යා යටතේ නිශ්චිතව සලසා ඇති ප්‍රතිපාදන වලිනි.

(ආ) වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්.– මේවා උපයෝගී කර ගනු ලබන්නේ ඇතැම් කටයුතු වාණිජ පදනමක් මත කර ගෙන යෑම පිණිසය. අදාල කටයුත්තේ පුනරාවර්තන වියහියදම් අත්තිකාරම් ගිණුමට වැයබාරය කරනු ලබන අතර ඒ කටයුත්තේ නිෂ්පාදිතයන් විකිණීමෙන් හෝ වෙනත් අන්දමකින් අපහරණය කිරීමෙන් හෝ ලැබෙන ආදායම අත්තිකාරම් ගිණුමට බැර කරනු ලැබේ.

(ඇ) විශේෂ අත්තිකාරම් ගිණුම්.– මේ ගිණුම් උපයෝගී කර ගනු ලබන්නේ පූර්වෝක්ත (අ) සහ (ආ) ඡේදවල සඳහන් කාර්යයන් හැර වෙනත් නිශ්චිත කාර්යයන් සඳහා ආපසු අය කර ගත යුතු අත්තිකාරම් ගෙවීම සඳහාය. මේ වූකලී රජයේ සේවකයන්ට හෝ මහජනයාට හෝ දෙන ණය මුදල්, හිමිකම් පෑම් වෙනුවෙන් කැරෙන කොටස් ගෙවීම් හා ආයතන හා වෙනත් රාජ්‍යයන් වෙනුවෙන් කැරෙන ගෙවීම් යන මේවා ගිණුම්ගත කිරීමේ පහසු ක්‍රමයකි. මේ අත්තිකාරම් ගිණුම්වලින්ද පාඩු සිදුවීමක් අපේක්ෂා කරනු නොලැබේ. මෙහිදී මුල් ගෙවීම සඳහා අධිකාර බලය දීමේදී නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගත යුතුය.

**මු.රෙ. 502. පාලනය සඳහා අවශ්‍ය පොත්, වාර්තා සටහන් යනාදිය.**– (1) පොත් හා වාර්තා සටහන්.– ගණන්දීමේ නිලධාරීන් විසින් එක් එක් අත්තිකාරම් ගිණුම් කටයුත්ත සම්බන්ධයෙන් –

(අ) පාර්ලිමේන්තුව විසින් නියම කරන ලද උපරිම වියදම් සීමාවන්, උපරිම හර ශේෂ සීමාවන්, උපරිම බැරකම් සීමාවන් නොඉක්මවන බව සහ ලැබීම් පිළිබඳ අවම සීමාවේ පහත වැටීමක් සිදු නොවන බව සහතික වනු පිණිස ප්‍රමාණවත් තරම් වාර්තා තබා ගන්නා බවටද – මු.රෙ. 503.

(ආ) (i) ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතු කර ගනු ලබන බව ද,

(ii) කටයුත්ත ක්‍රියාකරවීමෙහිලා සතුටුදායක ප්‍රගතියක් අත්කර ගන්නා බව ද,

(iii) කටයුත්තේ වාණිජ අංශයට අදල සියළුම ගනුදෙනු සටහන් කර තබා ගැනීමට විධිමත් පොත් පවත්වා ගන්නා බව සහතිකවනු පිණිස ප්‍රමාණවත් තරම් විධිවිධාන යොදන බවට ද වගබලා ගත යුතුය.



ඇතැම් අවස්ථාවලදී මේ පිළිබඳ අවම අවශ්‍යතාවන් භාණ්ඩාගාරය (රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව) විසින් නියම කරනු ලැබිය හැකි නමුත් විධිමත් වාර්තා සටහන් පවත්වා ගත යුතු වන්නේ එක් එක් ක්ෂේත්‍රවල කටයුත්තේ අවශ්‍යතාවලට ගැලපෙන පරිද්දෙන් හෙයින් ගණන්දීමේ නිලධාරීන් සුපරීක්ෂාකාරීව ක්‍රියාකරමින් දුෂ්කර අවස්ථාවලදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේද, විගණකාධිපතිවරයාගේ හා භාණ්ඩාගාරයේද (රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව) සහාය ලබා ගත යුතුය.

සංලක්ෂ්‍යය.– සීමා පාලනය සඳහා නිශ්චිත ආකෘති පත්‍රයක් නියම කරනු ලැබ නොමැති විට 138 (අ) (විසර්ජන (වැය සම්මත) ගිණුම) පොදු ආකෘති පත්‍රය සුදුසු පරිදි සංශෝධනය කොට භාවිතා කළ හැකිය. මුදල් වර්ෂය තුළ උපරිම වැය සීමාව, මුදල් වර්ෂය තුල ගිණුමට බැර කළ යුතු අවම ලැබීම් සීමාව හා හර ශේෂයේ උපරිම සීමාව සුපරීක්ෂාකාරීව එහි සටහන් කළ යුතුය. උපරිම බැරකම් සීමාවක් ඇතොත් ඒවා ආකෘති පත්‍රයේ වම් පැත්තේ සටහන් කළ යුතුය. හර ශේෂයේ උපරිම සීමාව නිශ්චය කිරීමෙහිලා ඉකුත් මුදල් වර්ෂයෙන් ඉදිරියට ගෙනා හර ශේෂය ද ගණනයට ගන්නා බැවින් ඒ හර ශේෂය ද සටහන් කළ යුතුය.

අත්තිකාරම් ගිණුමකට කැරෙන හර බැර යන දෙකම ඒවා උද්ගත වන ඒ ඒ අවස්ථාවේදීම සටහන් කළ යුතුය. එහෙත් අවම ලැබීම් සීමාව සහ හර ශේෂයේ උපරිම සීමාව නිශ්චය කිරීමෙහි ලා බැර ගණනයට ගන්නා නමුත් මුදල් වර්ෂය සඳහා උපරිම වියදම් සීමාව නිශ්චය කිරීමේ දී බැර ගණනයට නොගත යුතු බව ඒත්තු ගත යුතුය.

(2) ස්ථාවර වත්කම් රෙජිස්ටරය.– එක් එක් අත්තිකාරම් ගිණුම් කටයුත්ත වෙනුවෙන් ස්ථාවර වත්කම් රෙජිස්ටරයක්ද පවත්වා ගත යුතුය. එක් එක් ස්ථාවර වත්කම් විෂයයට අදාලව එහි පිරිවැය හැඳින්වීම, අත්පත්කරගත් (නැතහොත් වැඩ නිමවුන) දිනය, වාර්ෂික ක්ෂයකරණ අනුපාතිකය පිහිටීම ආදී සම්පූර්ණ විස්තර එම රෙජිස්ටරයේ සටහන් කළ යුතුය. ස්ථාවර වත්කම් සඳහා ගිණුම් තැබීම පිළිබඳ සවිස්තරාත්මක උපදෙස් 11 වැනි පරිශිෂ්ටයෙහි දැක්වේ.

**මු. රෙ.503. අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවල ඉක්මවීම්/පහත වැටීම්.**– (1) ඉක්මවීම/පහත වැටීම නිශ්චය කිරීම.– අත්තිකාරම් ගිණුමක් සඳහා නියමිත සීමාවල් ඉක්මවීමක්/පහත වැටීමක් සිදුවී ඇත්ද නැත්ද නිශ්චය කිරීමෙහිලා පහත සඳහන් වර්ගවල ගනුදෙනු ගණනයට නොගත යුතුය:

(අ) සදොස් නොහොත් වැරදි හර හා බැර;

(ආ) සදොස් නොහොත් වැරදි සටහන් ගැළපුම පිණිස කැරෙන හර හා බැර;

(ඇ) ලාභ මාරු කිරීම සඳහා කැරෙන හර – මු.රෙ. 510.

(ඈ) භාරක පාඩු පියවීම ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අවශ්‍ය බැර – මු.රෙ. 511 හා 512.

## ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

සාරාංශය

රු. '000

| විස්තරය | 2009 | 2010 ප්‍රතිශෝධිත අයවැය | 2011 ඇස්තමේන්තුව | 2012 ප්‍රක්ෂේපනය | 2013 ප්‍රක්ෂේපනය | 2010 - 2013 එකතුව |
|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **55,747** | **981,999** | **12,494,378** | **12,565,860** | **13,567,960** | **39,610,197** |
| **පුද්ගල පඩිනඩි** | **42,469** | **46,000** | **47,350** | **48,200** | **49,000** | **190,550** |
| වැටුප් හා වේතන | 31,017 | 32,000 | 32,900 | 33,500 | 34,100 | **132,500** |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,248 | 5,200 | 5,350 | 5,500 | 5,600 | **21,650** |
| වෙනත් දීමනා | 7,204 | 8,800 | 9,100 | 9,200 | 9,300 | **36,400** |
| **ගමන් වියදම්** | **564** | **900** | **980** | **1,025** | **1,070** | **3,975** |
| දේශීය | 143 | 300 | 350 | 375 | 400 | **1,425** |
| විදේශීය | 422 | 600 | 630 | 650 | 670 | **2,550** |
| **සැපයීම්** | **5,598** | **5,805** | **6,125** | **6,360** | **6,680** | **24,970** |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 3,648 | 3,500 | 3,675 | 3,800 | 4,000 | **14,975** |
| ඉන්ධන | 1,886 | 2,200 | 2,300 | 2,400 | 2,500 | **9,400** |
| ආහාර පාන හා නිල ඇඳුම් | 63 | 105 | 150 | 160 | 180 | **595** |

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **නඩත්තු වියදම්** | **3,702** | **4,120** | **4,325** | **4,625** | **5,235** | **18,305** |
| වාහන | 2,421 | 2,600 | 2,730 | 3,000 | 3,500 | 11,830 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,256 | 1,500 | 1,575 | 1,600 | 1,700 | 6,375 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 25 | 20 | 20 | 25 | 35 | 100 |
| **සේවා** | **2,253** | **923,874** | **3,915** | **4,250** | **4,475** | **[illegible]36,514** |
| ප්‍රවාහන | 250 | 300 | 315 | 350 | 375 | 1,340 |
| තැපැල් සහ සංනිවේදන | 1,834 | 2,500 | 2,600 | 2,700 | 2,800 | 10,600 |
| වෙනත් | 169 | 95 | 1,000 | 1,200 | 1,300 | 3,595 |
| අනපේක්ෂිත සේවා | | 920,979 | | | | 920,979 |
| **මාරු කිරීම්** | **1,160** | **1,300** | **1,375** | **1,400** | **1,500** | **5,575** |
| රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 1,160 | 1,300 | 1,375 | 1,400 | 1,500 | 5,575 |
| **වෙනත් පුනරාවර්තන වියදම්** | | | **12,430,308** | **12,500,000** | **13,500,000** | **38,430,308** |
| අනපේක්ෂිත සේවා | | | 12,430,308 | 12,500,000 | 13,500,000 | 38,430,308 |
| **මූලධන වියදම්** | **5,915** | **4,493,270** | **10,854,150** | **12,903,600** | **14,103,950** | **42,354,970** |
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **1,176** | **1,200** | **1,150** | **1,250** | **1,400** | **5,000** |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 177 | 600 | 500 | 550 | 600 | 2,250 |
| වාහන | 999 | 600 | 650 | 700 | 800 | 2,750 |
| **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | **3,223** | **1,300** | **1,400** | **1,600** | **1,750** | **6,050** |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 3,223 | 500 | 550 | 700 | 800 | 2,550 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | 800 | 850 | 900 | 950 | 3,500 |
| **හැකියා වර්ධනය** | **64** | **550** | **600** | **750** | **800** | **2,700** |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 64 | 550 | 600 | 750 | 800 | 2,700 |
| **වෙනත් මූලධන වියදම්** | **1,453** | **4,490,220** | **10,851,000** | **12,900,000** | **14,100,000** | **42,341,220** |
| වෙනත් ආයෝජන | 1,453 | 4,000 | 1,000 | | | 5,000 |
| අනපේක්ෂිත සේවා | | 4,486,220 | 10,850,000 | 12,900,000 | 14,100,000 | 42,336,220 |
| **මුළු වියදම** | **61,662** | **5,475,269** | **23,348,528** | **25,469,460** | **27,671,910** | **81,965,167** |
| **මුළු මූල්‍යකරණය** | **61,662** | **5,475,269** | **23,348,528** | **25,469,460** | **27,671,910** | **81,965,167** |
| දේශීය | 60,209 | 4,184,115 | 19,647,528 | 20,069,460 | 22,171,910 | 66,073,013 |
| විදේශීය | 1,453 | 1,291,155 | 3,701,000 | 5,400,000 | 5,500,000 | 15,[illegible]92,155 |

**සේවා නියුක්ති විස්තරය**

| කාණ්ඩය | 2009 | 2010 | 2011 ඇස්තමේන්තුව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 36 | 25 |
| තෘතීය මට්ටම | 1 | 1 | 1 |
| ද්විතීය මට්ටම | 63 | 83 | 62 |
| ප්‍රාථමික මට්ටම | 26 | 35 | 24 |
| **එකතුව** | **117** | **155** | **112** |

## ශ්‍රී ලංකාව පිළිබඳව සැකෙවින් - 2005 සහ 2011

| | **2005** | **2011** | | **2005** | **2011** |
|---|---|---|---|---|---|
| ද.දේ.නි. | | | රජයේ මුළු ණය සේවා (ඇ.ඩො. බිලියන) | **22,115** | **46,426** |
| වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. (රු.බිලියන) | 2,453 | 6,543 | මුළු ණය සේවා (ද.දේ.නි. % ලෙස) | 14.3 | 13.7 |
| වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. (ඇ.ඩො.බිලියන) | 24.4 | 59.2 | රජයේ මුළු ණය (ද.දේ.නි % ලෙස) | 90.6 | 78.5 |
| වෙළෙඳපොළ මිල අනුව ඒක පුද්ගල ආදායම (රු.) | 124,709 | 313,511 | දේශීය ණය (ද.දේ.නි. % ලෙස) | 51.6 | 42.9 |
| වෙළෙඳපොළ මිල අනුව ඒක පුද්ගල ආදායම (ඇ.ඩො.) | 1,241 | 2,836 | විදේශීය ණය (ද.දේ.නි. % ලෙස) | 39.0 | 35.6 |
| උද්ධමනය -ද.දේ.නි. අවධමනකය (%) | 10.4 | 7.8 | | | |
| උද්ධමනය-කො.පා.මි.ද.(%) (වාර්ෂික සාමාන්‍ය) | 10.2 | 6.7 | **පළාත් සභාවල අයවැය තත්ත්වය** | | |
| සේවා වියුක්ති අනුපාතය (%) | 7.2 | 4.2 | ආදායම් (රු. බිලියන) | 16.1 | 42.0 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය (%) | 49.3 | 48.2 | බදු ආදායම් (රු. බිලියන) | 13.8 | 36.0 |
| | | | වියදම් (රු. බිලියන) | 73.0 | 154.8 |
| ආර්ථික ව්‍යුහය | | | මධ්‍යම රජයේ මාරුකිරීම් (රු. බිලියන) | 59.7 | 115.9 |
| ද.දේ.නි. (වෙනස්වීමේ ප්‍රතිශතය) | 6.2 | 8.3 | | | |
| ද.ජා.නි. (වෙනස්වීමේ ප්‍රතිශතය) | 6.0 | 8.4 | මූල්‍ය අංශයේ වර්ධනය | | |
| | | | පටු මුදල් සැපයුම (රු.බිලියන) | 592.9 | 438.7 |
| ද.දේ.නි. දායකත්වය (%) | | | පුළුල් මුදල් සැපයුම (රු. බිලියන) | 822.9 | 2,192 |
| කෘෂිකර්මය | 12.5 | 11.2 | මුදල් සැපයුමේ වර්ධනය ($M_{2b}$) (%) | 19.6 | 20.9 |
| කාර්මික | 28.1 | 29.3 | | | |
| සේවා | 59.4 | 59.5 | බැංකු සහ මූල්‍ය කටයුතු සඳහා ප්‍රවේශය | | |
| | | | දේශීය වාණිජ බැංකු | 11 | 12 |

| | | |
|---|---|---|
| ද.දේ.නි. අංශික වර්ධනය (%) | | |
| කෘෂිකර්මය | 1.8 | 1.5 |
| කාර්මික | 8.0 | 10.3 |
| සේවා | 6.4 | 8.6 |
| | | |
| **විදේශීය වෙළෙඳාම** | | |
| අපනයන (ඇ.ඩො. මිලියන) | 6,347 | 10,559 |
| ආනයනය (ඇ.ඩො. මිලියන) | 8,863 | 20,269 |
| වෙළෙඳ ශේෂය (ඇ.ඩො. මිලියන) | -2,516 | -9,710 |
| ශ්‍රමික ප්‍රේෂණ (ඇ.ඩො. මිලියන) | 1,918 | 5,145 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ.ඩො. මිලියන) | -650 | -4,615 |
| සමස්ත ශේෂය (ඇ.ඩො. මිලියන) | 501 | -1,061 |
| | | |
| **රාජ්‍ය මූල්‍ය** | | |
| ආදායම (රු. බිලියන) | 380 | 935 |
| බදු ආදායම (රු. බිලියන) | 337 | 813 |
| බදු නොවන ආදායම (රු. බිලියන) | 43 | 122 |
| ආදායම (ඇ.ඩො. මිලියන) | 3,779 | 8,454 |
| බදු ආදායම (ඇ.ඩො. මිලියන) | 3,352 | 7,349 |
| බදු නොවන ආදායම (ඇ.ඩො. මිලියන) | 427 | 1,105 |
| මුළු වියදම හා ණය දීම (රු. බිලියන) | 592 | 1,414 |
| වර්තන වියදම (රු. බිලියන) | 443 | 1,007 |
| රාජ්‍ය ආයෝජන (රු. බිලියන) | 225 | 407 |
| වර්තන ගිණුමේ හිඟය / ද.දේ.නි. % | -2.6 | -1.1 |
| අයවැය හිඟය / ද.දේ.නි. % | -7.0 | -6.9 |
| මුළු වියදම (ඇ.ඩො. මිලියන) | 5,819 | 12,789 |
| වර්තන වියදම (ඇ.ඩො. මිලියන) | 4,412 | 9,104 |
| රාජ්‍ය ආයෝජන (ඇ.ඩො. මිලියන) | 1,479 | 3,680 |
| අයවැය හිඟය (ඇ.ඩො. මිලියන) | -1,716 | -4,071 |

| | | |
|---|---|---|
| ශාඛා | 1,090 | 1,533 |
| විදේශීය වාණිජ බැංකු | 11 | 12 |
| ශාඛා | 35 | 49 |
| විශේෂිත බැංකු (ප්‍රාදේශීය සංවර්ධන බැංකු හැර) | 8 | 8 |
| ශාඛා | 170 | 278 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 6 | 1 |
| ශාඛා | 199 | 233 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | ලැ.නො. | 2,240 |
| දේශීය වාණිජ බැංකු | ලැ.නො. | 2,035 |
| විදේශීය වාණිජ බැංකු | ලැ.නො. | 47 |
| විශේෂිත බැංකු | ලැ.නො. | 158 |
| | | |
| රක්ෂණ සමාගම් | 14 | 22 |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් | 28 | 39 |
| විශේෂිත කල්බදු සමාගම් | 18 | 16 |
| සිසු ඉතුරුම් ඒකක | 244 | 188 |
| නිකුත් කරන ලද ණය පත් | 181,857 | 148,481 |
| භාවිතයේ ඇති ණය පත් | 629,740 | 862,352 |
| | | |
| | | |
| | | |
| **විනිමය අනුපාත** | | |
| වාර්ෂික සාමාන්‍ය | | |
| ඇ.ඩොලරයට රුපියල් | 100.50 | 110.57 |
| වි.ගැ.හි. ඒකකයට රුපියල් | 148.45 | 174.54 |
| | | |
| **වර්ෂ අවසාන** | | |
| ඇ.ඩොලරයට රුපියල් | 102.12 | 113.90 |
| වි.ගැ.හි ඒකකයට රුපියල් | 145.95 | 174.87 |

## ශ්‍රී ලංකාව පිළිබඳව සැකෙවින් -2005 සහ 2011

දෙසැම්බර් 31 දිනට රේගු බදු ව්‍යුහය

| 2005 | | 2011 | |
|---|---|---|---|
| බදු නිදහස් අයිතම | 778 | බදු නිදහස් අයිතම | 3,024 |
| බදු අනුපාතය 2.5% අඩු | 2,169 | බදු අනුපාතය 5% | 412 |
| බදු අනුපාතය 6% අඩු | 479 | බදු අනුපාතය 15% | 1,508 |
| බදු අනුපාතය 15% අතර | 1,646 | බදු අනුපාතය 30% | 1,323 |
| බදු අනුපාතය 28% අතර | 1,445 | බදු අනුපාතය 75% | 04 |
| බදු අනුපාතය 50% අතර | 1 | බදු අනුපාතය 100% | 05 |
| බදු අනුපාතය 75% අතර | 2 | නිශ්චිත | 77 |
| බදු අනුපාතය 100% අතර | 5 | නිශ්චිත හා ප්‍රතිශතාත්මක | 162 |
| මුළු තීරු බදු සංකේතාංක අයිතම | **6,525** | මුළු තීරු බදු සංකේතාංක අයිතම | **6,515** |

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ශ්‍රී ලංකාව පිළිබඳව සැකෙවින් - 2005 සහ 2011

| | 2005 | 2011 | | 2005 | 2011 |
|---|---|---|---|---|---|
| සමාජ සංවර්ධනය | | | මූලික යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය | | |
| ජනගහන වර්ධනය | 1.1 | 1.0 | විදුලිබලය සහිත කුටුම්භ සංඛ්‍යාව (%) | 77 | 91 |
| උපතේ දී ආයු අපේක්ෂාව (අවුරුදු) | 67.9 | 74.9 | නල ජල පහසුකම් (%) | 30 | 42 |
| ළදරු මරණ අනුපාතිකය (සජීවී උපත් දහසකට) -2007 | 11.2 | 8.5 | පිරිසිදු සනීප ජල සැපයුම් සඳහා ප්‍රවේශය (ජනගහනයේ % ලෙස) | 75 | 84 |
| මාතෘ මරණ අනුපාතිකය (සජීවී උපත් ලක්ෂයකට) | ලැ.නො. | 41.6 | පණිවිඩ හුවමාරුව | | |
| දළ උපත් අනුපාතිකය (දහසකට) - 2010 | 18.9 | 17.6 | ස්ථාවර දුරකථන (දහස්) | 1,244 | 3,608 |
| දළ මරණ අනුපාතිකය (දහසකට) - 2010 | 6.7 | 6.2 | ජංගම දුරකථන (ග්‍රාහක සංඛ්‍යාව දහස්) | 3,362 | 18,319 |
| සාක්ෂරතාව (%) - 2006-2010 | | | අන්තර්ජාල සහ ග්‍රාහකයන් (දහස්) | 115 | 322 |
| සාමාන්‍ය | 90.8 | 91.9 | තැපැල් | | |
| පිරිමි | 92.7 | 93.2 | රජයේ තැපැල් කාර්යාල | 4,043 | 4,061 |
| ගැහැණු | 89.1 | 90.8 | පෞද්ගලික තැපැල් කාර්යාල | 654 | 614 |
| සාක්ෂරතාව -පරිගණක-2006/07 | ලැ.නො. | 20.3 | මාර්ග | | |
| යැපුම් අනුපාතය (%) | 48.3 | 48.4 | මාර්ගවල මුළු දිග (කි.මී. ) | 111,436 | 114,548 |
| | | | මාර්ග ඝනත්වය (වර්ග කි.මී.) | 1.70 | 1.75 |
| මෝටර් වාහන ආනයනය | | | වරාය | | |
| යතුරු පැදි | 193,411 | 252,038 | පැමිණි යාත්‍රා සංඛ්‍යාව | 4,139 | 4,358 |
| ත්‍රී රෝද රථ | 39,154 | 137,798 | මුළු බහාලුම් මෙහෙයවීම් සංඛ්‍යාව (TEUs'000) | 2,455 | 4,263 |
| ට්‍රැක්ටර් | 26,106 | 26,870 | මුළු නැව් මෙහෙයවීම් සංඛ්‍යාව - මෙ.ටො. දහස් | 37,300 | 65,096 |
| භාණ්ඩ ප්‍රවාහන මෝටර් රථ | 18,423 | 55,381 | ප්‍රති නැව් ගත සංඛ්‍යාව (TEUs'000) | 1,716 | 3,216 |
| මගී ප්‍රවාහන වෑන් රථ හා බස් රථ | 2,229 | 3,838 | ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම | | |
| මෝටර් කාර් | 15,944 | 56,369 | (අළුතින් වගා කිරීමට නියමිත හෙක්ටයාර ගණන) | | |
| විශේෂ කාර්ය මෝටර් රථ | 661 | 769 | දැදුරු ඔය ජලාශය | - | 11,000 |
| | | | කැළි ඔය ජලාශය | - | 5,200 |
| | | | යාන් ඔය ජලාශය | - | 4,925 |
| | | | රඹුක්කන් ඔය ජලාශය | - | 1,400 |
| | | | ඌරාව කලාපය | - | ලැ.නො. |
| | | | මොරගහකන්ද සහ කළු ගඟ | - | 5,000 |
| | | | උමා ඔය | - | ලැ.නො. |

ශ්‍රී ලංකාව පිළිබඳව සැකෙවින් - 2005 සහ 2011

| | 2005 | 2011 | | 2005 | 2011 |
|---|---|---|---|---|---|
| වෘත්තිකයන් (තාවකාලික) | | | මුද්‍රිත මාධ්‍ය | | |
| වෛද්‍යවරුන් | 12,692 | 17,199 | පුවත්පත් | 90 | 167 |
| හෙදියන් | 20,332 | 29,234 | සිංහල පුවත්පත් (සංඛ්‍යාව) | 63 | 108 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු | 1,581 | 1,718 | දෙමළ පුවත්පත් (සංඛ්‍යාව) | 07 | 24 |
| උපස්ථායකවරු | 6,705 | 8,403 | ඉංග්‍රීසි පුවත්පත් (සංඛ්‍යාව) | 20 | 35 |
| මූලික අවශ්‍යතා සඳහා ප්‍රවේශය | | | විද්‍යුත් මාධ්‍ය | | |
| සෞඛ්‍ය | | | රූපවාහිනී සේවා | 13 | 21 |
| රජයේ රෝහල් | 606 | 592 | රාජ්‍ය | 4 | 6 |
| පෞද්ගලික රෝහල් (පෞද්ගලික වෛද්‍ය ආයතන පනත යටතේ පිහිටුවා ඇති ආයතන) | n.a. | 3,183 | සිංහල | 2 | 2 |
| මධ්‍යම බෙහෙත්ශාලා | 397 | 475 | දෙමළ | 1 | 2 |
| ඇඳන් | 61,937 | 69,731 | ඉංග්‍රීසි | 1 | 2 |

| | | |
|---|---|---|
| අධ්‍යාපන | | |
| රජය | | |
| පාසල් | 9,723 | 9,714 |
| සිසුන් (දහස්) | 3,937 | 3,970 |
| ගුරුවරුන් (දහස්) | 189,234 | 217,112 |
| පෞද්ගලික | | |
| පාසල් | 85 | 97 |
| සිසුන් (දහස්) | 106 | 120 |
| ගුරුවරුන් | 5,000 | 5,788 |
| පිරිවෙන් | | |
| පාසල් | 653 | 716 |
| සිසුන් (දහස්) | 55 | 63 |
| ගුරුවරුන් | 5,481 | 6,487 |
| කාන්තා සහභාගිත්වය | | |
| කාන්තා ජනගහනය (දහස්) (2005 සහ 2010) | 9,862 | 10,404 |
| රැකියාවන්හි නියුතු කාන්තාවන් (දහස්) (2005 සහ 2010) | 2,383 | 2,575 |
| ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය (%) (2005 සහ 2010) | 30.9 | 31.2 |
| රාජ්‍ය සේවයේ නියුතු කාන්තාවන් (2005 සහ 2010) | n.a | 444,816 |
| කාන්තා රැකියා විරහිතභාවය (%) (2005 සහ 2010) | 11.9 | 7.7 |
| දරිද්‍රතාවය | | |
| දරිද්‍රතා පරතර දර්ශකය - PGI හෝ PI (%) | 3.1 | 1.7 |
| දරිද්‍රතා දර්ශකය - HCI (%) | 15.2 | 8.9 |

| | | |
|---|---|---|
| පෞද්ගලික | 9 | 15 |
| සිංහල | 5 | 7 |
| දෙමළ | 1 | 3 |
| ඉංග්‍රීසි | 3 | 5 |
| ගුවන් විදුලි නාලිකා | 32 | 52 |
| රාජ්‍ය | 20 | 21 |
| සිංහල | 13 | 14 |
| දෙමළ | 5 | 5 |
| ඉංග්‍රීසි | 2 | 2 |
| පෞද්ගලික | 12 | 31 |
| සිංහල | 6 | 18 |
| දෙමළ | 1 | 3 |
| ඉංග්‍රීසි | 5 | 10 |
| ක්‍රියාත්මක වෙමින් පවතින ජල විදුලි බල හා තාප බලාගාරයන්හි ධාරිතාවය (මෙ.වො) | | |
| ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය (පළමු අදියර) මෙ.වො. | - | 150 |
| නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය (පළමු අදියර) මෙ.වො. | - | 300 |
| ලංකා විදුලි බල මණ්ඩලය | 1,758 | 2,058 |
| ජල විදුලි බලය | 1,207 | 1,207 |
| තාප විදුලි බලය | 548 | 848 |
| අනෙකුත් | 3 | 3 |
| පෞද්ගලික අංශය | 653 | 1,083 |
| ජල විදුලි බලය | 84 | 194 |
| තාප විදුලි බලය | 567 | 842 |
| අනෙකුත් | 2 | 47 |

## ශ්‍රී ලංකාව පිළිබඳව සැකෙවින් - 2005 සහ 2011

| | 2005 | 2011 |
|---|---|---|
| දිනකට ලබා ගන්නා කැලරි ප්‍රමාණය (දිළිඳු සහ දිළිඳු නොවන දෙපිරිසම (2006/2007) සහ (2009/2010) | 2,118 | 2,094 |
| ගිනි සංගුණකය (%) ඒකපුද්ගල වියදම (2002 සහ 2009/2010) | 0.40 | 0.36 |
| (ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2002 සහ 2009/2010) | | |

| | 2005 | 2011 |
|---|---|---|
| කොටස් වෙළෙඳපොළ | | |
| කොටස් වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 584 | 2,214 |
| සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන) | 482 | 2,286 |
| සියලු කොටස් මිල දර්ශකය | 1,922 | 6,074 |
| මිලංකා මිල දර්ශකය | 2,451 | 5,229 |
| වෙළෙඳපොළ ඉපැයුම් අනුපාතය - වර්ෂය අවසානයේ (%) | 12.4 | 15.8 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණ පිරිවැටුම (%) | 23.7 | 24.7 |

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

### පුද්ගල ආදායම් බදු (%)

| 2005 | | 2012 | |
|---|---|---|---|
| පළමු රු. 300,000 | නිදහස් | පළමු රු. 500,000 | නිදහස් |
| ඊළඟ රු. 300,000 | 5 | ඊළඟ රු. 500,000 | 4 |
| ඊළඟ රු. 200,000 | 10 | ඊළඟ රු. 500,000 | 8 |
| ඊළඟ රු. 200,000 | 15 | ඊළඟ රු. 500,000 | 12 |
| ඊළඟ රු. 200,000 | 20 | ඊළඟ රු. 500,000 | 16 |
| ඊළඟ රු. 200,000 | 25 | ඊළඟ රු. 1,000,000 | 20 |
| ඉතිරිය | 30 | ඉතිරිය | 24 |

## ශ්‍රී ලංකාව පිළිබඳව සැකෙවින් -2005 සහ 2011

| | 2005 | 2012 |
|---|---|---|
| **සමාගම් බදු (%)** | | |
| සම්මත අනුපාතය | 32.5 | 28 |
| බදු අය කළ හැකි ආදායම රු. මිලියන 5.0 අඩු | 20 | 12 |
| අපනයන ආදායම | 15 | 12 |
| | | |
| **ආර්ථික සේවා ගාස්තු (%)** | | |
| ආර්ථික සේවා ගාස්තු අනුපාතය | 0.5-1% | 0.25% |
| (ඕනෑම ආර්ථික සේවා ගාස්තු ගෙවීමක් ගෙවිය යුතු ආදායම් බදු/සමාගම් බදු ගෙවීමකින් අඩු කළ හැක.) | | |
| **එකතු කළ අගය මත බදු (%)** | | |
| සම්මත අනුපාතය | 15 | 12 |
| අපනයන | 0 | 0 |
| සුඛෝපභෝගී | 18 | - |
| ජාතික ගොඩනැගීමේ බද්ද (%) | - | 2 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද (%) | 1. 5 | 5 |
| විදුලි සංදේශ බද්ද | - | 20 |
| කොටස් ගනුදෙනු බද්ද | 0.2 | 0.3 |
| **රේගු බදු (%)** | | |
| යෙදවුම්/අමුද්‍රව්‍ය | 0 - 2.5 | 0 - 5 |
| අතරමැදි භාණ්ඩ | 6 හෝ 15 | 5-15 |
| නිමි භාණ්ඩ සහ සුඛෝපභෝගී භාණ්ඩ | 28 | 30 |

| | 2005 | 2012 |
|---|---|---|
| **නිෂ්පාදන බදු** | | |
| දුම්වැටි (රු. 1,000 සඳහා) | | |
| එකක් දිග මි.මී. 60 නොඉක්මවූ දුම්වැටි | 1,640 | 4,037 |
| එකක් දිග මි.මී. 60ට වැඩි නමුත් මි.මී. 67ට අඩු දුම්වැටි | 3,137 | 8,112 |
| එකක් දිග මි.මී. 67ට වැඩි නමුත් මි.මී. 72 ට අඩු දුම්වැටි | 5,088 | 10,953 |
| එකක් දිග මි.මී. 72ට වැඩි නමුත් මි.මී. 84 ට අඩු දුම්වැටි | 5,904 | 13,815 |
| එකක් දිග මි.මී. 84ට වැඩි දුම්වැටි | 6,150 | 17,100 |
| **මෝටර් වාහන** | | |
| මගී ප්‍රවාහන | 0 | 0 |
| ත්‍රිරෝද රථ | | |
| පෙට්‍රල් | 4 | 40 |
| ඩීසල් | 14 | 40 |
| අනෙකුත් වාහන | 15-115 | 14 -173 |
| **සුරා බදු ව්‍යුහය** | | |
| **සම්මත සැර ලීටරයට රුපියල්** | | |
| පොල්වලින් සෑදූ / උක් පැණි අරක්කු | 336 | 983 |
| මෙරට නිෂ්පාදිත විදේශ මධ්‍යසාර | 490 | 1,123 |
| සාන්ද්‍රනය 5%ට වැඩි මෝල්ට් මධ්‍යසාර (බීර) ලීටරයකට | 43.50 | 106 |
| සාන්ද්‍රනය 5%ට අඩු මෝල්ට් මධ්‍යසාර (බීර) ලීටරයකට | 27.50 | 90 |
| සාන්ද්‍රනය 4%ට වැඩි වයින් | 200 | 838 |
| වායු කවන ලද ජලය (ලීටරයකට) | 6 | 8 |

***වේලාව අ.භා.7.30 වුයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2012 ජූනි මස 8වන සිකුරාදා අ.භා.1.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப.7.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2012 யூன் 08, வெள்ளிக்கிழமை பி.ப.1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 7.30 p.m.,* THE PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.30 p.m. on Friday, 08th June, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.